බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා: 51

අභිධම්ම පිටකයෙහි

07-08 වන ග්‍රන්ථය

# ධාතුකථා ප්‍රකරණය

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනාවෙන් රාජකීය පණ්ඩිත, නුවරඑළියේ

**සේනානන්ද නායක ස්ථවිරයන්**

වහන්සේ විසින් කරනලද සිංහල පරිවර්තනයෙන් ද

**සතරවැනි**

# පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය

බෙලිගම්මන පොත්ගුල් විහාරාධිපති, මහනුවර, මල්වතු මහාවිහාරයෙහි
අනුනායක ධූරන්ධර අඹන්වැල්ලේ

**සිරි ධම්මානන්ද නායක ස්ථවිරයන් වහන්සේ**

හා

හිඟුල, මාකඩවර විහාරාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ

**සුමනසාර ස්ථවිරයන් වහන්සේ විසින්**

කරනලද සිංහල පරිවර්තනයෙන් ද යුක්ත යි.

පාඨශෝධන පූර්වක සිංහල පරිවර්තන සංස්කරණය

**ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය විසින් කරන ලදී.**

බු: ව: 2557
ක්‍රි: ව: 2013

Buddha Jayanti Tripitaka Series, Volume 51

The Seventh & Eighth Books in the

**Abhidhamma-Pitaka**

**7-8**

# DHĀTUKATHĀPPAKARANA

With the Sinhala translation by

**The Venerable Pandita Nuwaraeliye Senānanda Nāyaka Thera**

AND

# PUGGALAPAÑÑATTIPPAKARANA

With the Sinhala translation by

**The Venerable Abanwelle Sri Dhammānanda Anunāyake Thera**

Malwatu Mahavihāra Kandy

&

**The Venerable Pandita Karahampitigoda Sumanasāra Thera**

Mākadawara Vihāra, Hingula

With the edition by

**Tripitaka Sampādaka Mandalaya**

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කුඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමත කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගිනී, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපීතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

**තෙරුවන් සරණයි.**

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
වීදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

## බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක**
**වි. ජ. මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි**
**තායිවානයේ ප්‍රධාන සංඝනායක**

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉතා සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලිනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහළවේවායි ප්‍රාර්ථනා කරමු.*

අභිධම්මපිටකෙ

# ධාතුකථාප්පකරණං

# පුග්ගල-
# පඤ්ඤත්තිප්පකරණං

අභිධර්මපිටකයෙහි

# ධාතුකථා ප්‍රකරණය

හා

# පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය

“තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති. නො පටිච්ඡන්නො.”

‘ මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි.”

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... ... | ix |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... ... | xi |
| සංඥපනය ... ... ... ... | xiii |
| සඞ්කේත නිරූපණය ... ... ... ... | xvi |
| පාළි හෝඩිය ... ... ... ... | xvii |
| ධාතුකථා – විෂය සූචි ... ... ... ... | xviii |
| පුග්ගලපඤ්ඤත්ති – විෂය සූචි ... ... ... ... | xix |
| ධාතුකථා – පෙළ හා පරිවර්තනය ... ... ... ... | 2-237 |
| පුග්ගලපඤ්ඤත්ති – පෙළ හා පරිවර්තනය ... ... ... | 240–411 |
| ධාතුකථා – පදානුක්කමණිකා ... ... ... | 413 |
| පුග්ගලපඤ්ඤත්ති – පදානුක්කමණිකා ... ... ... | 419 |

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි 47 වැනි ග්‍රන්ථය වූයේ අභිධර්ම පිටකයේ තුන්වැනි සතරවැනි ප්‍රකරණ වූ 'ධාතුකථා' ප්‍රකරණය හා '**පුග්ගල පඤ්ඤත්ති**' ප්‍රකරණය යන ග්‍රන්ථ දෙක යි.

ලඞ්කා බෞද්ධමණ්ඩලයේ ආරාධනය පරිදි රාජකීය පණ්ඩිත නුවර-එළියේ සෙනානන්ද නායක ස්ථවිරයන් වහන්සේ විසින් කරන ලද සිංහල අනුවාද සහිත වූ ධාතුකථා ප්‍රකරණය ත්‍රිපිටක පරිවර්තන සංස්කාරක මණ්ඩලයේ ස්ථවිරවරුන් විසින් සංස්කරණය කරන ලද්දේ විය.

පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය සිංහලානුවාදය සඳහා ආරාධිත වූවාහු අඹන්වැල්ලේ සිරිධම්මානන්දභිධාන මහනුවර මල්වතු මහාවිහාරයේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යැ. එහෙත් උන්වහන්සේගේ අවි-වේකී භාවය නිසා හිඟුලේ මාකඩවර පුරාණ විහාරාධිපති රාජකීය පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද සහාය කොටගෙන කරන ලද සිංහලානුවාද සහිත ව මුද්‍රණය සඳහා සම්මත විය.

විවිධ හෙතුන් නිසා මේ ග්‍රන්ථය ද මුද්‍රණය කරවාලිය නොහැකිව අවුරුදු බොහෝ ගණනක් පසුවෙමින් තිබිය දී ගරු අග්‍රාමාත්‍යවර සිරිමාවෝ බණ්ඩාරනායක උත්තමාවගේ විධානය පරිදි වර්තමාන ගරු සංස්කෘතික අමාත්‍ය තැන් පත් ටී. බී. තෙන්නකෝන් මැති තුමාණන්ගේ මෙහෙයැවීම ද සංස්කෘතික අධිකාරියේ තත්කාර්‍ය්‍යභාර මහතුන්ගේ හෘදයඞ්ගම සහයෝගය ද හෙතු කොට ගෙන ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය නො නැවැතී කරගෙන යා හැකිව පවත්නා බව කෘතඥතා පූර්වක ව සඳහන් කරම්හ.

භාෂා ශාස්ත්‍රාන්තරයෙහි හා ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති විෂයෙහි ද බැසගත් බුද්ධි ප්‍රභා ඇති වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි පණ්ඩිත මහාස්ථවිරවරුන් වහන්සේ දවරය සංශොධන සංස්කරණ කාර්‍ය්‍යයෙහි නිරතුරු යෙදීම නිසා මුද්‍රණය සාධුත්වයට පමුණුවාලියැ හැකි වූ බව ද විශෙෂයෙන් කියැ යුතු ය.

දෙහිවල තිසර මුද්‍රණාලයාධිකාරීන්ගේ හා තත් කාර්‍ය්‍යමණ්ඩලයේ ද ක්‍රියා කෞශල්‍යය මේ ග්‍රන්ථය අල්ප කාලයකින් නිමහම් කිරීමට හැකිවූ බව ද ප්‍රශංසා පූර්වක ව පවසම්හ.

බුද්ධශාසනායු රක්ෂණයට කාරණ වූ මෙම ත්‍රිපිටක මුද්‍රණ කාර්‍ය්‍යය සඳහා හැමලෙසින් සහාය වූ පින්වත් සාධූනට සගමොක් සුව ලැබෙවායි ආශංසනය කරම්හ.

මේ වගට:

ශාසනොදයකාරී,
ලබුගම ලඞ්කානන්ද ස්ථවිර

ත්‍රිපිටක කාර්‍ය්‍යාලය,
මහ නායක චාරිකාර මය,
115, විජේරාම මාවත, කොළඹ 7,
1976, සැප්තැම්බර් 20 දින.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහා ස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂුවිශ්ව විද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝද්දගොඩ ශ්‍රී ඤාණාලෝක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද-කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දැල්ලේ සිරි පඤ්ඤාලෝක – ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ – මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන්වහන්සේ.

කොළඹ, තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# සංඥපනය

ධාතුකථා:

ශ්‍රී සුගත තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සම්බොධියෙන් සත් වන වසැ තව්තිසායෙහි මාතෘදිව්‍යරාජයන් ප්‍රමුඛ දෙවියනට ප්‍රඥා-සන්දීපක වූ පරමගම්භීර අභිධර්මදේශනා කරනසේක් අටළොස් ප්‍රභේදයෙන් සමන්වාගත වූ විභඞ්ග දේශනා පවත්වා තදනන්තර වැ ධාතු ප්‍රභේද දක්වමින් ධාතුකථා වදළහ.

ධම්මසඞ්ගණියෙහි කුසලත්‍රිකය පටන් අරණධර්ම අන්ත කොට ඇති ධර්මයෝ ද ධාතුකථායෙහි පඤ්චස්කන්ධය පටන් මනසිකාර අන්ත කොට ඇති ධර්මයෝ ද ස්වභාවාර්ථයෙන් ධාතු නම් වෙති. ඔවුන් ගෙන කියන බැවින් මේ ප්‍රකරණ 'ධාතුකථා' නම් වෙයි. 'ධම්මසඞ්ගණී' ආදි අන්‍ය ප්‍රකරණයන්හිදු එ මැ ස්වභාවයෝ කියන ලදහ. ඒ හැම ප්‍රකරණ යන්හි ලා ඒකදේශකථනයක් මැ කරන ලද්දේ යැ. මෙහි වූකලි ඒ හැම ධාතූන් 'සඞ්ගහ, අසඞ්ගහ' ආදි තුදුස් නයෙහි ලා වෙන වෙන විභාග කොට කියන ලද වන බැවින් සාතිශය කථන නු යි මෙ මැ ප්‍රකරණ 'ධාතුකථා' නම් ලද.

''ධාතුකථා'' 'උද්දෙස' 'නිද්දෙස' විසින් ද්විවිධ වෙයි. උද්දෙස නම් මාතෘකා යි. එ ද 'නයමාතිකා' යැ 'අබ්භන්තර මාතිකා' යැ 'නයමුඛ-මාතිකා' යැ 'ලක්ඛණමාතිකා' යැ 'බාහිරමාතිකා' යැ යි පඤ්චවිධ වෙයි.

නයමාතිකා: 'සඞ්ගහො අසඞ්ගහො' යනු පටන් 'විප්පයුත්තෙන සඞ්ගහිතං අසඞ්ගහිතං' යනු හිම් කොට ඇති තුදුස් පද නයමාතිකා යි. ධාතු-කථා ධර්මයන් මේ සඞ්ගහාදි නයින් විභාග කරනු ලබන බැවින් මේ නය-මාතිකා නම් වෙයි. මේ තුදුස් පදයන් ධර්මවිභාගයට මුල් වන බැවින් 'මූලමාතිකා' යි කියනුදු වටී.

අබ්භන්තරමාතිකා: 'පඤ්චක්ඛන්ධා' යනු පටන් 'මනසිකාරො' යනු හිම් කොට ඇති එක්සිය පස්විස්සක් පද 'අබ්භන්තරමාතිකා' යි. විභඞ්ගයෙහි ආ අටළොස් මාතෘකා අතුරෙහි 'සික්ඛාපද, පටිසම්භිද, ඤාණ, ඛුද්දකවත්ථු, ධම්මපදය' යන මාතෘකා පස හැර අවශේෂ තෙළෙස් මාතෘකා ද විභඞ්ගයෙහි නො ආ පඤ්චින්ද්‍රිය, පඤ්චබල, යන මොහු ද 'ඵස්ස, වෙදනා, සඤ්ඤා, චෙතනා, චිත්ත, අධිමොක්ඛ, මනසිකාර' යන චිත්තාඞ්ග ධර්ම-යෝ ද මෙහි අන්තර්ගත වෙති. ස්කන්ධාදි ධර්මයන් සඞ්ග්‍රහාදි නයින් විභාග කොට ස්වරූප විසින් දක්වා ධාතුකථාභ්‍යන්තරයෙහි මැ තබනලද වන බැවින් මෙ අභ්‍යන්තරමාතෘකා නම් වෙයි. ඛන්ධාදි පදයන් ධම්ම-සඞ්ගණී මාතිකායෙහි අසඞ්ගෘහීත වන බැවින් මෙ 'ප්‍රකීර්ණක මාතෘකා'යි කියනුදු වටී.

නයමූඛමාතිකා: 'තීහි සඞ්ගහො තීහි අසඞ්ගහො, චතූහි සම්පයොගො, චතූහි විප්පයොගො' යන සතර පදයෙන් තබන ලද්දේ නයමූඛමාතිකා යි. සියලු මැ පඤ්චස්කන්ධාදි ධර්මයන්හිදු කුශලත්‍රිකාදි මාතෘකාධර්මයන්හිදු සඞ්ග්‍රහයත් අසඞ්ග්‍රහයත් ඛන්ධ ආයතන ධාතු පදත්‍රයෙන් මැ කළයුතු වෙයි. එහැමයෙහි සම්ප්‍රයොගයත් විප්‍රයොගයත් සතර අරූපස්කන්ධයෙන් මැ කළයුතු වෙයි. මේ මාතෘක සඞ්ග්‍රහාදිනයට 'මුඛ' වන බැවින් 'නයමූඛමාතිකා' යි කියනු ලැබේ.

ලක්ඛණමාතිකා: 'සභාගො, විසභාගො' යන මේ දෙපදයෙන් තබන ලද්දේ 'ලක්ඛණමාතිකා' නම. මෙහි සභාගලක්ඛණ ධර්මයෙන් 'අසඞ්ග්‍රහ, විප්‍රයොග දෙනය ද, විසභාගලක්ඛණ ධර්මයෙන් 'සඞ්ග්‍රහ සම්ප්‍රයොග දෙනය ද යෙදියයුතු යැ. සභාග විසභාග ලක්ෂණ වශයෙන් සඞ්ග්‍රහාදි ලක්ෂණ දක්වන්නට තබනලද වන බැවින් මේ 'ලක්ඛණමාතිකා' නම් වේ.

බාහිරමාතිකා: 'සබ්බාපි ධම්මසඞ්ගණී ධාතුකථාය මාතිකා' යනු 'බාහිරමාතිකා' යි. මෙහි කුසලත්තිකාදි ත්‍රිකපද සසැටක් ද හෙතුදුකාදි ද්විකපද සියයක් ද සංක්ෂිප්ත කොට දක්වන ලදි. මේ මාතෘකා පඤ්චක්ඛන්ධා ආදි අභ්‍යන්තරමාතෘකා දක්වූ යේ ධාතුකථාමාතෘකා අතුරෙහි නො ලා ඉන් බැහැර කොට තබනලද වන බැවින් 'බාහිරමාතිකා' නම් වේ.

නිද්දෙසයෙහි දී අභ්‍යන්තර මාතෘකා ද බාහිරමාතෘකා ද නය, නයමුඛ, ලක්ඛණ යන මාතෘකා පදයන්හි ලා විභාග කරන ලද්දේ යැ. මෙසේ බලත් මැ 'ධාතුකථාප්පකරණ' යනු 'ධම්මසඞ්ගණී මාතෘකා ද විභඞ්ග මාතෘකා ද ගෙන 'නය, නයමුඛ, ලක්ෂණ පදයන්හි ලා කරන ලද ස්වරූප විභාගයක් බව පෙනෙයි. වාචනාමාර්ගයෙහි ආ පමණින් 'ධාතුකථාප්පකරණය' සාතිරෙක බණවර සයෙකි.

**පුග්ගලපඤ්ඤත්ති:**

ධම්මසඞ්ගණියෙහි තික – දුක වශයෙන් සඞ්ග්‍රහ කරනලද ධර්මයෝ විභඞ්ගයෙහි දී ස්කන්ධාදි වශයෙන් නිෂ්ප්‍රදේශ කොට විභාග කරන ලදහ. දෙක්හි සඞ්ග්‍රහ කරන ලද්ද වූ ද විභාග කරන ලද්ද වූ ද ධර්මයෝ ධාතුකථායෙහි ලා 'සඞ්ග්‍රහ අසඞ්ග්‍රහ' ආදි තුදුස් නයෙකින් සාතිශය කොට විභාග කරන ලදහ. තදනන්තර වැ එ හැම ධර්මයන්ගේ ස්වභාව ප්‍රඥප්ති ද උපාද ප්‍රඥප්තිදු ප්‍රභේද වශයෙන් දක්වන්නට ''ඡපඤ්ඤත්තියො'' යනාදීන් පුද්ගලප්‍රඥප්ති දේශනා ආරබ්ධ යි.

සප්තප්‍රකරණයන් අතුරෙහි සතර වැන්න 'පුද්ගලපඤ්ඤත්තිප්පකරණ නම් වෙයි. පඤ්ඤත්ති සයෙකි; ඛන්ධපඤ්ඤත්ති යැ ආයතනපඤ්ඤත්ති යැ ධාතුපඤ්ඤත්ති යැ සච්චපඤ්ඤත්ති යැ ඉන්ද්‍රියපඤ්ඤත්ති යැ පුග්ගල පඤ්ඤත්ති යැ කියා යි.

පඤ්චවිධ ඥෙයධර්මයන් අතුරෙහි ප්‍රඥප්තිය ද එකෙකි. ආභිධර්මිකයන් ප්‍රඥප්තිධර්මයෙහි නොමුළා වන පිණිස ප්‍රඥප්තිධර්ම ද අභිධර්මයෙහි ලා සඞ්ගෘහීත වෙයි. පුග්ගලපඤ්ඤත්තිප්පකරණයෙහි ස්කන්ධාදි පඤ්චප්‍රඥප්තීන් ආදියෙහි ලා කියතුදු පුද්ගලප්‍රඥප්ති ප්‍රභේද ප්‍රකාශනය මැ මුඛ්‍ය වන බැවින් පුද්ගල ප්‍රඥප්තිය නිසා මේ ප්‍රකරණ පුද්ගල ප්‍රඥප්ති නම් වෙයි. ස්කන්ධාදි ප්‍රඥප්තීන් විභඞ්ගයෙහි ලා නිෂ්ප්‍රදේශ කොට වදරන ලද බැවින් මෙහි දී එකදේශයෙකින් වදළහ. විභඞ්ගයෙහි නො වදළ පුද්ගලප්‍රඥප්තිය මෙහි ලා විස්තර විසින් විභාග කොට දක්වන ලදි.

'පඤ්ඤත්ති' ශබ්දය වූ කලී ''ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති, පට්ඨපෙති'' ආදි තන්හි 'දර්ශනය ප්‍රකාශනය' යන අරුත්හි වැටෙයි. ''සුපඤ්ඤත්තං මඤ්චපීඨං'' යන තන්හි 'ස්ථාපන නික්ෂෙපණ' අරුත්හි වැටෙයි. 'පුග්ගලපඤ්ඤත්ති' යන තන්හි ඒ දෙ අරුත් මැ වටී. පුද්ගලයන් 'පුද්ගල' යයි දක්වීම, පැවැසීම, තැබීම, බහාලීම පුද්ගල ප්‍රඥප්ති නම් වෙයි.

පුග්ගලපඤ්ඤත්තිප්පකරණ උද්දෙස නිද්දෙස විසින් ද්විවිධ වෙයි. උද්දෙසයෙහි ඒකකය පටන් දසකය තෙක් අනුක්‍රමයෙන් රාශිදශයෙක ලා විවිධ පුද්ගලයෝ සඞ්ග්‍රහ කරන ලදහ. ඒකක රාශියෙහි පුද්ගලයෝ පනස්දෙනෙකි. ද්විකරාශි සවිස්සෙක, ත්‍රිකරාශි සොළොසෙක, චතුෂ්කරාශි එකුන්තිසෙක පඤ්චක රාශි තුදුසෙක, සප්තකරාශි දෙකෙක, ෂට්ක, අෂ්ටක, නවක දශක යන්හි එකෙකි රාශිය බැවිනි. සියලු පුද්ගලයෝ තුන්සිය තෙයාසූ (383) දෙනෙක් මෙහි සඞ්ගෘහීත වෙති. උද්දෙශයෙහි කියන ලද එක් එක් පුද්ගලයා ගෙන නිර්දෙශයෙහි දී විස්තර විසින් විභාග කොට දක්වන ලද්දේ යැ. වාචනාමාර්ගයෙහි ආ පමණින් 'පුග්ගලපඤ්ඤත්තිප්පකරණය අතිරේකයක් සහිත බණවර පසෙක් පමණ වේ. අභිධර්මය පිළිබඳ වැ කිවයුතු දය 'ධම්මසඞ්ගණිප්පකරණ' සංඥාපනයෙහි කියන ලද වන බැවින් මෙහි වටාලා නො කියම්හ.

මෙයට, සසුන් වැඩ කැමැති,
කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිර

ත්‍රිපිටක කාර්‍යාලය,
මහානායක වාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ 7,
1976, සැප්තැම්බර් 20 වැනි දින දීය.

# සංකේත නිරූපණය

සිමු: සිංහල මුද්‍රිත ග්‍රන්ථ

සිරිමු: සිරිපාද ත්‍රිපිටක මුද්‍රණය

මඡසං: බුරුම ඡට්ඨසංගීති - ශෝධිත අභිධම්ම පිටක

සයා: සියම් - තායයක්ෂර අභිධම්ම පිටක

PTS: Pali Text Society -

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya   ර ra   ල la   ව va   ස sa   හ ha   ළ ḷa   අං ṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ ම්බ, mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර grā | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā   ි i   ී ī   ු u   ූ ū   ෙ e   ො o

# ධාතුකථා-විෂය සූචි

## මාතිකා


| | | |
|---|---|---|
| 1. | නය මාතිකා ... ... ... ... ... | 2 |
| 2. | අබ්භන්තර මාතිකා ... ... ... ... | ,, |
| 3. | නයමුඛ මාතිකා ... ... ... ... ... | ,, |
| 4. | ලක්ඛණ මාතිකා ... ... ... ... ... | 4 |
| 5. | බාහිර මාතිකා ... ... ... ... ... | ,, |


## නිද්දෙස


| | | |
|---|---|---|
| 1. | සඞ්ගහා සඞ්ගහ පදනිද්දෙසො ... ... ... | 6– 64 |
| 2. | සඞ්ගහිතෙන අසඞ්ගහිත පදනිද්දෙසො ... ... | 66– 68 |
| 3. | අසඞ්ගහිතෙනසඞ්ගහිත පදනිද්දෙසො ... ... | 70– 74 |
| 4. | සඞ්ගහිතෙන සඞ්ගහිත පදනිද්දෙසො ... ... | 76– 78 |
| 5. | අසඞ්ගහිතෙන අසඞ්ගහිත පදනිද්දෙසො ... ... | 80– 96 |
| 6. | සම්පයොගවිප්පයොග පදනිද්දෙසො ... ... | 98-130 |
| 7. | සම්පයුත්තෙන විප්පයුත්ත පදනිද්දෙසො ... ... | 132-134 |
| 8. | විප්පයුත්තෙන සම්පයුත්ත පදනිද්දෙසො ... ... | -136 |
| 9. | සම්පයුත්තෙන සම්පයුත්ත ,, ... ... ... | 138-150 |
| 10. | විප්පයුත්තෙන විප්පයුත්ත පදනිද්දෙසො ... ... | 152-170 |
| 11. | සඞ්ගහිතෙන සම්පයුත්තවිප්පයුත්ත පදනිද්දෙසො ... | 172-176 |
| 12. | සම්පයුත්තෙන සඞ්ගහිත අසඞ්ගහිත පදනිද්දෙසො ... | 178-192 |
| 13. | අසඞ්ගහිතෙන සම්පයුත්ත විප්පයුත්ත පදනිද්දෙසො ... | 194-202 |
| 14. | විප්පයුත්තෙන සඞ්ගහිතාසඞ්ගහිත පදනිද්දෙසො ... | 204-236 |

# පුග්ගල පඤ්ඤත්ති—විෂය සූචි

## උද්දෙසවාරො 240–260


1. ඛන්ධ පඤ්ඤත්ති ... ... ... ... 240
2. ආයතන පඤ්ඤත්ති ... ... ... ... „
3 ධාතු පඤ්ඤත්ති ... ... ... ... ... „
4. සච්ච පඤ්ඤත්ති ... ... ... ... ... „
5. ඉන්ද්‍රිය පඤ්ඤත්ති ... ... ... ... 242
6. පුග්ගල පඤ්ඤත්ති ... ... ... ... 242-260

1. එකක මාතිකා ... ... ... ... ... 212–244
2. දුක මාතිකා ... ... ... ... ... 244–
3. තික මාතිකා ... ... ... ... ... 246–248
4. චතුක්ක මාතිකා ... ... ... ... ... 248–254
5. පඤ්චක මාතිකා ... ... ... ... ... 256-
6. ඡක්ක මාතිකා ... ... ... ... ... 258–
7. සත්තක මාතිකා ... ... ... ... 258–
8. අට්ඨක මාතිකා ... ... ... ... ... 260–
9. නවක මාතිකා ... ... ... ... „
10. දසක මාතිකා ... ... ... ... ... „


## නිද්දෙසවාරො 262–410


1. එකක නිද්දෙසො ... ... ... ... 262-276
2. දුක නිද්දෙසො ... ... ... ... ... 278–296
3. තික නිද්දෙසො ... ... ... ... ... 298-324
4. චතුක්ක නිද්දෙසො ... ... ... ... 326–382
5. පඤ්චක නිද්දෙසො ... ... ... ... 394–396
6. ඡක්ක නිද්දෙසො ... ... ... ... 398–
7. සත්තක නිද්දෙසො ... ... ... ... 400–402
8. අට්ඨක නිද්දෙසො ... ... ... ... 404–
9. නවක නිද්දෙසො ... ... ... ... 406–408
10. දසක නිද්දෙසො ... ... ... ... 410–

අභිධම්මපිටකෙ

# ධාතුකථාප්පකරණං

අභිධමම පිටකෙ

# ධාතුකථාපපකරණං

——:——

නමො තසස භගවතො අරහතො
සමමා සමබුදධසස

(මාතිකා)

## 1. නයමාතිකා.

සඞගහො අසඞගහො, සඞගහිතෙන අසඞගහිතං, අසඞගහිතෙන සඞගහිතං සඞගහිතෙන සඞගහිතං, අසඞගහිතෙන අසඞගහිතං.

සමපයොගො විපපයොගො, සමපයුතෙතන විපපයුතතං, විපපයුතෙතන සමපයුතතං, සමපයුතෙතන සමපයුතතං, විපපයුතෙතන විපපයුතතං.

සඞගහිතෙන සමපයුතතං විපපයුතතං, සමපයුතෙතන සඞගහිතං අසඞගහිතං, අසඞගහිතෙන සමපයුතතං විපපයුතතං, විපපයුතෙතන සඞගහිතං අසඞගහිතං.

## 2. අබභනතරමාතිකා.

පඤචකඛනධා, ද්වාදසායතනානි, අටඨාරසධාතුයො. චතතාරි සචචානි, බාවීසතින්ද්‍රියානි, පටිචචසමුපපාදො, චතතාරො සතිපටඨානා, චතතාරො සමමපපධානා, චතතාරො ඉද්ධිපාද, චතතාරි ඣානානි, චතසසො අපපමඤඤායො, පඤචින්ද්‍රියානි, පඤචබලානි, සතතබොජඣඞගා අරියො අටඨඞගිකො මගගො. ඵසසො, වෙදනා, සඤඤා, චෙතනා, චිතතං, අධිමොකෙඛා, මනසිකාරො.

## 3. නයමුඛමාතිකා.

තීහි සඞගහො, තීහි අසඞගහො, චතූහි සමපයොගො, චතූහි විපපයොගො.

අභිධර්ම පිටකයෙහි

# ධාතුකථා ප්‍රකරණය

—:—

## ඒ භාග්‍යවත් වූ අර්හත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා!

### මාතෘකා

#### 1. නය මාතෘකා.

සඞ්ග්‍රහ යැ අසඞ්ග්‍රහ යැ, සඞ්ගෘහීතයෙන් අසඞ්ගෘහීත යැ, අසඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත යැ, සඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත යැ, අසඞ්ගෘහීතයෙන් අසඞ්ගෘහීත යැ,

සම්ප්‍රයොග යැ විප්‍රයොග යැ, සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත යැ, විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත යැ, සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත යැ, විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත යැ.

සඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත යැ, සම්ප්‍රයුක්තයෙන් සඞ්ගෘහීත අසඞ්ගෘහීත යැ, අසඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත යැ, විප්‍රයුක්තයෙන් සඞ්ගෘහීත අසඞ්ගෘහීත යි.

#### 2. අභ්‍යන්තරමාතෘකා.

පඤ්චස්කන්ධයෝ යැ, ද්වාදශායතනයෝ යැ, අටළොස් ධාතුහු යැ, සතර සත්‍යයෝ යැ, දෙවිසි ඉන්ද්‍රියයෝ යැ, ප්‍රතීත්‍යසමුත්පාද යැ, සතරසතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක්ප්‍රධානයෝ යැ, සතර ඍද්ධිපාදයෝ යැ, සතර ධ්‍යානයෝ යැ, සතර අප්‍රාමාණ්‍යයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්චබලයෝ යැ, සප්තබොධ්‍යඞ්ගයෝ යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ග යැ, ස්පර්ශ යැ, වේදනා යැ, සංඥා යැ. චේතනා යැ, චිත්ත යැ, අධිමොක්ෂ යැ, මනසිකාර යි.

#### 3. නයමුඛමාතෘකා.

(ස්කන්ධ ධාතු ආයතන යන) තුන් පදයෙන් සඞ්ග්‍රහ වෙයි, තුන් පදයෙන් අසඞ්ග්‍රහ වෙයි. සතර අරූපස්කන්ධයෙන් සම්ප්‍රයොග වෙයි, සතර අරූපස්කන්ධයෙන් විප්‍රයොග වේ.

### 4. ලක්ඛණමාතිකා.

සභාගො, විසභාගො

### 5. බාහිරමාතිකා.

සබ්බා'පි ධම්මසඞ්ගණී ධාතුකථාය මාතිකා ති.

මාතිකා නිට්ඨිතා.

### 4. ලක්ඛණමාතෘකා.

සභාග යැ විසභාග යි.

### 5. බාහිර මාතෘකා.

5. හැම ධර්මසඞ්ගණී මාතෘකා ධාතු කථාවට මාතෘකා යි.

**මාතෘකා නිමි.**

# 1. සඞ්ගහාසඞ්ගහ පද නිද්දෙසො[1]

1. රූපක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහා යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතො:

රූපක්ඛන්ධො එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි, එකෙනායතනෙන, සත්තහි ධාතූහි අසඞ්ගහිතො.

2. වෙදනාක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතො:

වෙදනාක්ඛන්ධො එකෙන ඛන්ධෙන එකෙනා'යතනෙන එකාය ධාතුයා සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතො.

3. සඤ්ඤාක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහා'යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතො:

සඤ්ඤාක්ඛන්ධො එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතො.

4. සඞ්ඛාරක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතො:

සඞ්ඛාරක්ඛන්ධො එකෙන ඛන්ධෙන එකෙනා'යතනෙන එකාය ධාතුයා සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහා යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතො.

---
1. සංගහාසංගහො - PTS

## 1. සංග්‍රහ අසංග්‍රහ පද නිර්දේශය.

1. **රූපස්කන්ධය** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

රූපස්කන්ධය එක්මැ රූපස්කන්ධය විසින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත යි.

(ස්කන්ධාදී) කෙතෙකින්, සඞ්ගෘහීත නොවේ ද යත්: සතර නාමස්කන්ධයන් විසින් එක් මැ මනායතනය විසින් සප්ත විඥාන ධාතූන් විසින් අසඞ්ගෘහීත යි.

2. **වෙදනාස්කන්ධය** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

වෙදනාස්කන්ධය එක් මැ වෙදනාස්කන්ධය විසින්, එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත යි.

(ස්කන්ධාදී) කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත යි.

3. **සංඥස්කන්ධය** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

සංඥාස්කන්ධය එක් මැ සංඥාස්කන්ධය විසින් එක් මැ ධර්මායතනය විසින් එක්මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත යි.

(ස්කන්ධාදී) කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත යි.

4. **සංස්කාරස්කන්ධය** කෙතෙක් ස්කන්ධයන් විසින්, කෙතෙක් ආයතනයන් විසින්, කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

සංස්කාර ස්කන්ධය එක් මැ සංස්කාර ස්කන්ධය විසින් එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත යි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත යි.

5. විඤ්ඤාණක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහා යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතො:

විඤ්ඤාණක්ඛන්ධො එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතො.

6. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච කතිහි ඛන්ධෙහි කතිහා'යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

7. රූපක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච -පෙ- ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

8. රූපක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච -පෙ- ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

9. රූපක්ඛන්ධො ච විඤ්ඤාණක්ඛන්ධො ච -පෙ- ද්වීහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

5. **විඤ්ඤාණස්කන්ධය** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

විඤ්ඤාන ස්කන්ධය එක් මැ විඤ්ඤාණස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්ත විඤ්ඤාන ධාතූන් විසින් සඞ්ගෘහීත යි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත යි.

6. **රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත්** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් (රූප–වෙදනා යන) ස්කන්ධයන් දෙදෙනා විසින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

(ස්කන්ධාදී) කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ තුනෙකින් එක් මැ මනායතනයෙන් සප්තවිඤ්ඤානධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

7. **රූපස්කන්ධයත් සංඥස්කන්ධයත්** ... (රූප – සංඥ යන) ස්කන්ධ දෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ තුනකින් එක් මැ මනායතනයෙන් සප්තවිඤ්ඤානධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

8. **රූපස්කන්ධයත් සංස්කාරස්කන්ධයත්** –පෙ– (රූප සංස්කාර යන) ස්කන්ධ දෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ තුනෙකින් එක් මනායතනය විසින් සප්තවිඤ්ඤානධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

9. **රූපස්කන්ධයත් විඤ්ඤාණස්කන්ධයත්** ... (රූප – විඤ්ඤාන යන) ස්කන්ධ දෙකින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ තුනෙකින් අසඞ්ගෘහීත වෙති. කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

10. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච කතිහි ඛන්ධෙහි කතිහා'යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච තීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

11. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච -පෙ- තීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

12. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච විඤ්ඤාණක්ඛන්ධො ච -පෙ- තීහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

13. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

14. රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච විඤ්ඤාණක්ඛන්ධො ච -පෙ- චතූහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

10. **රූපස්කන්ධයත් වේදනාස්කන්ධයත් සංඥස්කන්ධයත්** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞගෘහීත ද යත්: රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංඥස්කන්ධයත් තුන් ස්කන්ධයන් විසින් එකොළොස් ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: ස්කන්ධ දෙකකින් එක් මැ මනායතනය විසින් සප්ත විඥනධාතූන් විසින් අසඞගෘහීත වෙත්.

11. **රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංස්කාරස්කන්ධයත්** ... තුන් ස්කන්ධයන් විසින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: ස්කන්ධ දෙකකින් එක් මැ මනායතනය විසින් සප්ත විඥන ධාතූන් විසින් අසඞගෘහීත වෙත්.

12. **රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් විඥනස්කන්ධයත්** ... තුන් ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: ස්කන්ධ දෙකෙකින් අසඞගෘහීත වෙත්. කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙතෙකුන් විසින් අසඞගෘහීත නොවෙත්.

13. **රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංඥස්කන්ධයත් සංස්කාරස්කන්ධයත්** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞගෘහීත ද යත්:

රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංඥස්කන්ධයත් සංස්කාරස්කන්ධයත් සතරස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: එක් මැ, විඥානස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්තවිඥාන ධාතූන් විසින් අසඞගෘහීත වෙත්.

14. රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංඥාස්කන්ධයත් විඥානස්කන්ධයත් ... සතර ස්කන්ධයෙකින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: එක් මැ (සංස්කාර) ස්කන්ධය විසින් අසඞගෘහීත වෙති. කිසි ආයතන කෙනකු විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞගෘහීත නොවෙත්.

15. රූපක්ඛන්ධො ච වේදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච විඤ්ඤාණක්ඛන්ධො ච කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

රූපක්ඛන්ධො ච වෙදනාක්ඛන්ධො ච සඤ්ඤාක්ඛන්ධො ච සඞ්ඛාරක්ඛන්ධො ච විඤ්ඤාණක්ඛන්ධො ච පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

16. පඤ්චක්ඛන්ධා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: පඤ්චක්ඛන්ධා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

---

17. චක්ඛායතනං කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතං: චක්ඛායතනං එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

18-26. සොතායතනං-පෙ-ඝානායතනං - ජිව්හායතනං- කායායතනං- රූපායතනං - සද්දායතනං - ගන්ධායතනං - රසායතනං- ඵොට්ඨබ්බායතනං- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

15. **රූපස්කන්ධයත් වෙදනාස්කන්ධයත් සංඥස්කන්ධයත් සංස්කාරස්කන්ධයත් විඥනස්කන්ධයත්** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞගෘහීත ද යත්:

රූපස්කන්ධයත්,වෙදනාස්කන්ධයත්, සංඥාස්කන්ධයත්, සංස්කාර ස්කන්ධයත්, විඥානස්කන්ධයත් පඤ්ච ස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: කිසි ස්කන්ධකෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞගෘහීත නොවෙත්.

16. **පඤ්චස්කන්ධයෝ** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞගෘහීත ද යත්: පඤ්ච-ස්කන්ධයෝ පඤ්චස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞගෘහීත වෙති.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින්, කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞගෘහීත නො වෙති.

---

17. **චක්ඛායතනය** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞගෘහීත ද යත්: චක්ඛායතනය එක් මැ රූපස්කන්ධය විසින් එක් මැ චක්ඛායතනය විසින් එක් මැ චක්ඛු ධාතුව විසින් සඞගෘහීත වෙයි.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: සතර නාමස්කන්ධයන් විසින් එකොළොස් ආයකනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞගෘහීත වෙයි.

18–26. **සොතායතනය... ඝානායතනය... ජිහ්වායතනය... කායායතනය ... රූපායතනය ... සද්දයතනය ... ගන්ධායතනය ... රසායතනය ... ඵොට්ඨබ්බායතනය** එක් මැ රූපස්කන්ධය විසින් එක් ආයතනයෙකින් එක් ධාතුවකින් සඞගෘහීත වෙයි.

කෙතෙකින් අසඞගෘහීත ද යත්: සතර නාමස්කන්ධයන් විසින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞගෘහීත වෙ.

27. මනායතනං -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතං.

28. ධම්මායතනං -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං,

29. චක්ඛායතනං ච සොතායතනං ච -පෙ- එකෙන ඛන්ධෙන ද්විහායතනෙහි ද්විහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා,

30-37. චක්ඛායතනඤ්ච ඝානායතනඤ්ච -පෙ- චක්ඛායතනඤ්ච ජිව්හායතනඤ්ච - චක්ඛායතනඤ්ච කායායතනඤ්ච - චක්ඛායතනඤ්ච රූපායතනඤ්ච - චක්ඛායතනඤ්ච සද්දායතනඤ්ච - චක්ඛායතනඤ්ච ගන්ධායතනඤ්ච - චක්ඛායතනඤ්ච රසායතනඤ්ච - චක්ඛායතනඤ්ච ඵොට්ඨබ්බායතනඤ්ච එකෙන ඛන්ධෙන ද්විහායතනෙහි ද්විහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

38. චක්ඛායතනඤ්ච මනායතනඤ්ච -පෙ- ද්වීහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා:

39. චක්ඛායතනඤ්ච ධම්මායතනඤ්ච -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්විහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

27. **මනායතනය** එක් මැ විඤ්ඤානස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්තවිඤ්ඤානධාතූන් විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

28. **ධම්මායතනය...** අසඞ්ඛත ධම්මායතනය ස්කන්ධ හෙයින් නො ගෙන (රූපාදි) සතර ස්කන්ධයන් විසින් එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් මැ විඤ්ඤාන ස්කන්ධය විසින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

29. **චක්ඛායතනයත් සොතායතනයත්...** එක් මැ රූපස්කන්ධය විසින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙති.

30–37. **චක්ඛායතනයත් ඝානායතනයත්...** චක්ඛායතනයත් ජිව්හායතනයත්... චක්ඛායතනයත් කායායතනයත් ... චක්ඛායතනයත් රූපායතනයත්... චක්ඛායතනයත් සද්දායතනයත් ... චක්ඛායතනයත් ගන්ධායතනයත්... චක්ඛායතනයත් රසායතනයත් ... චක්ඛායතනයත් ඵොට්ඨබ්බායතනයත්... එක් මැ රූපස්කන්ධය විසින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

38. **චක්ඛායතනයත් මනායතනයත්...** ස්කන්ධ දෙකකින් ආයතන දෙකකින් ධාතු අටකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනයකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

39. **චක්ඛායතනයත් ධම්මායතනයත්...** අසඞ්ඛත ධම්මායතනය ස්කන්ධ හෙයින් නො ගෙන (රූපාදි) සතර ස්කන්ධයකින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් මැ (විඤ්ඤාන) ස්කන්ධය විසින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

40. ද්වාදසායතනානි කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

ද්වාදසායතනානි අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

---

41. චක්ඛුධාතු කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: චක්ඛුධාතු එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

42–57. සොතධාතු -පෙ- ඝානධාතු – ජිව්හාධාතු – කායධාතු – රූපධාතු – සද්දධාතු–ගන්ධධාතු–රසධාතු –ඵොට්ඨබ්බධාතු–චක්ඛුවිඤ්ඤාණ-ධාතු – සොතවිඤ්ඤාණධාතු – ඝානවිඤ්ඤාණධාතු – ජිව්හාවිඤ්ඤාණධාතු කායවිඤ්ඤාණධාතු – මනොධාතු – මනොවිඤ්ඤාණධාතු එකෙන ඛන්ධෙන-එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

58. ධම්මධාතු -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

59. චක්ඛුධාතු ච සොතධාතු ච -පෙ- එකෙන ඛන්ධෙන ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

40. **ද්වාදසායතනයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් අසඞ්ගෘහීත ද යත්:**

ද්වාදසායතනයෝ අසඞ්ඛත ධර්මායතනය ස්කන්ධ හෙයින් නො ගෙන පඤ්චස්කන්ධයෙන් ද්වාදශායතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නොවේ.

---

41. චක්ඛුධාතුව කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: චක්ඛු ධාතුව එක් මැ රූපස්කන්ධයෙන් එක් මැ චක්ඛායතනයෙන් එක් මැ චක්ඛුධාතුයෙන් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

42–57. සොතධාතුව... ඝානධාතුව... ජිව්හාධාතුව... කායධාතුව... රූපධාතුව...සද්දධාතුව... ගන්ධධාතුව... රසධාතුව... ඵොට්ඨබ්බධාතුව... චක්ඛුවිඤ්ඤාණධාතුව... සොතවිඤ්ඤාණධාතුව ඝානවිඤ්ඤාණ ධාතුව... ජිව්හාවිඤ්ඤාණ ධාතුව... කායවිඤ්ඤාණ ධාතුව... මනොධාතුව... මනොවිඤ්ඤාණ ධාතුව... එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් එක්ධාතුවකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

58. ධම්මධාතුව... අසඞ්ඛත ධම්මායතනය ස්කන්ධ හෙයින් නො ගෙන සතර ස්කන්ධයකින් එක් මැ ධම්මායතනයෙන් එක් මැ ධම්මධාතුයෙන් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් මැ විඥනස්කන්ධයෙන් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුවකින් අසඞ්ගෘහීත වේ.

59. චක්ඛුධාතුවත් සොතධාතුවත් ... එක් මැ රූපස්කන්ධයෙන් ආයතන දෙකකින් ධාතූන් දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

60–67. චක්ඛුධාතු ච ඝාන ධාතු ච –පෙ– චක්ඛුධාතු ච ජිව්හාධාතු ච– චක්ඛුධාතු ච කායධාතු ච – චක්ඛුධාතු ච රූපධාතු ච – චක්ඛුධාතු ච සද්දධාතු ච – චක්ඛුධාතු ච ගන්ධධාතු ච – චක්ඛුධාතු ච රසධාතු ච – චක්ඛුධාතු ච ඵොට්ඨබ්බධාතු ච එකෙන ඛන්ධෙන ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා..

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

68. චක්ඛු ධාතු ච චක්ඛුවිඤ්ඤාණධාතු ච –පෙ– ද්වීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

69–74. චක්ඛුධාතු ච සොත විඤ්ඤාණධාතු ච–පෙ–චක්ඛුධාතු ච ඝාන විඤ්ඤාණධාතු ච – චක්ඛුධාතු ච ජිව්හාවිඤ්ඤාණධාතු ච – චක්ඛුධාතු ච කායවිඤ්ඤාණධාතු ච – චක්ඛුධාතු ච මනොධාතු ච – චක්ඛුධාතු ච මනො විඤ්ඤාණධාතු ච ද්වීහිඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

75. චක්ඛුධාතු ච ධම්මධාතු ච –පෙ– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

76. අට්ඨාරසධාතුයො කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා:

අට්ඨාරස ධාතුයො අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

**60-67. චක්ඛු ධාතුවත් ඝාන ධාතුවත්...** චක්ඛුධාතුවත් ජිව්හා ධාතුවත් ... චක්ඛුධාතුවත් කාය ධාතුවත් ... චක්ඛු ධාතුවත් රූප ධාතුවත් චක්ඛු ධාතුවත් සද්දධාතුවත් ... චක්ඛුධාතුවත් ගන්ධධාතුවත් ... චක්ඛු ධාතුවත් රසධාතුවත් ... චක්ඛුධාතුවත් ඵොට්ඨබ්බධාතුවත් ... එක් මැ රූපස්කන්ධය විසින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුවකින් අසඞ්ගෘහීත වෙත්.

68. **චක්ඛුධාතුවත් චක්ඛුවිඤ්ඤාණධාතුවත්...** ස්කන්ධ දෙකකින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුවකින් අසඞ්ගෘහීත වෙත්.

**69-74. චක්ඛුධාතුවත් සෝතවිඤ්ඤාණ ධාතුවත්** ... චක්ඛුධාතුවත් ඝානවිඤ්ඤාණධාතුවත් චක්ඛු ධාතුවත් ජිව්හාවිඤ්ඤාණධාතුවත්... චක්ඛු ධාතුවත්, කාය විඤ්ඤාණ ධාතුවත්... චක්ඛු ධාතුවත් මනොධාතුවත් චක්ඛු ධාතුවත් මනොවිඤ්ඤාණ ධාතුවත් ... ස්කන්ධ දෙකකින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනය කින් සොළොස් ධාතුවකින් අසඞ්ගෘහීත වෙති.

75. **චක්ඛු ධාතුවත් ධම්මධාතුවත්** ... අසඞ්ඛතධම්මධාතුව ස්කන්ධ හෙයින් නො ගෙන සතර ස්කන්ධයකින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් මැ ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

76. අටළොස් ධාතුහු කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආය තනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: අටළොස් ධාතුහු අසඞ්ඛතධම්මධාතුව ස්කන්ධ හෙයින් නො ගෙන පඤ්ච ස්කන්ධ යෙන් ද්වාදශායතනයෙන් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

77. දුක්ඛසච්චං කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතං.

දුක්ඛසච්චං පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතං.

78–79. සමුදයසච්චං -පෙ- මග්ගසච්චං- එකෙන ඛන්ධෙන එකෙනා-යතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

80. නිරොධසච්චං -පෙ- න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

81. දුක්ඛසච්චඤ්ච සමුදයසච්චඤ්ච -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහාය-තනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

82. දුක්ඛසච්චඤ්ච මග්ගසච්චඤ්ච -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහාය-තනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

83. දුක්ඛසච්චඤ්ච නිරොධසච්චඤ්ච -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

77. දුඃඛ සත්‍යය කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: දුඃඛ සත්‍යය පඤ්චස්කන්ධය විසින් දවාදශායතනය විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතුකෙනකුන් විසින් අසඞ්ගෘහීත නොවේ.

78-79. **සමුදය සත්‍යය ... මාර්ග සත්‍යය...** එක් මැ සංස්කාර ස්කන්ධය විසින් එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

80. **නිරොධසත්‍යය...** කිසි ස්කන්ධ කෙනකුන් විසින් සඞ්ගෘහීත නො වෙයි. එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත වේ ද යත්: පඤ්චස්කන්ධය විසින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

81. **දුඃඛසත්‍යයත් සමුදයසත්‍යයත්** ... පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කියි ධාතු කෙනකු විසින් අසඞ්ගෘහීත නො වෙත්.

82. **දුඃඛසත්‍යයත් මාර්ගසත්‍යයත්** ... පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද. යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

83. **දුඃඛසත්‍යයත් නිරොධසත්‍යයත්** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ හෙයින් නො ගෙන පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

84. දුක්ඛසච්චඤ්ච සමුදයසච්චඤ්ච මග්ගසච්චඤ්ච –පෙ– පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

85. දුක්ඛසච්චඤ්ච සමුදයසච්චඤ්ච නිරොධසච්චඤ්ච –පෙ– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

86. දුක්ඛසච්චඤ්ච සමුදයසච්චඤ්ච මග්ගසච්චඤ්ච –පෙ– නිරොධසච්චඤ්ච අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

87. චත්තාරි සච්චානි කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතානි:

චත්තාරි සච්චානි අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතානි.

කතිහි අසඞ්ගහිතානි: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතානි.

---

88. චක්ඛුන්ද්‍රියං කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතං:

චක්ඛුන්ද්‍රියං එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං

84. **දුඃඛසත්‍යයත් සමුදයසත්‍යයත් මාර්ගසත්‍යයත් ... පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස්ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.**

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

85. **දුඃඛසත්‍යයත් සමුදයසත්‍යයත් නිරොධසත්‍යයත්** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ හෙයින් නො ගෙන පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස්-ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

86. **දුඃඛ සත්‍යයත් සමුදය සත්‍යයත් මාර්ග සත්‍යයත් නිරොධ සත්‍යයත්** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ හෙයින් නො ගෙන පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකු විසින් අසඞ්ගෘහීත නොවෙත්.

87. චතුස්සත්‍යයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

චතුස් සත්‍යයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධභාවයෙන් හැර පියා පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධකෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

---

88. චක්ඛුන්ද්‍රියය කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්:

චක්ඛුන්ද්‍රියය එක් මැ රූපස්කන්ධය විසින් එක් මැ චක්ඛායතනය විසින් එක් මැ චක්ඛුධාතුව විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

89–94. සොතින්ද්‍රියං -පෙ- ඝානින්ද්‍රියං – ජිව්හින්ද්‍රියං – කායින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං – පුරිසින්ද්‍රියං – එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

95. මනින්ද්‍රියං -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතං.

96. ජීවිතින්ද්‍රියං -පෙ- ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: තීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

97–109. සුඛින්ද්‍රියං -පෙ- දුක්ඛින්ද්‍රියං– සොමනස්සින්ද්‍රියං– දොමනස්සින්ද්‍රියං– උපෙක්ඛින්ද්‍රියං– සද්ධින්ද්‍රියං– විරියින්ද්‍රියං– සතින්ද්‍රියං– සමාධින්ද්‍රියං– පඤ්ඤින්ද්‍රියං– අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං– අඤ්ඤින්ද්‍රියං– අඤ්ඤාතාවින්ද්‍රියං– එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

110. චක්ඛුන්ද්‍රියඤ්ච සොතින්ද්‍රියඤ්ච -පෙ- එකෙන ඛන්ධෙන ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

111–115. චක්ඛුන්ද්‍රියඤ්ච ඝානින්ද්‍රියඤ්ච -පෙ- චක්ඛුන්ද්‍රියඤ්ච ජිව්හින්ද්‍රියඤ්ච – චක්ඛුන්ද්‍රියඤ්ච කායින්ද්‍රියඤ්ච– චක්ඛුන්ද්‍රියං ච ඉත්ථින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච පුරිසින්ද්‍රියඤ්ච- එකෙන ඛන්ධෙන ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

89-94. **සොතින්ද්‍රියය... ඝානින්ද්‍රියය... ජිව්හින්ද්‍රියය... කායින්ද්‍රියය... ඉත්‍ථින්ද්‍රියය ... පුරිසින්ද්‍රියය ...** එක් මැ රූපස්කන්ධය විසින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

95. **මනින්ද්‍රියය** ... එක් මැ විඥානස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්ත විඥාන ධාතූන් විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

96. **ජීවිතින්ද්‍රියය** ... ස්කන්ධ දෙකකින් එක් මැ ධර්මායතනයෙන් එක් මැ ධර්මධාතුයෙන් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

97-109. **සුඛින්ද්‍රියය ... දුක්ඛින්ද්‍රියය ...** සොමනස්සින්ද්‍රියය ... දෙමනස්සින්ද්‍රියය ... උපෙක්ඛින්ද්‍රියය ... සද්ධින්ද්‍රියය ... විරියින්ද්‍රියය ... සතින්ද්‍රියය ... සමාධින්ද්‍රියය ... පඤ්ඤින්ද්‍රියය ... අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය ... අඤ්ඤින්ද්‍රියය ... අඤ්ඤාතාවින්ද්‍රියය ... එක් ස්කන්ධයකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

110. **චක්ඛුන්ද්‍රියයත් සෝතින්ද්‍රියයත්** ... එක් මැ රූපස්කන්ධයෙන් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

111-115. **චක්ඛුන්ද්‍රියයත් ඝානින්ද්‍රියයත්**... චක්ඛුන්ද්‍රියයත් ජිව්හින්ද්‍රියයත්... චක්ඛුන්ද්‍රියයත් කායින්ද්‍රියයත්... චක්ඛුන්ද්‍රියයත් ඉත්ථින්ද්‍රියයත්... චක්ඛුන්ද්‍රියයත් පුරිසින්ද්‍රියයත්... එක් මැ රූපස්කන්ධය විසින් ආයතන දෙකකින් ධාතු දෙකකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

116. චක්ඛුන්ද්‍රියඤ්ච මනින්ද්‍රියඤ්ච -පෙ- ද්වීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

117. චක්ඛුන්ද්‍රියඤ්ච ජීවිතින්ද්‍රියඤ්ච -පෙ- ද්වීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා

118--130. චක්ඛුන්ද්‍රියඤ්ච සුඛින්ද්‍රියඤ්ච -පෙ- චක්ඛුන්ද්‍රියඤ්ච දුක්ඛින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච සොමනස්සින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච දොමනස්සින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච උපෙක්ඛින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච සද්ධින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච විරියින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච සතින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච සමාධින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච පඤ්ඤින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච අඤ්ඤින්ද්‍රියඤ්ච- චක්ඛුන්ද්‍රියඤ්ච අඤ්ඤාතාවින්ද්‍රියඤ්ච - ද්වීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

131. බාවීසතින්ද්‍රියානි කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතානි:

බාවීසතින්ද්‍රියානි චතූහි ඛන්ධෙහි සත්තහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතානි.

කතිහි අසඞ්ගහිතානි: එකෙන ඛන්ධෙන පඤ්චහායතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතානි.

---

132. අවිජ්ජා -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

116. **චක්ඛුන්ද්‍රියයත් මනින්ද්‍රියයත්** ... ස්කන්ධ දෙකකින් ආයතන දෙකකින් ධාතු අටෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද : යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනයකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙති.

117. **චක්ඛුන්ද්‍රියයත් ජීවිතින්ද්‍රියයත්** ... ස්කන්ධ දෙකකින් ආයතන දෙකෙකින් ධාතුන් දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

118–130. **චක්ඛුන්ද්‍රියයත් සුඛින්ද්‍රියයත්** ... චක්ඛුන්ද්‍රියයත් දුක්ඛින්ද්‍රියයත් චක්ඛුන්ද්‍රියයත් සොමනස්සින්ද්‍රියයත් චක්ඛුන්ද්‍රියයත් දෙමනස්සින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් උපෙක්ඛින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් සද්ධින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් විරියින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් සතින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් ... සමාධින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් පඤ්ඤින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් අඤ්ඤින්ද්‍රියයත් ... චක්ඛුන්ද්‍රියයත් අඤ්ඤාතාවින්ද්‍රියයත් ... ස්කන්ධ දෙකෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

131. **දෙවිසි ඉන්ද්‍රියයෝ** කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතුන් විසින් සඞ්ගෘහීත ද යත්: දෙවිසි ඉන්ද්‍රියයෝ සතර ස්කන්ධයකින් සප්ත ආයතනයකින් තෙලෙස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් පඤ්ච ආයතනයකින් පඤ්චධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

---

132. **අවිද්‍යාව** ... එක් මැ සංස්කාරස්කන්ධය විසින් එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙ.

133. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

134. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතං.

135. විඤ්ඤාණපච්චයා නාමරූපං -පෙ- චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතං.

136. නාමරූපපච්චයා සළායතනං -පෙ- ද්වීහි ඛන්ධෙහි ඡහායතනෙහි ද්වාදසහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: තීහි ඛන්ධෙහි ඡහායතනෙහි ඡහි ධාතූහි අසඞ්ගහිතං.

137 – 141. සළායතනපච්චයා ඵස්සො -පෙ- ඵස්සපච්චයා වෙදනා- වෙදනාපච්චයා තණ්හා,—තණ්හාපච්චයා උපාදානං,— උපාදානපච්චයා කම්මභවො – එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතො.

142 – 145. උපපත්තිභවො – කාමභවො - සඤ්ඤාභවො - පඤ්චවොකාර භවො -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අසඞ්ගහිතො.

133. **අවිද්‍යා ප්‍රත්‍යයෙන් වන සංස්කාරයෝ** ... එක් මැ සංස්කාර ස්කන්ධය විසින් එක් මැ ධර්මායතනය විසින් එක් මැ ධර්මධාතුව විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

134. **සංස්කාර ප්‍රත්‍යයෙන් වන විඥානය**... එක් මැ විඥනස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්තවිඥනධාතූන් විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

135. **විඥනප්‍රත්‍යයෙන් වන නාමරූපය** ... සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් මැ විඥන ස්කන්ධය විසින් එක් මැ මනායතනය විසින් සප්තවිඥන ධාතූන් විසින් අසඞ්ගෘහීත වේ.

136. **නාමරූප ප්‍රත්‍යයෙන් වන ෂඩායතනය** ස්කන්ධ දෙකෙකින් ආයතන සයෙකින් ධාතු දෙළොසෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් ෂඩ් ආයතනයකින් ෂඩ් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

137-141. **ෂඩායතන ප්‍රත්‍යයෙන් වන ස්පර්ශය**... ස්පර්ශප්‍රත්‍යයෙන් වන වෙදනාව...වෙදනා ප්‍රත්‍යයෙන් වන තෘෂ්ණාව...තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වන උපාදනය ... උපාදනප්‍රත්‍යයෙන් වන කර්මභවය ... එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

142–145. **උත්පත්තිභවය...කාමභවය...සංඥභවය...පඤ්චවොකාර භවය** ... පඤ්ච ස්කන්ධයන් විසින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධකෙනකුන් විසින් අසඞ්ගෘහීත නොවේ. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙයි.

146. රූපභවො -පෙ- පඤ්චහි ඛන්ධෙහි පඤ්චහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො : න කෙහිචි ඛන්ධෙහි සත්තහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතො.

147–149. අරූපභවො -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවො, චතුවොකාරභවො – චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො : එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතො.

150–151. අසඤ්ඤාභවො -පෙ- එකවොකාරභවො- එකෙන ඛන්ධෙන ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො : චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතො.

152–154. ජාති -පෙ- ද්වීහි ඛන්ධෙහි- ජරා- ද්වීහි ඛන්ධෙහි- මරණං- ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං : තීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

155–161. සොකො -පෙ- පරිදෙවො- දුක්ඛං- දොමනස්සං- උපායාසො- සතිපට්ඨානං- සම්මප්පධානං- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං : චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

162. ඉද්ධිපාදෙ -පෙ- ද්වීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො : තීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතො.

146. **රූපභවය** ... පඤ්ච ස්කන්ධයෙන් පඤ්ච ආයතනයෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් විසින් අසඞ්ගෘහීත නො වෙයි. සප්ත ආයතනයකින් දශ ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

147–149. **අරූපභවය** ... **නේවසඤ්ඤානාසඤ්ඤාභවය**... **චතුවොකාරභවය**...සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් ධාතුන් දෙකෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දශ ආයතනයකින් සොළොස්ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

150–151. **අසංඥ භවය**... **එකවෝකාරභවය**... එක් ස්කන්ධයකින් ආයතන දෙකෙකින් ධාතුන් දෙකෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයෙකින් දශ ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

152–154. **ජාතිය**...ස්කන්ධ දෙකෙකින් ජරාව...ස්කන්ධ දෙකෙකින් මරණය ... ස්කන්ධ දෙකෙකින් එක් ආයතනයකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

155–161. **සෝකය** ... **පරිදේවය** ... **දුක්ඛය** ... **දෙමනස්සය** ... **උපායාසය**... **සතිපට්ඨානය**... **සම්මප්පධානය**... එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

162. **ඍද්ධිපාදය**... ස්කන්ධ දෙකෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් දශ ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

163. ඣානං -පෙ- ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: තීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතං.

164–174. අප්පමඤ්ඤා -පෙ- පඤ්චින්ද්‍රියානි- පඤ්චබලානි- සත්තබොජ්ඣඞ්ගා,- අරියො අට්ඨඞ්ගිකො මග්ගො- ඵස්සො,- වෙදනා- සඤ්ඤා - චෙතනා - අධිමොක්ඛො, - මනසිකාරො - එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතො.

කතිහි අසඞ්ගහිතො: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතො.

175. චිත්තං -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතං.

කතිහි අසඞ්ගහිතං: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතං.

---

176. කුසලා ධම්මා -පෙ- අකුසලා ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: කුසලාධම්මා- අකුසලාධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

177. අබ්‍යාකතා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

178 – 179. සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා -පෙ- දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා – තීහි ඛන්ධෙහි ද්විහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

163. **ධ්‍යානය**... ස්කන්ධ දෙකෙකින් එක් ආයතනයකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: තුන් ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

164–174. **අප්‍රමාණ්‍යයෝ**... **පඤ්චෙන්ද්‍රියයෝ**... **පඤ්චබලයෝ**... **සප්ත බොධ්‍යඞ්ගයෝ** ... **ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය** ... **ස්පර්ශය** ... **වෙදනාව** ... **සංඥාව** ... **චෙතනාව** ... **අධිමොක්ෂය** ... **මනසිකාරය** ... එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

175. **චිත්තය**...එක් ස්කන්ධයකින් එක් ආයතනයකින් සප්තවිඥාන ධාතූන් විසින් සඞ්ගෘහීත වෙයි.

කෙතෙකින් අසඞ්ගෘහීත ද? යත්: සතර ස්කන්ධයකින් එකොළොස් ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වේ.

---

176. කුශල ධර්මයෝ අකුශල ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: කුශල ධර්මයෝ අකුශල ධර්මයෝ සතර ස්කන්ධයකින් ආයතන-දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

177. **අව්‍යාකෘත ධර්මයෝ** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධභාවයෙන් හැරපියා පඤ්චස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස්ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

178–179. **සුඛ වෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ**... **දුඃඛ වෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ**... තුන් ස්කන්ධයකින් ආයතන දෙකෙකින් තුන් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයකින් පසළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

180. අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා, -පෙ- තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

181. විපාකා ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

182-183. විපාකධම්මධම්මා -පෙ- සංකිලිට්ඨ සංකිලෙසිකා ධම්මා - චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

184. නෙවවිපාකනවිපාකධම්මධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

185. උපාදින්නුපාදනියා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අසඞ්ගහිතා.

186. අනුපාදින්නුපාදනියා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි සත්තහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි පඤ්චහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

**180. අදුක්ඛමසුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ**...තුන් ස්කන්ධයකින් ආයතන දෙකෙකින් සප්ත ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

181. **විපාක ධර්මයෝ** ... සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

182-183. **විපාක සවභාව ධර්මයෝ**...**සංක්ලිෂ්ට සාංක්ලෙශිකධර්මයෝ** සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

184. **නේවවිපාකනවිපාකසවභාවධර්මයෝ** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ භාවයෙන් හැරපියා පඤ්ච ස්කන්ධය විසින් දොළොස් ආයතන යන් විසින් තෙළෙස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් පඤ්ච ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

185. **උපාදින්නොපාදනියධර්මයෝ** ... පඤ්ච ස්කන්ධය විසින් එකොළොස් ආයතනයකින් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. එක් ආයතනයකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

186. **අනුපාදින්නොපාදනිය ධර්මයෝ** ... පඤ්ච ස්කන්ධය විසින් සප්ත ආයතනයකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් අසඞ්ගෘහීත නොවෙත්. පඤ්ච ආයතනයකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

187-188. අනුපාදින්නඅනුපාදනියා ධම්මා -පෙ- අසංකිලිට්ඨ-අසංකිලෙසිකා ධම්ම – අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

189. අසඞ්කිලිට්ඨසඞ්කිලෙසිකා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

190. සවිතක්කසවිචාරා ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

191. අවිතක්කවිචාරමත්තා ධම්මා -පෙ- පීති සහගතා ධම්මා- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ධාතූහි ද්විහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

192. අවිතක්කඅවිචාරා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා අසඞ්ගහිතා.

193. සුඛසහගතා ධම්මා -පෙ- තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

194. උපෙක්ඛාසහගතා ධම්මා -පෙ- තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

188. **අනුපාදින්න අනුපාදනිය ධර්මයෝ**...අසංක්ලිෂ්ට අසාංක්ලෙශික ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධභාවයෙන් හැරපියා සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

189. **අසංක්ලිෂ්ට සාංක්ලෙශිකධර්මයෝ** ... පඤ්චස්කන්ධය විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

190. **සවිතර්ක සවිචාර ධර්මයෝ** ... සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් තුන් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් පසළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

191. **අවිතර්ක විචාර මාත්‍ර ධර්මයෝ** ... ප්‍රීති සහගත ධර්මයෝ ... සතර ස්කන්ධයකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයකින් දස ආයතනයකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

192. **අවිතර්ක අවිචාර ධර්මයෝ**...අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් සතළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතන යෙකින් අසඞ්ගෘහීත නො වෙත්. එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

193. **සුඛසහගත ධර්මයෝ** ... තුන් ස්කන්ධයෙකින් දෙ ආයතනයෙකින් තුන් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයෙකින් පසළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

194. **උපෙක්ෂා සහගත ධර්මයෝ** ... තුන් ස්කන්ධයෙකින් දෙආයතනයෙකින් සප්ත ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

195–203. දස්සනෙන පහාතබ්බා ධම්මා –පෙ– භාවනාය පහාතබ්බා ධම්මා – දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා – භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා – ආචයගාමිනො ධම්මා – අපචයගාමිනො ධම්මා – සෙක්ඛා ධම්මා – අසෙක්ඛා ධම්මා – මහග්ගතා ධම්මා- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

204 – 207. නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බා ධම්මා –පෙ– නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා – නෙවාචයගාමී නාපචයගාමිනො ධම්මා – නෙවසෙක්ඛානාසෙක්ඛා[1] ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

208. පරිත්තා ධම්මා –පෙ– පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨා–රසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

209. අප්පමාණා ධම්මා –පෙ– පණීතා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

210. පරිත්තාරම්මණා ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

1. නෙවසෙක්ඛනාසෙක්ඛා– මජසං.

195-203. **දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ** ... භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ ... දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... ආචයගාමී ධර්මයෝ ... අපචයගාමී ධර්මයෝ ... ශෛක්ෂ ධර්මයෝ ... අශෛක්ෂ ධර්මයෝ ... මහද්ගත ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් දෙ ආයතනයෙකින් ද්විවිධ ධාතුයකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

204–207. **නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ** ... නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... නො මැ ආචයගාමී නො ද අපචයගාමී ච්‍යුති ප්‍රතිසන්ධිය ධර්මයෝ ... නො මැ ශෛක්ෂ නො ද අශෛක්ෂ ධර්මයෝ ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙකින් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නොවෙත්.

208. **පරිත්ත ධර්මයෝ** ... පඤ්චස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

209. **අප්‍රමාණ ධර්මයෝ** ... ප්‍රණීත ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් දෙ ආයතනයෙකින් ධාතුන් දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

210. **පරිත්තාලම්බන ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

211-220. මහග්ගතාරම්මණා ධම්මා -පෙ- අප්පමාණාරම්මණා ධම්මා-හීනා ධම්මා-මිච්ඡත්තනියතා ධම්මා-සම්මත්තනියතා ධම්මා-මග්ගාරම්මණා ධම්මා-මග්ගහෙතුකා ධම්මා-මග්ගාධිපතිනො ධම්මා- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

221. මජ්ඣිමා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

222. අනියතා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

223. උප්පන්නා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

224. අනුප්පන්නා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි සත්තහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි පඤ්චහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

225. උප්පාදිනො ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අසඞ්ගහිතා.

211–220. **මහද්ගතාලම්බන ධර්මයෝ ... අප්‍රමාණාලම්බන ධර්මයෝ ... හීන ධර්මයෝ ...මිථ්‍යාත්ව නියත ධර්මයෝ ... සම්‍යක්ත්ව නියත ධර්මයෝ... මාර්ගාලම්බන ධර්මයෝ ... මාර්ග හේතුක ධර්මයෝ...මාර්ගාධිපති ධර්මයෝ ...** සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස්ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

221. **මධ්‍යම ධර්මයෝ** ... පඤ්චස්කන්ධයෙන් දොළොස් ආයතනයෙකින් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

222. **අනියත ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙකින් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

223. **උත්පන්න ධර්මයෝ**... පඤ්චස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

224. **අනුත්පන්න ධර්මයෝ**... පඤ්චස්කන්ධයෙන් සප්ත ආයතනයෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නො වෙත්. ආයතන පසෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

225. **උත්පාදී ධර්මයෝ** ... පඤ්චස්කන්ධයෙන් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නො වෙත්. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

226–231. අතීතා ධම්මා -පෙ- අනාගතා ධම්මා–පච්චුප්පන්නා ධම්මා–අජ්ඣත්තා ධම්මා–අජ්ඣත්තබහිද්ධා ධම්මා– පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

232. බහිද්ධා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

233–234. අතීතාරම්මණා ධම්මා-පෙ-අනාගතාරම්මණා ධම්මා-චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

235–238. පච්චුප්පන්නාරම්මණා ධම්මා -පෙ- අජ්ඣත්තාරම්මණා ධම්මා,—බහිද්ධාරම්මණා ධම්මා– අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා– චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

239. සනිදස්සනසප්පටිඝා ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

240. අනිදස්සනසප්පටිඝා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන නවහායතනෙහි නවහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි තිහායතනෙහි නවහි ධාතූහි අසඞ්ගහිතා.

226–231. **අතීත ධර්මයෝ** ... අනාගත ධර්මයෝ ... ප්‍රත්‍යුත්පන්න ධර්මයෝ ... අධ්‍යාත්ම ධර්මයෝ ... අධ්‍යාත්ම බාහිර ධර්මයෝ ... පඤ්චස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

232. **බාහ්‍ය ධර්මයෝ** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

233–234. **අතීතාලම්බන ධර්මයෝ** ... අනාගතාලම්බන ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

235–238. **ප්‍රත්‍යුත්පන්නාලම්බන ධර්මයෝ** ... ආධ්‍යාත්මාලම්බන ධර්මයෝ ... බාහිරාලම්බන ධර්මයෝ ... ආධ්‍යාත්ම බාහිරාලම්බන ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

239. **සනිදර්ශන සප්‍රතිඝ ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

240. **අනිදර්ශන සප්‍රතිඝ ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් නව ආයතනයෙකින් නව ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් තුන් ආයතනයෙකින් නව ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

241. අනිදස්සනඅප්පටිඝා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

---

242-244. හෙතු ධම්මා -පෙ- හෙතුචෙව සහෙතුකා ච ධම්මා- හෙතු චෙව හෙතුසම්පයුත්තා ච ධම්මා- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

245-248. න හෙතු ධම්මා -පෙ- අහෙතුකා ධම්මා- හෙතුවිප්පයුත්තා ධම්මා- න හෙතුඅහෙතුකා ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

249-253. සහෙතුකා ධම්මා -පෙ- හෙතුසම්පයුත්තා ධම්මා- සහෙතුකාචෙව න ච හෙතු ධම්මා- හෙතුසම්පයුත්තා චෙව න ච හෙතු ධම්මා- න හෙතු සහෙතුකා ධම්මා- චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

254-255. සප්පච්චයා ධම්මා -පෙ- සඞ්ඛතා ධම්මා- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

256. අප්පච්චයා ධම්මා - පෙ - අසඞ්ඛතා ධම්මා න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

241. **අනිදර්ශන අප්‍රතිඝ ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්චස්කන්ධයෙන් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නොවෙත්. දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

---

242–244. **හේතු ධර්මයෝ** ... හෙතු සහෙතුක වූ ධර්මයෝ ... හෙතු ද හෙතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ ... එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

245–248. **හේතු නොවූ ධර්මයෝ** ... අහෙතුක ධර්මයෝ ... හෙතු විප්‍රයුක්ත ධර්මයෝ ... හෙතු නොවූ අහෙතුක ධර්මයෝ ... අසඞ්ඛත-ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්චස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

249–253. **සහේතුක ධර්මයෝ** ... හෙතු සම්ප්‍රයුක්ත ධර්මයෝ ... සහෙතුක ද නො ද හෙතු ද වූ ධර්මයෝ ... හෙතු සම්ප්‍රයුක්ත ද නො ද හෙතු ද වූ ධර්මයෝ ... හෙතු නො වූ සහෙතුක ධර්මයෝ ... සතර ස්කන්ධ-යෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

254–255. **සප්‍රත්‍යය ධර්මයෝ** ... සඞ්ඛත ධර්මයෝ ....පඤ්ච ස්කන්ධ යෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

256. **අප්‍රත්‍යය ධර්මයෝ** ... අසඞ්ඛත ධර්මයෝ ... කිසි ස්කන්ධ යෙකින් සඞ්ගෘහීත නොවෙත්. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: පඤ්ච ස්කන්ධයෙන් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

257. සනිදස්සනා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

258. අනිදස්සනා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අසඞ්ගහිතා.

259. සප්පටිඝා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

260. අප්පටිඝා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

261. රූපිනො ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

262. අරූපිනො ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

257. **සනිදර්ශන ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් එක් ආයතන-යෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

258. **අනිදර්ශන ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නො වෙත්. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

259. **සප්‍රතිඝ ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් ආය තන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

260. **අප්‍රතිඝ ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නො වෙත්. දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

261. **රූපී ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් එකොළොස් ආයතන යෙකින් එකොළොස් ධාතුයෙකින සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

262. **අරූපී ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

263. ලොකියා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

264. ලොකුත්තරා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

265 – 266. කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා – පෙ - කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

267 – 269. ආසවා ධම්මා – පෙ – ආසවාචෙව සාසවා ච ධම්මා – ආසවාචෙ'ව ආසව සම්පයුත්තා ච ධම්මා– එකෙන ඛන්ධෙන එකෙනා'යතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

270 – 271. නො ආසවා ධම්මා – පෙ – ආසවවිප්පයුත්තා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

272 – 274. සාසවා ධම්මා – පෙ – සාසවා චෙව නො ච ආසවා ධම්මා– ආසවවිප්පයුත්තා සාසවා ධම්මා–පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහා'යතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

263. **ලෞකික ධර්මයෝ** ... පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

264. **ලෝකෝත්තර ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යා වෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

265–266. **කිසි විඥ්ඥාණයෙකින් දත යුතු වූ ධර්මයෝ...කිසි විඥ්ඥාණ යෙකින් නො දත යුතු වූ ධර්මයෝ** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යා වෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස්-ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

267–269. **ආස්‍රව ධර්මයෝ** ... ආස්‍රව ද සාස්‍රව ද වූ ධර්මයෝ ... ආස්‍රව ද ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ ... එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

270–271. **ආස්‍රව නො වූ ධර්මයෝ ... ආස්‍රව විප්‍රයුක්ත ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

272–274. **සාස්‍රව ධර්මයෝ ... සාස්‍රව ද නො ද ආස්‍රව ද වූ ධර්මයෝ ... ආස්‍රව විප්‍රයුක්ත සාස්‍රව ධර්මයෝ** ... පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නොවෙත්.

275 – 276. අනාසවා ධම්මා –පෙ– ආසව විප්පයුත්තා අනාසවා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

277 – 278. ආසවසම්පයුත්තා ධම්මා – පෙ – ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

279 – 285. සඤ්ඤොජනා ධම්මා – පෙ – ගන්ථා ධම්මා – ඔඝා ධම්මා – යොගා ධම්මා – නීවරණා ධම්මා – පරාමාසා ධම්මා – පරාමාසා චෙව පරාමට්ඨා ධම්මා– එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

286 – 287. නො පරාමාසා ධම්මා –පෙ– පරාමාසා විප්පයුත්තා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

288 – 290. පරාමට්ඨා ධම්මා –පෙ– පරාමට්ඨා චෙව නො ච පරාමාසා ධම්මා – පරාමාසවිප්පයුත්තා පරාමට්ඨා ධම්මා– පඤ්චහි ඛන්ධෙහි ද්වාදස–හා'යතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

291 – 292. අපරාමට්ඨා ධම්මා –පෙ– පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි, ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

275-276. **අනාස්‍රව ධර්මයෝ** ... ආස්‍රව විප්‍රයුක්තවූ අනාස්‍රව ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

277-278. **ආස්‍රව සම්ප්‍රයුක්ත ධර්මයෝ** ... ආස්‍රව සම්ප්‍රයුක්ත ද නො ද ආස්‍රව ද වූ ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතුන් දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

279-285. **සංයෝජන ධර්මයෝ** ... ග්‍රන්ථ ධර්මයෝ...ඔඝ ධර්මයෝ යොග ධර්මයෝ ... නීවරණ ධර්මයෝ ... පරාමර්ශ ධර්මයෝ ... පරාමර්ශ ද පරාමෘෂ්ට ද වූ ධර්මයෝ ... එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

286-287. **පරාමර්ශ නො වූ ධර්මයෝ** ... පරාමර්ශ විප්‍රයුක්ත ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්චස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

288-290. **පරාමෘෂ්ට ධර්මයෝ** ... පරාමෘෂ්ට ද නො ද පරාමර්ශ ද වූ ධර්මයෝ ... පරාමර්ශ විප්‍රයුක්ත වූ ද පරාමෘෂ්ට ධර්මයෝ ... පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

291-292. **අපරාමෘෂ්ට ධර්මයෝ** ... පරාමර්ශ විප්‍රයුක්ත වූ අපරාමෘෂ්ට ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

293. පරාමාසසම්පයුත්තා ධම්මා–පෙ– චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

294. සාරම්මණා ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

295. අනාරම්මණා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

296. චිත්තා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

297. නො චිත්තා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

298–300. චෙතසිකා ධම්මා – පෙ – චිත්තසම්පයුත්තා ධම්මා – චිත්ත සංසට්ඨා ධම්මා– තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

293. **පරාමර්ශසම්ප්‍රයුක්ත ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතුදෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

294. **සාලම්බන ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

295. **අනාලම්බන ධර්මයෝ**...අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා එක් ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

296. **චිත්ත ධර්මයෝ**...එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත්ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

297. **චිත්ත නොවූ ධර්මයෝ**...අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යා-වෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

298–300. **චෛතසික ධර්මයෝ** ... චිත්තසම්ප්‍රයුක්ත ධර්මයෝ ... චිත්ත සංසෘෂ්ට ධර්මයෝ ... තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

301. අචෙතසිකා ධම්මා –පෙ– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා ද්වීහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

302–303. චිත්තවිප්පයුත්තා ධම්මා – පෙ – චිත්තවිසංසට්ඨා[1] ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

304. චිත්තසමුට්ඨානා ධම්මා චතූහි ඛන්ධෙහි ඡහායතනෙහි ඡහි-ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන ඡහායතනෙහි ද්වාදසහි ධාතූහි අසඞ්ගහිතා.

305–306. නො චිත්තසමුට්ඨානා ධම්මා – පෙ – නො චිත්තසහභුනො ධම්මා – නො චිත්තානුපරිවත්තිනො ධම්මා– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා ද්වීහිඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

307–308. චිත්තසහභුනො ධම්මා – පෙ – චිත්තානුපරිවත්තිනො ධම්මා– චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

309–310. චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා – පෙ – චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා – චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා– තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

---

1. චිත්ත සංසට්ඨා ධම්මා - සී මු

301. **චෛතසික නොවූ ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා ස්කන්ධ දෙකෙකින් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: තුන් ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත වෙති. කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

302–303. **චිත්ත විප්‍රයුක්ත ධර්මයෝ...චිත්ත විසංසෘෂ්ට ධර්මයෝ...** අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා එක් ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

304. **චිත්තසමුත්ථාන ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතනසයෙකින් ධාතු සයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් ආයතනසයෙකින් දෙළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

305–306. **චිත්තසමුත්ථාන නො වූ ධර්මයෝ** ... චිත්තසහභූ නො වූ ධර්මයෝ ... චිත්තානුපරිවර්ති නො වූ ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා ස්කන්ධ දෙකෙකින් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත්ද සත්: තුන් ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත වෙති. කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

307–308. **චිත්තසහභූ වූ ධර්මයෝ** ... චිත්තානුපරිවර්ති වූ ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

309–310. **චිත්තසංසෘෂ්ටසමුත්ථාන වූ ධර්මයෝ** ... චිත්තසංසෘෂ්ට සමුත්ථාන සහභූ වූ ධර්මයෝ ... චිත්තසංසෘෂ්ට සමුත්ථානානුපරිවර්ති වූ ධර්මයෝ ... තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

311–313. නො චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා –පෙ– නො චිත්තසංසට්ඨසමුට්ඨානසහභුනො ධම්මා – නො චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා ද්වීහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

314. අජ්ඣත්තිකා ධම්මා ද්වීහි ඛන්ධෙහි ඡහායතනෙහි ද්වාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: තීහි ඛන්ධෙහි ඡහායතනෙහි ඡහි ධාතූහි අසඞ්ගහිතා.

315. බාහිරා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ඡහායතනෙහි ඡහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන ඡහායතනෙහි ද්වාදසහි ධාතූහි අසඞ්ගහිතා.

316. උපාදා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

317. නො උපාදා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි තීහායතනෙහි නවහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි නවහායතනෙහි නවහි ධාතූහි අසඞ්ගහිතා.

318. උපාදින්නා ධම්මා -පෙ- පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අසඞ්ගහිතා.

311–313. **චිත්තසංසෘෂ්ටසමුත්ථාන නොවූ ධර්මයෝ** ... චිත්තසංසෘෂ්ට සමුත්ථාන සහභූ නො වූ ධර්මයෝ ... චිත්තසංසෘෂ්ටසමුත්ථානානු පරිවර්ති නො වූ ධර්මයෝ ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා ස්කන්ධ දෙකෙකින් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: තුන් ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත වෙති. කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

314. **ආධ්‍යාත්මික ධර්මයෝ** ... ස්කන්ධ දෙකෙකින් ආයතන සයෙකින් දෙළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: තුන් ස්කන්ධයෙකින් ආයතන සයෙකින් ධාතු සයෙකින් අසඞ්ගෘහීත වෙත්.

315. **බාහිර ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ෂඩායතනයෙකින් ෂඩ්ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් ෂඩායතනයෙකින් දෙළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

316. **උපාදා ධර්මයෝ** ... එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් ආයතනදෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

317. **උපාදා නො වූ ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධසඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් තුන් ආයතනයෙකින් නව ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නො වෙත්. නව ආයතනයෙකින් නව ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

318. **උපාදින්න ධර්මයෝ** ... පඤ්ච ස්කන්ධයෙන් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නොවෙති. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

319. අනුපාදින්නා ධම්මා -පෙ- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි සත්තහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි පඤ්චහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

320–324. උපාදනා ධම්මා –පෙ– කිලෙසා ධම්මා–කිලෙසා චෙව සංකිලෙසිකා ච ධම්මා– කිලෙසා චෙව සංකිලිට්ඨා ච ධම්මා–කිලෙසාචෙව කිලෙසසම්පයුත්තා ධම්මා- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකා දසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

325–327. නො කිලෙසා ධම්මා -පෙ- අසංකිලිට්ඨා ධම්මා - කිලෙසවිප්පයුත්තා ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

328–330. සංකිලෙසිකා ධම්මා -පෙ- සංකිලෙසිකා චෙව නො ච කිලෙසා ධම්මා – කිලෙසවිප්පයුත්තා සංකිලෙසිකා ධම්මා- පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහා'යතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

331–332. අසංකිලෙසිකා ධම්මා -පෙ- කිලෙසවිප්පයුත්තා අසංකිලෙසිකා ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්විහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

319. **අනුපාදින්න ධර්මයෝ** ...අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙකින් සප්ත ආයතනයෙන් අෂ්ට ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් අසඞ්ගෘහීත නොවෙති. පඤ්ච ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

320–324. **උපාදාන ධර්මයෝ** ... **ක්ලේශ ධර්මයෝ** ... ක්ලේශ ද සාංක්ලේශික ද වූ ධර්මයෝ ... ක්ලේශ ද සංක්ලිෂ්ට වූ ද ධර්මයෝ ... ක්ලේශ ද වූ ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ ... එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

325–327. **ක්ලේශ නො වූ ධර්මයෝ** ... අසංක්ලිෂ්ට ධර්මයෝ ... ක්ලේශ විප්‍රයුක්ත ධර්මයෝ ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස්ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

328–330. **සාංක්ලේශික ධර්මයෝ** ... සාංක්ලේශික ද නො ද ක්ලේශ ද වූ ධර්මයෝ ... ක්ලේශ විප්‍රයුක්ත වූ සාංක්ලේශික ධර්මයෝ... පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

331–332. **සාංක්ලේශික නො වූ ධර්මයෝ** ... ක්ලේශ විප්‍රයුක්ත අසාංක්ලේශික වූ ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

333–336. සංකිලිට්ඨා ධම්මා -පෙ- කිලෙසසම්පයුත්තා ධම්මා සංකිලිට්ඨා චෙව නො ච කිලෙසා ධම්මා–කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

337–340. දස්සනෙන පහාතබ්බා ධම්මා -පෙ- භාවනාය පහාතබ්බා ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා – භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා– චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

341–344. න දස්සනෙන පහාතබ්බා ධම්මා -පෙ- න භාවනාය පහාතබ්බා ධම්මා–න දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා – න භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

345–346. සවිතක්කා ධම්මා -පෙ- සවිචාරා ධම්මා- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහා'යතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

347–348. අවිතක්කා ධම්මා -පෙ- අවිචාරා ධම්මා- අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා අසඞ්ගහිතා.

333–336. **සංක්ලිෂ්ට ධර්මයෝ** ...ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයෝ... සංක්ලිෂ්ට ද නො ද ක්ලේශ ද වූ ධර්මයෝ ... ක්ලේශ සම්ප්‍රයුක්ත ද නො ද ක්ලේශ ද වූ ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

337–340. **දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ** ... භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ ... දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

341-344. **දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ** ... භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයෝ ... දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ ... භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ හේතු ඇති ධර්මයෝ ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

345–346. **සවිතර්ක ධර්මයෝ** ... **සවිචාර ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් තුන් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් පසළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

347–348. **අවිතර්ක ධර්මයෝ** ... **අවිචාර ධර්මයෝ** ... අසඞ්ඛත-ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්චස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් සතළොස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් අසඞ්ගෘහීත නො වෙති. එක් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

349–350. සප්පීතිකා ධම්මා –පෙ– පීතිසහගතා ධම්මා –චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

351–353. අප්පීතිකා ධම්මා–පෙ–න පීතිසහගතා ධම්මා – න සුඛසහගතා ධම්මා –අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහා'යතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

354. සුඛසහගතා ධම්මා –පෙ– තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

355. උපෙක්ඛා සහගතා ධම්මා –පෙ– තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහා'යතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

356. න උපෙක්ඛා සහගතා ධම්මා –පෙ– අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

357–359. කාමාවචරා ධම්මා –පෙ– පරියාපන්නා ධම්මා –සඋත්තරා ධම්මා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

349–350. **සප්‍රීතික ධර්මයෝ** ... **ප්‍රීතිසහගත ධර්මයෝ** ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

351–353. **අප්‍රීතික ධර්මයෝ** ... ප්‍රීති සහගත නො වූ ධර්මයෝ ... සුඛසහගත නො වූ ධර්මයෝ ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

354. **සුඛ සහගත ධර්මයෝ** ... තුන් ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් තුන් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයෙකින් පසළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

355. **උපේක්ෂා සහගත ධර්මයෝ** ... තුන් ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් සප්ත ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකෙකින් දස ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

356. **උපේක්ෂා සහගත නොවූ ධර්මයෝ** ... අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් තෙළෙස් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත්ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් අසඞ්ගෘහීත නොවෙත්. පඤ්ච ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

357–359. **කාමාවචර ධර්මයෝ** ... **පර්‍යාපන්න ධර්මයෝ** ... **සඋත්තර ධර්මයෝ** ... පඤ්ච ස්කන්ධයෙන් දොළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

360–362. න කාමාවචරා ධම්මා -පෙ- අපරියාපන්නා ධම්මා– අනුත්තරා ධම්මා – අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

363–367. රූපාවචරා ධම්මා -පෙ- අරූපාවචරා ධම්මා–නිය්‍යානිකා ධම්මා – නියතා ධම්මා – සරණා ධම්මා – චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

368–372. න රූපාවචරා ධම්මා -පෙ- න අරූපාවචරා ධම්මා – අනිය්‍යානිකා ධම්මා – අනියතා ධම්මා – අරණා ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: අරණා ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

**සඞ්ගහාසඞ්ගහ පද නිද්දෙසො නිට්ඨිතො.**

360–362. **කාමාවචර නොවූ ධර්මයෝ** ... අපයාපන්න ධර්මයෝ... **අනුත්තර ධර්මයෝ** ... අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

363–367. **රූපාවචර ධර්මයෝ** ... අරූපාවචර ධර්මයෝ ... නෛය්‍යාණික ධර්මයෝ ... නියත ධර්මයෝ ... සරණ ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු දෙකෙකින් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

368–372. **රූපාවචර නො වූ ධර්මයෝ** ... අරූපාවචර නො වූ ධර්මයෝ ... නෛය්‍යාණික නො වූ ධර්මයෝ ... අනියත ධර්මයෝ ... අරණ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයෙන් කෙතෙක් ආයතනයෙන් කෙතෙක් ධාතුයෙන් අසඞ්ගෘහීත වෙත් ද යත්:

අරණ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයෙන් දෙළොස් ආයතනයෙන් අටළොස් ධාතුයෙන් සඞ්ගෘහීත වෙති.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධයෙකින් කිසි ආයතනයෙකින් කිසි ධාතුයෙකින් අසඞ්ගෘහීත නො වෙත්.

**සඞ්ග්‍රහාසඞ්ග්‍රහ පද නිර්දේශය නිමි.**

## 2. සඞ්ගහිතෙන අසඞ්ගහිත පද නිද්දෙසො

1. චක්ඛායතනෙන යෙ ධම්මා -පෙ- ඵොට්ඨබ්බායතනෙන යෙ ධම්මා – චක්ඛුධාතුයා යෙ ධම්මා – ඵොට්ඨබ්බධාතුයා යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි අසඞ්ගහිතා: තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

2. චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා -පෙ- සොත විඤ්ඤාණධාතුයා යෙ ධම්මා – ඝානවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා – ජිව්හාවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා – කාය විඤ්ඤාණධාතුයා යෙ ධම්මා – මනො ධාතුයා යෙ ධම්මා– මනො විඤ්ඤාණධාතුයා යෙ ධම්මා ඛන්ධසඞ්ගගෙන සඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි ද්වාදසහි ධාතූහි අසඞ්ගහිතා.

3. චක්ඛුන්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- සොතින්ද්‍රියෙන යෙ ධම්මා – ඝානින්ද්‍රියෙන යෙ ධම්මා – ජිව්හින්ද්‍රියෙන යෙ ධම්මා – කායින්ද්‍රියෙන යෙ ධම්මා – ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා – පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන සඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

4. අසඤ්ඤභවෙන යෙ ධම්මා -පෙ- එකවොකාර භවෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි තීහායතනෙහි නවහි ධාතූහි අසඞ්ගහිතා.

5. පරිදෙවෙන යෙ ධම්මා -පෙ- සනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

## 2. සඞ්ගෘහීතයෙන් අසඞ්ගෘහීත පද නිර්දෙශය

1. චක්ඛායතන විසින් යම් (චක්ඛායතන වර්ජිත වූ සත්විසිරූප) ධර්ම කෙනෙක් ... ඵොට්ඨබ්බායතන විසින් යම් ධර්ම කෙනෙක් - චක්ඛු ධාතුහු විසින් යම් ධර්ම කෙනෙක් ඵොට්ඨබ්බ ධාතු විසින් යම්- ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත්ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

2. චක්ඛු විඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක්, සොත විඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක්, ඝාන විඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක් ජිව්හා විඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක්, කාය විඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක්, මනොධාතු විසින් යම් ධර්ම කෙනෙක් මනොවිඤ්ඤාණ ධාතු විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද යත්: ඒ ධර්මයෝ... සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් දෙළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

3. චක්ඛුන්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සොතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, ඝානින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ජිව්හින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, කායින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, ඉත්ථින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ... ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූ වාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත්ද යත්: ඒ ධර්මයෝ... සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

4. අසංඥාභව විසින් යම් ධර්ම කෙනෙක්– එකවොකාර භව විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද යත් : ඒ ධර්මයෝ ... සතර ස්කන්ධයෙකින් තුන් ආයතනයෙකින් නව ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

5. පරිදෙව විසින් යම් ධර්ම කෙනෙක් සනිදර්ශන සප්‍රතිඝධර්ම විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද. ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

6. අනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

7. සනිදස්සනෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

8. සප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- උපාදාධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි අසඞ්ගහිතා:

තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

දසායතනා සත්තරස ධාතුයො – සත්තින්ද්‍රියා අසඤ්ඤාභවො[1]
එකවොකාරභවො පරිදෙවො – සනිදස්සනසප්පටිඝං
අනිදස්සනං පුනදෙව[2] – සප්පටිඝං උපාදා'ති.

සඞ්ගහිතෙන අසඞ්ගහිතපදනිද්දෙසො නිට්ඨිතො.[3]

1. අසඤ්ඤීභවො–සිරිමු
2. පුනරෙව–
3. අසඞ්ගහිතෙන සඞ්ගහිතං පදනිද්දෙසො–සිරිමු, ස්‍යා, ම ර ස්‍යා

6. අනිදර්ශන සප්‍රතිඝධර්ම විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් සොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

7. සනිදර්ශනධර්ම විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

8. සප්‍රතිඝධර්ම විසින් යම් ධර්මකෙනෙක් ... උපාද ධර්ම විසින් යම් ධර්මකෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු වෙත් ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතුන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්:

ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීත වෙත්.

**උද්දානය:**

දස ආයතන යෑ, සතළොස් ධාතුහු යෑ සප්ත ඉන්ද්‍රියයෝ යෑ, අසංඥ භව යෑ එකවෝකාරභව යෑ පරිදේව යෑ සනිදස්සනසප්පටිඝ යෑ අනිදස්සන යෑ සප්පටිඝ යෑ උපාද යි.

**සඞ්ගෘහීතයෙන් අසඞ්ගෘහීත පද නිර්දේශය නිමි.**

## 3. අසඞ්ගහිතෙන සඞ්ගහිත පද නිද්දෙසො

1. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා- සමුදයසච්චෙන යෙ ධම්මා,- මග්ගසච්චෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන සඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා,

2. නිරොධසච්චෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා

3. ජීවිතින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

4. ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා - සුඛින්ද්‍රියෙන යෙ ධම්මා- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා,- සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා,- දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා,- උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා,- සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා,- විරියින්ද්‍රියෙන යෙ ධම්මා - සතින්ද්‍රියෙන යෙ ධම්මා- සමාධින්ද්‍රියෙන යෙ ධම්මා- පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා - අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා - අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා- අවිජ්ජාය යෙ ධම්මා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙන යෙ ධම්මා - සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා - ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා - වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා- තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා - කම්මභවෙන යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

## 3. අසඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත පද නිර්දේශය

1. වෙදනා ස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක්, සංඥා ස්කන්ධය විසින් යම් ධර්මකෙනෙක් සංස්කාර ස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක්, සමුදය සත්‍යය විසින් යම් ධර්ම කෙනෙක් මාර්ග සත්‍යය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව (නිර්වාණය) ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

2. නිරෝධ සත්‍යය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

3. ජීවිතේන්ද්‍රියය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ-සඞ්ඛ්‍යාවෙන් හැරපියා ස්කන්ධ දෙකෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

4. ඉත්ථින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්... පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සුඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, දුක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සොමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, දොම-නස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, උපෙක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සද්ධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, විරියින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සමාධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, පඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අඤ්ඤාතාවින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අවිද්‍යාව විසින් යම් ධර්ම කෙනෙක්, අවිද්‍යාප්‍රත්‍යයෙන් වන සංස්කාරයන් විසින් යම් ධර්ම කෙනෙක්, ෂඩායතන ප්‍රත්‍යයෙන් වන ස්පර්ශය විසින් යම් ධර්ම කෙනෙක්,ස්පර්ශප්‍රත්‍යයෙන් වන වෙදනාව විසින් යම් ධර්ම කෙනෙක්, වෙදනා ප්‍රත්‍යයෙන් වන තෘෂ්ණාව විසින් යම් ධර්ම කෙනෙක්, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වන උපාදානය විසින් යම් ධර්ම කෙනෙක් කර්ම භවය විසින්, යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධ-යෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

5. ජාතියා යෙ ධම්ම -පෙ- ජරාය යෙ ධම්මා- මරණෙන යෙ ධම්මා- ඣානෙන යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

6. සොකෙන යෙ ධම්මා -පෙ- දුක්ඛෙන යෙ ධම්මා- දෙමනස්සෙන යෙ ධම්මා- උපායාසෙන යෙ ධම්මා- සතිපට්ඨානෙන යෙ ධම්මා- සම්මප්පධානෙන යෙ ධම්මා,- අප්පමඤ්ඤාය යෙ ධම්මා,- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා- ඵස්සෙන යෙ ධම්මා- වෙදනාය යෙ ධම්මා- සඤ්ඤාය යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- අධිමොක්ඛෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා- හෙතූහි ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙ' ව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා,- හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

7. අප්පච්චයෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසඞ්ඛතෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

8. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහිචෙව ආසවහි සම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

5. ජාතිය විසින් යම් ධර්ම කෙනෙක්, ජරාව විසින් යම් ධර්ම කෙනෙක්, මරණය විසින් යම් ධර්ම කෙනෙක්, ධ්‍යානය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහිත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා ස්කන්ධ දෙකෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහිත වෙත්.

6. ශොකය විසින් යම් ධර්ම කෙනෙක්, දුඃඛය විසින් යම් ධර්ම කෙනෙක්, දෞර්මනස්සය විසින් යම් ධර්ම කෙනෙක්, උපායාසය විසින් යම් ධර්ම කෙනෙක්, සතිපට්ඨානය විසින් යම් ධර්ම කෙනෙක් සම්‍යක්-ප්‍රධානය විසින් යම් ධර්ම කෙනෙක්,අප්‍රාමාණ්‍යය විසින් යම් ධර්මකෙනෙක්, පඤ්චෙන්ද්‍රියයන් විසින් යම් ධර්ම කෙනෙක්, පඤ්චබල විසින් යම් ධර්ම කෙනෙක්, සප්ත බොධ්‍යඞ්ගයන් විසින් යම් ධර්ම කෙනෙක්,ආර්‍ය්‍ය අෂ්ටාඞ්-ගික මාර්ගය විසින් යම් ධර්ම කෙනෙක්,ස්පර්ශයවිසින් යම්ධර්මකෙනෙක්, වෙදනාව විසින් යම් ධර්ම කෙනෙක්, සංඥාව විසින් යම් ධර්ම කෙනෙක්, චෙතනාව විසින් යම් ධර්ම කෙනෙක්, අධිමොක්ෂය විසින් යම් ධර්ම කෙනෙක්, මනසිකාරය විසින් යම් ධර්ම කෙනෙක්, හෙතු ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, හෙතු ද සහෙතුක ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, හේතුද හෙතුසම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහිත වූවාහු, ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු. ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වා-ණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධයෙකින් එක් ආයතන-යෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහිත වෙත්.

7. අප්‍රත්‍යය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්,අසඞ්ඛත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහිත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු වෙත්ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහිත වෙත්.

8. ආස්‍රව ධර්මයන් විසින් යම් ධර්මකෙනෙක්-ආස්‍රව ද සාස්‍රව ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, ආස්‍රව ද ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහිත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහිත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහිත වෙත්.

9. සඤ්ඤොජනෙහි -පෙ- ගන්ථෙහි- ඔඝෙහි- යොගෙහි- නීවරණෙහි- පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ග හන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

10. චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තස සට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

11. චිත්තසහභූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා. -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

12. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහා'යතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා තීහි ඛන්ධෙහි එකෙනාය තනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

තයො ඛන්ධා තථා සච්චා ඉන්ද්‍රියානි ච සොළස
පදානි පච්චයාකාරෙ චුද්දසූ'පරි චුද්දස,
සමතිංස පද හොන්ති ගොච්ඡකෙසු දසස්වථ
දුවෙ චූළන්තර[1] දුකා අට්ඨ හොන්ති මහන්තරා,ති[2]

**අසඞ්ගහිතෙන සඞ්ගහිතපදනිද්දෙසො නිට්ඨිතො.**

1. චූළන්තර - මජසං
2. උද්දානගාථා PTS පොත්ථකෙ න දිස්සන්ති.

9. සංයොජන-ග්‍රන්ථ-ඕස-යොග-නීවරණ-පරාමර්ශ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, පරාමර්ශ ද පරාමෘෂ්ට ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

10. චෛතසික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, චිත්තසම්ප්‍ර යුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, චිත්තසංසෘෂ්ට ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, චිත්තසංසෘෂ්ට සමුත්ථානසහභූ ධර්මයන් විසින් ධර්ම කෙනෙක්, චිත්තසංසෘෂ්ටසමුත්ථානානු පරිවර්ති ධර්මයන් විසින් යම් ධර්මකෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද...ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

11. චිත්තසහභූ ධර්මයන් විසින් යම් ධර්මකෙනෙක්, චිත්තානු-පරිවර්ති ධර්මයන් විසින් යම් ධර්මකෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ... ඒ ධර්මයෝ කිසි ස්කන්ධයෙකින් සඞ්ගෘහීත නො වෙති. එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

12. උපාදාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ක්ලෙශ ද සාංක්ලෙශික ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද සංක්ලිෂ්ට ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද ක්ලෙශ සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයෙන් කෙතෙක් ආයතනයෙන් කෙතෙක් ධාතුයෙන් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ නිර්වාණය ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා තුන් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත වෙත්.

**උද්දානය:**

ස්කන්ධයෝ තිදෙනෙක් වෙති, එසේ මැ සත්‍යයෝ තිදෙනෙක් වෙති, ඉන්ද්‍රියයෝ ද සොළොසෙකි, ප්‍රත්‍යයාකාරයෙහි තුදුස්පදයෙකි, මත්තෙහි පද තුදුසෙකි, දසගොච්ඡකයන් අතුරෙන් මෙහි සමතිස් පද කෙනෙක් වෙති. චූලන්තරදුකයෙන් පද දෙකෙකි. මහන්තරදුකයෙන් අටපද කෙනෙක් වෙත් යයි.

**අසඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත පද නිර්දේශ නිමි.**

## 4. සඞ්ගහිතෙන සඞ්ගහිතපදනිද්දෙසො.

1. සමුදයසච්චෙන යෙ ධම්මා -පෙ- මග්ගසච්චෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහා යතනෙහි කතිහි ධාතුහි සඞ්ගහිතා: තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

2. ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා, සුඛින්ද්‍රියෙන යෙ ධම්මා- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා- සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා, දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා- උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා- සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා,- විරියින්ද්‍රියෙන[1] යෙ ධම්මා- සතින්ද්‍රියෙන යෙ ධම්මා- සමාධින්ද්‍රියෙන යෙ ධම්මා- පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා-

අවිජ්ජාය යෙ ධම්මා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙන යෙ ධම්මා- සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා- වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා- තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා- කම්මභවෙන යෙ ධම්මා- සොකෙන යෙ ධම්මා- පරිදෙවෙන යෙ ධම්මා-දුක්ඛෙන යෙ ධම්මා- දොමනස්සෙන යෙ ධම්මා- උපායාසෙන යෙ ධම්මා-

සතිපට්ඨානෙන යෙ ධම්මා- සම්මප්පධානෙන යෙ ධම්මා- අප්පමඤ්ඤාය යෙ ධම්මා- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා- ඵස්සෙන යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- අධිමොක්ඛෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා-

1. විරියින්ද්‍රියෙන - ම ඡ සං

## 4. සඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත පද නිර්දේශය

1. සමුදයසත්‍ය විසින් යම් ධර්ම කෙනෙක් මාර්ගසත්‍ය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහු ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ කරන ලද්දාහු ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙත්.

2. ඉත්ථින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් සුඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, දුක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සොමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, දෙමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් උපෙක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සද්ධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් විරියින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, සමාධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් පඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්, අඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් අඤ්ඤාතාවින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් –

අවිද්‍යාව විසින් යම් ධර්ම කෙනෙක්, අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරය විසින් යම් ධර්ම කෙනෙක්, ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය විසින් යම් ධර්ම කෙනෙක්, වේදනා ප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව විසින් යම් ධර්ම කෙනෙක්, තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වූ උපාදානය විසින් යම් ධර්ම කෙනෙක්, කර්ම භවය විසින් යම් ධර්ම කෙනෙක්, ශොකයෙන් යම් ධර්ම කෙනෙක්, පරිදෙවයෙන් යම් ධර්ම කෙනෙක්, දුඃඛයෙන් යම් ධර්ම කෙනෙක්, දෞර්මනස්සයෙන් යම් ධර්ම කෙනෙක් උපායාසයෙන් යම් ධර්ම කෙනෙක් –

සතිපට්ඨානයෙන් යම් ධර්ම කෙනෙක්, සම්‍යක්ප්‍රධානයෙන් යම් ධර්ම කෙනෙක්, අප්‍රාමාණ්‍යයෙන් යම් ධර්ම කෙනෙක් පඤ්චෙන්ද්‍රියයන් විසින් යම් ධර්ම කෙනෙක්, පඤ්ච බලයන් විසින් යම් ධර්ම කෙනෙක්, සප්ත බොධ්‍යඞ්ගයන් විසින් යම් ධර්ම කෙනෙක්, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන් යම් ධර්ම කෙනෙක්, ස්පර්ශයෙන් යම් ධර්ම කෙනෙක්, චෙතනායෙන් යම් ධර්ම කෙනෙක්, අධිමොක්ෂයෙන් යම් ධර්ම කෙනෙක් මනසිකාරයෙන් යම් ධර්ම කෙනෙක් –

හෙතූහි ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙව සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහි- සඤ්ඤොජනෙහි- ගන්ථෙහි- ඔඝෙහි- යොගෙහි- නීවරණෙහි- පරාමාසෙහි- උපාදානෙහි- කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්ම- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා. තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා; තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

ද්වෙ සච්චා පණ්ණරසින්ද්‍රියා[1] එකාදසපටිච්චපදා[2]
උද්ධං පුන එකාදස ගොච්ඡකපදමෙත්ථ තිංසවිධං[3] ති.

**ඞ්ගහිතෙන සඞ්ගහිතපදනිද්දෙසො නිට්ඨිතො.**

1. පණ්ණරසින්ද්‍රියානි, PTS
2. පටිච්චසමුප්පාද-PTS
3. තිංසවිධාසිමු.-PTS

හේතු ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් හෙතු ද වූ සහෙතුක ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, හෙතු ද වූ හෙතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්, ආශ්‍රවයන් විසින් සංයොජනයන් විසින්-ග්‍රන්ථයන් විසින්-ඔඝයන් විසින්-යොගයන් විසින්-නීවරණයන් විසින්-පරාමර්ශයන් විසින් - උපාදනයන් විසින්-ක්ලෙශධර්මයන් විසින්-යම් ධර්ම කෙනෙක් - ක්ලෙශ ද වූ සාංක්ලෙශික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද වූ සංක්ලිෂ්ට ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ක්ලෙශ ද වූ ක්ලෙශ සම්ප්‍රයුක්තද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවා හු ද, ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවා හුද, ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහුද, ඒ ධර්මයන් විසින් යම් ධර්මකෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වෙත් ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වෙත් ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් සඞ්ගෘහීත යෝ යි.

උද්දනය:

සත්‍යයෝ දෙදෙනෙකැ, ඉන්ද්‍රියයෝ පසළොස් දෙනෙකැ, ප්‍රතීත්‍ය සමුත්පාදපදයෝ එකොළොස් දෙනෙකැ, යළි මත්තෙහි ධර්මයෝ එකොළොස් දෙනෙකැ, මෙහි ගොච්ඡකපදය තිස් වැදෑරුම් වෙ යයි.

**සඞ්ගෘහීතයෙන් සඞ්ගෘහීත පද නිර්දේශය නිමි.**

## 5. අසඞ්ගහිතෙන අසඞ්ගහිත පද නිද්දෙසො

1. රූපක්ඛන්ධෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා, ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි අසඞ්ගහිතා. තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

2. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

3. විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- මනායතනෙන යෙ ධම්මා- චක්ඛුවිඤ්ඤාණ ධාතුයා යෙ ධම්මා- මනො ධාතුයා යෙ ධම්මා-මනො විඤ්ඤාණ ධාතුයා යෙ ධම්මා- මනින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි අසඞ්ගහිතා.

4. චක්ඛායතනෙන යෙ ධම්මා -පෙ- ඵොට්ඨබ්බායතනෙන යෙ ධම්මා- චක්ඛුධාතුයා යෙ ධම්මා- ඵොට්ඨබ්බධාතුයා යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

## 5. අසඞගෘහීතයෙන් අසඞගෘහීත පද නිර්දේශය

1. රූපස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ධාතු සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් අසඞගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් සප්තධාතූන් විසින් අසඞගෘහීත යෝ යි.

2. වෙදනාස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක්- සංඥාස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක් – සංස්කාරස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතන සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ධාතුසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞගෘහීත වෙත්.

3. විඥානස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක්- මනායතනය විසින් යම් ධර්ම කෙනෙක්- චක්ෂුර් විඥානධාතුව විසින් යම් ධර්ම කෙනෙක්- මනොධාතුව විසින් යම් ධර්ම කෙනෙක්-මනොවිඥානධාතුව විසින් යම් ධර්ම කෙනෙක් මනින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ආයතන සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ධාතු සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞගෘහීතයෝ යි.

4. චක්ඛායතනය විසින් යම් ධර්ම කෙනෙක් ...ඵොට්ඨබ්බායතනය විසින් යම් ධර්ම කෙනෙක් චක්ඛුධාතුව විසින් යම් ධර්ම කෙනෙක්... ඵොට්ඨබ්බධාතුව විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතන සඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතූන් විසින් අසඞගෘහීතයෝ යි.

5. ධම්මායතනෙන යෙ ධම්මා -පෙ- ධම්මධාතුයා යෙ ධම්මා ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා-පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා- ජීවිතින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

6. සමුදයසච්චෙන යෙ ධම්මා -පෙ- මග්ගසච්චෙන යෙ ධම්මා- නිරොධසච්චෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

7. චක්ඛුන්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- කායින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

8. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා-සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා- දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා- උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා- සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා- විරියින්ද්‍රියෙන[1] යෙ ධම්මා -සතින්ද්‍රියෙන යෙ ධම්මා-සමාධින්ද්‍රියෙන යෙ ධම්මා -පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා- අවිජ්ජාය යෙ ධම්මා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන. අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

---

1. විරියින්ද්‍රියෙන- ම ඡ සං

5. ධර්මායතනය විසින් යම් ධර්ම කෙනෙක්- ධර්ම ධාතුව විසින් යම් ධර්ම කෙනෙක්- ඉත්ථින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්- පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් - ජීවිතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත්ද, ආයතන සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතු සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්තධාතූන් විසින් අසඞගෘහීතයෝ යි.

6. සමුදය සත්‍යයෙන් යම් ධර්ම කෙනෙක් - මාර්ගසත්‍යයෙන් යම් ධර්ම කෙනෙක්- නිරොධසත්‍යයෙන් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතන සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතු සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞගෘහීතයෝ යි.

7. චක්ඛුන්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – කායින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ආයතන සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතු සඞග්‍රහයෙන් ද අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු අටෙකින් අසඞගෘහීතයෝ යි.

8. සුඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – දුක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – සොමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – දොමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – උපෙක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – සද්ධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – විරියින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – සතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – සමාධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – පඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – අඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් අඤ්ඤාතාවින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් – අවිද්‍යාව විසින් යම් ධර්ම කෙනෙක් – අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරය විසින් යම් ධර්මකෙනෙක් ස්කන්ධ සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත්ද, ආයතන සඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද, ධාතුසඞග්‍රහයෙන් අසඞගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞගෘහීතයෝ යි.

9. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

10. විඤ්ඤාණපච්චයා නාමරූපෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා–පෙ–තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

11. නාමරූපපච්චයා සළායතනෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙ එකාය ධාතුයා අසඞ්ගහිතා.

12. සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා –පෙ– ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා–වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා– තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා– කම්මභවෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

13. අරූපභවෙන යෙ ධම්මා –පෙ– නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙන යෙ ධම්මා- චතුවොකාරභවෙන යෙ ධම්මා- ඉද්ධිපාදෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා., ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

14. අසඤ්ඤභවෙන[1] යෙ ධම්මා –පෙ– එකවොකාරභවෙන යෙ ධම්මා– ජාතියා යෙ ධම්මා- ජරාය යෙ ධම්මා-මරණෙන යෙ ධම්මා- ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

---

1. අසඤ්ඤිභවෙන- සිමු

9. සංස්කාර ප්‍රත්‍යයෙන් වූ විඥානය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

10. විඥානප්‍රත්‍යයෙන් වූ නාමරූපය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

11. නාම රූප ප්‍රත්‍යයෙන් වූ ෂඩායතනය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත්ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

12. ෂඩායතනප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය විසින් යම් ධර්ම කෙනෙක්– ස්පර්ශප්‍රත්‍යයෙන් වූ වෙදනාව විසින් යම් ධර්ම කෙනෙක් – වෙදනා ප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව විසින් යම් ධර්ම කෙනෙක් – තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වූ උපාදානය විසින් යම් ධර්ම කෙනෙක් – කර්මභවය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

13. අරූප භවය විසින් යම් ධර්ම කෙනෙක් – නේවසඤ්ඤානාසඤ්ඤා භවය විසින් යම් ධර්ම කෙනෙක් චතුවොකාරභවය විසින් යම් ධර්ම කෙනෙක් ඉද්ධිපාදයෙන් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසංග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසංග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දසධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

14. අසංඥාභවයෙන් යම් ධර්ම කෙනෙක් – එකවොකාරභවයෙන් යම් ධර්ම කෙනෙක් – ජාතිය විසින් යම් ධර්ම කෙනෙක්, ජරාව විසින් යම් ධර්ම කෙනෙක්, මරණය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසංග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසංග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

15. පරිදෙවෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

16. සොකෙන යෙ ධම්මා -පෙ- දුක්ඛෙන යෙ ධම්මා- දොමනස්සෙන යෙ ධම්මා- උපායාසෙන යෙ ධම්මා- සතිපට්ඨානෙන යෙ ධම්මා- සම්මප්පධානෙන යෙ ධම්මා- ඣානෙන යෙ ධම්මා- අප්පමඤ්ඤාය යෙ ධම්මා- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි-බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා - ඵස්සෙන යෙ ධම්මා- වෙදනාය යෙ ධම්මා- සඤ්ඤාය යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- අධිමොක්ඛෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා, ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

17. චිත්තෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

18. කුසලෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අකුසලෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- විපාකෙහි ධම්මෙහි යෙ ධම්මා- විපාකධම්මධම්මෙහි යෙ ධම්මා- අනුපාදින්නඅනුපාදානියෙහි ධම්මෙහි යෙ ධම්මා- සඞ්කිලිට්ඨසඞ්කිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- අසඞ්කිලිට්ඨඅසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා- අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා-

15. පරිදේවය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් අෂ්ට ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

16. ශෝකයෙන් යම් ධර්ම කෙනෙක්- දුඃඛයෙන් යම් ධර්ම කෙනෙක්- දෞර්මනස්‍යයෙන් යම් ධර්ම කෙනෙක්- උපායාසයෙන් යම් ධර්මකෙනෙක්- සතිපට්ඨානයෙන් යම් ධර්ම කෙනෙක් - සම්‍යක් ප්‍රධානයෙන් යම් ධර්ම කෙනෙක් - ධ්‍යානයෙන් යම් ධර්ම කෙනෙක්- අප්‍රාමාණ්‍යයෙන් යම් ධර්ම කෙනෙක් - පඤ්චින්ද්‍රියයන් විසින් යම් ධර්ම කෙනෙක්- පඤ්චබලයන් විසින් යම් ධර්ම කෙනෙක්-සප්ත බොධ්‍යඞ්ගයන් විසින් යම් ධර්ම කෙනෙක්- ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙන් යම් ධර්ම කෙනෙක් - ස්පර්ශයෙන් යම් ධර්ම කෙනෙක් - වෙදනායෙන් යම් ධර්ම කෙනෙක් - සංඥායෙන් යම් ධර්ම කෙනෙක්- චේතනායෙන් යම් ධර්ම කෙනෙක් - අධිමොක්ෂයෙන් යම් ධර්ම කෙනෙක්-මනසිකාරයෙන් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

17. චිත්තයෙන් යම් ධර්මකෙනෙක්, ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

18. කුශල ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අකුශලධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අදුක්ඛමසුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - විපාකධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- විපාකස්වභාවධර්මයන් විසින් යම් ධර්මකෙනෙක් අනුපාදින්න අනුපාදනීය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් සංක්ලිෂ්ට සාංක්ලෙශික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අසංක්ලිෂ්ට අසාංක්ලෙශික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - සවිතර්කසවිචාර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අවිතර්කවිචාරමාත්‍ර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-

පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා– සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා– උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා– දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා– භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා – දස්සනෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– ආචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා– අපචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා– සෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා– අසෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා– මහග්ගතෙහි ධම්මෙහි යෙ ධම්මා අප්පමාණෙහි ධම්මෙහි යෙ ධම්මා– පරිත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– මහග්ගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අප්පමාණාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– හීනෙහි ධම්මෙහි යෙ ධම්මා– පණීතෙහි ධම්මෙහි යෙ ධම්මා– මිච්ඡත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා- සම්මත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා–මග්ගාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා - මග්ගහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- මග්ගාධිපතීහි ධම්මෙහි යෙ ධම්මා– අතීතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා–අනාගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– පච්චුප්පන්නාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා- අජ්ඣත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා- බහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අජ්ඣත්තබහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

19. සනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– අනිදස්සන සප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

20. හෙතූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතූහි චෙව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙව හෙතුසම්පයුත්තකෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා- -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

ප්‍රීතිසහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සුඛසහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් උපෙක්ෂාසහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- භාවනායෙන් ප්‍රහාතව්‍යධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් · ආචයගාමී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – අපචයගාමී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- ශෛක්ෂ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්–අශෛක්ෂ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - මහද්ගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් අප්‍රමාණධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- පරිත්තාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - මහද්ගතාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – අප්‍රමාණාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් හීනධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ප්‍රණීතධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – මිථ්‍යාත්වනියත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – සම්‍යක්ත්වනියත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් මාර්ගාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – මාර්ගහෙතුක ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - මාර්ගාධිපති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අතීතාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අනාගතාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ප්‍රත්‍යුත්පන්නාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – අධ්‍යාත්මාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – බාහ්‍යාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– අධ්‍යාත්මබාහ්‍යාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දසධාතුයෙකින් අසඞ්ගෘහීත යෝ යි.

19. සනිදර්ශන සප්‍රතිඝ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– අනිදර්ශන සප්‍රතිඝ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් ආයතන දෙකෙකින් ධාතු අටෙකින් අසඞ්ගෘහීතයෝ යි.

20. හේතු ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - හේතු ද වූ මැ. සහේතුක ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – හේතු ද වූ මැ හේතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

21. සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතුසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- සහෙතුකෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා හෙතුසම්පයුත්තෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා- න හෙතු සහෙතුකෙහි ධම්මෙහි[1] යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

22. අප්පච්චයෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසඞ්ඛතෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

23. සනිදස්සනෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා. ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි අසඞ්ගහිතා.

24. රූපීහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන, එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

25. අරූපීහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ලොකුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු-සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

26. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහි චෙව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා-ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහා'යතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

1. න හෙතූහි ධම්මෙහි සහෙතුකෙහි ධම්මෙහි—සයා

21. සහේතුක ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – හේතුසම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – සහෙතුක ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – හෙතු සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – හෙතු නොවූ සහෙතුක ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

22. අප්‍රත්‍යය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – අසඞ්ඛත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

23. සනිදර්ශන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – සප්‍රතිඝ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ සතරෙකින් ආයතන දෙකෙකින් ධාතු අටෙකින් අසඞ්ගෘහීතයෝ යි.

24. රූපී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් ධාතු සතෙක්න් අසඞ්ගෘහීතයෝ යි.

25. අරූපී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ලොකොත්තර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

26. ආස්‍රව ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ආස්‍රව ද වූ මැ, සාස්‍රව ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

27. අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා-ආසවසම්පයුත්තෙහි චෙව නො ච ආසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා-ආසවවිප්පයුත්තෙහි අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහා'යතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

28. සංයොජනෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ගන්ථෙහි ධම්මෙහි යෙ ධම්මා-ඔඝෙහි ධම්මෙහි යෙ ධම්මා-යොගෙහි ධම්මෙහි යෙ ධම්මා-නීවරණෙහි ධම්මෙහි යෙ ධම්මා-පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා-පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා-ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

29. අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අපරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසවිප්පයුත්තෙහි අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා - සාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා—පෙ— තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

30. අනාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා-පෙ-නො චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මාචිත්තවිසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා-චිත්තසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා-චිත්තසහභූහි ධම්මෙහි යෙ ධම්මා-චිත්තානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා-බාහිරෙහි ධම්මෙහි යෙ ධම්මා-උපාදාහි ධම්මෙහි[1]. යෙ ධම්මා- ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

1. උපාදාධම්මෙහි- ම ඡ සං, ස්‍යා

27. අනාශ්‍රව ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ආශ්‍රවසම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ආශ්‍රවසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආශ්‍රව ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ආශ්‍රවවිප්‍රයුක්ත වූ අනාශ්‍රවධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

28. සංයෝජන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- ග්‍රන්ථ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ඕඝධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– යොග ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – නීවරණ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - පරාමර්ශධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – පරාමර්ශ ද වූ මැ පරාමෘෂ්ටද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

29. අපරාමෘෂ්ට ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – අපරාමර්ශ සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – පරාමර්ශ විප්‍රයුක්ත වූ අපරාමෘෂ්ට ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – සාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

30. අනාලම්බනධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – චිත්ත නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් චිත්තවිප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – චිත්තවිසංසෘෂ්ට වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් චිත්තසමුත්ථාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – චිත්ත සහභූධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – චිත්තානුපරිවර්ති වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් බාහ්‍ය වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් උපාද ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් එක් ආයතනයෙකින් සප්ත ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

31. චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

32. චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා–චිත්තසංසට්ඨ-සමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා–චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා–චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

33. අජ්ඣත්තිකෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ග-හිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා අඞ්ගහිතා.

34. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා–පෙ–කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා– කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා– කිලෙසෙහි චෙව කිලෙසසම්ප-යුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

35. අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– සංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා – කිලෙසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා – කිලෙස සම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා– කිලෙසවිප්ප-යුත්තෙහි අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා – දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා – භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා – දස්ස-නෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– භාවනාය පහාතබ්බහෙතු-කෙහි ධම්මෙහි යෙ ධම්මා – සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා – සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා– සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා – පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා–සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා – උපෙක්ඛාසහ ගතෙහි ධම්මෙහි යෙ ධම්මා– න කාමාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා

31. චිත්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතන සඞ්ග්‍රහයෙන්අසඞ්ගෘහීත වෙත් ද ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයෙකින් එකොළොස් ආයතනයෙකින් එකොළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

32. චෛතසික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් චිත්තසම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්–චිත්තසංසෘෂ්ටධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ටසමුත්ථාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

33. ආධ්‍යාත්මික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ තුනෙකින් එක් ආයතනයෙකින් එක් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

34. උපාදාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ක්ලේශධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ක්ලේශ ද වූ මැ සංක්ලේශික ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ක්ලෙශ ද වූ මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් –ක්ලෙශ ද වූ මැ ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ... ඒ ධර්මයෝ ස්කන්ධ දෙකෙකින් එකොළොස් ආයතනයෙකින් සතළොස් ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

35. අසංක්ලේශිකධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – සංක්ලිෂ්ටධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ක්ලෙශවිප්‍රයුක්ත වූ අසංක්ලේශිකධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - භාවනායෙන ප්‍රහාතව්‍ය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– සවිතර්ක ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– සවිචාරධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– සප්‍රීතිකධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ප්‍රීතිසහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්– සුඛසහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - උපෙක්ෂා සහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් කාමාවචර නො වූ ධර්මයන් විසින්

රූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා–අරූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා අපරියාපන්නෙහි ධම්මෙහි යෙ ධම්මා–නිය්‍යානිකෙහි ධම්මෙහි යෙ ධම්මා– නියතෙහි ධම්මෙහි යෙ ධම්මා– අනුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා– සරණෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා තෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා; තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි අසඞ්ගහිතා. තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

රූපඤ්ච ධම්මායතනං ධම්මධාතු –
ඉත්ථිපුමං ජීවිතං නාමරූපං,
ද්වෙ භවා ජාතිජරාමච්චුරූපං,
අනාරම්මණා නො චිත්තෙන විප්පයුත්තං.

විසංසට්ඨං[1] සමුට්ඨානසහභූහි අනුපරිවත්ති,
බාහිරං උපාදා ද්වෙ වීසති[2] එස නයො සුබුද්ධො,

[සබ්බෙ ඛන්ධා තථායතන ධාතුයො සච්චතො තයො,
ඉන්ද්‍රියානිපි සබ්බානි තෙ වීසති පටිච්චතො.
පරතො සොළස පද තෙචත්තාළීසකං තිකෙ,
ගොච්ඡකෙ සත්තති ද්වෙ ච සත්ත චූළන්තරෙ පද.
මහන්තරෙ පද වුත්තා අට්ඨාරස තතො පරං,
අට්ඨාරසෙව ඤාතබ්බා සෙසා ඉධ න භාසිතා ති[3].

අසඞ්ගහිතෙන අසඞ්ගහිත පද නිද්දෙසො නිට්ඨිතො.

1. විසංසට්ඨා – P.T.S.
2. චෙව වීසයො – ම ඡ සං, සිරිමු
3. ඉමා ගාථායො කත්ථචි න දිස්සන්ති

යම් ධර්ම කෙනෙක් රූපාවචර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් අරූපාවචරධර්මයන් විසින් යම් ධර්මකෙනෙක් අපයාපන්න ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් නෛයාණිකධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් – නියතධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් අනුත්තරධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සරණ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ධාතු සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයෙකින් දස ආයතනයෙකින් දස ධාතුයෙකින් අසඞ්ගෘහීතයෝ යි.

උද්දානය:

රූපස්කන්ධ යැ ධර්මායතන යැ ධර්මධාතු යැ ස්ත්‍රීන්ද්‍රිය යැ පුරුෂෙන්ද්‍රිය යැ ජීවිතෙන්ද්‍රිය යැ නාමරූප යැ අරූපභව අසංඥභව දෙක යැ ජාති යැ ජරා යැ මරණ යැ අනාලම්බන යැ නො චිත්ත යැ චිත්තය හා විප්‍රයුක්ත යැ.

විසංසෘෂ්ට යැ සමුත්ථාන යැ සහභූ යැ අනුපරිවර්ති යැ බාහිර යැ උපාද යැ යි දෙවිසිපායෙකි. තෙල නය (සර්වඥයන් විසින්) මොනොවට අවබොධ කරන ලද්දේ යි.

උද්දානය:

සියලු ස්කන්ධයෝ යැ, එසේ මැ සියලු ආයතනධාතු යැ. සත්‍ය හෙයින් තිදෙනෙකැ සියලු මැ ඉන්ද්‍රියයෝ යැ ප්‍රතීත්‍ය සමුත්පාද හෙයින් තෙවිස්සෙකැ මත්තෙහි සොළොස්පදයෝ යැ. ත්‍රිකමාතෘකායෙහි තෙතාලිසෙකැ ගොච්ඡකයෙහි දෙ සැත්තෑ පදයෝ යැ, චූල්ලන්තරයෙහි සත්පදයෝ යැ මහන්තරයෙහි අටළොස් පදයෝ යැ යන මොහු වදරන ලද්දහ. එයින් මත්තෙහි අටළොස් පද කෙනෙක් මැ වෙති'යි දතයුත්තාහ. සෙසු පදයෝ මෙහි නො වදරන ලද්දහ යි.

**අසඞ්ගෘහීතයෙන් අසඞ්ගෘහීතපද නිර්දේශය නිමි.**

# 6. සම්පයොගවිප්පයොග පද නිද්දෙසො

1. රූපක්ඛන්ධො කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තොති: නත්ථි.

කතිහි විප්පයුත්තො: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

2. වෙදනාක්ඛන්ධො -පෙ- සඤ්ඤාක්ඛන්ධො-- සඞ්ඛාරක්ඛන්ධො -පෙ- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තො එකෙනායත-නෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තො, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

3. විඤ්ඤාණක්ඛන්ධො –පෙ– තීහි ඛන්ධෙහි සම්පයුත්තො එකෙනායත නෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො; එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

4. චක්ඛායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං -පෙ- සම්පයුත්තන්ති: නත්ථි.

කතිහි විප්පයුත්තං, චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

## 6. සම්ප්‍රයොග විප්‍රයෝග පද නිර්දේශය

1. රූපස්කන්ධය කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වේ ද යත්: සම්ප්‍රයෝගයෙක් නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: සතර ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්තධාතූන් හා සමග විප්‍රයුක්ත යැ, එක් මනායතනය හා සමග එක් ධර්මධාතුව හා සමග කිසිවකුන් (ධර්මායතන ධර්මධාතු පර්‍යාපන්න වූ වෙදනා සංඥා සංස්කාරයන්) හා විප්‍රයුක්ත වේ.

2. වේදනාස්කන්ධය... සංඥාස්කන්ධය... සංස්කාරස්කන්ධය... තුන් ස්කන්ධයන් හා සමග, එක් ආයතනයක් හා සමග, සප්තධාතූන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග, එක් ධාතුවක් හා සමග, කිසිවකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කීදෙනකුන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමඟ දස ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමඟ (රූපනිබ්බාණ සඞ්ඛාත) කිසිවකුන් හා සමග විප්‍රයුක්ත වේ.

3. විඥානස්කන්ධය... තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්ත යැ. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග (වෙදනාදී) කිසිවකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කී දෙනකුන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දසධාතූන් හා සමග විප්‍රයුක්ත යැ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග, කිසිවකුන් හා විප්‍රයුක්ත වේ.

4. චක්ෂුරායතනය ... ස්ප්‍රෂ්ටව්‍යායතනය (කිසිවකුන් හා සමග) සම්ප්‍රයුක්ත වේ ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කී දෙනකුන් හා සමග විප්‍රයුක්ත ද යත්: සතර ස්කන්ධයන් හා සමග එක් මනායතනය හා සමග සප්තධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසිවකුන් හා විප්‍රයුක්ත වේ.

5. මනායතනං -පෙ- තීහි ඛන්ධෙහි සම්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

6. චක්ඛුධාතු - පෙ- ඵොට්ඨබ්බධාතු -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

7. චක්ඛුවිඤ්ඤාණධාතු -පෙ- මනොධාතු—මනො විඤ්ඤාණ ධාතු- තීහි ඛන්ධෙහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

8. සමුදය සච්චං -පෙ- මග්ගසච්චං -පෙ- තීහි ඛන්ධෙහි එකෙනා- යතනෙන එකාය ධාතුයා සම්පයුත්තං. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං

9. නිරොධසච්චං -පෙ- චක්ඛුන්ද්‍රියං— කායින්ද්‍රියං— ඉත්ථින්ද්‍රියං— පුරි- සින්ද්‍රියං— සම්පයුත්තන්ති: නත්ථි.

කතිහි විප්පයුත්තං: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

5. මනායතනය තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්ත යැ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසිවකුත් හා සම්ප්‍රයුක්ත වෙයි.

කී දෙනකුන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග, දස ආයතනයන් හා සමග දසධාතුන් හා සමග විප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසිවකුත් හා විප්‍රයුක්ත වේ.

6. චක්ඛුධාතුව ... ඵොට්ඨබ්බධාතුව ... සම්ප්‍රයුක්ත වේ ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: සතර ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසිවකුත් හා විප්‍රයුක්ත වේ.

7. චක්ෂුර්විඥාන ධාතුව ... මනො ධාතුව, මනො විඥාන ධාතුව තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා කිසිවකුත් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධයන් හා සමග විප්‍රයුක්ත වේද යත්: එක් ස්කන්ධයක් හා සමග, දස ආයතනයන් හා සමග, සොළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුත් හා විප්‍රයුක්ත වේ.

8. සමුදය සත්‍යය, මාර්ග සත්‍යය, තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තවෙයි. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනෙකුත් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුත් හා විප්‍රයුක්ත වේ.

9. නිරොධ සත්‍යය චක්ෂුරින්ද්‍රියය ... කායින්ද්‍රියය, ඉත්ථීන්ද්‍රියය පුරිසින්ද්‍රියය සම්ප්‍රයුක්ත වේ ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: සතර ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනෙකුත් හා විප්‍රයුක්ත වේ.

10. මනින්ද්‍රියං -පෙ- තීහි ඛන්ධෙහි සම්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතීහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

11. සුඛින්ද්‍රියං -පෙ- දුක්ඛින්ද්‍රියං - සොමනස්සින්ද්‍රියං - දොමනස්සින්ද්‍රියං- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතීහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

12. උපෙක්ඛින්ද්‍රියං -පෙ- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන ඡහි ධාතූහි සම්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතීහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

13: සද්ධින්ද්‍රියං -පෙ- විරියින්ද්‍රියං- සතින්ද්‍රියං-සමාධින්ද්‍රියං -පඤ්ඤින්ද්‍රියං- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං - අඤ්ඤින්ද්‍රියං - අඤ්ඤාතාවින්ද්‍රියං - අවිජ්ජා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරා - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතීහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

10. මනින්ද්‍රිය තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙයි. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්මකෙනෙකුන් හා විප්‍රයුක්ත වේ.

11. සුඛින්ද්‍රිය...දුක්ඛින්ද්‍රිය...සොමනස්සින්ද්‍රිය...දෞමනස්සින්ද්‍රිය–තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

12. උපෙක්ඛින්ද්‍රිය... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග ෂඩ් ධාතූන් හා සමග සම්ප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග එකොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

13. සද්ධින්ද්‍රිය...විරියින්ද්‍රිය...සතින්ද්‍රිය...සමාධින්ද්‍රිය...පඤ්ඤින්ද්‍රිය–අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය–අඤ්ඤින්ද්‍රිය – අඤ්ඤාතාවින්ද්‍රිය–අවිද්‍යාව–අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයෝ – තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනෙකුන් හා සම්ප්‍රයුක්තයෝ ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්තයහ. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනෙකුන් හා විප්‍රයුක්ත වෙත්.

14, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- තීහි ඛන්ධෙහි සම්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

15. සළායතනපච්චයා ඵස්සො -පෙ- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තො. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

16. ඵස්සපච්චයා වෙදනා -පෙ- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

17. වෙදනාපච්චයා තණ්හා -පෙ- තණ්හා පච්චයා උපාදානං- කම්මභවො – තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තො, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

14. සංස්කාරප්‍රත්‍යයෙන් වූ විඥානය... තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වන්නේ ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතුන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

15. ෂඩායතනප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතුන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

16. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වූ වේදනාව... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතුන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

17. වෙදනාප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව...තෘෂ්ණාප්‍රත්‍යයෙන් වූ උපාදානය–කර්මභවය– තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමහ එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

18. රූපභවො -පෙ- සම්පයුත්තොති: නත්ථි.

කතිහි විප්පයුත්තො: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි තීහි ධාතූහි විප්පයුත්තො.

19. අරූපභවො -පෙ- නෙවසඤ්ඤා නාසඤ්ඤාභවො - චතුවොකාර භවො - සම්පයුත්තොති: නත්ථි.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

20. අසඤ්ඤාභවො -පෙ- එකවොකාර භවො - පරිදෙවො - සම්පයුත්තොති: නත්ථි.

කතිහි විප්පයුත්තො: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

21. සොකො -පෙ- දුක්ඛං-දොමනස්සං - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

22. උපායාසො -පෙ- සතිපට්ඨානං - සම්මප්පධානං - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තං. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

18. රූපභවය ... සම්ප්‍රයුක්ත වේ ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් හා සමග කිසි ආයතන කෙනෙකුන් හා සමග විප්‍රයුක්ත නො වෙයි. තුන් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙයි.

19. අරූපභවය ... නේවසඤ්ඤානාසඤ්ඤාභවය ... චතුවොකාර භවය ... සම්ප්‍රයුක්ත වේද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනෙකුන් හා විප්‍රයුක්ත වේ.

20. අසංඥභවය ... එකවෝකාරභවය ... පරිදේවය ... සම්ප්‍රයුක්ත වේ ද යත්: සම්ප්‍රයෝගයෙක් නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: සතර ස්කන්-ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග විප්‍ර-යුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

21. සෝකය, දුක්ඛය, දෞමනස්සය ... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

22. උපායාසය – සතිපට්ඨානය – සම්මප්පධානය ... තුන් ස්කන්ධ-යන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍ර යුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතු වක් හා සමග කිසි ධර්ම කෙනෙකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

23. ඉද්ධිපාදො -පෙ- ද්වීහි ඛන්ධෙහි සම්පයුත්තො. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො,

24. ඣානං -පෙ- ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තං. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තං, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

25. අප්පමඤ්ඤා -පෙ- පඤ්චින්ද්‍රියානි-පඤ්චබලානි-සත්තබොජ්ඣඞ්ගා- අරියො අට්ඨඞ්ගිකො මග්ගො - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තො. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

26. ඵස්සො -පෙ- චෙතනා - මනසිකාරො - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තො. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

23. ඉද්ධිපාදය ... ස්කන්ධ දෙකක් හා සමග සම්ප්‍රයුක්තය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

24. ධ්‍යානය – ස්කන්ධ දෙකක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

25. අප්‍රාමාණ්‍යයෝ පඤ්චෙන්ද්‍රියයෝ, පඤ්චබලයෝ, සප්තබොධ්‍යඞ්ගයෝ, ආයර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය ... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

26. ඵස්සය, චේතනාව, මනසිකාරය ... තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

27. වෙදනා -පෙ- සඤ්ඤා - තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

28. චිත්තං -පෙ- තීහි ඛන්ධෙහි සම්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තං.

කතිහි විප්පයුත්තං: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තං. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තං.

29. අධිමොක්ඛො -පෙ- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන ද්විහි ධාතූහි සම්පයුත්තො. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තො.

කතිහි විප්පයුත්තො: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තො. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තො.

30. කුසලා ධම්මා -පෙ- අකුසලා ධම්මා - කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

31. සුඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා -පෙ- දුක්ඛාය වෙදනාය සම්පයුත්තා ධම්මා - එකෙන ඛන්ධෙන සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

27. වේදනාව සංඥාව තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

28. චිත්තය ... තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයක් හා සමග දස ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වේ.

29. අධි මෝක්ෂය තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග ධාතු දෙකක් හා සමග සම්ප්‍රයුක්ත ය. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වේ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වේ ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග පසළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්තවේ.

30. කුශලධර්මයෝ, අකුශල ධර්මයෝ, කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

31. සුඛ වේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ, දුඃඛ වේදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ – එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග පසළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

32. අදුක්ඛමසුඛාය වේදනාය සම්පයුත්තා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

33. විපාකා ධම්මා -පෙ- සම්පයුත්තා'ති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

34. විපාකධම්මධම්මා -පෙ- සංකිලිට්ඨසංකිලෙසිකා ධම්මා - සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

35. නෙව විපාකනවිපාකධම්මධම්මා -පෙ- අනුපාදින්නුපාදනියා ධම්මා - සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

36. අනුපාදින්නඅනුපාදනියා ධම්මා -පෙ- අසංකිලිට්ඨඅසංකිලෙසිකා ධම්මා - සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතූහි විප්පයුත්තා.

32. අදුක්ඛමසුඛවේදනා ව හා සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග එකොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

33. විපාක ධර්මයෝ – සම්ප්‍රයුක්ත වෙත් ද යත්: සම්ප්‍රයුක්තයෝ නැති.

කෙතෙක් ස්කන්ධයන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග දස ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

34. විපාකස්වභාව ධර්මයෝ – සංක්ලිෂ්ට සාංක්ලේශික ධර්මයෝ– සම්ප්‍රයුක්ත වෙත් ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

35. නො මැ විපාක වූ විපාක ස්වභාව ධර්ම නො වූවාහු ... අනුපාදින්න අනුපාදනිය ධර්මයෝ සම්ප්‍රයුක්ත වෙත් ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා සමග කිසි ආයතන කෙනකුන් හා සමග විප්‍රයුක්ත නො වෙති. පඤ්ච ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙත්.

36. අනුපාදින්න අනුපාදනිය ධර්මයෝ – අසංකලිෂ්ට අසාංක්ලෙශික ධර්මයෝ — සම්යුක්ත වෙත් ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා සමග කිසි ආයතන කෙනකුන් හා සමග විප්‍රයුක්ත නො වෙති. ෂඩ් ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙත්.

37. සවිතක්කසවිචාරා ධම්මා-පෙ-එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

38. අවිතක්කවිචාරමත්තා ධම්මා -පෙ- පීති සහගතා ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

39. අවිතක්කඅවිචාරා ධම්මා -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා විප්පයුත්තා.

40. සුඛසහගතා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

41. උපෙක්ඛාසහගතා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

37. සවිතර්ක සවිචාර ධර්මයෝ ... එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග පසළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

38. අවිතර්ක විචාරමාත්‍ර ධර්මයෝ – ප්‍රීතිසහගත ධර්මයෝ – එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්-ධයක් හා සමග දස ආයතනයන් හා සමග සොළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

39. අවිතර්ක අවිචාර ධර්මයෝ – සම්ප්‍රයුක්ත වෙත් ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් හා සමග කිසි ආයතන කෙනකුන් හා සමග විප්‍ර-යුක්ත නො වෙති එක් ධාතුවක් හා සමග විප්‍රයුක්ත වෙත්.

40. සුඛසහගත ධර්මයෝ ... එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා සමග දස ආයතනයන් හා සමග පසළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

41. උපෙක්ෂා සහගත ධර්මයෝ... එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍ර යුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයක් හා සමග එකොළොස් ධාතුන් හා සමග විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

42. දස්සනෙන පහාතබ්බා ධම්මා -පෙ- භාවනාය පහාතබ්බා ධම්මා- දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා- ආචයගාමිනො ධම්මා - අපචයගාමිනො ධම්මා - සෙක්ඛා ධම්මා- අසෙක්ඛා ධම්මා-මහග්ගතා ධම්මා-සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

43. අප්පමාණා ධම්මා -පෙ- පණීතා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතූහි විප්පයුත්තා.

44. පරිත්තාරම්මණා ධම්මා -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

45. මහග්ගතාරම්මණා ධම්මා -පෙ- අප්පමාණාරම්මණා ධම්මා- හීනා ධම්මා- මිච්ඡත්තනියතා ධම්මා- සම්මත්තනියතා ධම්මා- මග්ගාරම්මණා ධම්මා- මග්ගහෙතුකා ධම්මා- මග්ගාධිපතිනො ධම්මා- සම්පයුත්තා'ති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

46. අනුප්පන්නා ධම්මා -පෙ- සම්පයුත්තා'ති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

42. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ ... භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ - දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ - භාවනාවෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ-ආචයගාමී ධර්මයෝ-අපචයගාමී ධර්මයෝ-ශෛක්ෂ ධර්මයෝ-අශෛක්ෂ ධර්මයෝ - මහද්ගත ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

43. අප්‍රමාණ ධර්මයෝ... ප්‍රණීත ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. ෂඩ් ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

44. පරිත්තාලම්බන ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

45. මහද්ගතාලම්බන ධර්මයෝ...අප්‍රමාණාලම්බන ධර්මයෝ-හීන ධර්මයෝ-මිථ්‍යාත්ව නියත ධර්මයෝ-සම්‍යක්ත්ව නියත ධර්මයෝ-මාර්ගාලම්බන ධර්මයෝ-මාර්ගහේතුක ධර්මයෝ - මාර්ගාධිපති ධර්මයෝ ... සම්ප්‍රයුක්ත වෙත් ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

46. අනුත්පන්න ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත වෙති. පඤ්ච ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

47. අතීතාරම්මණා ධම්මා -පෙ- අනාගතාරම්මණා ධම්මා – සම්ප-යුත්තාති: නත්‍ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප යුත්තා.

48. පච්චුප්පන්නාරම්මණා ධම්මා -පෙ- අජ්ඣත්තාරම්මණා ධම්මා- බහිද්ධාරම්මණා ධම්මා- අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා- සම්පයුත්තාති: නත්‍ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

49. සනිදස්සනසප්පටිඝා ධම්මා -පෙ- අනිදස්සනසප්පටිඝා ධම්මා- සම්පයුත්තාති: නත්‍ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

50. හෙතූ ධම්මා–පෙ– හෙතූචෙ'ව සහෙතුකා ච ධම්මා- හෙතූ-චෙ'ව හෙතුසම්පයුත්තා ච ධම්මා- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප යුත්තා.

51. සහෙතුකා ධම්මා -පෙ- හෙතුසම්පයුත්තා ධම්මා - සම්ප-යුත්තා'ති: නත්‍ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප-යුත්තා.

47. අතීතාලම්බන ධර්මයෝ ...අනාගතාලම්බන ධර්මයෝ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

48. ප්‍රත්‍යුත්පන්නාලම්බන ධර්මයෝ...අධ්‍යාත්මාලම්බන ධර්මයෝ– බාහ්‍යාලම්බන ධර්මයෝ – අධ්‍යාත්මබාහ්‍යාලම්බන ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

49. සනිදර්ශනසප්‍රතිඝ ධර්මයෝ ... අනිදර්ශනසප්‍රතිඝ ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සත්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

50. හේතු ධර්මයෝ...හේතු ද වූ මැ සහේතුක ද වූ ධර්මයෝ–හේතු ද වූ මැ හේතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයෝ-තුන් ස්කන්ධයන් හා එක් ආයතනයක් හා එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

51. සහේතුක ධර්මයෝ...හේතු සම්ප්‍රයුක්ත ධර්මයෝ-සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

52. සහෙතුකා චෙ'ව න ච හෙතු ධම්මා -පෙ- හෙතුසම්පයුත්තා චෙ'ව න ච හෙතු ධම්මා - න හෙතු සහෙතුකා ධම්මා - එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

53. අප්පච්චයා ධම්මා -පෙ- අසඞ්ඛතා ධම්මා - සනිදස්සනා ධම්මා- සප්පටිඝා ධම්මා- රූපිනො ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

54. ලොකුත්තරා ධම්මා -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතුහි විප්පයුත්තා.

55. ආසවා ධම්මා -පෙ- ආසවා චෙ ච සාසවා ච ධම්මා- ආසවා චෙව ආසවසම්පයුත්තා ච ධම්මා- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතුහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

56. අනාසවා ධම්මා -පෙ- ආසවවිප්පයුත්තා අනාසවා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතුහි විප්පයුත්තා.

52. සහේතුක ද වූ මැ නො ද හේතු වූ ධර්මයෝ ... හේතු සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හෙතු වූ ධර්මයෝ–හේතු නොවූ සහෙතුක ධර්මයෝ–එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

53. අප්‍රත්‍යය ධර්මයෝ...අසඞ්ඛත ධර්මයෝ- සනිදර්ශන ධර්මයෝ–සප්‍රතිඝ ධර්මයෝ - රූපී ධර්මයෝ – සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

54. ලෝකෝත්තර ධර්මයෝ – සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. ෂඩ් ධාතුන් හා විප්‍රයුක්ත වෙත්.

55. ආස්‍රව ධර්මයෝ ... ආස්‍රව ද වූ මැ සාස්‍රව ද වූ ධර්මයෝ–ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත වූ ධර්මයෝ – තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

56. අනාස්‍රව ධර්මයෝ ... ආස්‍රවවිප්‍රයුක්තඅනාස්‍රව ධර්මයෝ ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධයක් හා කිසි ආයතනයක් හා විප්‍රයුක්ත නො වෙති. ෂඩ් ධාතුන් හා විප්‍රයුක්ත වෙත්.

57. ආසවසම්පයුත්තා ධම්මා -පෙ සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනා'යතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප යුත්තා.

58. ආසවසම්පයුත්තා චෙව නො ච ආසවා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප-යුත්තා.

59. සඤ්ඤොජනා ධම්මා -පෙ- ගන්ථා ධම්මා- ඔඝා ධම්මා- යොගා ධම්මා- නීවරණා ධම්මා- පරාමාසා ධම්මා- පරාමාසා චෙව පරාමට්ඨා ච ධම්මා- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා,

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

60. අපරාමට්ඨා ධම්මා -පෙ- පරාමාසවිප්පයුත්තා අපරාමට්ඨා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතූහි විප්පයුත්තා.

61. පරාමාසසම්පයුත්තා ධම්මා පෙ- එකෙන ඛන්ධෙන එකෙ-නායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්ප-යුත්තා.

57. ආශ්‍රව සම්ප්‍රයුක්ත ධර්මයෝ - සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයක් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

58. ආශ්‍රවසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආශ්‍රව වූ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

59. සංයෝජන ධර්මයෝ... ග්‍රන්ථ ධර්මයෝ- ඕඝ ධර්මයෝ- යොග ධර්මයෝ- නීවරණ ධර්මයෝ- පරාමර්ශ ධර්මයෝ- පරාමර්ශ ද වූ ම පරාමෘෂ්ට ද වූ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

60. අපරාමෘෂ්ට ධර්මයෝ... පරාමර්ශ විප්‍රයුක්ත වූ අපරාමෘෂ්ට ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. ෂඩ්ධාතුන් හා විප්‍රයුක්ත වෙත්.

61. පරාමර්ශ සම්ප්‍රයුක්ත ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

62. සාරම්මණා ධම්මා -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

63. අනාරම්මණා ධම්මා -පෙ- චිත්තවිප්පයුත්තා ධම්මා- චිත්තවිසංසට්ඨා ධම්මා: උපාදා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

64. චිත්තා ධම්මා -පෙ- තීහි ඛන්ධෙහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

65. චෙතසිකා ධම්මා -පෙ- චිත්ත සම්පයුත්තා ධම්මා- චිත්තසංසට්ඨා ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානා ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානා සහභුනො ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තිනො ධම්මා- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

66. අනුපාදින්නා ධම්මා -පෙ- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

62. සාලම්බන ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

63. අනාලම්බන ධර්මයෝ... චිත්ත විප්‍රයුක්ත ධර්මයෝ– චිත්ත විසංසෘෂ්ට ධර්මයෝ– උපාද ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

64. චිත්ත ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සම්ප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයක් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

65. චෛතසික ධර්මයෝ .. චිත්තසම්ප්‍රයුක්ත– ධර්මයෝ චිත්ත සංසෘෂ්ට ධර්මයෝ– චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයෝ– චිත්තසංසෘෂ්ට සමුත්ථානසහභූ ධර්මයෝ - චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති ධර්මයෝ එක් ස්කන්ධයක් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

66. අනුපාදින්න ධර්මයෝ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනෙකුන් හා විප්‍රයුක්ත නො වෙති. පඤ්ච ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

67. උපාදනා ධම්මා -පෙ- කිලෙසා ධම්මා- කිලෙසා චෙව සංකිලෙසිකා ච ධම්මා- කිලෙසා චෙ'ව සංකිලිට්ඨා ච ධම්මා- කිලෙසා චෙව කිලෙසසම්පයුත්තා ච ධම්මා- තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

68. අසංකිලෙසිකා ධම්මා -පෙ- කිලෙසවිප්පයුත්තා අසංකිලෙසිකා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

69. සංකිලිට්ඨා ධම්මා -පෙ- කිලෙසසම්පයුත්තා ධම්මා-සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

70. සංකිලිට්ඨා චෙ'ව නො ච කිලෙසා ධම්මා -පෙ- කිලෙසසම්පයුත්තා චෙව නො ච කිලෙසා ධම්මා- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන ඒකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

71. දස්සනෙන පහාතබ්බා ධම්මා -පෙ- භාවනාය පහාතබ්බා ධම්මා- දස්සනෙන පහාතබ්බහෙතුකා ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

67. උපාදාන ධර්මයෝ... ක්ලේශ ධර්මයෝ- ක්ලේශ ද වූවාහු මැ සාංක්ලේශික ද වූ ධර්මයෝ- ක්ලේශ ද වූවාහු මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයෝ- ක්ලේශ ද වූවාහු මැ ක්ලේශ සම්ප්‍රයුක්තද වූ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්ත වෙත්. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

68. අසාංක්ලෙශික ධර්මයෝ... ක්ලෙශවිප්‍රයුක්ත අසාංක්ලෙශික ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. ෂඩ් ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

69. සංක්ලිෂ්ට ධර්මයෝ... ක්ලේශසම්ප්‍රයුක්තධර්මයෝ සම්ප්‍රයුක්ත යෝද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

70. සංක්ලිෂ්ට ද වූවාහු මැ නො ද ක්ලේශ ද වූ ධර්මයෝ... ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූවාහු මැ නො ද ක්ලේශ වූ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

71. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ... භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයෝ- දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ- භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

72. සවිතක්කා ධම්මා -පෙ- සවිචාරා ධම්මා - එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

73. අවිතක්කා ධම්මා -පෙ- අවිචාරා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.
කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා විප්පයුත්තා.

74. සප්පීතිකා ධම්මා -පෙ- පීතිසහගතා ධම්මා- එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා: එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

75. සුඛ සහගතා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන සම්පයුත්තා: එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.[1]

76. උපෙක්ඛා සහගතා ධම්මා -පෙ- එකෙන ඛන්ධෙන සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

1. සුඛසහගතා ධම්මා -පෙ- කෙහිචි විප්පයුත්තා - PTS ඌනං.

72. සවිතර්ක ධර්මයෝ... සවිචාර ධර්මයෝ... එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

73. අවිතර්ක ධර්මයෝ, අවිචාර ධර්මයෝ... සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

74. සප්‍රීතික ධර්මයෝ - ප්‍රීතිසහගත ධර්මයෝ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

75. සුඛසහගත ධර්මයෝ... එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

76. උපේක්ෂා සහගත ධර්මයෝ... එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා එකොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

77. න කාමාවචරා ධම්මා -පෙ- අපරියාපන්නා ධම්මා- අනුත්තරා ධම්මා- සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

78. රූපාවචරා ධම්මා -පෙ- අරූපාවචරා ධම්මා- නියානිකා ධම්මා- නියතා ධම්මා- සරණා ධම්මා- කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

ධම්මායතනං ධම්මධාතු දුක්ඛසච්චඤ්ච ජීවිතං,
සළායතනං නාමරූපං චත්තාරො ච මහාභවා,
ජාති ජරා ච මරණං තිකෙසෙවනූනවීසති,
ගොච්ඡකෙසු ච පඤ්ඤාස අට්ඨචූළන්තරෙ[1] පද
මහන්තරෙ පණ්ණරස අට්ඨාරස තතො පරෙ,
තෙ වීසපදසතං එතං සම්පයොගෙ න ලබ්භතීති.

**සම්පයොග විප්පයොගපදනිද්දෙසො නිට්ඨිතො.**

1. චූලන්තරෙ - මජසං

77. කාමාවචර නොවූ ධර්මයෝ... අපයඨාපන්න ධර්මයෝ... අනුත්තර ධර්මයෝ සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, ෂඩ් ධාතුන් හා විප්‍රයුක්ත වෙත්.

78. රූපාවචර ධර්මයෝ... අරූපාවචර ධර්මයෝ... නෛයඨාණික ධර්මයෝ- නියත ධර්මයෝ- සරණ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතුන් හා සමග සම්ප්‍රයුක්තයෝ ද යත්: නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

උද්දානය:

ධර්මායතන යැ ධර්මධාතු යැ දුඃඛසත්‍යයැ ජීවිතින්ද්‍රිය යැ ෂඩායතන යැ නාම රූප යැ මහාභව සතර යැ ජාති යැ ජරා යැ මරණ යැ යි තික පදයන් අතුරෙහි එකුන් විසි පදයෝ ද, ගොච්ඡකයන්හි පණස් පදයෝ ද, චූළන්තරදුකයෙහි අටපදයෝ ද, මහන්තර දුකයෙහි පසළොස් පදයෝ ද, ඉන් මතුයෙහි පිට්ඨිදුකයෙහි අටළොස් පදයෝ ද යන තෙල එක්සිය තෙවිසි පදයෝ සම්ප්‍රයෝග (විප්‍රයොගක්‍රම) යෙහි නො ලැබෙත්.

**සම්ප්‍රයෝග විප්‍රයෝග පද නිර්දේශ නිමි.**

## 7. සම්පයුත්තෙන විප්පයුත්තපදනිද්දෙසො

1. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා -විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා- මනායතනෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙ ධම්මා කතිහි ඛන්ධෙහි, කතිහායතනෙහි, කතිහි ධාතූහි විප්පයුත්තා:

තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

2. චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා -පෙ- මනොධාතුයා යෙ ධම්මා- මනොවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා විප්පයුත්තා.

3. මනින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

4. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි, න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

5. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා -පෙ- සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා- ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා,- ඵස්සෙන යෙ ධම්මා- වෙදනාය යෙ ධම්මා- සඤ්ඤාය යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- චිත්තෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

## 7. සම්ප්‍රයුක්තයෙන් විප්‍රයුක්තපදනිර්දේශය

1. වෙදනා ස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥා ස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්- සංස්කාරස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්- විඥානස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්- මනායතනය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා කෙතෙක් ආයතනයන් හා කෙතෙක් ධාතූන් හා විප්‍රයුක්ත වෙත් ද යත්:

ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්තධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්මයන් හා විප්‍රයුක්ත වෙත්.

2. චක්ඛුර්විඥාන ධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් ... මනො ධාතුව හා සමග යම් ධර්ම කෙනෙක්- මනොවිඥාන ධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

3. මනින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම්, ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනෙකුන් හා විප්‍රයුක්ත වෙත්.

4. උපෙක්ඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්මකෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, පඤ්ච ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

5. සංස්කාර ප්‍රත්‍යයෙන් වූ විඥානය හා සමග යම් ධර්ම කෙනෙක්... ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක්-ස්පර්ශ ප්‍රත්‍යයෙන් වූ වෙදනාව හා සමග යම් ධර්ම කෙනෙක්- ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක්- වේදනාව හා සමග යම් ධර්ම කෙනෙක්-සංඥාව හා සමග යම් ධර්ම කෙනෙක්- චෙතනාව හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තය හා සමග යම් ධර්ම කෙනෙක්- මනසිකාරය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

6. අධිමොක්ඛෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා විප්පයුත්තා.

7. අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතුහි විප්පයුත්තා.

8. සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා විප්පයුත්තා.

9. චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨ සමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

10. සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා -පෙ- න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා විප්පයුත්තා.

11. උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි විප්පයුත්තා: තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

ඛන්ධා චතුරො ආයතනඤ්චෙකං
ධාතුසු සත්ත ද්වෙ පි ච ඉන්ද්‍රියතො[1]
තයො පටිච්ච තථ'රිව[2] ඵස්සපඤ්චමා
අධිමුච්චනා මනසි තිකෙසු තීණි.
සත්තන්තරා[3] ද්වෙ ච මනෙන යුත්තා-
විතක්ක විචාරණා උපෙක්ඛාය චා ති[4]

**සම්පයුත්තෙන විප්පයුත්තපදනිද්දෙසො නිට්ඨිතො.**

1. ඉන්ද්‍රියානො - PTS
2. තයො පටිච්චත්ථ'රිව - PTS
3. පුත්තන්තරා - PTS
4. උපෙක්ඛතායචාති - PTS

6. අධිමොක්ෂය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

7. අදුක්ඛමසුඛ වෙදනා හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

8. සවිතර්ක සවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

9. චිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– චෛතසික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– චිත්ත සම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්මකෙනෙක් - චිත්තසංසෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තසංසෘෂ්ටසමුත්ථාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තසංසෘෂ්ටසමුත්ථාන සහභූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්තධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

10. සවිතර්ක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්, සවිචාර ධර්මයන් සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වෙත් ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති. එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

11. උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්... සම්ප්‍රයුක්ත වෙත් ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා කෙතෙක් ආයතනයන් හා කෙතෙක් ධාතුන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, පඤ්ච ධාතුන් හා විප්‍රයුක්ත වෙත්.

සතර නාමස්කන්ධයෝ යැ එක් මැ මනායතන යැ ධාතුන් අතුරෙන් සප්ත විඥාන ධාතු යැ ඉන්ද්‍රියයන් අතුරෙන් ඉන්ද්‍රියයෝ දෙදෙනෙකැ පටිච්චසමුප්පාදඞ්ගයෝ තුන් දෙනෙකැ එසේ ම ස්පර්ශය පස්වනු කොට ඇති පදයෝ යැ අධිමොක්ෂයැ මනස්කාර යැ ත්‍රික මාතෘකා පදයන් අතුරෙන් පද තුනෙකැ මහන්තර දුකයෙන් පදයෝ සත් දෙනෙකැ, මනො ධාතුව හා සමග සම්ප්‍රයුක්ත වූ (විතර්ක විචාර පදය හා සවිතර්ක සවිචාර යන) දෙපද යැ උපෙක්ෂා සම්ප්‍රයුක්ත (පදය යන මේ පදයෝ මෙහි වෙති.)

**සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පදනිර්දේශය නිමි.**

## 8. විප්පයුත්තෙන සම්පයුත්ත පද නිද්දෙසො

1. රූපක්ඛන්ධෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

2. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා- විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා- සරණෙහි ධම්මෙහි යෙ ධම්මා- අරණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

ධම්මායතන ධම්මධාතු අථ ජීවිත නාමරූපං,
සළායතනං ජාති ජරා මරණං[1] දෙව මාතිකෙ න ලබ්භරෙ.
පඨමන්තරෙ සත්ත ච ගොච්ඡකෙ දස අපරන්තෙ.
චුද්දස ඡ ච මජ්ඣෙ ඉච්චෙතෙ සත්තචත්තාළීස ධම්මා,
සමුච්ඡෙදෙ න ලබ්භන්ති මොඝපුච්ඡකෙන ච.

**විප්පයුත්තෙන සම්පයුත්ත පද නිද්දෙසො නිට්ඨිතො.**

1. මතං - මජසං බුද්දස ච - සීවීමු

## 8. විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිර්දේශය

1. රූපස්කන්ධය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: (සම්ප්‍රයොග-යෙක්) නැති.

2. වේදනාස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්... සංඥා ස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්- සංස්කාර ස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්- විඥාන ස්කන්ධය හා යම් ධර්ම කෙනෙක් — සරණ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්- අරණ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් නම්, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා කෙතෙක් ආයතනයන් හා කෙතෙක් ධාතූන් හා සම්ප්‍රයුක්තයෝ ද යත්: (සම්ප්‍රයොගයෙක්) නැති.

උද්දානය:

ධර්මායතන යැ ද ධර්මධාතු යැ යළි ජීවිතේන්ද්‍රිය'යැ නාම රූප යැ ෂඩායතන යැ ජාතියැ ජරා යැ මරණ යැ (ත්‍රිකදුක) මාතෘකායෙහි දෙ පදයෙකැ පළමුවන චූල්ලන්තර දුකයෙහි සත් වැදෑරුම් වූ පදයෝ යැ ගොච්ඡකයෙහි දස පදයෙකැ අන්‍ය වූ මහන්තර දුකයෙහි තුදුස් පද යැ මත්තෙහි පිට්ඨිදුක-යෙහි සපදයෙකැ යන මේ සත්සාළිසක් ප්‍රභෙද ගත වූ (අෂ්ට) පදයෝ මොසපුච්ඡක නම් වූ මේ නිර්දෙශය හා සමග සමුච්ඡෙද නම් වූ චූද්දසම නය නිර්දෙශයෙහි නො ලැබෙත්.

**විප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිර්දේශය නිමි.**

## 9. සම්පයුත්තෙන සම්පයුත්තපදනිද්දෙසො

1. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා – පෙ – සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා – සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා. තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා: තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

2. විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා – පෙ – මනායතනෙන යෙ ධම්මා – චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා – මනොධාතුයා යෙ ධම්මා – මනොවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා – පෙ – තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

3. සමුදයසච්චෙන යෙ ධම්මා –පෙ– මග්ගසච්චෙන යෙ ධම්මා –පෙ– සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා – පෙ – තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

4. මනින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා – පෙ - තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායත-නෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

5. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා – පෙ – දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා – සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා – දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා, සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා.

6. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන ඡහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

## 9. සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පදනිර්දේශය

1. වෙදනාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්– සංස්කාරස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ද යත්: ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග, එක් ආයතනයක් හා සමග, සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත යෝ යි.

2. විඥානස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...මනායතනය හා සමග යම් ධර්ම කෙනෙක්– චක්ෂුර්විඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් ... මනොධාතුව හා සමග යම් ධර්ම කෙනෙක්– මනොවිඥාන ධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

3. සමුදය සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක්...මාර්ග සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

4. මනින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්.. ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

5. සුඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්...දුක්ඛිනද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–සොමනස්සිනද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්– දෙමනස්-සින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම් ... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයෝ යි.

6. උපෙක්ඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග ෂඩ් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත යහ. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

7. සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- විරියින්ද්‍රියෙන යෙ ධම්මා- සතින්ද්‍රියෙන යෙ ධම්මා – සමාධින්ද්‍රියෙන යෙ ධම්මා – පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා – අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා – අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා – අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා – අවිජ්ජාය යෙ ධම්මා – අවිජ්ජා පච්චයා සඞ්ඛාරෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

8. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

9. සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

10. ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

11. වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා -පෙ- තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා – කම්මභවෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

7. සද්ධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්...විරියින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්-සතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්-සමාධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්- පඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්-අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්-අඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්- අඤ්ඤාතාවින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්-අවිද්‍යාව හා සමග යම් ධර්ම කෙනෙක්-අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක්ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

8. සංස්කාර ප්‍රත්‍යයෙන් වූ විඥානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

9. ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශ හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්තධාතුන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

10. ස්පර්ශප්‍රත්‍යයෙන් වූ වේදනාව සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

11. වේදනාප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව හා සමග යම් ධර්ම කෙනෙක්... තෘෂ්ණාප්‍රත්‍යයෙන් වූ උපාදානය හා සමග යම් ධර්ම කෙනෙක්-කර්මභවය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන්. හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

12. සොකෙන යෙ ධම්මා -පෙ- දුක්ඛෙන යෙ ධම්මා-දෙමනස්සෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

13. උපායාසෙන යෙ ධම්මා -පෙ- සතිපට්ඨානෙන යෙ ධම්මා - සම්මප්පධානෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

14. ඉද්ධිපාදෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

15. ඣානෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, -පෙ- තෙ ධම්මා ද්වීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

16. අප්පමඤ්ඤාය යෙ ධම්මා -පෙ- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා - සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා - අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා සම්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

17. ඵස්සෙන යෙ ධම්මා -පෙ- චෙතනාය යෙ ධම්මා - මනසිකාරෙන යෙ ධම්මා සම්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා - පෙ - තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා,

12. ශෝකය හා සමග යම් ධර්ම කෙනෙක්...දුඃඛය හා සමග යම් ධර්ම කෙනෙක්–දෞර්මනස්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

13. උපායාසය හා සමග යම් ධර්ම කෙනෙක්...සතිපට්ඨානය හා සමග යම් ධර්ම කෙනෙක්– සම්මප්පධානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

14. ඉද්ධිපාදය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්..ඒ ධර්මයෝ ස්කන්ධ දෙකක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

15. ධ්‍යානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්..ඒ ධර්මයෝ ස්කන්ධ දෙකක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

16. අප්‍රමාණ්‍යය හා සමග යම් ධර්ම කෙනෙක්...පඤ්චෙන්ද්‍රියයන් හා සමග යම් ධර්ම කෙනෙක්–පඤ්ච බලයන් හා සමග යම් ධර්ම කෙනෙක්-සප්ත බොධ්‍යඞ්ගයන් හා සමග යම් ධර්ම කෙනෙක්–ආර්‍ය්‍ය අෂ්ටාංගිකමාර්ගය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

17. ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක්...චෙතනාව හා සමග යම් ධර්ම කෙනෙක්-මනසිකාරය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතුන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

18. වෙදනාය යෙ ධම්මා -පෙ- සඤ්ඤාය යෙ ධම්මා සම්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

19. විඤ්ඤාණෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

20. අධිමොක්ඛෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන ද්වීහි ධාතූහි සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

21. සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

22. සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - පීති සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

23. සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

18. වේදනාව හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥාව හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්තධාතූන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

19. චිත්තය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

20. අධිමොක්ෂය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග ධාතුදෙකක් හා සමග සම්ප්‍රයුක්තයහ. එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

21. සුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...දුක්ඛ වේදනාව හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–අදුක්ඛමසුඛවේදනාව හා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

22. සවිතර්කසවිචාර වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්... අවිතර්කවිචාරමාත්‍ර වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–ප්‍රීති සහගත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්තවූවාහු නම් ..ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

23. සුඛ සහගත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...උපේක්ෂා සහගත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

24. හෙතුහි ධම්මෙහි යෙ ධම්මා --පෙ– හෙතුහි චෙ'ව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා - හෙතුහි චෙ'ව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

25. සහෙතුකෙහි චෙ'ව න ච හෙතුහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතු සම්පයුත්තෙහි චෙව න ච හෙතුහි ධම්මෙහි යෙ ධම්මා - න හෙතුහි සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

26. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවෙහි චෙ'ව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා - ආසවෙහි චෙ'ව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

27. ආසවසම්පයුත්තෙහි චෙ'ව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

28. සඤ්ඤොජනෙහි -පෙ- ගන්ථෙහි- ඔඝෙහි – යොගෙහි- නීවරණෙහි – පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා – පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා –පෙ– තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

24. හේතු ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...හෙතු ද වූ මැ සහෙතුක ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-හෙතු ද වූ මැ හෙතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

25. සහේතුක ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...හෙතු සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-හෙතු නොවූ සහෙතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

26. ආශ්‍රවධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...ආශ්‍රව ද වූ මැ සාශ්‍රව ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ආශ්‍රව ද වූ මැ ආශ්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්තවූවාහු නම් ...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

27. ආශ්‍රවසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආශ්‍රව වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

28. සංයෝජන-ග්‍රන්ථ-ඔඝ-යොග-නීවරණ-පරාමර්ශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- පරාමාර්ශ ද වූ මැ පරාමෘෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

29. පරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

30. චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

31. චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්ත සංසට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨසමුට්ඨාන සහභූහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා.

32. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා - කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනා-යතනෙන එකාය ධාතුයා සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායත-නෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

33. සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසසම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා-සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා- සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා-පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

29. පරාමර්ශ සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

30. චිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

31. චෛතසික වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...චිත්ත සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්ත සංසෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-චිත්තසංසෘෂ්ටසමුත්ථාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්තයෝ යි.

32. උපාදාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...ක්ලේශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ සාංක්ලෙශික ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ ක්ලෙශ සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්ම යන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්තවූවාහු නම්... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

33. සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...ක්ලෙශ සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-සවිතර්ක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-සවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–සප්‍රීතික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් ප්‍රීති සහගත ධර්මයන් සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත යෝ යි.

34. සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහා'යතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා: තෙ ධම්මා එකෙන ඛන්ධෙන සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා,

අරූපක්ඛන්ධා චත්තාරො මනායතනමෙව ච,
විඤ්ඤාණධාතුයො සත්ත ද්වෙ සච්චා චුද්දසින්ද්‍රියා
පච්චයෙ ද්වාදසපද තතො උපරි සොළස,
තිකෙසු අට්ඨ ගොච්ඡකෙ තෙචත්තාරීසමෙව ච,
මහන්තරදුකෙ සත්ත පද පිට්ඨිදුකෙසු ඡ
නවමස්ස පදස්සෙත නිද්දෙසෙ සඞ්ගහං ගතා' ති.

සම්පයුත්තෙන සම්පයුත්ත පද නිද්දෙසො නිට්ඨිතො.

34. සුඛ සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්තයෝ ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්තයහ, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනෙකුන් හා සම්ප්‍රයුක්තයෝ යි.

උද්දානය:

සතර නාමස්කන්ධයෝ යැ, මනායතන යැ, සප්තවිඥානධාතු යැ, සත්‍ය දෙකෙකැ, තුදුස් ඉන්ද්‍රියයෝ යැ, පටිච්චසමුප්පාදයෙහි දෙළොස් පදයෝ යැ, ඉන් මත්තෙහි සොළොස් පදයෝ යැ, ත්‍රික මාතෘකායෙහි අට පදයෝ යැ, ගොච්ඡකයෙහි තෙසාළිස් පදයෝ යැ, මහන්තර දුකයෙහි සප්ත පදයෝ යැ, පිට්ඨිදුකයෙහි සපදයෝ යැ, යන මේ (එක් සිය විස්සක්) පදයෝ නව වැනි උද්දෙශයාගේ නිර්දේශයෙහි සංග්‍රහ වෙත්.

**සම්ප්‍රයුක්තයෙන් සම්ප්‍රයුක්ත පද නිර්දේශ නිමි.**

## 10. විප්පයුත්තෙන විප්පයුත්ත පදනිද්දෙසො

1. රූපක්ඛන්ධෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි විප්පයුත්තා: තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

2. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා– සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා– විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා– මනායතනෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

3. චක්ඛායතනෙන යෙ ධම්මා -පෙ- ඵොට්ඨබ්බායතනෙන යෙ ධම්මා– චක්ඛුධාතුයා යෙ ධම්මා- ඵොට්ඨබ්බධාතුයා යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

4. චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා -පෙ- මනොවිඤ්ඤාණ ධාතුයා යෙ ධම්මා–සමුදයසච්චෙන යෙ ධම්මා–මග්ගසච්චෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

5. නිරොධසච්චෙන යෙ ධම්මා -පෙ- චක්ඛුන්ද්‍රියෙන යෙ ධම්මා– කායින්ද්‍රියෙන යෙ ධම්මා– ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා– පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතන-නෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

## 10. විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පදනිර්දේශය

1. රූපස්කන්ධය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහුද ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා කෙතෙක් ආයතනයන් හා කෙතෙක් ධාතූන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්මයන් හා විප්‍රයුක්ත වෙත්.

2. වෙදනාස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්...සංඥාස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්-සංස්කාරස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්-විඥාන ස්කන්ධය හා යම් ධර්ම කෙනෙක්-මනායතනය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දසධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා එක් ධාතුවක් හා ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

3. චක්ඛායතනය හා යම් ධර්ම කෙනෙක් ... ඵොට්ඨබ්බායතනය හා යම් ධර්ම කෙනෙක්-චක්ඛු ධාතුව හා යම් ධර්ම කෙනෙක්-ඵොට්ඨබ්බ ධාතුව හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහුද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

4. චක්ඛුවිඤ්ඤාණධාතුව හා යම් ධර්ම කෙනෙක් ... මනොවිඤ්ඤාණ ධාතුව හා යම් ධර්ම කෙනෙක්-සමුදයසත්‍යය හා යම් ධර්ම කෙනෙක්-මාර්ගසත්‍යය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

5. නිරොධසත්‍යය හා යම් ධර්ම කෙනෙක්... චක්ඛුන්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්-කායින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්- ඉත්ථින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්-පුරිසින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

6. මනින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

7. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා –පෙ– දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා–සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා–දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

8. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

9. සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා - පෙ- විරියින්ද්‍රියෙන යෙ ධම්මා–සතින්ද්‍රියෙන යෙ ධම්මා–සමාධින්ද්‍රියෙන යෙ ධම්මා–පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා–අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා–අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා–අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා–අවිජ්ජාය යෙ ධම්මා–අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

10. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා –පෙ– සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා–ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

11. වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා –පෙ– තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා–කම්මභවෙන යෙ ධම්මා විප්පයුත්තා තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා –පෙ– තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

6. මනින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

7. සුඛින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් ... දුක්ඛින්ද්‍රිය හා යම් ධර්ම-කෙනෙක් - සොමනස්සින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් - දොමනස්සින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

8. උපෙක්ඛින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්ම-යන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා එකොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

9. සද්ධින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්...විරියින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් - සතින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් - සමාධින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්–පඤ්ඤින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්–අනඤ්ඤාතඤ්ඤස්සාමී-තින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක් - අඤ්ඤින්ද්‍රිය හා යම් ධර්ම කෙනෙක්–අඤ්ඤාතාවින්ද්‍රිය හා යම් ධර්මකෙනෙක්–අවිද්‍යාව හා යම් ධර්ම කෙනෙක්–අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

10. සංස්කාර ප්‍රත්‍යයෙන් වූ විඥානය හා යම් ධර්ම කෙනෙක්... ෂඩා-යතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය හා යම් ධර්ම කෙනෙක්–ස්පර්ශ ප්‍රත්‍යයෙන් වූ වෙදනාව හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්

11. වෙදනා ප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව හා යම් ධර්ම කෙනෙක්.. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වූ උපාදානය හා යම් ධර්ම කෙනෙක්- කර්මභවය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

12. රූපභවෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි තීහි ධාතූහි විප්පයුත්තා.

13. අසඤ්ඤභවෙන යෙ ධම්මා -පෙ- එකවොකාර භවෙන යෙ ධම්මා - පරිදෙවෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

14. අරූපභවෙන යෙ ධම්මා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤභවෙන යෙ ධම්මා- චතුවොකාරභවෙන යෙ ධම්මා- සොකෙන යෙ ධම්මා- දුක්ඛෙන යෙ ධම්මා- දොමනස්සෙන යෙ ධම්මා- උපායාසෙන යෙ ධම්මා- සතිපට්ඨානෙන යෙ ධම්මා- සම්මප්පධානෙන යෙ ධම්මා- ඉද්ධිපාදෙන යෙ ධම්මා- ඣානෙන යෙ ධම්මා- අප්පමඤ්ඤාය යෙ ධම්මා - පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

15. ඵස්සෙන යෙ ධම්මා -පෙ- වෙදනාය යෙ ධම්මා-සඤ්ඤාය යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- චිත්තෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

16. අධිමොක්ඛෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

12. රූපභවය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධයක් හා කිසි ආයතනයක් හා විප්‍රයුක්ත නො වෙති, තුන් ධාතු කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

13. අසඤ්ඤාභවය හා යම් ධර්ම කෙනෙක් ... එකවොකාරභවය හා යම් ධර්ම කෙනෙක් – පරිදේවය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

14. අරූපභවය හා යම් ධර්ම කෙනෙක්... නේවසඤ්ඤානාසඤ්ඤාභවය හා යම් ධර්ම කෙනෙක්– චතුවොකාරභවය හා යම් ධර්ම කෙනෙක්– සොකය හා යම් ධර්ම කෙනෙක්–දුක්ඛය හා යම් ධර්ම කෙනෙක්–දෞමනස්සය හා යම් ධර්ම කෙනෙක්–උපායාසය හා යම් ධර්ම කෙනෙක්–සතිපට්ඨානය හා යම් ධර්ම කෙනෙක්–සම්මප්පධානය හා යම් ධර්ම කෙනෙක්– ඉද්ධිපාදය හා යම් ධර්ම කෙනෙක්–ධ්‍යානය හා යම් ධර්ම කෙනෙක්– අප්පමඤ්ඤාව හා යම් ධර්ම කෙනෙක්–පඤ්චින්ද්‍රියයන් හා යම් ධර්ම කෙනෙක්–පඤ්චබලයන් හා යම් ධර්ම කෙනෙක්–සප්තබොධ්‍යඞ්ගයන් හා සමග යම් ධර්ම කෙනෙක්–ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

15. ස්පර්ශය හා යම් ධර්ම කෙනෙක් ... වේදනාව හා යම් ධර්ම කෙනෙක්–සංඥාව හා යම් ධර්ම කෙනෙක්–චෙතනාව හා යම් ධර්ම කෙනෙක්-චිත්තය හා යම් ධර්ම කෙනෙක්–මනසිකාරය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

16. අධිමොක්ෂය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු... නම් ඒ ධර්මයෝ එක්-ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

17. කුසලෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අකුසලෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

18. සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

19. අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

20. විපාකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

21. විපාකධම්මධම්මෙහි යෙ ධම්මා -පෙ- සංකිලිට්ඨසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

22. නෙවවිපාකනවිපාකධම්මධම්මෙහි යෙ ධම්මා -පෙ- අනුපාදින්නුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

23. අනුපාදින්නඅනුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසංකිලිට්ඨඅසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

17. කුශල ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අකුශල ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

18. සුඛවෙදනාව හා සමග සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...දුඃඛවෙදනාව හා සමග සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

19. අදුක්ඛමසුඛ වෙදනාව හා සමග සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහුද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්, ඒ ධර්මයෝ...එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා එකොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

20. විපාකධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

21. විපාකධර්මධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...සංක්ලිෂ්ට සාංක්ලෙශික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

22. නෙවවිපාකනවිපාකධර්මධර්මයන් හා යම් ධර්ම කෙනෙක්... අනුපාදින්නොපාදනීය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, පඤ්ච ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

23. අනුපාදින්න අනුපාදනිය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්... අසංක්ලිෂ්ට අසාංක්ලේශික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නොවෙති, ෂඩ් ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

24. සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

25. අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා. තෙහි ධම්මෙහි යෙ ධම්මා ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

26. අවිතක්කඅවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා විප්පයුත්තා.

27. සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

28. උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

29. දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- දස්සනෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- ආචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා- අපචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා- සෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා- අසෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා- මහග්ගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

24. සවිතර්ක සවිචාර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

25. අවිතර්කවිචාරමාත්‍ර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ප්‍රීති සහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

26. අවිතර්ක අවිචාර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

27. සුඛසහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

28. උපෙක්ඛා සහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා එකොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

29. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්... භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්–දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතුක වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතුක වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්–ආචයගාමී ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්–අපචයගාමී ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්– ශෛක්ෂ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්–අශෛක්ෂ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්–මහද්ගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

30. අප්පමාණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පණීතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි ඡහි ධාතූහි විප්පයුත්තා.

31. පරිත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

32. මහග්ගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අප්පමාණාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– හීනෙහි ධම්මෙහි යෙ ධම්මා– මිච්ඡත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා– සම්මත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා– මග්ගාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– මග්ගහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා$_7$ මග්ගාධිපතීහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

33. අනුප්පන්නෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

34. අතීතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අනාගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

35. පච්චුප්පන්නාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අජ්ඣත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– බහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා අජ්ඣත්තබහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

30. අප්‍රමාණ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ප්‍රණීත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ කිසි ස්කන්ධකෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, ෂඩ්ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

31. පරිත්තාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

32. මහග්ගතාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අප්‍රමාණාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හීන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-මිථ්‍යාත්වනියත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-සම්‍යක්ත්ව නියත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-මාර්ගාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-මාර්ග හේතුක ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් -මාර්ගාධිපති ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

33.. අනුත්පන්න ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, පඤ්චධාතූන් හා ද විප්‍රයුක්ත වෙත්.

34. අතීතාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අනාගතාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

35. ප්‍රත්‍යුත්පන්නාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්, අධ්‍යාත්මාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-බාහ්‍යාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-අධ්‍යාත්මබාහ්‍යාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

36. සනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

37. හෙතූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- හෙතුසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙ'ව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- සහෙතුකෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා හෙතු සම්පයුත්තෙහි චෙ'ව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා- න හෙතූහි සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

38. අප්පච්චයෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසඞ්ඛතෙහි ධම්මෙහි යෙ ධම්මා–සනිදස්සනෙහි ධම්මෙහි යෙ ධම්මා–සප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා- රූපීහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

39. ලොකුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

40. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහි චෙව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ආසවසම්පයුත්තෙහි චෙව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

36. සනිදර්ශන සප්‍රතිඝ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අනිදර්ශන සප්‍රතිඝ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

37. හේතුධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...සහේතුක ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හේතු සම්ප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හේතු ද වූ මැ සහේතුක ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් සහේතුක ද වූ මැ නො ද හේතු වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හේතු ද වූ මැ හේතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හේතුසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හේතු වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-හේතු නොවූ සහේතුක ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

38. අප්‍රත්‍යය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අසඞ්ඛත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-සනිදර්ශන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-සප්‍රතිඝ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-රූපිධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ...ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්තධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

39. ලෝකෝත්තර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත වෙති, ෂඞ්ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

40. ආස්‍රව ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ආස්‍රව සම්ප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ආස්‍රව ද වූ මැ සාස්‍රව ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආස්‍රව වූ ධර්ම-යන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආය-තනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

41. අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවවිප්පයුත්තෙහි අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

42. සඤ්ඤොජනෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ගන්ථෙහි ධම්මෙහි යෙ ධම්මා- ඕඝෙහි ධම්මෙහි යෙ ධම්මා-යොගෙහි ධම්මෙහි යෙ ධම්මා- නීවරණෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාස සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

43. අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පරාමාස විප්පයුත්තෙහි අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

44. සාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

45. අනාරම්මණෙහි[1] ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තවිසංසට්ඨෙහි[2] ධම්මෙහි යෙ ධම්මා උපාදාධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා

1. ආරම්මණෙහි -P.T.S.
2. චිත්තසංසට්ඨෙහි ධම්මෙහි—P.T.S.

41. අනාස්‍රවධර්මයන් හා යම් ධර්ම කෙනෙක් ..ආස්‍රව විප්‍රයුක්තවූ අනාස්‍රව ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන්, හා යම් ධර්මයක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නොවෙති. ෂඩ්ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

42. සංයෝජන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ග්‍රන්ථධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ඕඝධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-යොග ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-නීවරණ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-පරාමර්ශධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-පරාමර්ශසම්ප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-පරාමර්ශ ද වූ මැ පරාමෘෂ්ට ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

43. අපරාමෘෂ්ටධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...පරාමර්ශවිප්‍රයුක්ත අපරාමෘෂ්ටධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නොවෙති, ෂඩ්ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

44. සාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...චිත්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චෛතසික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්තසම්ප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්ත සංසෘෂ්ට ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්තසංසෘෂ්ටසමුත්ථානසහභූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්තසංසෘෂ්ටසමුත්ථානානුපරිවර්ති ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

45. අනාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...චිත්තවිප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-චිත්ත විසංසෘෂ්ට ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-උපාදාධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

46. අනුපාදින්නෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි විප්පයුත්තා.

47. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා,- කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසසම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

48. අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසවිප්පයුත්තෙහි අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

49. දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- දස්සනෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

50. සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

51. අවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා විප්පයුත්තා.

46. අනුපාදින්න ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු නම්.. ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, පඤ්චධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

47. උපාදාන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ක්ලේශ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...සංක්ලිෂ්ට ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ක්ලේශ සම්ප්‍රයුක්ත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ සාංක්ලේශික ද වූ ධර්මයන් හා යම් ධර්මකෙනෙක්-ක්ලේශ ද වූමැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහූ ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධය හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

48. අසාංක්ලේශික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ක්ලේශ විප්‍රයුක්ත අසාංක්ලේශික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහූද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, ෂඩ් ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

49. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...භාවනා යෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයන් හා යම් ධර්මකෙනෙක් භාවනායෙන් ප්‍රහාතව්‍ය හේතු ඇති ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දසආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

50. සවිතර්ක ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...සවිචාර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

51. අවිතර්ක ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අවිචාර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහූද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනෙකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, එක් ධාතුවක් හා විප්‍රයුක්ත වෙත්.

52. සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පීති සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

53. සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

54. උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි එකාදසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

55. න කාමාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අපරියාපන්නෙහි ධම්මෙහි යෙ ධම්මා - අනුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි විප්පයුත්තා.

56. රූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අරූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා - නිය්‍යානිකෙහි ධම්මෙහි යෙ ධම්මා - නියතෙහි ධම්මෙහි යෙ ධම්මා - සරණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි විප්පයුත්තා: තෙ ධම්මා එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

ධම්මායතනං ධම්මධාතු දුක්ඛසච්චඤ්ච ජීවිතං,
සළායතනං නාමරූපං චත්තාරො ච මහාභවා,
ජාති ජරා[1] මරණං තිකෙසෙවකුනවීසති,
ගොච්ඡකෙසු ච පඤ්ඤස අට්ඨ චූලන්තරෙ පද,
මහන්තරෙ පණ්ණරස අට්ඨාරස තතො පරෙ,
තෙ වීසති පදසතං එතං සම්පයොගෙ[2] න ලබ්භතී'ති

**විප්පයුත්තෙන විප්පයුත්තපදනිද්දෙසො නිට්ඨිතො.**

---

1. ජරා ච-මජසං 2. සම්පයොගො-සිරිමු

52. සප්‍රීතික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...ප්‍රීති සහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් සොළොස් ධාතුන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

53. සුඛ සහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

54. උපෙක්ෂා සහගත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ඒ ධර්මය හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්... ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා එකොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

55. කාමාවචර නො වූ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අපයර්‍යාපන්න ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්—අනුත්තර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම්...ඒ ධර්මයෝ කිසි ස්කන්ධ කෙනකුන් හා කිසි ආයතන කෙනකුන් හා විප්‍රයුක්ත නො වෙති, ෂඩ් ධාතූන් හා විප්‍රයුක්ත වෙත්.

56. රූපාවචර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්...අරූපාවචර ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්—නෛර්‍යාණික ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-නියත ධර්මයන් හා යම් ධර්ම කෙනෙක්-සරණ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු නම් ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා කෙතෙක් ආයතනයන් හා කෙතෙක් ධාතූන් හා විප්‍රයුක්තයෝ ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා සොළොස් ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

උද්දානය:

ධර්මායතන යැ, ධර්මධාතු යැ, දුඃඛසත්‍ය යැ, ජීවිත යැ, ෂඩායතන යැ, නාමරූප යැ, සතර මහාභවයෝ යැ, ජාතියැ, ජරා යැ, මරණ යැ, තික මාතෘකා පදයන් අතුරෙන් එකුන් විසි පද කෙනෙකැ, ගොච්ඡකයෙහි පනස් පද කෙනෙකැ, චූල්ලන්තර දුකයෙහි අටපදයෝ යැ මහන්තර දුකයෙහි පසළොස් පදයෝ යැ එයින් අන්‍ය පිට්ඨිදුකයෙහි අටළොස් පදයෝ යැ යන මේ එක් සිය තෙවිසි පදයෝ සම්ප්‍රයොගයෙහි නො ලැබෙත්.

විප්‍රයුක්තයෙන් විප්‍රයුක්ත පද නිර්දේශ නිමි.

## 11. සඞ්ගහිතෙන සම්පයුත්තවිප්පයුත්තපදනිද්දෙසො

1. සමුදයසච්චෙන යෙ ධම්මා -පෙ- මග්ගසච්චෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා:

තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා. එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

2. ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

3. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා - සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා - දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

# 11. සඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්තපදනිර්දේශය

1. සමුදය සත්‍යය විසින් යම් ධර්ම කෙනෙක්...මාර්ග සත්‍යය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සංග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ද යත්: ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහුය, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වූවාහුය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහු ය.

2. ඉත්ථින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්...පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ද යත්: සම්ප්‍රයුක්ත වූ ධර්ම කෙනෙක් නැත.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්තවූවාහු ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනය හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වූවාහුය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහු ය.

3. සුඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්...දුක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්...සොමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්...දෙමනස්සින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහුය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහුය.

4. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන ද්වීහි ධාතූහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

5. සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- විරියින්ද්‍රියෙන යෙ ධම්මා - සතින්ද්‍රියෙන යෙ ධම්මා - සමාධින්ද්‍රියෙන - යෙ ධම්මා - පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා - අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා - අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා - අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා - අවිජ්ජාය යෙ ධම්මා - අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙහි යෙ ධම්මා - සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා - වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා - තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා - කම්මභවෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

6. පරිදෙවෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා ආයතන සඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

4. උපෙක්ඛින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග ධාතු දෙකක් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ය. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද: යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා පසළොස් ධාතූන් හා විප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහු ය.

5. සද්ධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්...විරියින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–සතින්ද්‍රිය විසින් ධර්ම කෙනෙක්–සමාධින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–පඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–අඤ්ඤින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–අඤ්ඤාතාවින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්–අවිද්‍යාව විසින් යම් ධර්ම කෙනෙක්–අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයන් විසින් යම් ධර්ම කෙනෙක්–ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය විසින් යම් ධර්ම කෙනෙක්–වෙදනාප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව විසින් යම් ධර්ම කෙනෙක්–තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වූ උපාදනයන් විසින් යම් ධර්ම කෙනෙක්–කර්මභවය විසින් යම් ධර්ම කෙනෙක්–ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් සමග කිසි ධර්ම කෙනෙකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා ද විප්‍රයුක්ත වූවාහු ය.

6. පරිදේවය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධාදීන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ද යත්: සම්ප්‍රයුක්ත වූ ධර්ම කෙනෙක් නැත්තාහ.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්ත වූවාහු ද යත්: සතර ස්කන්ධයක් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා සමග ද විප්‍රයුක්ත වූවාහුය. එක් ආයතනයක් හා සමග ද එක් ධාතුවක් හා කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහු ය.

7. සොකෙන යෙ ධම්මා -පෙ- දුක්ඛෙන යෙ ධම්මා – දොමනස්සෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා; එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

8. උපායාසෙන යෙ ධම්මා -පෙ- සතිපට්ඨානෙන යෙ ධම්මා – සම්මප්පධානෙන යෙ ධම්මා – අප්පමඤ්ඤාය යෙ ධම්මා – පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා – පඤ්චහි බලෙහි යෙ ධම්මා–සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා:– අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා – ඵස්සෙන යෙ ධම්මා – චෙතනාය යෙ ධම්මා – අධිමොක්ඛෙන යෙ ධම්මා – මනසිකාරෙන යෙ ධම්මා – හෙතූහි ධම්මෙහි යෙ ධම්මා – හෙතූහි චෙව සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා – හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා – ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා – ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා – ආසවෙහි චෙව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා – සඤ්ඤොජනෙහි ධම්මෙහි යෙ ධම්මා– ගන්ථෙහි ධම්මෙහි යෙ ධම්මා – ඔඝෙහි ධම්මෙහි යෙ ධම්මා – යොගෙහි ධම්මෙහි යෙ ධම්මා–නීවරණෙහි ධම්මෙහි යෙ ධම්මා – පාරමාසෙහි ධම්මෙහි යෙ ධම්මා – උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා – කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා – කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා – කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා – කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන සඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන සඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන සඞ්ගහිතා. තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා: තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි සම්පයුත්තා, එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

දෙව සච්චා පණ්ණරසින්ද්‍රියා එකාදස පටිච්චපද,

උද්ධං පුන එකාදස ගොච්ඡකපදමෙත්ථ තිංසවිධා ති

**සඞ්ගහිතෙන සම්පයුත්ත විප්පයුත්තපදනිද්දෙසො නිට්ඨිතො.**

7. ශෝකය විසින් යම් ධර්ම කෙනෙක්...දුඃඛය විසින් යම් ධර්ම කෙනෙක්-දෞර්මනස්‍යය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද...ඒ ධර්මයෝ ස්කන්ධත්‍රයක් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු ය.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වූවාහු ය.

8. උපායාසය විසින් යම් ධර්ම කෙනෙක්...සතිපට්ඨානය විසින් යම් ධර්ම කෙනෙක්-සම්මප්පධානය විසින් යම් ධර්ම කෙනෙක්-අප්‍රාමාණ්‍යය විසින් යම් ධර්ම කෙනෙක්-පඤ්චෙන්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්-පඤ්චබලයන් විසින් යම් ධර්ම කෙනෙක්-සප්තබොධ්‍යඞ්ගයන් විසින් යම් ධර්ම කෙනෙක්-ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය විසින් යම් ධර්ම කෙනෙක්-ස්පර්ශය විසින් යම් ධර්ම කෙනෙක්-චෙතනාව විසින් යම් ධර්ම කෙනෙක්-අධිමොක්ෂය විසින් යම් ධර්ම කෙනෙක්-මනසිකාරය විසින් යම් ධර්ම කෙනෙක්-හේතු ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-හේතු ද වූ මැ සහේතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-හේතු ද වූ මැ හේතුසම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ආස්‍රවධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ආස්‍රවද වූ මැ සාස්‍රව ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සංයෝජන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ග්‍රන්ථධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ඔඝ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-යෝග ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-නීවරණ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-පරාමර්ශ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-උපාදානධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද වූ මැ සාංක්ලෙශික ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද වූ මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද වූ ක්ලෙශ සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ගෘහීත වූවාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහුද යත්:

ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ය, එක් ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වූවාහු යි.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වූවාහු ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන හා විප්‍රයුක්ත වූවාහු ය, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්තවූවාහුයි.

සත්‍යයෝ දෙදෙනා යැ, පසළොස් ඉන්ද්‍රියපදයෝ යැ, එකොළොස් ප්‍රතීත්‍ය සමුත්පාද පදයෝ යැ, යළි මතුයෙහි එකොළොස් පද යැ, තිස් වැදෑරුම් ගොච්ඡක පදයෝ යැ යන මොහු මෙහි වෙත්.

සඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පදනිර්දේශ නිමි.

## 12. සම්පයුත්තෙන සඞ්ගහිත අසඞ්ගහිතපදනිද්දෙසො

1. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා සම්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

2. විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා -පෙ- මනායතනෙන යෙ ධම්මා- චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා - මනොධාතුයා යෙ ධම්මා - මනොවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

3. සමුදයසච්චෙන යෙ ධම්මා -පෙ- මග්ගසච්චෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

4. මනින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

## 12. සම්ප්‍රයුක්තයෙන් සඞ්ගෘහීත අසඞ්ගෘහීතපදනිර්දේශය

1. වේදනාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...සංස්කාරස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

2. විඥානස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...මනායතනය හා සමග යම් ධර්ම කෙනෙක් චක්ඛුර්විඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් ... මනොධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් ... මනොවිඥාන ධාතුව හා යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

3. සමුදය සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක්...මාර්ග සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතනඑයක් විසින් ධාතුඑයක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

4. මනින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධඑයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

5. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා - සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා -දෙමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා; ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

6. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්විහායතනෙහි සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

7. සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- විරියින්ද්‍රියෙන යෙ ධම්මා- සතින්ද්‍රියෙන යෙ ධම්මා- සමාධින්ද්‍රියෙන යෙ ධම්මා- පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා- අවිජ්ජාය යෙ ධම්මා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

8. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

5. සුඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්...දුඃඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–සොමනස්සින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – දෞමනස්සින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද . . . ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

6. උපෙක්ඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද . . . ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් සප්ත ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් එකොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්

7. සද්ධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්...විරියින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–සතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් -සමාධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–පඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–අඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් අඤ්ඤාතාවින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–අවිද්‍යාව හා සමග යම් ධර්ම කෙනෙක් – අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද . . . ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

8. සංස්කාර ප්‍රත්‍යයෙන් වූ විඥානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද . . . ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

9. සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා සම්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

10. ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

11. වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා -පෙ- තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා– කම්මභවෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

12. සොකෙන යෙ ධම්මා -පෙ- දුක්ඛෙන යෙ ධම්මා- දෙමනස්සෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

13. උපායාසෙන යෙ ධම්මා -පෙ- සතිපට්ඨානෙන යෙ ධම්මා– සම්මප්පධානෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

14. ඉද්ධිපාදෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

9. ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

10. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වූ වේදනාව හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

11. වේදනා ප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව හා සමග යම් ධර්ම කෙනෙක්... තෘෂ්ණා ප්‍රත්‍යයෙන් වූ උපාදනය හා සමග යම් ධර්ම කෙනෙක්-කර්මභවය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

12. ශෝකය හා සමග යම් ධර්ම කෙනෙක්...දුඃඛය හා සමග යම් ධර්ම කෙනෙක්-දෞර්මනස්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

13. උපායාසය හා සමග යම් ධර්ම කෙනෙක්...සතිපට්ඨානය හා සමග යම් ධර්ම කෙනෙක්-සම්මප්පධානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

14. ඉද්ධිපාදය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

15. ඣානෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

16. අප්පමඤ්ඤාය යෙ ධම්මා -පෙ- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා- පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

17. ඵස්සෙන යෙ ධම්මා -පෙ- චෙතනාය යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

18. වෙදනාය යෙ ධම්මා -පෙ- සඤ්ඤාය යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

19. විඤ්ඤාණෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

15. ධ්‍යානය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

16. අප්‍රාමාණ්‍යය හා සමග යම් ධර්ම කෙනෙක්... පඤ්චෙන්ද්‍රියයන් හා සමග යම් ධර්ම කෙනෙක් පඤ්ච බලයන් හා සමග යම් ධර්ම කෙනෙක් සප්තබොධ්‍යඞ්ගයන් හා සමග යම් ධර්ම කෙනෙක්– ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

17. ස්පර්ශ හා සමග යම් ධර්ම කෙනෙක්...චෙතනාව හා සමග යම් ධර්ම කෙනෙක්– මනසිකාරය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් -ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

18. වේදනාව හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥාව හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

19. චිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

20. අධිමොක්ඛෙන යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

21. සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා- අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

22. හෙතූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතූහි චෙව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

23. සහෙතුකෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතුසම්පයුත්තෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා - න හෙතූහි සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

20. අධිමොක්ෂය හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද ...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයෙකින් දස ආයතනයක් විසින් පසළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

21. සුඛ වෙදනා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්.. දුක්ඛ වෙදනා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අදුක්ඛ මසුඛවෙදනා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– සවිතර්ක සවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අවිතර්ක විචාර මාත්‍ර වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ප්‍රීතිසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සුඛසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

22. හේතු ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...හෙතු ද වූ මැ සහෙතුක ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- හෙතු ද වූ මැ හෙතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම්ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

23. සහේතුක ද වූ මැ නො ද හේතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...හේතුසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හේතු ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- හේතු නො වූ සහේතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

24. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා- ආසවෙහි චෙව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

25. ආසවසම්පයුත්තෙහි චෙව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

26. සඤ්ඤොජනෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ගන්ථෙහි ධම්මෙහි යෙ ධම්මා- ඕඝෙහි ධම්මෙහි යෙ ධම්මා- යොගෙහි ධම්මෙහි යෙ ධම්මා- නීවරණෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

27. පරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා-පෙ- තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

24. ආස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්... ආස්‍රව ද වූ මැ සාස්‍රව ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

25. ආස්‍රව සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

26. සංයෝජන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්... ග්‍රන්ථ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ඔඝ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- යෝග ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- නීවරණ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- පරාමර්ශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- පරාමර්ශ ද වූ මැ පරාමෘෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූ වාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

27. පරාමර්ශ සම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහුද...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

28. විතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: ද්වීහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

29. චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන සත්තහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි අසඞ්ගහිතා.

30. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා-පෙ-කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා-කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා-කිලෙසෙහි චෙව කිලෙස සම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

31. සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- -පෙ- කිලෙසසම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා-- සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා- සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා- පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා සම්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා එකෙන ඛන්ධෙන එකෙනායතනෙන එකාය ධාතුයා සඞ්ගහිතා.

28. චිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: ස්කන්ධ දෙකක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

29. චෛතසික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...චිත්තසම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්ත සංසෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්ත සංසෘෂ්ට සමුත්ථාන සහභූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- චිත්තසංසෘෂ්ට සමුත්ථානානුපරිවර්ති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් ධාතු සතක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් එකොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

30. උපාදාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්... ක්ලේශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ක්ලේශ ද වූමැ සාංක්ලේශික ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ක්ලෙශ ද වූ මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ක්ලෙශ ද වූමැ ක්ලේශ සම්ප්‍රයුක්තද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

31. සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්...ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සවිතර්ක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සප්‍රීතික වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ප්‍රීතිසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සුඛසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සම්ප්‍රයුක්ත වූවාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත ද යත්: ඒ ධර්මයෝ එක් ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් එක් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකාදසහායතනෙහි සත්තරසහි ධාතූහි අසඞ්ගහිතා.

අරූපක්ඛන්ධා චත්තාරො මනායතනමෙව ච,
විඤ්ඤාණධාතුයො සත්ත ද්වෙ සච්චා චුද්දසින්ද්‍රියා.
පච්චයෙ ද්වාදස පද තතො උපරි සොළස,
තිකෙසු අට්ඨ ගොච්ඡකෙ තෙචත්තාළීසමෙව ච.
මහන්තරදුකෙ සත්තපද පිට්ඨිදුකෙසු ඡ.[1]
නවමස්ස පදස්සෙත නිද්දෙසෙ සඞ්ගහං ගතා'ති

**සම්පයුත්තෙන සඞ්ගහිත අසඞ්ගහිතපදනිද්දෙසො නිට්ඨිතො.**

1. පිට්ඨිදුකෙසු ඡ ඉති - සිරිමු

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් සතළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

උද්දානය:

සතර නාමස්කන්ධයෝ යැ, මනායතනයැ, සප්තවිඥාන ධාතු යැ, සත්‍ය දෙක යැ, තුදුස් ඉන්ද්‍රියයෝ යැ, පටිච්චසමුප්පාදයෙහි දෙළොස් පදයෝ යැ එයින් මත්තෙහි සොළොස් පදයෝ යැ, ත්‍රිකමාතෘකායෙහි අටපදයෝ යැ. ගොච්ඡකයෙහි තෙසාළිස් පදයෝ යැ, මහන්තර දුකයෙහි සප්ත පදයෝ යැ, පිට්ඨි දුකයෙහි සපදයෝ යැ යන මේ (එක් සිය විස්සක්) පදයෝ නව වැනි වූ උද්දෙශ පදයාගේ නිර්දෙශයෙහි සඞ්ගෘහීත වෙත්.

සම්ප්‍රයුක්තයෙන් සඞ්ගෘහීත අසඞ්ගෘහීත පද නිර්දේශ නිමි.

## 13. අසඞ්ගහිතෙන සම්පයුත්ත විප්පයුත්ත පද නිද්දෙසො

1. රූපක්ඛන්ධෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිනායතනෙහි, කතිහි ධාතූහි සම්පයුත්තා. තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

2. ධම්මායතනෙන යෙ ධම්මා -පෙ- ධම්මධාතුයා යෙ ධම්මා- ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා-- පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා— ජීවිතින්ද්‍රියෙන යෙ ධම්මා— විඤ්ඤාණපච්චයා නාමරූපෙන යෙ ධම්මා— අසඤ්ඤාභවෙන යෙ ධම්මා— එකවොකාර භවෙන යෙ ධම්මා— ජාතියා යෙ ධම්මා— ජරාය යෙ ධම්මා— මරණෙන යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

3. අරූපභවෙන යෙ ධම්මා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙන යෙ ධම්මා -චතුවොකාරභවෙන යෙ ධම්මා- ඉද්ධිපාදෙන යෙ ධම්මා ඛන්ධ සඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තාති: නත්ථි.

## 13. අසඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද නිර්දේශය

1. රූපස්කන්ධය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

2. ධර්මායතනය විසින් යම් ධර්ම කෙනෙක්... ධර්මධාතුව විසින් යම් ධර්ම කෙනෙක්-ඉත්ථීන්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්- පුරිසින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්- ජීවිතින්ද්‍රිය විසින් යම් ධර්ම කෙනෙක්- විඤ්ඤාන ප්‍රත්‍යයෙන් වූ නාමරූපය විසින් යම් ධර්ම කෙනෙක්- අසංඥභවය විසින් යම් ධර්ම කෙනෙක්-එකවොකාර භවය විසින් යම් ධර්ම කෙනෙක්- ජාතිය විසින් යම් ධර්ම කෙනෙක්- ජරාව විසින් යම් ධර්ම කෙනෙක්- මරණය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධ සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද...ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

3. අරූපභවය විසින් යම් ධර්ම කෙනෙක්- නේවසඤ්ඤානාසඤ්ඤා භවය විසින් යම් ධර්ම කෙනෙක්- චතුවෝකාර භවය විසින් යම් ධර්ම කෙනෙක්- ඉද්ධිපාදය විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දාහු ද ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දාහු ද ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දාහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වූවාහු ද යත්: (සම්ප්‍රයුක්ත වන්නාවූ ධර්මයෙක්) නැති.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

4. කුසලෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අකුසලෙහි ධම්මෙහි යෙ ධම්මා–සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා–දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– විපාකෙහි ධම්මෙහි යෙ ධම්මා– විපාක ධම්මධම්මෙහි යෙ ධම්මා– අනුපාදින්නඅනුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා–සංකිලිට්ඨසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා–අසංකිලිට්ඨඅසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා–සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා– අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා–සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා–දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා– භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා– දස්සනෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– ආචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා– අපචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා- සෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා– අසෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා– මහග්ගතෙහි ධම්මෙහි යෙ ධම්මා– අප්පමාණෙහි ධම්මෙහි යෙ ධම්මා– පරිත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– මහග්ගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අප්පමාණාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– හීනෙහි ධම්මෙහි යෙ ධම්මා– පණීතෙහි ධම්මෙහි යෙ ධම්මා– මිච්ඡත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා– සම්මත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා- මග්ගාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා- මග්ගහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– මග්ගාධිපතීහි ධම්මෙහි යෙ ධම්මා– අතීතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අනාගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා- පච්චුප්පන්නාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අජ්ඣත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– බහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– අජ්ඣත්තබහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා– සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා– හෙතුසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– සහෙතුකෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා– හෙතු සම්පයුත්තෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා– න හෙතූහි සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා ආයතන සඞ්ගහෙන අසඞ්ගහිතා ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා ති: නත්ථි.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

4. කුශල ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... අකුශල ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සුඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-දුඃඛවෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- අදුක්ඛමසුඛ (උපෙක්ෂා) වෙදනාව හා සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-විපාක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-විපාකස්වභාව ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අනුපාදින්න අනුපාදනිය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සංක්ලිෂ්ට සාංක්ලෙශික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අසංක්ලිෂ්ට අසාංක්ලෙශික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සවිතර්ක සවිචාර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අවිතර්කවිචාරමාත්‍ර වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ප්‍රීති සහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සුඛසහගත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- උපෙක්ෂා සහගත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- දර්ශනයෙන් (සෝවාන් මගින්) ප්‍රහාතව්‍ය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් භාවනායෙන් (මතු මාර්ග ත්‍රයයෙන්) ප්‍රහාතව්‍ය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ආචයගාමී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්. අපචයගාමී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ශෛක්ෂ වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අශෛක්ෂ වූ ධර්මයන් විසින් ධර්ම කෙනෙක්-මහද්ගත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අප්‍රමාණවූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-පරිත්තාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් මහාද්ගතාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- අප්‍රමාණාලම්බනවූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- හීන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ප්‍රණීත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් මිථ්‍යාත්වනියත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සම්‍යක්ත්වනියත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-මාර්ගාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-මාර්ගහෙතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් මාර්ගාධිපති වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- අතීතාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අනාගතාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ප්‍රත්‍යුත්පන්නාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් අධ්‍යාත්මාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- බාහිරාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- අධ්‍යාත්මබාහිරාලම්බන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් සහෙතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් හෙතු සම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සහෙතුක ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් හේතුසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද හේතු වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- හෙතු නො වූ සහෙතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දහු ද, ආයතන සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දහු ද, ධාතු සඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නොකරන ලද්දහු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: (සම්ප්‍රයුක්ත වන්නා වූ ධර්මයෙක්) නැති.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

5. රූපීහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා -පෙ- තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

6. අරූපීහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ලොකුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා- අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා- ආසවසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- ආසවසම්පයුත්තෙහි චෙව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා- ආසවවිප්පයුත්තෙහි අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා- අසංයොජනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අගන්ථනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අනොඝනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අයොගනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අනීවරණියෙහි ධම්මෙහි යෙ ධම්මා- අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- පරාමාසවිප්පයුත්තෙහි අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- සාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා'ති: නත්ථි.

කතිහි විප්පයුත්තා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා,

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයක් හා සමග එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

5. රූපී ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්ද හු ද ආයතනසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්දහු ද ධාතුසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහ නො කරන ලද්ද හු ද,... ඒ ධර්මයෝ තුන් ස්කන්ධයන් හා සමග සම්ප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

6. අරූපිධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්... ලෝකෝත්තර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අනාස්‍රව ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ආස්‍රවසම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ආස්‍රවසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ආස්‍රව වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ආස්‍රවවිප්‍රයුක්ත වූ අනාස්‍රව ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සංයෝජනීය නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - ග්‍රන්ථනීය නොවූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ඔඝනීය - නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-යෝගනීය නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-නීවරණීය නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- අපරාමෘෂ්ට නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-පරාමර්ශසම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - පරාමර්ශවිප්‍රයුක්තඅපරාමෘෂ්ට ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: (සම්ප්‍රයුක්ත වන්නා වූ ධර්මයෙක්) නැති.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: සතර ස්කන්ධයන් හා එක් ආයතනයක් හා සප්ත ධාතූන් හා විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

7. අනාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- නො චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තවිසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්ත සහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා- බාහිරෙහි ධම්මෙහි යෙ ධම්මා- උපාදාධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ග- හෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතුසඞ්ගහෙන අසඞ්ගහිතා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා: තෙ ධම්මා තීහි ඛන්ධෙහි සම්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි සම්පයුත්තා.

කතිහි විප්පයුත්තා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි විප්පයුත්තා. එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

8. අනුපාදින්නෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- උපාදානසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- උපාදානසම්පයුත්තෙහි චෙව නො ච උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා- උපාදානවිප්පයුත්තෙහි අනුපාදිනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසසම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසවිප්පයුත්තෙහි අසං- කිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- දස්සනෙන පහාතබ්බ හෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා- සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා- සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා- පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා-සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා-උපෙක්ඛා සහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- න කාමාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා- රූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා- අරූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා- අපරියාපන්නෙහි ධම්මෙහි යෙ ධම්මා - නිය්‍යානිකෙහි ධම්මෙහි යෙ ධම්මා- නියතෙහි ධම්මෙහි යෙ ධම්මා- අනුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා - සරණෙහි ධම්මෙහි යෙ ධම්මා ඛන්ධසඞ්ගහෙන අසඞ්ගහිතා, ආයතනසඞ්ගහෙන අසඞ්ගහිතා, ධාතු සඞ්ගහෙන අසඞ්ගහිතා; තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සම්පයුත්තා'ති: නත්ථි.

7. අනාලම්බන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්...චිත්ත නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-චිත්තවිප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-චිත්තවිසංසෘෂ්ට වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-චිත්තසමුත්ථාන ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-චිත්තසහභූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-චිත්තානුපරිවර්ති ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-බාහිර ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-උපාද ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ආයතන සඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වෙත් ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්ත වෙත් ද යත්: ඒ ධර්මයෝ තුන් ස්කන්ධයක් හා සමග සම්ප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා සම්ප්‍රයුක්ත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් හා විප්‍රයුක්ත වෙත් ද යත්: එක් ස්කන්ධයක් හා දස ආයතනයන් හා දස ධාතූන් හා විප්‍රයුක්ත වෙති. එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග කිසි ධර්ම කෙනකුන් හා විප්‍රයුක්ත වෙත්.

8. අනුපාදනිය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්...උපාදානසම්ප්‍රයුක්ත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-උපාදානසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද උපාදාන වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- උපාදානවිප්‍රයුක්ත වූ අනුපාදනිය ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අසාංක්ලෙශික වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සංක්ලිෂ්ට වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශසම්ප්‍රයුක්ත වූ ධර්මයන විසින් යම් ධර්ම කෙනෙක්- සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලෙශ වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- ක්ලෙශසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-ක්ලෙශවිප්‍රයුක්ත වූ අසාංක්ලෙශික වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ ධර්මයන විසින් යම් ධර්ම කෙනෙක්-දර්ශනයෙන් ප්‍රහාතව්‍යහේතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - භාවනායෙන් ප්‍රහාතව්‍යහේතුක වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- විතර්ක සහිත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-විචාර සහිත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සප්‍රීතික වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- ප්‍රීතිසහගත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- සුඛසහගත වූ ධර්මයන විසින් යම් ධර්ම කෙනෙක්- උපෙක්ෂා සහගත වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-කාමාවචර නො වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- රූපාවචර වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් අරූපාවචර වූ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-අපර්යාපන්න ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් නෛර්‍යාණික ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්- නියත ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් - අනුත්තරධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක්-සරණ ධර්මයන් විසින් යම් ධර්ම කෙනෙක් ස්කන්ධසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ද ආයතනසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවාහු ද ධාතුසඞ්ග්‍රහයෙන් අසඞ්ගෘහීත වූවා හු ද, ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් හා සමග කෙතෙක් ආයතනයන් හා සමග කෙතෙක් ධාතූන් හා සමග සම්ප්‍රයුක්තයෝ ද යත්: සම්ප්‍රයුක්ත වන ධර්මයෙක් නැති.

කතිහි විප්පයුත්තා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි විප්පයුත්තා, එකෙනායතනෙන එකාය ධාතුයා කෙහිචි විප්පයුත්තා.

රූපඤ්ච ධම්මායතනං ධම්මධාතු ඉත්ථි පුමං,
ජීවිතං නාමරූපං ද්වෙ භවා ජාති ජරා ච[1]
මච්චු ච රූපී[2] අනාරම්මණං නො චිත්තං චෙතසිකා[3] විප්පයුත්තං
විසංසට්ඨසමුට්ඨානං[4] සහභූ අනුපරිවත්ති,
බාහිරුපාදා[5]. ද්වෙ විසයො එසනයො සුබ්බුද්ධා.

අසඞ්ගහිතෙන සම්පයුත්ත විප්පයුත්තපදනිද්දෙසො නිට්ඨිතො.

1. ජාතිජරා—P.T.S.
2. මච්චුරූප—ම ඡ සං— P.T.S.
3. නො චිතසිකා— සිරිමු
4. චිත්ත සංසට්ඨසමුට්ඨානා—සිරිමු
5. බාහිරං උපාදා—ම ඡ සං., P.T.S.

කෙතෙක් ස්කන්ධාදීන් හා සමග විප්‍රයුක්තයෝ ද යත්: සතර ස්කන්ධයන් හා සමග එක් ආයතනයක් හා සමග සප්ත ධාතූන් හා සමග විප්‍රයුක්ත වෙති, එක් ආයතනයක් හා සමග එක් ධාතුවක් හා සමග ඇතැම් ධර්ම කෙනෙකුන් හා විප්‍රයුක්ත වෙත්.

උද්දානය:

රූප යැ, ධර්මායතන යැ, ධර්මධාතු යැ, ස්ත්‍රීන්ද්‍රිය යැ, පුරුෂෙන්ද්‍රිය යැ, ජීවිතෙන්ද්‍රිය යැ, කාමරූපයැ, භවයෝ දෙදෙන යැ, ජාති යැ, ජරාව යැ, මරණ යැ රූපී ධර්ම යැ අනාරම්මණ යැ චිත්ත නො වූ ධර්ම යැ චිත්තවිප්පයුත්ත ධර්ම යැ, චිත්තවිසංසට්ඨ ධර්ම යැ, චිත්තසමුට්ඨාන ධර්ම යැ, චිත්ත සහභූ ධර්ම යැ, චිත්තානුපරිවත්ති ධර්ම යැ, බාහිර උපාද ධර්ම දෙක යැයි දෙවිසිනයක් ඇති මේ ක්‍රමය මොනොවට අවබොධ කරන ලද්දේ වෙයි.

**අසඞ්ගෘහීතයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත පද නිර්දේශය නිමි.**

## 14. විප්පයුත්තෙන සඞ්ගහිතා'සඞ්ගහිත පදනිද්දෙසො

1. රූපක්ඛන්ධෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

2. වෙදනාක්ඛන්ධෙන යෙ ධම්මා- -පෙ- සඤ්ඤාක්ඛන්ධෙන යෙ ධම්මා- සඞ්ඛාරක්ඛන්ධෙන යෙ ධම්මා- විඤ්ඤාණක්ඛන්ධෙන යෙ ධම්මා- මනායතනෙන යෙ ධම්මා- මනින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

3. චක්ඛායතනෙන යෙ ධම්මා -පෙ- ඵොට්ඨබ්බායතනෙන යෙ ධම්මා- චක්ඛුධාතුයා යෙ ධම්මා -පෙ- ඵොට්ඨබ්බධාතුයා යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

4. චක්ඛුවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා -පෙ- සොතවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා- ඝානවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා- ජිව්හාවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා- කායවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා- මනොධාතුයා යෙ ධම්මා- මනොවිඤ්ඤාණධාතුයා යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

## 14. විප්‍රයුක්තයෙන් සඞ්ගෘහීතා'සඞ්ගෘහීත පදනිර්දේශය

1. රූපස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ සතර (නාම) ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීතයහ.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් සඞ්ගෘහීත යෝ යි.

2. වේදනාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්...සංඥාස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්- සංස්කාර ස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්-විඥානස්කන්ධය හා සමග යම් ධර්ම කෙනෙක්- මනායතනය හා සමග යම් ධර්ම කෙනෙක්-මනින්ද්‍රිය හා සමග යම් ධර්මකෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් හැරපියා එක් ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් එකොළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර (නාම) ස්කන්ධයන් විසින් එක් මනායතනය විසින් සප්ත ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

3. චක්ඛායතනය හා සමග යම් ධර්ම කෙනෙක්...ඵොට්ඨබ්බායතනය හා සමග යම් ධර්ම කෙනෙක්-චක්ඛුධාතුව හා සමග යම් ධර්මකෙනෙක්- පොට්ඨබ්බධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයෝ සතර (නාම) ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධ යක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

4. චක්ඛුර්විඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක්... ශ්‍රොත්‍ර විඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක්-ඝ්‍රාණවිඥාන ධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් – ජිහ්වාවිඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් කායවිඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් – මනොධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් – මනොවිඥානධාතුව හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් හැරපියා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් සතළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීතයෝ යි.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා අසඞ්ගහිතා.

5. දුක්ඛසච්චෙන යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

6. සමුදයසච්චෙන යෙ ධම්මා -පෙ- මග්ගසච්චෙන යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

7. නිරොධසච්චෙන යෙ ධම්මා -පෙ- චක්ඛුන්ද්‍රියෙන යෙ ධම්මා- කායින්ද්‍රියෙන යෙ ධම්මා- ඉත්ථින්ද්‍රියෙන යෙ ධම්මා- පුරිසින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

8. සුඛින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- දුක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා- සොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා- දොමනස්සින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්. එක් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

5. දුඃඛසත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහුද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතුන් දෙකක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්-ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

6. සමුදය සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් ... මාර්ග සත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතුන් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

7. නිරොධසත්‍යය හා සමග යම් ධර්ම කෙනෙක් ... චක්ඛුන්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – කායින්ද්‍රියය හා සමග යම් ධර්ම කෙනෙක්– ඉත්ථින්ද්‍රියය හා සමග යම් ධර්ම කෙනෙක්– පුරිසින්ද්‍රියය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වෙත් ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් අෂ්ට ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධ යක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

8. සුඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් ... දුක්ඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – සොමනස්සින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – දොමනස්සින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතුන් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

9. උපෙක්ඛින්ද්‍රියෙන යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.[1]

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

10. සද්ධින්ද්‍රියෙන යෙ ධම්මා -පෙ- විරියින්ද්‍රියෙන යෙ ධම්මා- සතින්ද්‍රියෙන යෙ ධම්මා- සමාධින්ද්‍රියෙන යෙ ධම්මා- පඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤින්ද්‍රියෙන යෙ ධම්මා- අඤ්ඤාතාවින්ද්‍රියෙන යෙ ධම්මා- අවිජ්ජාය යෙ ධම්මා- අවිජ්ජාපච්චයා සඞ්ඛාරෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

11. සඞ්ඛාරපච්චයා විඤ්ඤාණෙන යෙ ධම්මා -පෙ- සළායතනපච්චයා ඵස්සෙන යෙ ධම්මා- ඵස්සපච්චයා වෙදනාය යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

12. වෙදනාපච්චයා තණ්හාය යෙ ධම්මා -පෙ- තණ්හාපච්චයා උපාදානෙන යෙ ධම්මා- කම්මභවෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි අසඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

1. උපෙක්ඛින්ද්‍රියෙන -පෙ- ධාතූහි අසඞ්ගහිතා- PTS. උභො.

9. උපෙක්ඛින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් තෙළෙස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. පඤ්ච ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

10. සද්ධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් ... විරියින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්– සතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්- සමාධින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් - පඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – අඤ්ඤින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක් – අඤ්ඤාතාවින්ද්‍රිය හා සමග යම් ධර්ම කෙනෙක්–අවිද්‍යාව හා සමග යම් ධර්ම කෙනෙක් – අවිද්‍යාප්‍රත්‍යයෙන් වූ සංස්කාරයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

11. සංස්කාරප්‍රත්‍යයෙන් වූ විඥානය හා සමග යම් ධර්ම කෙනෙක් ... ෂඩායතන ප්‍රත්‍යයෙන් වූ ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක්–ස්පර්ශ ප්‍රත්‍යයෙන් වූ වෙදනාව හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ...ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් හැරපියා එක් ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් එකොළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයන් විසින් එක් ආයතනයක් විසින් සප්ත ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

12. වේදනාප්‍රත්‍යයෙන් වූ තෘෂ්ණාව හා සමග යම් ධර්ම කෙනෙක් ... තෘෂ්ණාප්‍රත්‍යයෙන් වූ උපාදානය හා සමග යම් ධර්ම කෙනෙක්- කර්මභවය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛත-ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙකින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

13. උප්පත්තිභවෙන යෙ ධම්මා - පෙ - සඤ්ඤාභවෙන යෙ ධම්මා- පඤ්චවොකාරභවෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පන්නරසහි ධාතූහි අසඞ්ගහිතා.

14. කාමභවෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි පඤ්චහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි තෙරසහි ධාතූහි අසඞ්ගහිතා.

15. රූපභවෙන යෙ ධම්මා -පෙ- අසඤ්ඤාභවෙන යෙ ධම්මා- එක- වොකාරභවෙන යෙ ධම්මා- පරිදෙවෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

16. අරූපභවෙන යෙ ධම්මා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙන යෙ ධම්මා-චතුවොකාරභවෙන යෙ ධම්මා- සොකෙන යෙ ධම්මා- දුක්ඛෙන යෙ ධම්මා- දොමනස්සෙන යෙ ධම්මා- උපායාසෙන යෙ ධම්මා- සතිපට්ඨා- නෙන යෙ ධම්මා- සම්මප්පධානෙන යෙ ධම්මා- ඉද්ධිපාදෙන යෙ ධම්මා- ඣානෙන යෙ ධම්මා- අප්පමඤ්ඤාය යෙ ධම්මා- පඤ්චහි ඉන්ද්‍රියෙහි යෙ ධම්මා පඤ්චහි බලෙහි යෙ ධම්මා- සත්තහි බොජ්ඣඞ්ගෙහි යෙ ධම්මා- අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන යෙ ධම්මා- විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

13. උපපත්තිභවය හා සමග යම් ධර්ම කෙනෙක් ... සංඥාභවය හා සමග යම් ධර්ම කෙනෙක්- පඤ්චවොකාර භවය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් තුන් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් පසළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

14. කාමභවය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් පඤ්ච ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් තෙළෙස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

15. රූපභවය හා සමග යම් ධර්ම කෙනෙක් ... අසංඥභවය හා සමග යම් ධර්ම කෙනෙක්- එකවෝකාරභවය හා සමග යම් ධර්ම කෙනෙක්- පරිදේවය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් අෂ්ට ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

16. අරූපභවය හා සමග යම් ධර්ම කෙනෙක් ... නේවසඤ්ඤා නාසඤ්ඤාභවය හා සමග යම් ධර්ම කෙනෙක් – චතුවොකාරභවය හා සමග යම් ධර්ම කෙනෙක් – ශොකය හා සමග යම් ධර්ම කෙනෙක් – දුඃඛය හා සමග යම් ධර්මකෙනෙක්–දෞර්මනස්සාය හා යම් ධර්ම කෙනෙක්- උපායාසය හා සමග යම් ධර්ම කෙනෙක්- සතිපට්ඨානය හා සමග යම් ධර්ම කෙනෙක් – සම්‍යක්ප්‍රධානය හා සමග යම් ධර්ම කෙනෙක්-ඉද්ධිපාදය හා සමග යම් ධර්ම කෙනෙක්– ධ්‍යානය හා සමග යම් ධර්ම කෙනෙක්- අප්‍රාමාණ්‍යය හා සමග යම් ධර්ම කෙනෙක්– පඤ්චින්ද්‍රියයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පඤ්ච බලයන් හා සමග යම් ධර්ම කෙනෙක් – සප්ත බොධ්‍යඞ්ගයන් හා සමග යම් ධර්ම කෙනෙක්–ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස්ධාතුන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

17. ඵස්සෙන යෙ ධම්මා -පෙ- වෙදනාය යෙ ධම්මා- සඤ්ඤාය යෙ ධම්මා- චෙතනාය යෙ ධම්මා- චිත්තෙන යෙ ධම්මා- මනසිකාරෙන යෙ ධම්මා- විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

18. අධිමොක්ඛෙන යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා අසඞ්ගහිතා.

19. කුසලෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අකුසලෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- දුක්ඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

20. අබ්‍යාකතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්විහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

17. ස්පර්ශය හා සමග යම් ධර්ම කෙනෙක් – වේදනාව හා සමග යම් ධර්ම කෙනෙක් – සංඥාව හා සමග යම් ධර්ම කෙනෙක් - චෙතනාව හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තය හා සමග යම් ධර්ම කෙනෙක් – මනසිකාරය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් හැරපියා එක් ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයන් විසින් එකොළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයන් විසින් එක් ආයතනයක් විසින් සප්ත ධාතුවක් විසින් අසඞ්ගෘ හීත වෙත්.

18. අධිමොක්ෂය හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් සතළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති එක් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

19. කුශලධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – අකුශල ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සුඛවෙදනා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – දුඃඛවේදනාව සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

20. අව්‍යාකෘත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

21. අදුක්ඛමසුඛාය වෙදනාය සම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා-පෙ- විපාකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

22. විපාකධම්මධම්මෙහි යෙ ධම්මා -පෙ- සංකිලිට්ඨසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

23. නෙවවිපාකනවිපාකධම්මධම්මෙහි යෙ ධම්මා -පෙ- අනුපාදින්නුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අනුපාදින්නඅනුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා- අසංකිලිට්ඨඅසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

24. උපාදින්නුපාදනියෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

21. අදුක්ඛමසුඛවේදනා සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- විපාක වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍ර යුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් තෙළෙස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. පඤ්ච ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

22. විපාකස්වභාව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සංක්ලිෂ්ට සාංක්ලෙශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කනධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත වෙත්.

23. නො මැ විපාක වූ විපාකස්වභාව නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-අනුපාදින්නොපාදනිය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් අනුපාදින්නඅනුපාදනිය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අසංක්ලිෂ්ට අසාංක්ලේශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් අෂ්ට ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

24. උපාදින්නොපාදනිය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් තුන් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් පසළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

25. අසංකිලිට්ඨසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

26. සවිතක්කසවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, එකාය ධාතුයා අසඞ්ගහිතා.

27. අවිතක්කවිචාරමත්තෙහි ධම්මෙහි යෙ ධම්මා -පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

28. අවිතක්කඅවිචාරෙහි[1] ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පන්නරසහි ධාතූහි අසඞ්ගහිතා.

29. උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

---

1. අවිතක්ක විචාරෙහි- PTS

25. අසංක්ලිෂ්ට අසාංක්ලේශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

26. සවිතර්කසවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයෝ – අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යාවෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් සතළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. එක් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

27. අවිතර්කවිචාරමාත්‍ර වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ප්‍රීතිසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–සුඛ සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහුද... ඒ ධර්මයෝ අසඞ්ඛත-ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතුන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

28. අවිතර්කඅවිචාර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍ර යුක්තවූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් තුන් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් පසළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

29. උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ-අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් තෙළෙස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නොවෙති. පඤ්ච ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

30. දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා - දස්සනෙන පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා - භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා - ආචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා - අපචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා - සෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා - අසෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා - මහග්ගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

31. නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- නෙවදස්සනෙන න භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා-නෙවාචයගාමී නාපචයගාමීහි ධම්මෙහි යෙ ධම්මා-නෙවසෙක්ඛා නාසෙක්ඛෙහි ධම්මෙහි යෙ ධම්මා - පරිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

32. අප්පමාණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පණීතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

30. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් සමග යම් ධර්ම කෙනෙක්- භාවනායෙන් ප්‍රහාතව්‍ය හෙතු ඇති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ආචයගාමී ච්‍යුතිප්‍රතිසන්ධිය ලැබිය හැකි වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් අපචයගාමී ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ශෛක්ෂ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අශෛක්ෂ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- මහද්ගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

31. නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- නො මැ දර්ශනයෙන් නො ද භාවනායෙන් ප්‍රහාතව්‍ය වූ හෙතු ඇති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- නො මැ ආචයගාමී නො ද අපචයගාමී වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- නො මැ ශෛක්ෂ නො ද අශෛක්ෂ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- පරිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

32. අප්‍රාමාණ්‍ය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- ප්‍රණීත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

33. පරිත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි ද්වාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි අසඞ්ගහිතා.

34. මහග්ගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අප්පමාණාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා – හීනෙහි ධම්මෙහි යෙ ධම්මා – මිච්ඡත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා – සම්මත්තනියතෙහි ධම්මෙහි යෙ ධම්මා – මග්ගාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා – මග්ගහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා – මග්ගාධිපතීහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

35. මජ්ඣිමෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අනියතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා

36. උප්පන්නෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අනුප්පන්නෙහි ධම්මෙහි යෙ ධම්මා – උප්පාදීහි ධම්මෙහි යෙ ධම්මා – අතීතෙහි ධම්මෙහි යෙ ධම්මා – අනාගතෙහි ධම්මෙහි යෙ ධම්මා – පච්චුප්පන්නෙහි ධම්මෙහි යෙ ධම්මා – අජ්ඣත්තෙහි ධම්මෙහි යෙ ධම්මා – බහිද්ධාහි ධම්මෙහි යෙ ධම්මා – සනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා – අනිදස්සනසප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙහි දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

33. පරිත්තාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් හැරපියා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් දෙළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. ෂඩ් ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

34. මහද්ගතාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අප්‍රමාණාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - හීන වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - මිච්ඡත්තනියත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - සම්මත්තනියත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - මාර්ගාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - මාර්ග හෙතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - මාර්ගාධිපති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහුද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද: යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

35. මධ්‍යම වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් අනියත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

36. උත්පන්න වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අනුත්පන්න වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- උත්පාදී වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අතීත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අනාගත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් -ප්‍රත්‍යුත්පන්න වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අධ්‍යාත්ම වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- බාහ්‍ය වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- සනිදර්ශන සප්‍රතිඝ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අනිදර්ශන සප්‍රතිඝ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයො සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

37. අතීතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අනාගතාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා - අජ්ඣත්තාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා - බහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා,

38. පච්චුප්පන්නාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අජ්ඣත්තබහිද්ධාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි ද්වාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි, ඡහි ධාතූහි අසඞ්ගහිතා.

39. හෙතූහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා - හෙතුසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - හෙතූහි චෙව සහෙතුකෙහි ච ධම්මෙහි යෙ ධම්මා - සහෙතුකෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා - හෙතූහි චෙව හෙතුසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා - හෙතුසම්පයුත්තෙහි චෙව න ච හෙතූහි ධම්මෙහි යෙ ධම්මා - න හෙතුසහෙතුකෙහි[1] ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

40. අහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- හෙතුවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා-න හෙතුඅහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

1. න හෙතූහි සහෙතුකෙහි - සිරිමු.

37. අතීතාලම්බන වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අනාගතාලම්බන වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–අධ්‍යාත්මාලම්-බනවූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– බාහිරාලම්බනවූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

38. ප්‍රත්‍යුත්පන්නාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– අධ්‍යාත්ම බාහිරාලම්බන වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් දෙළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙති. ෂඩ් ධාතූන් විසින් අසඞ්ගෘහීත වෙත්.

39. හෙතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – සහෙතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හෙතු සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හේතු ද වූ මැ සහෙතුක ද වූ ධර්මන් හා සමග යම් ධර්ම කෙනෙක් සහෙතුක ද වූ මැ නො ද හෙතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හේතු ද වූ මැ හේතු සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හේතු සම්ප්‍රයුක්ත වූ මැ නො ද හේතු වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් හේතු නො වූ සහේතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛත-ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

40. අහේතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හේතුවිප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – හේතු නො වූ අහේතුක ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

41. අප්පච්චයෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසඞ්ඛතෙහි ධම්මෙහි යෙ ධම්මා – සනිදස්සනෙහි ධම්මෙහි යෙ ධම්මා – අනිදස්සනෙහි ධම්මෙහි යෙ ධම්මා – සප්පටිඝෙහි ධම්මෙහි යෙ ධම්මා – රූපීහි ධම්මෙහි යෙ ධම්මා – ලොකුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

42. ලොකියෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

43. ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- ආසවසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා – ආසවෙහි චෙව සාසවෙහි ච ධම්මෙහි යෙ ධම්මා – ආසවෙහි චෙව ආසවසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා – ආසවසම්පයුත්තෙහි චෙව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

41. අප්‍රත්‍යය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – අසඞ්ඛත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– සනිදර්ශන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– අනිදර්ශන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – රූපී ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ලොකොත්තර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

42. ලෞකික වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

43. ආස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් ආස්‍රව සම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් ආස්‍රව ද වූ මැ සාස්‍රව ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ආස්‍රව ද වූ මැ ආස්‍රව සම්ප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් ආස්‍රවසම්ප්‍රයුක්ත වූ මැ නො ද ආස්‍රව වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යාවෙන් හැරපියා පඤ්ච ස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත වෙත්.

44. සාසවෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– ආසවවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා – සාසවෙහි චෙව නො ච ආසවෙහි ධම්මෙහි යෙ ධම්මා – ආසවවිප්පයුත්තෙහි සාසවෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, –පෙ– තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

45. අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– ආසවවිප්පයුත්තෙහි අනාසවෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, –පෙ– තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

46. සඤ්ඤොජනෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– ගන්ථෙහි ධම්මෙහි යෙ ධම්මා – ඔඝෙහි ධම්මෙහි යෙ ධම්මා – යොගෙහි ධම්මෙහි යෙ ධම්මා– නීවරණෙහි ධම්මෙහි යෙ ධම්මා– පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා–පරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– පරාමාසෙහි චෙව පරාමට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, –පෙ– තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

47. පරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා –පෙ– පරාමාසවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා– පරාමට්ඨෙහි චෙව නො ච පරාමාසෙහි ධම්මෙහි යෙ ධම්මා– පරාමාසවිප්පයුත්තෙහි පරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, –පෙ– තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

44. සාස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ආස්‍රව විප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – සාස්‍රව ද වූ මැ නො ද ආස්‍රව වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ආස්‍රව විප්‍රයුක්ත සාස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවා හු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

45. අනාස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ආස්‍රව විප්‍රයුක්ත අනාස්‍රව ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

46. සංයෝජන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ග්‍රන්ථ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – ඕඝ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – යොග ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– නීවරණ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පරාමර්ශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පරාමර්ශසම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - පරාමර්ශ ද වූ මැ පරාමෘෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

47. පරාමෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පරාමර්ශ විප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පරාමෘෂ්ට ද වූ මැ නො ද පරාමර්ශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්– පරාමර්ශ විප්‍රයුක්ත පරාමෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද... ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

48. අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පරාමාසවිප්පයුත්තෙහි අපරාමට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා -පෙ- චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

49. සාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- චෙතසිකෙහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨසමුට්ඨානෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තසංසට්ඨසමුට්ඨානසහභූහි ධම්මෙහි යෙ ධම්මා- චිත්තසංසට්ඨසමුට්ඨානානුපරිවත්තීහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා එකෙන ඛන්ධෙන එකාදසහායතනෙහි එකාදසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: චතූහි ඛන්ධෙහි එකෙනායතනෙන සත්තහි ධාතූහි අසඞ්ගහිතා.

50. අනාරම්මණෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- චිත්තවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා - චිත්තවිසංසට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා - උපාදාධම්මෙහි යෙ ධම්මා - අනුපාදින්නෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

51. උපාදින්නෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්විහායතනෙහි තීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි පණ්ණරසහි ධාතූහි අසඞ්ගහිතා.

48. අපරාමෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – පරාමර්ශ විප්‍රයුක්ත අපරාමෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

49. සාලම්බන ධර්මයන් හා යම් ධර්ම කෙනෙක් – චිත්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චෛතසික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ට සමුත්ථාන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ට සමුත්ථානසහභූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තසංසෘෂ්ට සමුත්ථානානුපරිවර්ති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සඞ්ඛ්‍යායෙන් තබා එක් ස්කන්ධයක් විසින් එකොළොස් ආයතනයක් විසින් එකොළොස් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: සතර ස්කන්ධයක් විසින් එක් ආයතනයක් විසින් ධාතු සතක් විසින් අසඞ්ගෘහීත වෙත්.

50. අනාලම්බන ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්ත විප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – චිත්තවිසංසෘෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – උපාදා ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – අනුපාදින්න ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

51. උපාදින්න ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් තුන් ධාතුවක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් පසළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

52. උපාදානෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසසම්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලෙසිකෙහි ච ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව සංකිලිට්ඨෙහි ච ධම්මෙහි යෙ ධම්මා- සංකිලිට්ඨෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසෙහි චෙව කිලෙසසම්පයුත්තෙහි ච ධම්මෙහි යෙ ධම්මා - කිලෙසසම්පයුත්තෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි එකාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

53. සංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අසංකිලිට්ඨෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසවිප්පයුත්තෙහි ධම්මෙහි යෙ ධම්මා- සංකිලෙසිකෙහි චෙව නො ච කිලෙසෙහි ධම්මෙහි යෙ ධම්මා- කිලෙසවිප්පයුත්තෙහි සංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

54. අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- කිලෙසවිප්පයුත්තෙහි අසංකිලෙසිකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

52. උපාදානධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ක්ලේශ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - සංක්ලිෂ්ට ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ක්ලේශසම්ප්‍රයුක්ත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ සාංක්ලේශිකවූ ද ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලේශ ද වූ මැ සංක්ලිෂ්ට ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් සංක්ලිෂ්ට ද වූ මැ නො ද ක්ලේශ ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලෙශ ද වූ මැ ක්ලේශ සම්ප්‍රයුක්ත ද වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ක්ලේශසම්ප්‍රයුක්ත ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

53. සාංක්ලේශික වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්- අසංක්ලිෂ්ට වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-ක්ලෙශවිප්‍රයුක්ත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - සාංක්ලේශික ද වූ මැ නො ද ක්ලේශ වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ක්ලේශවිප්‍රයුක්ත සාංක්ලේශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

54. අසාංක්ලේශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - ක්ලේශ විප්‍රයුක්ත අසාංක්ලෙශික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවා හු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතූන් අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

55. දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- දස්සනෙන පහාතබ්බ-හෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං බන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතුහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතුහි අසඞ්ගහිතා.

56. න දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- න භාවනාය පහාතබ්බෙහි ධම්මෙහි යෙ ධම්මා- න දස්සනෙන පහාතබ්බ හෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා- න භාවනාය පහාතබ්බහෙතුකෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතුහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතුහි අසඞ්ගහිතා.

57. සවිතක්කෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- සවිචාරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං බන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි සත්තරසහි ධාතුහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා; න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි එකාය ධාතුයා අසඞ්ගහිතා.

58. සප්පීතිකෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පීතිසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා- සුඛසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං බන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වා-දසහායතනෙහි අට්ඨාරසහි ධාතුහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතුහි අසඞ්ගහිතා.

55. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-භාවනායෙන් ප්‍රහාතව්‍ය ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-භාවනායෙන් ප්‍රහාතව්‍යහෙතු ඇති ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ – අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්ච ස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

56. දර්ශනයෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–භාවනායෙන් ප්‍රහාතව්‍ය නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–දර්ශනයෙන් ප්‍රහාතව්‍යහෙතුක නොවූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – භාවනායෙන් ප්‍රහාතව්‍යහේතුක නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

57. විතර්ක සහිත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–විචාර සහිත වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යාවෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් සතළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්. එක් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

58. සප්‍රීතික වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–ප්‍රීතිසහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-සුඛ සහගත ධර්මයන් සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ... ඒ ධර්මයෝ අසඞ්ඛත ධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දොළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනෙකුන් විසින් කිසි ආයතන කෙනෙකුන් විසින් කිසි ධාතු කෙනෙකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

59. උපෙක්ඛාසහගතෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි තෙරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි පඤ්චහි ධාතූහි අසඞ්ගහිතා.

60. කාමාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- පරියාපන්නෙහි ධම්මෙහි යෙ ධම්මා- ස උත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

61. න කාමාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අපරියාපන්නෙහි ධම්මෙහි යෙ ධම්මා- අනුත්තරෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි අට්ඨහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි දසහි ධාතූහි අසඞ්ගහිතා.

62. රූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- අරූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා- නිය්‍යාණිකෙහි ධම්මෙහි යෙ ධම්මා- නියතෙහි ධම්මෙහි යෙ ධම්මා- සරණෙහි ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා -පෙ- තෙ ධම්මා අසඞ්ඛතං ඛන්ධතො ඨපෙත්වා පඤ්චහි ඛන්ධෙහි ද්වාදසහායතනෙහි අට්ඨාරසහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: න කෙහිචි ඛන්ධෙහි න කෙහිචි ආයතනෙහි න කාහිචි ධාතූහි අසඞ්ගහිතා.

59. උපෙක්ෂා සහගත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්තවූවාහු ද ..ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් තෙළෙස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත් පඤ්ච ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙති.

60. කාමාවචර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-පර්‍යාපන්න ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-සඋත්තර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

61. කාමාවචර නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-අපර්‍යාපන්න ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-අනුත්තර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ සතර ස්කන්ධයක් විසින් ආයතන දෙකක් විසින් ධාතු අටක් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් දස ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙත්.

62. රූපාවචර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – අරූපාවචර ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් – නෛර්‍යාණික ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-නියත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්–සරණ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද...ඒ ධර්මයෝ අසඞ්ඛතධාතුව ස්කන්ධ සංඛ්‍යායෙන් තබා පඤ්චස්කන්ධයන් විසින් දෙළොස් ආයතනයන් විසින් අටළොස් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙති.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: කිසි ස්කන්ධ කෙනකුන් විසින් කිසි ආයතන කෙනකුන් විසින් කිසි ධාතු කෙනකුන් විසින් අසඞ්ගෘහීත නො වෙත්.

63. න රූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා -පෙ- න අරූපාවචරෙහි ධම්මෙහි යෙ ධම්මා- අනියාණිකෙහි ධම්මෙහි යෙ ධම්මා- අනියතෙහි ධම්මෙහි යෙ ධම්මා- අරණෙහි' ධම්මෙහි යෙ ධම්මා විප්පයුත්තා, තෙ ධම්මා කතිහි ඛන්ධෙහි කතිහායතනෙහි කතිහි ධාතූහි සඞ්ගහිතා: තෙ ධම්මා චතූහි ඛන්ධෙහි ද්වීහායතනෙහි ද්වීහි ධාතූහි සඞ්ගහිතා.

කතිහි අසඞ්ගහිතා: එකෙන ඛන්ධෙන දසහායතනෙහි සොළසහි ධාතූහි අසඞ්ගහිතා.

ධම්මායතනං ධම්මධාතු[1] අථ ජීවිතං නාමරූපං,

සළායතනං ජාතිජරාමරණං දෙව ච තිකෙ න ලබ්භරෙ[2].

පඨමන්තරෙ සත්ත ච ගොච්ඡකෙ දස අපරන්තෙ චුද්දස ජ ච මජ්ඣෙ ඉච්චෙතෙ සත්තචත්තාරීස ධම්මා සමුච්ඡෙදෙ' නුපලබ්භන්ති
මොඝ පුච්ඡකෙන චා ති.

විප්පයුත්තෙන සඞ්ගහිතාසඞ්ගහිතපදනිද්දෙසො නිට්ඨිතො.

ධාතුකථාප්පකරණං සමත්තං.

---

(සංගහමසංගහං සම්පයොග විප්පයොගං පරමඤ්ඤ ච,
ගම්භීරං නිපුණං ඨානං තම්පි බුද්ධෙන දෙසිතං.
සඞ්ගහිතෙන අසඞ්ගහිතං අසඞ්ගහිතෙන ච සඞ්ගහිතං.
සඞ්ගහිතෙන සඞ්ගහිතං අසඞ්ගහිතෙන ච සඞ්ගහිතං.
ගම්භීර ධම්මං චතුසච්චගොචරං චතුප්පකාරං විභජි තථාගතො.
සම්පයුත්තෙන ච විප්පයුත්තං විප්පයුත්තෙන සම්පයුත්තං.
සම්පයුත්තෙන ච සම්පයුත්තං විප්පයුත්තෙන ච විප්පයුත්තං.
රූපී අරූපී බහු ධම්මසංකුලං විභාජි ධම්මං චතුධා තථාගතො.)

---

1. ධම්මධාතු ජීවිතං නාමං ච ලබ්භති - PTS
2. ජාතියා ජරාමරණං දෙව ච ජාතියා න ලබ්භරෙ - PTS.

63. රූපාවචර නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - අරූපාවචර නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-නෛර්‍යාණික නො වූ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් - අනියත ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක්-අරණ ධර්මයන් හා සමග යම් ධර්ම කෙනෙක් විප්‍රයුක්ත වූවාහු ද ඒ ධර්මයෝ කෙතෙක් ස්කන්ධයන් විසින් කෙතෙක් ආයතනයන් විසින් කෙතෙක් ධාතූන් විසින් සඞ්ගෘහීත වෙත් ද යත්: ඒ ධර්මයෝ සතර ස්කන්ධයන් විසින් ආයතන දෙකක් විසින් ධාතු දෙකක් විසින් සඞ්ගෘහීත වෙත්.

කෙතෙක් ස්කන්ධාදීන් විසින් අසඞ්ගෘහීත වෙත් ද යත්: එක් ස්කන්ධයක් විසින් දස ආයතනයක් විසින් සොළොස් ධාතුවක් විසින් අසඞ්ගෘහීත වෙති.

උද්දානය:

ධර්මායතන යැ ධර්ම ධාතු යැ යළි ජීවිතෙන්ද්‍රිය යැ නාම රූප යැ ෂඩායතන යැ ජාති යැ ජරා යැ මරණ යැ තිකමාතෘකාවෙහි (අජ්ඣත්ත බහිද්ධා පදය අනිදස්සන අප්පටිඝ පදය යන) දෙපදයෝ යැ යන මොහු නො ලැබෙත්.

පළමුවන අන්තර දුකයෙහි සත් පදයෙකැ ගොච්ඡකයෙහි දසපදයෙකැ අපර වූ මහන්තර දුකයෙහි තුදුස්පදයෙකැ පිට්ඨි දුකයෙහි සපදයෙකැ යන මේ සත්සාළිස් ධර්මයෝ මොස පුච්ඡකය හා වුද්දසම නය (සමුච්ඡේද) නිර්දෙශයෙහි නො ලැබෙත්.

**විප්‍රයුක්තයෙන් සඞ්ගෘහීත අසඞ්ගෘහීත පද නිර්දේශ නිමි.**

**ධාතුකථා ප්‍රකරණය සමාප්ත යි.**

අභිධම්ම පිටකෙ

# පුග්ගල-
# පඤ්ඤත්තිප්පකරණං

අභිධම්මපිටකෙ

# පුග්ගල-පඤ්ඤත්තිප්පකරණං

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

## 1 මාතිකා

ඡ පඤ්ඤත්තියො: ඛන්ධපඤ්ඤත්ති, ආයතනපඤ්ඤත්ති, ධාතු-පඤ්ඤත්ති, සච්චපඤ්ඤත්ති, ඉන්ද්‍රියපඤ්ඤත්ති, පුග්ගලපඤ්ඤත්ති ති.

කිත්තාවතා ඛන්ධානං ඛන්ධපඤ්ඤත්ති: යාවතා පඤ්චක්ඛන්ධා, රූපක්ඛන්ධො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණ-ක්ඛන්ධො. එත්තාවතා ඛන්ධානං ඛන්ධපඤ්ඤත්ති.

කිත්තාවතා ආයතනානං ආයතනපඤ්ඤත්ති: යාවතා ද්වාදසා-යතනානි චක්ඛායතනං රූපායතනං සොතායතනං සද්දායතනං ඝානායතනං ගන්ධායතනං ජිව්හායතනං රසායතනං කායායතනං ඵොට්ඨබ්බායතනං මනායතනං ධම්මායතනං. එත්තාවතා ආයතනානං ආයතනපඤ්ඤත්ති.

කිත්තාවතා ධාතූනං ධාතුපඤ්ඤත්ති: යාවතා අට්ඨාරසධාතුයො, චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු සද්දධාතු සොත-විඤ්ඤාණධාතු, ඝානධාතු ගන්ධධාතු ඝානවිඤ්ඤාණධාතු, ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණ ධාතු, මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු. එත්තාවතා ධාතූනං ධාතුපඤ්ඤත්ති.

කිත්තාවතා සච්චානං සච්චපඤ්ඤත්ති: යාවතා චත්තාරි සච්චානි, දුක්ඛසච්චං සමුදයසච්චං නිරොධසච්චං මග්ගසච්චං. එත්තාවතා සච්චානං සච්චපඤ්ඤත්ති.

### අභිධර්ම පිටකයෙහි

# පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය

---

ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට
නමස්කාර වේවා

---

## 1. මාතෘකා

ප්‍රඥප්තිහු සදෙනෙකි: ස්කන්ධ ප්‍රඥප්ති ය, ආයතන ප්‍රඥප්ති ය, ධාතු ප්‍රඥප්ති ය, සත්‍ය ප්‍රඥප්ති ය, ඉන්ද්‍රිය ප්‍රඥප්ති ය, පුද්ගල ප්‍රඥප්ති යි.

කෙතෙකින් ස්කන්ධයන්ගේ ස්කන්ධප්‍රඥප්තිය වේ ද යත්: යම් පමණෙකින් (සැකෙවින්) පඤ්චස්කන්ධය වේ ද, (විභාග විසින්) රූපස්කන්ධය, වේදනාස්කන්ධය, සංඥාස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධ යි. මෙතෙකින් ස්කන්ධයන්ගේ ස්කන්ධප්‍රඥප්තිය වේ.

කෙතෙකින් ආයතනයන්ගේ ආයතනප්‍රඥප්තිය වේ ද යත්: යම් පමණෙකින් (සැකෙවින්) දෙළොස් ආයතන කෙතෙක් වෙත් ද, (විභාග විසින්) චක්ෂුරායතන ය, රූපායතන ය, ශ්‍රොත්‍රායතන ය, ශබ්දායතන ය, ඝ්‍රාණායතන ය, ගන්ධායතන ය, ජිහ්වායතන ය, රසායතන ය, කායායතන ය, ස්ප්‍රෂ්ටව්‍යායතන ය, මනායතන ය, ධර්මායතන යැ යි. මෙතෙකින් ආයතනයන්ගේ ආයතනප්‍රඥප්තිය වේ.

කෙතෙකින් ධාතූන්ගේ ධාතුප්‍රඥප්තිය වේ ද යත්: යම් පමණෙකින් (සැකෙවින්) අටළොස් ධාතු කෙතෙක් වෙත් ද; (විභාග විසින්) චක්ෂුර්ධාතු ය, රූපධාතු ය, චක්ෂුර්විඥානධාතු ය, ශ්‍රොත්‍රධාතු ය, ශබ්දධාතු ය, ශ්‍රොත්‍රවිඥානධාතු ය, ඝ්‍රාණධාතු ය, ගන්ධධාතු ය, ඝ්‍රාණවිඥානධාතු ය, ජිහ්වාධාතු ය, රසධාතු ය, ජිහ්වාවිඥානධාතු ය, කායධාතු ය, ස්ප්‍රෂ්ටව්‍යධාතු ය, කායවිඥානධාතු ය, මනොධාතු ය, ධර්මධාතු ය, මනොවිඥානධාතු යැ යි. මෙතෙකින් ධාතූන්ගේ ධාතුප්‍රඥප්තිය වේ.

කෙතෙකින් සත්‍යයන්ගේ සත්‍යප්‍රඥප්තිය වේ ද යත්: යම් පමණෙකින් (සැකෙවින්) සතර සත්‍ය කෙතෙක් වෙත් ද, (විභාග විසින්) දුඃඛ සත්‍ය ය, සමුදය සත්‍ය ය, නිරොධසත්‍ය ය, මාර්ගසත්‍ය යැ යි. මෙතෙකින් සත්‍යයන්ගේ සත්‍යප්‍රඥප්තිය වේ.

කිත්තාවතා ඉන්ද්‍රියානං ඉන්ද්‍රියපඤ්ඤත්ති: යාවතා බාවීසතින්ද්‍රියානි: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං. එත්තාවතා ඉන්ද්‍රියානං ඉන්ද්‍රියපඤ්ඤත්ති.

කිත්තාවතා පුග්ගලානං පුග්ගලපඤ්ඤත්ති:

1. සමයවිමුත්තො
2. අසමයවිමුත්තො
3. කුප්පධම්මො
4. අකුප්පධම්මො
5. පරිහානධම්මො
6. අපරිහානධම්මො
7. චෙතනාභබ්බො
8. අනුරක්ඛනාභබ්බො
9. පුථුජ්ජනො
10. ගොත්‍රභූ
11. භයූපරතො
12. අභයූපරතො
13. භබ්බාගමනො
14. අභබ්බාගමනො
15. නියතො
16. අනියතො
17. පටිපන්නකො
18. ඵලෙඨිතො
19. සමසීසී
20. ඨිතකප්පී
21. අරියො
22. අනරියො
23. සෙඛො[1]
24. අසෙඛො[2]
25. නෙවසෙඛො නාසෙඛො[3]
26. තෙවිජ්ජො
27. ඡළභිඤ්ඤො
28. සම්මාසම්බුද්ධො
29. පච්චෙකබුද්ධො[4]
30. උභතොභාගවිමුත්තො
31. පඤ්ඤාවිමුත්තො
32. කායසක්ඛී
33. දිට්ඨිප්පත්තො
34. සද්ධාවිමුත්තො
35. ධම්මානුසාරී
36. සද්ධානුසාරී
37. සත්තක්ඛත්තුපරමො
38. කොලංකොලො
39. එකබීජී
40. සකදාගාමී
41. අනාගාමී
42. අන්තරාපරිනිබ්බායී
43. උපහච්චපරිනිබ්බායී
44. අසඞ්ඛාරපරිනිබ්බායී
45. සසඞ්ඛාරපරිනිබ්බායී
46. උද්ධංසොතො අකනිට්ඨගාමී

1. සෙක්ඛො–ම ජ සං සිහු.
2. අසෙක්ඛො–ම ජ සං
3. නෙවසෙක්ඛනාසෙක්ඛො–ම ජ සං
4. පච්චෙකසම්බුද්ධො–ම ජ සං

කෙතෙකින් ඉන්ද්‍රියයන්ගේ ඉන්ද්‍රියප්‍රඥප්තිය වේ ද යත්: යම්පමණෙකින් (සැකෙවින්) දෙවිසි ඉන්ද්‍රිය කෙනෙක් වෙත් ද, (විභාග විසින්) චක්ෂුරින්ද්‍රිය ය, ශ්‍රොත්‍රෙන්ද්‍රිය ය, ඝ්‍රාණෙන්ද්‍රිය ය, ජිහ්වෙන්ද්‍රිය ය, කායෙන්ද්‍රිය ය, මනඉන්ද්‍රිය ය, ස්ත්‍රීන්ද්‍රිය ය, පුරුෂෙන්ද්‍රිය ය, ජීවිතෙන්ද්‍රිය ය, සුඛෙන්ද්‍රිය ය, දුඃඛෙන්ද්‍රිය ය, සෞමනස්‍යෙන්ද්‍රිය ය, දෞර්මනස්‍යෙන්ද්‍රිය ය, උපෙක්ෂෙන්ද්‍රිය ය, ශ්‍රද්ධෙන්ද්‍රිය ය, වීර්‍ය්‍යෙන්ද්‍රියය, ස්මෘතීන්ද්‍රිය ය, සමාධීන්ද්‍රිය ය, ප්‍රඥෙන්ද්‍රිය ය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය ය, අඤ්ඤින්ද්‍රිය ය, අඤ්ඤතාවින්ද්‍රිය ය යි. මෙතෙකින් ඉන්ද්‍රියයන්ගේ ඉන්ද්‍රියප්‍රඥප්තිය වේ.

කොතෙකින් පුද්ගලයන්ගේ පුද්ගලප්‍රඥප්තිය වේ ද යත්:

1. සමයවිමුක්ත ය,
2. අසමයවිමුක්ත ය,
3. කොප්‍යධර්ම ය,
4. අකොප්‍යධර්ම ය,
5. පරිහාණධර්ම ය,
6. අපරිහාණධර්ම ය,
7. චෙතනාභව්‍ය ය,
8. අනුරක්ෂණාභව්‍ය ය,
9. පෘථග්ජන ය,
10. ගොත්‍රභූ ය,
11. භයොපරත ය,
12. අභයොපරත ය,
13. භව්‍යාගමන ය,
14. අභව්‍යාගමන ය,
15. නියත ය,
16. අනියත ය,
17. ප්‍රතිපන්නක ය,
18. ඵලස්ථිත ය,
19. සමශීර්ෂි ය
20. ස්ථිතකල්පී ය,
21. ආර්‍ය්‍ය ය,
22. අනාර්‍ය්‍ය ය,
23. ශෛක්ෂ ය,
24. අශෛක්ෂ ය,
25. නෛවශෛක්ෂ නාශෛක්ෂ ය,
26. ත්‍රෛවිද්‍ය ය,
27. ෂඩභිඥ ය,
28. සම්‍යක්සම්බුද්ධ ය,
29. ප්‍රත්‍යෙකබුද්ධ ය,
30. උභතොභාගවිමුක්ත ය,
31. ප්‍රඥාවිමුක්ත ය,
32. කායසාක්ෂී ය,
33. දෘෂ්ටප්‍රාප්ත ය,
34. ශ්‍රද්ධාවිමුක්ත ය,
35. ධර්මානුසාරී ය,
36. ශ්‍රද්ධානුසාරී ය,
37. සප්තකෘත්වඃපරම ය,
38. කොලංකොල ය,
39. ඒකබීජී ය,
40. සකෘදගාමී ය,
41. අනාගාමී ය,
42. අන්තරාපරිනිර්වායී ය,
43. උපහත්‍යපරිනිර්වායී ය,
44. අසංස්කාරපරිනිර්වායී ය,
45. සසංස්කාරපරිනිර්වායී ය,
46. ඌර්ධ්වංස්‍රොත අකනිෂ්ටගාමී ය,

47. සොතාපන්නො, සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නො
48. සකදාගාමී, සකදාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්නො
49. අනාගාමී, අනාගාමිඵල සච්ඡිකිරියාය පටිපන්නො
50. අරහා, අරහත්තඵල සච්ඡිකිරියාය[1] පටිපන්නො

එකක මාතිකා නිට්ඨිතා

## 2. දුක මාතිකා

1. කොධනො ච උපනාහී ච
2. මක්ඛී ච පළාසී ච
3. ඉස්සුකී ච මච්ඡරී ච
4. සඨො ච මායාවී ච
5. අහිරිකො ච අනොත්තප්පී ච
6. දුබ්බචො ච පාපමිත්තො ච
7. ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො ච භොජනෙ අමත්තඤ්ඤූ ච
8. මුට්ඨස්සති ච අසම්පජානො ච
9. සීලවිපන්නො ච දිට්ඨිවිපන්නො ච
10. අජ්ඣත්තසංයොජනො ච බහිද්ධාසංයොජනො ච
11. අක්කොධනො ච අනුපනාහී ච
12. අමක්ඛී ච අපළාසී ච
13. අනිස්සුකී ච අමච්ඡරී ච
14. අසඨො ච අමායාවී ච
15. හිරිමා ච ඔත්තප්පී ච
16. සුවචො ච කල්‍යාණමිත්තො ච
17. ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො ච භොජනෙ මත්තඤ්ඤූ ච
18. උපට්ඨිතස්සති ච සම්පජානො ච
19. සීලසම්පන්නො ච දිට්ඨිසම්පන්නො ච
20. ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං
21. ද්වෙ පුග්ගලා දුත්තප්පයා
22. ද්වෙ පුග්ගලා සුතප්පයා
23. ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති
24. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති
25. හීනාධිමුත්තො ච පණීතාධිමුත්තො ච
26. තිත්තො ච තප්පෙතා ච

දුක මාතිකා නිට්ඨිතා

---
1. අරහත්තාය - PTS.

47. ශ්‍රොතආපන්න යැ, ශ්‍රොතආපත්තිඵල සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නේ යැ,
48. සකෘදගාමී යැ, සකෘදගාමී ඵල සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නේ යැ,
49. අනාගාමී යැ, අනාගාමී ඵල සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නේ යැ,
50. අර්හත් යැ, අර්හත්ත්වඵල සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නේ යැ, (යන මෙතෙකින් පුද්ගලයන්ගේ පුද්ගලප්‍රඥප්තිය වේ.)

**ඒකක මාතෘකා නිමි.**

**ද්වික මාතෘකා**

1. ක්‍රොධ ඇත්තේ ද, බද්ධවෛර ඇත්තේ ද,
2. ගුණමකු වූයේ ද, යුගග්‍රාහ (තමා අනුන් හා සම කිරීම) ඇත්තේ ද,
3. ඊර්ෂ්‍යා ඇත්තේ ද, මාත්සර්‍ය්‍ය (මසුරු බව) ඇත්තේ ද,
4. කෛරාටික වූයේ ද, මායා ඇත්තේ ද,
5. (පාපයෙහි) ලජ්ජා නැත්තේ ද, (උපවාදයෙහි) බිය නැත්තේ ද,
6. දුර්වචස්ක වූයේ ද, පාපමිත්‍රයන් ඇත්තේ ද,
7. ඉඳුරන්හි නො පියන ලද දෙර ඇත්තේ ද, වැළැඳීමෙහි පමණ නො දන්නේ ද,
8. මුළා වූ සිහි ඇත්තේ ද, නුවණ නැත්තේ ද,
9. ශීලවිපත්තියට පැමිණියේ ද, දෘෂ්ටිවිපත්තියට පැමිණියේ ද,
10. අධ්‍යාත්ම සංයෝජන ඇත්තේ ද, බාහ්‍ය සංයෝජන ඇත්තේ ද,
11. ක්‍රෝධ නැත්තේ ද, බද්ධවෛර නැත්තේ ද,
12. ගුණමකු නො වූයේ ද, යුගග්‍රාහ (තමා අනුන් හා සම කොට ගැනුම) නැත්තේ ද,
13. ඊර්ෂ්‍යා නැත්තේ ද, මාත්සර්‍ය්‍ය (මසුරු බව) නැත්තේ ද,
14. කෛරාටික නොවූයේ ද, මායා නැත්තේ ද,
15. (පාපයෙහි) ලජ්ජා ඇත්තේ ද, (උපවාදයෙහි) බිය ඇත්තේ ද,
16. සුවච වූයේ ද, කල්‍යාණ මිත්‍රයන් ඇත්තේ ද,
17. ඉන්ද්‍රියයන්හි පියන ලද දෙර ඇත්තේ ද, වැළැඳීමෙහි පමණ දන්නේ ද,
18. එළඹ සිටි සිහි ඇත්තේ ද, නුවණ ඇත්තේ ද,
19. ශීල සම්පන්න වූයේ ද, දෘෂ්ටි සම්පන්න වූයේ ද, (වෙති.)
20. ලෝකයෙහි දුර්ලභ පුද්ගලයෝ දෙදෙනෙකි,
21. පිණවීමට දුෂ්කර පුද්ගලයෝ දෙදෙනෙකි,
22. පිණවීමට සුකර පුද්ගලයෝ දෙදෙනෙකි,
23. පුද්ගලයන් දෙදෙනකුන් ගේ ආස්‍රවයෝ වැඩෙත්,
24. පුද්ගලයන් දෙදෙනකුන් ගේ ආස්‍රවයෝ නො වැඩෙත්,
25. හීනාධිමුක්ත වූයේ ද, ප්‍රණීතාධිමුක්ත වූයේ ද,
26. තෘප්ත වූයේ ද, තෘප්තිකාරක වූයේ ද (යන මොහු ය,)

**ද්වික මාතෘකා නිමි.**

## 3. තික මාතිකා

1. නිරාසො ආසංසො විගතාසො.

2. තයො ගිලානූපමා පුග්ගලා.

3. කායසක්ඛී දිට්ඨිප්පත්තො සද්ධාවිමුත්තො.

4. ගූථභාණී පුප්ඵභාණී මධුභාණී.

5. අරුකූපම[1] චිත්තො පුග්ගලො විජ්ජූපමචිත්තො පුග්ගලො වජිරූපමචිත්තො පුග්ගලො.

6. අන්ධො එකචක්ඛු ද්විචක්ඛු.

7. අවකුජ්ජපඤ්ඤො පුග්ගලො උච්ඡඞ්ගපඤ්ඤො පුග්ගලො පුථුපඤ්ඤො පුග්ගලො.

8. අත්ථෙකච්චො පුග්ගලො කාමෙසු ච භවෙසු ච අවීතරාගො, අත්ථෙකච්චො පුග්ගලො කාමෙසු වීතරාගො භවෙසු අවීතරාගො, අත්ථෙකච්චො පුග්ගලො කාමෙසු ච භවෙසු ච වීතරාගො.

9. පාසාණලෙඛූපමො පුග්ගලො පඨවිලෙඛූපමො පුග්ගලො උදකලෙඛූපමො පුග්ගලො.

10. තයො පොත්ථකූපමා පුග්ගලා

11. තයො කාසිකවත්ථූපමා පුග්ගලා.

12. සුප්පමෙය්‍යො, දුප්පමෙය්‍යො, අප්පමෙය්‍යො.

13. අත්ථෙකච්චො පුග්ගලො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො.

අත්ථෙකච්චො පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො, අත්ථෙකච්චො පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො.

14. අත්ථෙකච්චො පුග්ගලො ජිගුච්ඡිතබ්බො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො,

අත්ථෙකච්චො පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො,

අත්ථෙකච්චො පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො.

1. අරුළුපම - PTS

### 3. ත්‍රික මාතෘකා

1. ප්‍රාර්ථනා නැත්තේ යැ, ප්‍රාර්ථනා ඇත්තේ යැ, පහ වූ ප්‍රාර්ථනා ඇත්තේ යි,
2. ගිලනාට බඳු උපමා ඇති පුද්ගලයෝ තිදෙනෙකි.
3. කායසාක්ෂී යැ, දෘෂ්ටප්‍රාප්ත යැ, ශ්‍රද්ධාවිමුක්ත යැ.
4. ගූථයට බඳු වචන ඇත්තේ යැ, පුෂ්පයට බඳු වචන ඇත්තේ යැ, මී බඳු වචන ඇත්තේ යි.
5. පැරණි ව්‍රණයට බඳු සිත් ඇති පුද්ගල යැ, විදුලියට බඳු සිත් ඇති පුද්ගල යැ, වජ්‍රයට බඳු සිත් ඇති පුද්ගල යි.
6. අන්ධ යැ, එකැස් ඇතියේ යැ, දැස් ඇතියේ යි.
7. යැටිකුරු වූ ප්‍රඥා ඇති පුද්ගල යැ, ඇකයෙහි ලූවක් බඳු ප්‍රඥා ඇති පුද්ගල යැ, පතළා වූ ප්‍රඥා ඇති පුද්ගල යි.
8. (පඤ්ච) කාමයන්හි ද, (රූපාරූප) භවයන්හි ද නො පහ වූ රාග ඇති ඇතැම් පුද්ගලයෙක් ඇත, කාමයන්හි පහ වූ රාග ඇති භවයන්හි නො පහ වූ රාග ඇති ඇතැම් පුද්ගලයෙක් ඇත, කාමයන්හි ද භවයන්හි ද පහ වූ රාග ඇති ඇතැම් පුද්ගලයෙක් ඇති.
9. ගලෙහි ඇඳි හිර බඳු පුද්ගල යැ, පොළොවෙහි ඇඳි හිර බඳු පුද්ගල යැ, දියෙහි ඇඳි හිර බඳු පුද්ගල යි.
10. සණවැහැරි කඩමාලු බඳු පුද්ගලයෝ තිදෙනෙකි.
11. කසීවත් බඳු පුද්ගලයෝ තිදෙනෙකි,
12. සුවසේ මිනියැ හැක්කේ යැ, දුකසේ මිනියැ හැක්කේ යැ, නො මිනියැ හැක්කේ යි.
13. සේවනය නො කළ යුතු භජනය නො කළ යුතු පර්යුපාසනය නො කළ යුතු කිසි පුද්ගලයෙක් ඇත,

    සේවනය කළ යුතු භජනය කළ යුතු පර්යුපාසනය කළ යුතු කිසි පුද්ගලයෙක් ඇත, සත්කාර කොට ගරුකාර කොට සේවනය කළයුතු භජනය කළයුතු පර්යුපාසනය කළයුතු කිසි පුද්ගලයෙක් ඇති.
14. පිළිකුල් කටයුතු වූ සේවනය නොකළ යුතු වූ භජනය නො කළ යුතු වූ පර්යුපාසනය නො කළ යුතු වූ ඇතැම් පුද්ගලයෙක් ඇත,

    උපෙක්ෂා කටයුතු වූ සේවනය නො කළයුතු වූ භජනය නො කළ යුතු වූ පර්යුපාසනය නො කළ යුතු වූ කිසි පුද්ගලයෙක් ඇත,

    සේවනය කළ යුතු වූ භජනය කළ යුතු වූ පර්යුපාසනය කළ යුතු වූ කිසි පුද්ගලයෙක් ඇති.

15. අපෙකච්චො පුග්ගලො සීලෙසු පරිපූරකාරී සමාධිස්මිං මත්තසොකාරී පඤ්ඤාය මත්තසොකාරී.

අපෙකච්චො පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී සමාධිස්මිං ච පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී.

අපෙකච්චො පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී සමාධිස්මිං ච පරිපූරකාරී පඤ්ඤාය ච පරිපූරකාරී.

16. තයො සත්ථාරො, අපරෙපි තයො සත්ථාරො.

**තික මාතිකා නිට්ඨිතා.**

## 4. චතුක්ක මාතිකා

1. අසප්පුරිසො, අසප්පුරිසෙන අසප්පුරිසතරො, සප්පුරිසො. සප්පුරිසෙන සප්පුරිසතරො.

2. පාපො, පාපෙන පාපතරො, කල්‍යාණො, කල්‍යාණෙන කල්‍යාණතරො.

3. පාපධම්මො, පාපධම්මෙන පාපධම්මතරො, කල්‍යාණධම්මො, කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරො.

4. සාවජ්ජො, වජ්ජබහුලො, අප්පවජ්ජො, අනවජ්ජො.

5. උග්ඝටිතඤ්ඤූ, විපඤ්චිතඤ්ඤූ[1], නෙය්‍යො, පදපරමො.

6. යුත්තපටිභානො නො මුත්තපටිභානො, මුත්තපටිභානො නො යුත්තපටිභානො, යුත්තපටිභානො ච මුත්තපටිභානො ච, නෙව යුත්තපටිභානො නො මුත්තපටිභානො.

7. චත්තාරො ධම්මකථිකා පුග්ගලා.

8. චත්තාරො වලාහකූපමා පුග්ගලා.

9. චත්තාරො මූසිකූපමා පුග්ගලා.

10. චත්තාරො අම්බූපමා පුග්ගලා.

11. චත්තාරො කුම්භූපමා පුග්ගලා.

12. චත්තාරො උදකරහදූපමා පුග්ගලා.

13. චත්තාරො බලිවද්දූපමා[2] පුග්ගලා.

14. චත්තාරො ආසිවිසූපමා පුග්ගලා.

1. විපචිතඤ්ඤූ - සිමු.
2. බලීබද්දූපමා - ම ජ සං.

15. ශීලයන්හි සපුරා කරන සුලු වූ, සමාධියෙහි එක්දෙසක් කරනසුලු වූ, ප්‍රඥායෙහි එක්දෙසක් කරන සුලු වූ ඇතැම් පුද්ගලයෙක් ඇත, ශීලයන්හි ද සපුරා කරනසුලු වූ, සමාධියෙහි ද සපුරා කරනසුලු වූ, ප්‍රඥායෙහි එක්දෙසක් කරනසුලු වූ ඇතැම් පුද්ගලයෙක් ඇත.

ශීලයන්හි ද සපුරා කරන සුලු වූ, සමාධියෙහි ද සපුරා කරනසුලු වූ, ප්‍රඥායෙහි ද සපුරා කරනසුලු වූ කිසි පුද්ගලයෙක් ඇති.

16. ශාස්තෘහු තිදෙනෙක, අන්‍ය වූ ද ශාස්තෘහු තිදෙනෙකි.

**ත්‍රික මාතෘකා නිමි.**

## 4. චතුෂ්ක මාතෘකා

1. අසත්පුරුෂ යැ, අසත්පුරුෂයාට වඩා අසත්පුරුෂතර යැ, සත්පුරුෂ යැ, සත්පුරුෂයාට වඩා සත්පුරුෂතර යි.

2. පාප යැ, පාපියාට වඩා පාපතර යැ, කල්‍යාණ යැ, කල්‍යාණයාට වඩා කල්‍යාණතර යි.

3. පාපධර්ම යැ, පාපධර්මයාට වඩා පාපධර්මතර යැ, කල්‍යාණධර්ම යැ, කල්‍යාණධර්මයාට වඩා කල්‍යාණධර්මතර යි.

4. සාවද්‍ය යැ, වද්‍ය බහුල යැ, අල්පවද්‍ය යැ, අනවද්‍ය යි.

5. උග්ඝටිතඥයැ, විපඤ්චිතඥ යැ, නේය යැ, පදපරම යි.

6. මුක්තප්‍රතිභාන නො වූ යුක්තප්‍රතිභාන යැ, යුක්තප්‍රතිභාන නො වූ මුක්තප්‍රතිභාන යැ, යුක්තප්‍රතිභාන ද මුක්තප්‍රතිභාන ද වූයේ යැ, යුක්තප්‍රතිභාන නො ද වූ මුක්ත ප්‍රතිභාන නො වූයේ යි.

7. ධර්මකථික පුද්ගලයෝ සතර දෙනෙකි.

8. වලාහකයට බඳු පුද්ගලයෝ සතර දෙනෙකි.

9. මූෂිකොපම පුද්ගලයෝ සතර දෙනෙකි.

10. අම්බූපම (අඹයට බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

11. කුම්භූපම (කළය බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

12. උදකරහදූපම (ජලාශය බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

13. බලිවර්දෙපම (ගවයා බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

14. ආශිර්විෂොපම (සර්පයාට බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

15. අපෙකච්චො පුග්ගලො, අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනියෙ ඨානෙ පසාදං උපදංසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා පසාදනියෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති.

16. අපෙකච්චො පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණා-රහස්ස අවණ්ණං භාසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනියෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති,

අපෙකච්චො පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනියෙ ඨානෙ පසාදං උපදංසිතා හොති,

17. අපෙකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන,

අපෙකච්චො පුග්ගලො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො අවණ්ණාරහස්ස අවණ්ණං. භාසිතා හොති භූතං තච්ඡං කාලෙන,

අපෙකච්චො පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

අපෙකච්චො පුග්ගලො නෙව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

15. තුලනය නො කොට නුවණින් ගුණයට නො බැස නුගුණ කියයුත්තා ගේ ගුණ කියන කිසි පුද්ගලයෙක් ඇත,

තුලනය නො කොට නුවණින් ගුණයට නො බැස ගුණ කියයුත්තා ගේ නුගුණ කියන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

තුලනය නො කොට නුවණින් ගුණයට නො බැස නො පැහැදිය යුතු තැන ප්‍රසාදය උපදවන්නේ වේ ද (එබඳු) කිසි පුද්ගලයෙක් ඇත,

තුලනය නො කොට නුවණින් ගුණයට නො බැස පැහැදිය යුතු තැන අප්‍රසාදය උපදවන්නේ වේ ද (එබඳු) කිසි පුද්ගලයෙක් ඇති.

16. තුලනය කොට නුවණින් ගුණයට බැස නුගුණ කිය යුත්තා ගේ නුගුණ කියන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

තුලනය කොට නුවණින් ගුණයට බැස ගුණ කිය යුත්තා ගේ ගුණ කියන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

තුලනය කොට නුවණින් ගුණයට බැස නො පැහැදිය යුතු තැන අප්‍රසාදය උපදවන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත.

තුලනය කොට නුවණින් ගුණයට බැස පැහැදිය යුතු තැන ප්‍රසාදය උපදවන්නේ වේ ද (එබඳු) කිසි පුද්ගලයෙක් ඇති.

17. නුගුණ කියයුත්තා ගේ විද්‍යමාන වූ සත්‍ය වූ නුගුණ සුදුසු කල්හි කියන්නේ වේ ද, එතෙකුදු වුවත් ගුණ කිය යුත්තා ගේ විද්‍යමාන වූ සත්‍ය වූ ගුණ සුදුසු කල්හි නො කියන්නේ වේ ද (එබඳු) කිසි පුද්ගලයෙක් ඇත.

ගුණ කියයුත්තා ගේ විද්‍යමාන වූ සත්‍ය වූ ගුණ සුදුසු කල්හි කියන්නේ වේ ද, එතෙකුදු වුවත් නුගුණ කියයුත්තා ගේ විද්‍යමාන වූ සත්‍ය වූ නුගුණ සුදුසු කල්හි නො කියන්නේ වේ ද, (එබඳු) ඇතැම් පුද්ගල යෙක් ඇත.

නුගුණ කිය යුත්තා ගේ විද්‍යමාන වූ තථ්‍ය වූ නුගුණ සුදුසු කල්හි කියන්නේ වේ ද, ගුණකියයුත්තා ගේ (ද) විද්‍යමාන වූ තථ්‍ය වූ ගුණ සුදුසු කල්හි කියන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත.

නුගුණ කියයුත්තා ගේ විද්‍යමාන වූ තථ්‍ය වූ නුගුණ සුදුසු කාලයෙහි නො මැ කියන්නේ වේ ද, ගුණ කියයුත්තාගේ ද විද්‍යමාන වූ තථ්‍ය වූ ගුණ සුදුසු කල්හි නො කියන්නේ වේ ද (එබඳු) පුද්ගලයෙක් ඇති.

18. උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී,
පුඤ්ඤඵලූපජීවී නො උට්ඨානඵලූපජීවී,
උට්ඨානඵලූපජීවී ච පුඤ්ඤඵලූපජීවී ච.
නෙව උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී.

19. තමොතම පරායනො, තමො ජොතිපරායනො, ජොතිතම පරායනො, ජොති ජොති පරායනො.

20. ඔනතොනතො, ඔනතුන්නතො, උන්නතොනතො, උන්නතුන්නතො.

21. චත්තාරො රුක්ඛූපමා පුග්ගලා.

22. රූපප්පමාණො රූපප්පසන්නො, ඝොසප්පමාණො ඝොසප්පසන්නො, ලූඛප්පමාණො ලූඛප්පසන්නො, ධම්මප්පමාණො ධම්මප්පසන්නො

23. අපෙකච්චො පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය,

අපෙකච්චො පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය,

අපෙකච්චො පුග්ගලො අත්තහිතාය චෙව පටිපන්නො හොති පරහිතාය ච,

අපෙකච්චො පුග්ගලො නෙවත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

24. අපෙකච්චො පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො,

අපෙකච්චො පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො,

අපෙකච්චො පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච පරපරිතාපනානුයොගමනුයුත්තො,

18. පුණ්‍යඵලයෙන් නො ව උත්ථාන (වීර්‍ය) ඵලයෙන් දිවිරක්නේ යැ,
උත්ථානඵලයෙන් නො ව පුණ්‍යඵලයෙන් දිවිරක්නේ යැ,
උත්ථාන ඵලයෙනුත් පුණ්‍යඵලයෙනුත් දිවිරක්නේ යැ,
උත්ථාන ඵලයෙනුත් පුණ්‍යඵලයෙනුත් දිවි නො රක්නේ යි.

19. අඳුරින් අඳුරට යන්නේ යැ, අඳුරින් එළියට යන්නේ යැ, එළියෙන් අඳුරට යන්නේ යැ, එළියෙන් එළියට යන්නේ යි.

20. අවනත වැ සිට අවනත වන්නේ යැ,
අවනත වැ සිට උන්නත වන්නේ යැ,
උන්නත වැ සිට අවනත වන්නේ යැ,
උන්නත වැ සිට උන්නත වන්නේ යි.

21. වෘක්ෂොපම (රුකක් බඳු) පුද්ගලයෝ සතර දෙනෙකි.

22. රූප ප්‍රමාණ රූප ප්‍රසන්න යැ, ඝොෂ ප්‍රමාණ ඝොෂ ප්‍රසන්න යැ, රූක්ෂ ප්‍රමාණ රූක්ෂ ප්‍රසන්න යැ, ධර්ම ප්‍රමාණ ධර්ම ප්‍රසන්න යි.

23. තමාට හිත පිණිස පිළිපන්නේ පරහට හිත පිණිස පිළිපන්නේ නො වේ ද (එබඳු) එක්තරා පුද්ගලයෙක් ඇත,

පරහට හිත පිණිස පිළිපන්නේ තමාහට හිත පිණිස පිළිපන්නේ නො වේ ද (එබඳු) එක්තරා පුද්ගලයෙක් ඇත,

තමහට හිත පිණිස ද පිළිපන්නේ ම පරහට ද හිත පිණිස පිළිපන්නේ වේ ද (එබඳු) එක්තරා පුද්ගලයෙක් ඇත,

තමහට හිත පිණිස නො පිළිපන්නේ ම පරහට හිත පිණිස (ද) නො පිළිපන්නේ වේ ද (එබඳු) එක්තරා පුද්ගලයෙක් ඇති.

24. තමා තවන්නේ තමන් තවන ප්‍රතිපදාවෙහි යෙදුවේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

අනුන් තවන්නේ අනුන් තවන ප්‍රතිපදාවෙහි යෙදුණේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

තමා තවන්නේ තමන් තවන ප්‍රතිපදාවෙහි යෙදුණේ ද, අනුන් තවන්නේ අනුන් තවන ප්‍රතිපදාවෙහි යෙදුණේත් වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

අත්ථෙකච්චො පුග්ගලො නෙව අත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො න පරපරිතාපනානුයොගමනුයුත්තො, සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

25. සරාගො, සදොසො, සමොහො, සමානො.

26. අත්ථෙකච්චො පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

අත්ථෙකච්චො පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤාධම්මවිපස්සනාය, න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස.

අත්ථෙකච්චො පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

අත්ථෙකච්චො පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

27. අනුසොතගාමී පුග්ගලො, පටිසොතගාමී පුග්ගලො, ඨිතත්තො පුග්ගලො, තිණ්ණො පාරගතො[1]. ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

28. අප්පස්සුතො සුතෙන අනුපපන්නො, අප්පස්සුතො සුතෙන උපපන්නො, බහුස්සුතො සුතෙන අනුපපන්නො, බහුස්සුතො සුතෙන උපපන්නො.

29. සමණමචලො, සමණපදුමො, සමණපුණ්ඩරීකො, සමණෙසු සමණසුඛුමාලො.

චතුක්ක මාතිකා නිට්ඨිතා.

---

1. පාරඞ්ගතො-ම ජ සං

තමා නො තවන්නේ ම තමා තවන ප්‍රතිපදයෙහි නො යෙදුණේ, අනුන් නො තවන්නේ අනුන් තවන ප්‍රතිපදයෙහි නො යෙදුණේ වේ ද, හෙතෙම තමා නො තවන්නේ අනුන් නො තවන්නේ මෙ අත්බැව්හි ම තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳුනේ ශ්‍රේෂ්ඨ වූ ආත්මයෙන් යුතු ව වාස කෙරේ ද, (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇති.

25. රාග සහිත යැ, ද්වේෂ සහිත යැ, මෝහ සහිත යැ, මානසහිත යි.

26. අධ්‍යාත්මයෙහි චිත්තශමථය ලබන්නේ අධිප්‍රඥා ධර්මවිදර්ශනාව නො ලබන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

අධිප්‍රඥාධර්මවිදර්ශනාව ලබන්නේ, අධ්‍යාත්මයෙහි චිත්තශමථය නො ලබන්නේ වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

අධ්‍යාත්මයෙහි චිත්තශමථය ලබන්නේ ම අධිප්‍රඥා ධර්මවිදර්ශනාව ලබන්නේත් වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇත,

අධ්‍යාත්මයෙහි චිත්තශමථය නො ලබන්නේ ම අධිප්‍රඥාධර්ම-විදර්ශනාව නො ලබන්නේත් වේ ද (එබඳු) ඇතැම් පුද්ගලයෙක් ඇති.

27. (සංසාර ස්‍රොතස්හි) යටිගං බලා යන සුලු පුද්ගල යැ, උඩුගං බලා යන සුලු පුද්ගල යැ, ස්ථිතාත්ම පුද්ගල යැ, තරණය කළ පරතෙරට ගිය ගොඩසිටුනා බ්‍රාහ්මණ යි.

28. අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න යැ, අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න යැ, බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න යැ, බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න යි.

29. සමණමචල යැ, සමණපදුමයා, සමණපුණ්ඩරීක යැ, මහණුන්-අතුරෙහි සමණ සුඛමාල යි.

**චතුෂ්ක මාතෘකා නිමි.**

## 5. පඤ්චක මාතිකා

1. අත්ථෙකච්චො පුග්ගලො ආරභති[1] ච විප්පටිසාරී ච හොති තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

අත්ථෙකච්චො පුග්ගලො ආරභති න විප්පටිසාරී ච හොති තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

අත්ථෙකච්චො පුග්ගලො නාරභති විප්පටිසාරී හොති තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

අත්ථෙකච්චො පුග්ගලො නාරභති න විප්පටිසාරී හොති තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

අත්ථෙකච්චො පුග්ගලො නාරභති න විප්පටිසාරී හොති තඤ්ච චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති.

2. දත්වා අවජානාති, සංවාසෙන අවජානාති, ආධෙය්‍යමුඛො හොති, ලොලො හොති මන්දො මොමූහො හොති.

3. පඤ්ච යොධාජීවූපමා පුග්ගලා.

4. පඤ්ච පිණ්ඩපාතිකා.

5. පඤ්ච ඛලුපච්ඡාභත්තිකා.

6. පඤ්ච එකාසනිකා.

7. පඤ්ච පංසුකූලිකා.

8. පඤ්ච තෙචීවරිකා.

9. පඤ්ච ආරඤ්ඤිකා.

10. පඤ්ච රුක්ඛමූලිකා.

11. පඤ්ච අබ්භොකාසිකා.

12. පඤ්ච නෙසජ්ජිකා,

13. පඤ්ච යථාසන්ථතිකා.

14. පඤ්ච සොසානිකා.

පඤ්චක මාතිකා නිට්ඨිතා.

1. ආරබ්භති – ම ජ සං

## 5. පඤ්චක මාතෘකා

1. ඇවතට පැමිණෙයි, (සිකපද මඩී) විපිළිසර ද වෙයි, ඒ චිත්ත-විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇතිසැටියෙන් නො දනී. යම් තැනක ඔහුගේ ඒ උපන ලාමක වූ අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම්, ඒ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇති සැටියෙන් නො දනී.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) ඇවතට පැමිණෙයි එතෙකුදු වත් විපිළිසර නො වෙයි. යම් තැනක ඔහු ගේ ඒ උපන් ලාමක වූ අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ චිත්ත විමුක්-තියත්, ප්‍රඥාවිමුක්තියත් ඇති සැටියෙන් නො දනී.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) ඇවැතට නො පැමිණෙයි, විපිළිසරත් වෙයි. ඒ චිත්ත විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇතිසැටියෙන් නො දනී. යම් තැනක ඔහු ගේ ඒ උපන් ලාමක වූ අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙ‍ෟ නම් ඒ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇති සැටියෙන් නො දනී.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) ඇවැතට නො පැමිණෙයි, විපිළිසර නො වෙයි. යම් තැනෙක ඔහු ගේ ඒ උපන් ලාමක වූ අකුශල ධර්මයෝ නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම්, ඒ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇති සැටියෙන් නො දනී.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) ඇවැතට නො පැමිණෙයි. විපිළිසර නො වෙයි. යම් තැනෙක ඔහුගේ ඒ උපන් ලාමක වූ අකුශලධර්මයෝ නිරවශේෂයෙන් නිරුද්ධ වෙත් නම්, ඒ චිත්ත-විමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් ඇති සැටියෙන් දන්නේ වේ,

2. දී අවමන් කරන්නේ යැ, එක් වැ වැස අවමන් කරන්නේ යැ, ආදී-වචනය ම අදහාගන්නේ යැ, ලොල් වූයේ යැ, බාල වූයේ අතිශයින් මුළා වූයේ වේ.

3. යොධාජීවූපම (යුද්ධයෙන් දිවිරක්නවුන් බඳු) පුද්ගලයෝ පස් දෙනෙකි.

4. පිණ්ඩපාතිකයෝ පස්දෙනෙකි.

5. ඛලුපච්ඡාභත්තිකයෝ (බතින් පසු නො වළඳන පුද්ගලයෝ) පස්-දෙනෙකි.

6. එකාසනිකයෝ පස්දෙනෙකි.
7. පංශුකූලිකයෝ පස්දෙනෙකි.
8. තෙචීවරිකයෝ පස්දෙනෙකි.
9. ආරඤ්ඤිකයෝ පස්දෙනෙකි.
10. රුක්ඛමූලිකයෝ පස්දෙනෙකි.
11. අබ්භොකාසිකයෝ පස්දෙනෙකි.
12. නෙසජ්ජිකයෝ පස්දෙනෙකි.
13. යථාසන්ථතිකයෝ පස්දෙනෙකි.
14. සොසානිකයෝ පස්දෙනෙකි.

පඤ්චක මාතෘකා නිමි.

## 6. ඡක්ක මාතිකා

1. අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණාති බලෙසු ච වසීභාවං.

අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, න ච තත්ථ සබ්බඤ්ඤුතං පාපුණාති න ච බලෙසු[1] වසීභාවං.

අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, සාවකපාරමිං ච පාපුණාති.

අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, න ච සාවකපාරමිං පාපුණාති.

අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති න ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං.

අත්ථෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති න ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං.

ඡක්ක මාතිකා නිට්ඨිතා.

## 7. සත්තක මාතිකා

1. සත්ත උදකූපමා පුග්ගලා; සකිං නිමුග්ගො නිමුග්ගොව හොති, උම්මුජ්ජිත්වා නිමුජ්ජති, උම්මුජ්ජිත්වා ඨිතො හොති, උම්මුජ්ජිත්වා විපස්සති විලොකෙති, උම්මුජ්ජිත්වා පතරති, උම්මුජ්ජිත්වා පටිගාධප්පත්තො හොති, උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

2. උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛී, දිට්ඨිප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී.

සත්තක මාතිකා නිට්ඨිතා.

---

1. ඵලෙසු-PTS.

## 6. ෂට්ක මාතෘකා

1. එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ ධර්මයන්හි තෙමේ ම සිව්සස් අවබෝධ කෙරෙයි, එහි සර්වඥත්වයට ද පැමිණෙයි, බලධර්මයන්හි ද වශීභාවයට පැමිණේ.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ දහම්හි තෙමේ ම සිව්සස් අවබෝධ කෙරෙයි, එහි සර්වඥත්වයට නො ද පැමිණෙයි, බල-ධර්මයන්හි වශීභාවයට නො ද පැමිණේ.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ දහම්හි තෙමේ ම සිව්සස් අවබෝධ නො කෙරෙයි, මෙ අත්බැව්හි ම දුක් කෙළවර කරන්නේ වෙයි, ශ්‍රාවකපාරමීතාවට ද පැමිණේ.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ දහම්හි තෙමේ ම සිව්සස් අවබෝධ නො කෙරෙයි, මෙ අත්බැව්හි ම දුක් කෙළවර කරන්නේ වෙයි, ශ්‍රාවකපාරමීතාවට නො ද පැමිණේ.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ දහම්හි තෙමේ ම සිව්සස් අවබොධ නො කෙරෙයි, මෙ අත්බැව්හි ම දුක් කෙළවර කරන්නේ නො ද වෙයි, මේ කාමධාතුවට නො එන්නේ අනාගාමී වේ.

එක් පුද්ගලයෙක් ඇත: (හෙතෙම) පෙර නො ඇසූ දහම්හි තෙමේ ම සිව්සස් අවබොධ නො කෙරෙයි, මෙ අත්බැව්හි ම දුක් කෙළවර කරන්නේ නො ද වෙයි, මේ කාමධාතුවට එන්නේ ආගාමී වේ.

ෂට්ක මාතෘකා නිමි.

## 7. සප්තක මාතෘකා

1. උදකොපම පුද්ගලයෝ සත්දෙනෙකි: වරක් ගිලුණේ ගිලුණේ මැ වෙයි. ඉල්පැ ගිලෙයි, ඉල්පැ සිටියේ වෙයි, ඉල්පැ අවට විමසයි බලයි, ඉල්ප පිහිනයි, ඉල්පැ නො ගැඹුරට පැමිණියේ වෙයි, ඉල්ප තරණය කෙළේ වෙයි ඒ බ්‍රාහ්මණ පරතෙර ගියේ ගොඩ සිටී.

2. උභතොභාගවිමුක්ත යැ, ප්‍රඥාවිමුක්ත යැ, කායසාක්ෂී යැ, දෘෂ්ටිප්‍රාප්ත යැ, ශ්‍රද්ධාවිමුක්ත යැ, ධර්මානුසාරියැ, ශ්‍රද්ධානුසාරී යි.

සප්තක මාතෘකා නිමි.

## 8. අට්ඨක මාතිකා

1. චත්තාරො මග්ගසමඞ්ගිනො, චත්තාරො ඵලසමඞ්ගිනො–පුග්ගලා.

අට්ඨක මාතිකා නිට්ඨිතා

## 9. නවක මාතිකා

1. සම්මා සම්බුද්ධො, පච්චෙක බුද්ධො, උභතොභාගවිමුත්තො, පඤ්ඤාවිමුත්තො, කායසක්ඛී, දිට්ඨප්පත්තො, සද්ධාවිමුත්තො, ධම්මානුසාරී, සද්ධානුසාරී.

නවක මාතිකා නිට්ඨිතා

## 10. දසක මාතිකා

1. පඤ්චන්නං ඉධ නිට්ඨා, පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා.

දසක මාතිකා නිට්ඨිතා

පුග්ගලපඤ්ඤත්ති මාතිකා නිට්ඨිතා

## 8. අෂ්ටක මාතෘකා

1. මාර්ගසමඞ්ගී පුද්ගලයෝ සතර දෙන යෑ, ඵලසමඞ්ගී පුද්ගලයෝ සතර දෙනා යි.

අෂ්ටක මාතෘකා නිමි.

## 9. නවක මාතෘකා

සම්‍යක් සම්බුද්ධ යෑ, ප්‍රත්‍යෙක බුද්ධ යෑ, උභතොභාග විමුක්ත යෑ, ප්‍රඥා විමුක්ත යෑ, කායසාක්ෂී යෑ, දෘෂ්ටප්‍රාප්ත යෑ, ශ්‍රද්ධාවිමුක්ත යෑ, ධර්මානුසාරී යෑ, ශ්‍රද්ධානුසාරී යි.

නවක මාතෘකා නිමි.

## 10. දශක මාතෘකා

පස්දෙනකුන් ගේ 'ඉහනිෂ්ඨා යෑ, පස් දෙනකුන් ගේ ඉහවිහාය-නිෂ්ඨා' යි.

දශක මාතෘකා නිමි.

**පුද්ගලප්‍රඥප්ති මාතෘකා නිමි.**

## 1. එකක නිද්දෙසො

1. කතමො ච පුග්ගලො සමයවිමුත්තො: ඉධෙකච්චො පුග්ගලො කාලෙන කාලං සමයෙන සමයං අට්ඨවිමොක්ඛෙ කායෙන ඵස්සිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො සමය විමුත්තො.

2. කතමො ච පුග්ගලො අසමයවිමුත්තො: ඉධෙකච්චො පුග්ගලො න හෙව ඛො කාලෙන කාලං සමයෙන සමයං අට්ඨවිමොක්ඛෙ කායෙන ඵස්සිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො අසමයවිමුත්තො. සබ්බෙපි අරිය පුග්ගලා අරියවිමොක්ඛෙ අසමයවිමුත්තා.

3. කතමොව ච පුග්ගලො කුප්පධම්මො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති. රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, සො ච ඛො න නිකාමලාභී හොති න අකිච්ඡලාභී න අකසිරලාභී, න යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති'පි වුට්ඨාතිපි. ඨානං ඛො පනෙතං විජ්ජති යං තස්ස පුග්ගලස්ස පමාදමාගම්ම තා සමාපත්තියො කුප්පෙය්‍යුං. අයං වුච්චති පුග්ගලො කුප්පධම්මො.

4. කතමො ච පුග්ගලො අකුප්පධම්මො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං. සො ච ඛො නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති'පි වුට්ඨාති'පි. අට්ඨානමෙතං අනවකාසො යං තස්ස පුග්ගලස්ස පමාදමාගම්ම තා සමාපත්තියො කුප්පෙය්‍යුං. අයං වුච්චති පුග්ගලො අකුප්පධම්මො. සබ්බෙපි අරියපුග්ගලා අරියෙ විමොක්ඛෙ අකුප්පධම්මා.

---

1. ඵුසිත්වා—ම ඡ සං

# 1. එකක නිර්දෙශය

1. කවර පුද්ගලයෙක් සමයවිමුක්ත වේ ද යත්: මේ (සත්ත්ව) ලෝකයෙහි එක් පුද්ගලයෙක් කලින් කලැ සමයෙන් සමයෙහි අෂ්ට-විමොක්ෂයන් (රූපාරූප අෂ්ටසමාපත්තීන්) (නාම) කයින් ස්පර්ශ කොට වෙසෙයි, ඔහු විසින් ප්‍රඥායෙන් දැක ඇතැම් ආස්‍රව කෙනෙක් ක්ෂය කරන ලද්දහු (විදර්ශනා ප්‍රඥායෙන් සංස්කාරයන් ද මාර්ගප්‍රඥායෙන් චතුස්සත්‍යධර්මයන් ද දැක යි සේ යි) මේ පුද්ගල තෙමේ සමයවිමුක්ත යැ යි කියනු ලැබේ.

2. කවර පුද්ගලයෙක් අසමය විමුක්ත වේ ද යත්: මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් කලින් කල සමයෙන් සමයෙහි අෂ්ටවිමොක්ෂයන් කයින් ස්පර්ශ කොට නො මැ වෙසෙයි, එතෙකුදු වත් ඔහු විසින් ප්‍රඥායෙන් දැක ආස්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙත්. මේ පුද්ගල අසමයවිමුක්ත යැ යි කියනු ලැබේ. සියලු ම ආර්‍ය්‍ය පුද්ගලයෝ ලොකොත්-තර විමොක්ෂයෙහි අසමයවිමුක්තයෝ යි.

3. කවර පුද්ගලයෙක් කොප්‍යධර්ම වේ ද යත්: මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසහගත (රූපාවචර) වූ හෝ අරූපසහගත (අරූපා-වචර) වූ හෝ සමාපත්තීන් ලබන සුලු වෙයි, එතෙකුදු වත් හෙතෙම කැමැති සේ ලබන්නෝ නො වෙයි, නිදුකින් ලබන්නෝ නො වෙයි, මහත්සේ ලබන්නේ නො වෙයි, කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තාක් සමවදනේ ද, (ඉන්) නැඟෙන්නේ ද නො වෙයි, යම් ප්‍රමාදයකට පැමිණ ඒ පුහුල්හුගේ ඒ සමාපත්තීහු නැසෙන්නාහු නම් තෙල කරුණ විද්‍යමාන වෙයි, මේ පුද්ගල කොප්‍යධර්ම යැයි කියනු ලැබේ.

4. කවර පුද්ගලයෙක් අකොප්‍යධර්ම වේ ද යත්: මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමාපත්තීන් ලබනසුලු යැ, තවද හෙතෙමේ කැමැති සේ ලබන සුලු යැ, නිදුකින් ලබනසුලු යැ, මහත්සේ ලබනසුලු යි. කැමැති තැනෙක කැමැති සම-වතකට කැමැති තාක් සමවදනේ ද (ඉන්) නැඟෙන්නේ ද වෙයි. යම් පමාවකට පැමිණ ඒ පුද්ගලයා ගේ ඒ සමාපත්තීහු නැසෙන්නාහු නම් තෙල කරුණ නැත, එයට ඉඩ නැත්තේ යැ. මේ පුද්ගල අකොප්‍ය ධර්ම යැ යි කියනු ලැබේ. සියලු මැ ආර්‍ය්‍ය පුද්ගලයෝ ආර්‍ය්‍යවිමොක්ෂයෙහි අකොප්‍යධර්මයෝ යි.

5. කතමො ච පුග්ගලො පරිහානධම්මො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, සො ච ඛො න නිකාමලාභී හොති න අකිච්ඡලාභී න අකසිරලාභී, න යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති පි වුට්ඨාති'පි. ඨානං ඛො පනෙතං විජ්ජති යං සො පුග්ගලො පමාදමාගම්ම තාහි සමාපත්තීහි පරිහායෙය්‍ය, අයං වුච්චති පුග්ගලො පරිහානධම්මො.

6. කතමො ච පුග්ගලො අපරිහානධම්මො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, සො ච ඛො නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති'පි වුට්ඨාතිපි. අට්ඨානමෙතං අනවකාසො යං සො පුග්ගලො පමාදමාගම්ම තාහි සමාපත්තීහි පරිහායෙය්‍ය, අයං වුච්චති පුග්ගලො අපරිහාන ධම්මො. සබ්බෙපි අරියපුග්ගලා අරියෙ විමොක්ඛෙ අපරිහානධම්මා.

7. කතමො ච පුග්ගලො චෙතනාභබ්බො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, සො ච ඛො න නිකාමලාභී හොති, න අකිච්ඡලාභී, න අකසිරලාභී, යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති'පි වුට්ඨාති'පි. සචෙ අනුසඤ්චෙතෙති න පරිහායති තාහි සමාපත්තීහි, සචෙ න අනුසඤ්චෙතෙති පරිහායති තාහි සමාපත්තීහි. අයං වුච්චති පුග්ගලො චෙතනාභබ්බො.

8. කතමො ච පුග්ගලො අනුරක්ඛනාභබ්බො: ඉධෙකච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, සො ච ඛො න නිකාමලාභී හොති න අකිච්ඡලාභී න අකසිර ලාභී, න යත්ථිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං සමාපජ්ජති පි වුට්ඨාති'පි. සචෙ අනුරක්ඛති න පරිහායති තාහි සමාපත්තීහි, සචෙ න අනුරක්ඛති පරිහායති තාහි සමාපත්තීහි. අයං වුච්චති පුග්ගලො අනුරක්ඛනාභබ්බො.

5. කවර පුද්ගලයෙක් පරිහාණධර්ම වේ ද යත්: මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමාපත්තීන් ලබනසුලු වෙයි, එතෙකුදු වත් හෙතෙම කැමැති සේ ලබන්නේ නො වෙයි, නිදුකින් ලබන්නේ නො වෙයි, විපුල වැ ලබන්නේ නො වෙයි. කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තාක් සමවදනේ ත් (ඉන්) නැඟෙන්නේත් නො වේ. යම් බඳු පමාවකට පැමිණ ඒ පුද්ගල ඒ සමාපත්තීන් ගෙන් පිරිහෙන්නේ නම් තෙල කරුණ විද්‍යමාන වේ. මේ පුද්ගල පරිහාණධර්ම යැ යි කියනු ලැබේ.

6. කවර පුද්ගලයෙක් අපරිහාණධර්ම නම් වේ ද යත්: මේ ලෝක- යෙහි එක් පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමා- පත්තීන් ලබනසුලු යැ, තවද හෙතෙම කැමැති සේ ලබන සුලු වෙයි, නිදුකින් ලබනසුලු යැ. මහත් සේ ලබන සුලු යැ, කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තාක් සමවදනේ ත් ඉන් නැඟෙන්නේ ත් වෙයි. යම් පමාවකට පැමිණ ඒ පුද්ගල ඒ සමාපත්තීන් කෙරෙන් පිරි- හෙන්නේ නම් තෙල කරුණු නැත. එයට ඉඩ නැත, මේ පුද්ගල අපරිහාණ ධර්මයැ යි කියනු ලැබේ. සියලු මැ ආර්‍ය්‍යපුද්ගලයෝ ආර්‍ය්‍යවිමොක්ෂයෙහි අපරිහාණ ධර්ම ඇත්තෝ යි.

7. කවර පුද්ගලයෙක් චේතනාභව්‍ය වේ ද යත්: මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමාපත්තීන් ලබන සුලු වෙයි, එතෙකුදු වත් හෙතෙම කැමති සේ ලබන්නේ නො වෙයි නිදුකින් ලබන්නේ නො වෙයි, මහත්සේ ලබන්නේ නො වේ, කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තාක් සමවදනේ ත් ඉන් නැඟෙන්නේත් වෙයි. ඉදින් සමවදනේ නම් ඒ සමාපත්තීන් කෙරෙන් නො පිරිහෙයි, ඉදින් නො සමවදනේ නම් ඒ සමාපත්තීන් කෙරෙන් පිරිහෙයි. මේ පුද්ගල චේතනාභව්‍ය යැ යි කියනු ලැබේ.

8. කවර පුද්ගලයෙක් අනුරක්ෂණාභව්‍ය වේ ද යත්: මේ ලෝක- යෙහි එක් පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමා- පත්තීන් ලබනසුලු වෙයි, එතෙකුදු වත් හෙතෙම කැමැති සේ ලබන්නේ නො වෙයි, නිදුකින් ලබන්නේ නො වෙයි, විපුල වැ ලබන්නේ නො වේ, කැමැති තැනෙක කැමැති සමවතකට කැමැති තාක් සමවදනේ ත් ඉන් නැඟෙන්නේ ත් නොවේ. ඉදින් රක්නේ නම් ඒ සමාපත්තීන් කෙරෙන් නො පිරිහෙයි, ඉදින් නො රක්නේ නම් ඒ සමාපත්තීන් කෙරෙන් පිරිහෙයි. මේ පුද්ගල අනුරක්ෂණාභව්‍ය යැ යි කියනු ලැබේ.

9. කතමො ච පුග්ගලො පුථුජ්ජනො: යස්ස පුග්ගලස්ස තීණි සංයොජනානි අප්පහීනානි න ච තෙසං ධම්මානං පහානාය පටිපන්නො, අයං වුච්චති පුග්ගලො පුථුජ්ජනො.

10. කතමො ච පුග්ගලො ගොත්‍රභූ: යෙසං ධම්මානං සමනන්තරා අරියධම්මස්ස අවක්කන්ති හොති තෙහි ධම්මෙහි සමන්නාගතො, අයං වුච්චති පුග්ගලො ගොත්‍රභූ.

11–12. කතමො ච පුග්ගලො භයූපරතො: සත්ත සෙඛා භයූපරතා යෙ ච පුථුජ්ජනා සීලවන්තා; අරහා අභයූපරතො.

13. කතමො ච පුග්ගලො අභබ්බාගමනො: යෙ තෙ පුග්ගලා කම්මාවරණෙන සමන්නාගතා කිලෙසාවරණෙන සමන්නාගතා විපාකාවරණෙන සමන්නාගතා අස්සද්ධා අච්ඡන්දිකා දුප්පඤ්ඤා එළා[1] අභබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං, ඉමෙ වුච්චන්ති පුග්ගලා අභබ්බාගමනා.

14. කතමො ච පුග්ගලො භබ්බාගමනො: යෙ තෙ පුග්ගලා න කම්මාවරණෙන සමන්නාගතා, න කිලෙසාවරණෙන සමන්නාගතා, න විපාකාවරණෙන සමන්නාගතා, සද්ධා ඡන්දිකා පඤ්ඤවන්තා අනෙළා[2] භබ්බා නියාමං ඔක්කමිතුං කුසලෙසු ධම්මෙසු සම්මත්තං, ඉමෙ වුච්චන්ති පුග්ගලා භබ්බාගමනා.

15–16. කතමො ච පුග්ගලො නියතො: පඤ්ච පුග්ගලා ආනන්තරියකා යෙ ච මිච්ඡා දිට්ඨිකා නියතා, අට්ඨ ච අරියපුග්ගලා නියතා. අවසෙසා පුග්ගලා අනියතා.

17–18. කතමො ච පුග්ගලො පටිපන්නකො: චත්තාරො මග්ග සමඞ්ගිනො පුග්ගලා පටිපන්නකා, චත්තාරො ඵලසමඞ්ගිනො පුග්ගලා ඵලෙ ඨිතා.

19. කතමො ච පුග්ගලො සමසීසී: යස්ස පුග්ගලස්ස අපුබ්බං අචරිමං ආසවපරියාදානං ච හොති ජීවිතපරියාදානං ච, අයං වුච්චති පුග්ගලො සමසීසී.

---

1. එළා – සිමු – ජලා – PTS.
2. පඤ්ඤවන්තො සිමු

9. කවර පුද්ගලයෙක් පෘථග්ජන වේ ද යත්: යම් පුද්ගලයකු ගේ සංයොජනයෝ තිදෙනෙක් ප්‍රහීණ නො වූවාහු ද, ඒ සංයොජනධර්මයන් ගේ ප්‍රහාණය පිණිස නො පිළිපන්නේ ත් වේ ද, මේ පුද්ගල පෘථග්ජන යි කියනු ලැබේ.

10. කවර පුද්ගලයෙක් ගොත්‍රභූ වේ ද යත්: යම් ධර්මකෙනකුන්ට සමනන්තරව ආර්යමාර්ගයාගේ පහළ වීම වේ ද, ඒ ධර්මයන්ගෙන් යුක්ත වූ මේ පුද්ගල ගොත්‍රභූ යි කියනු ලැබේ.

11–12. කවර පුද්ගලයෙක් භයොපරත වේ ද යත්: සප්ත ශෛක්ෂයෝ ද, යම් පෘථග්ජන සිල්වත් කෙනෙක් වෙත් නම් ඔහු ද භයොපරත යෝ යැ, අර්හත් තෙමේ අභයොපරත වූයේ යි.

13. කවර පුද්ගලයෙක් අභව්‍යාගමන වේ ද යත්: යම් ඒ පුද්ගල කෙනෙක් කර්මාවරණයෙන් යුක්ත වූවාහු ක්ලෙශාවරණයෙන් යුක්ත වූවාහු විපාකාවරණයෙන් යුක්ත වූවාහු ශ්‍රද්ධා රහිත වූවාහු කර්තුකම්‍යතා කුශලච්ඡන්ද රහිත වූවාහු භවාඞ්ග (ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි) ප්‍රඥා රහිත වූවාහු, ජඩ වූවාහු කුශලධර්මයන්හි මාර්ග නියාමයට බැස ගන්නට අභව්‍ය වූවාහු ද මේ පුද්ගලයෝ අභව්‍යාගමනයෝ යි කියනු ලැබෙත්.

14. කවර පුද්ගලයෙක් භව්‍යාගමන වේ ද යත්: යම් ඒ පුද්ගල කෙනෙක් කර්මාවරණයෙන් යුක්ත නො වූවාහු, ක්ලේශාවරණයෙන් යුක්ත නො වූවාහු, විපාකාවරණයෙන් යුක්ත නො වූවාහු, ශ්‍රද්ධා ඇත්තාහු, කර්තුකම්‍යතා කුශලච්ඡන්ද ඇත්තාහු, ප්‍රඥා ඇත්තාහු කුශලධර්මයනාහි මාර්ගනියාමයට බැස ගන්නට භව්‍ය (සුදුසු) වූවාහු ද, මේ පුද්ගලයෝ භව්‍යාගමනයෝ යි කියනු ලැබෙත්.

15–16. කවර පුද්ගලයෙක් නියත වේ ද යත්: ආනන්තර්‍ය්‍ය කර්ම සමඞ්ගී පුද්ගලයෝ පස් දෙනා ද නියත මිථ්‍යාදෘෂ්ටික වූ යම් කෙනෙක් වෙත් නම් ඔහු ද, ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනා ද නියතයෝ යැ, අවශෙෂ පුද්ගලයෝ අනියතයෝ යි.

17–18. කවර පුද්ගලයෙක් ප්‍රතිපන්නක වේ ද යත්: මාර්ග සමඞ්ගී පුද්ගලයෝ සතර දෙන ප්‍රතිපන්නකයෝ යැ, ඵලසමඞ්ගී පුද්ගලයෝ සතර දෙන ඵලයෙහි සිටියෝ යි.

19. කවර පුද්ගලයෙක් සමසීසී වේ ද යත්: යම් පුද්ගලයක්හු ගේ පෙර පසු නො වැ ආශ්‍රවක්ෂයත් ජීවිතක්ෂයත් වේ ද, මේ පුද්ගල සමසීසී යැ යි කියනු ලැබේ.

20. කතමො ච පුග්ගලො ඨිතකප්පී: අයං ච පුග්ගලො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො අස්ස, කප්පස්ස ච උඩ්ඩය්හනවෙලා අස්ස. නෙව තාව කප්පො උඩ්ඩය්හෙය්‍ය, යාවායං පුග්ගලො න සොතාපත්තිඵලං සච්ඡිකරොති. අයං වුච්චති පුග්ගලො ඨිතකප්පී සබ්බෙපි මග්ගසමඞ්ගිනො පුග්ගලා ඨිතකප්පිනො.

21–22. කතමො ච පුග්ගලො අරියො: අට්ඨාරියපුග්ගලා අරියා, අවසෙසා පුග්ගලා අනරියා.

23–25. කතමො ච පුග්ගලො සෙඛො: චත්තාරො මග්ගසමඞ්ගිනො තයො ඵලසමඞ්ගිනො පුග්ගලා සෙඛා, අරහා අසෙඛො, අවසෙසා පුග්ගලා නෙව සෙඛා නාසෙක්ඛා.

26. කතමො ච පුග්ගලො තෙවිජ්ජො: තීහි විජ්ජාහි සමන්නාගතො පුග්ගලො තෙවිජ්ජො.

27. කතමො ච පුග්ගලො ඡළභිඤ්ඤො: ඡහි අභිඤ්ඤාහි සමන්නාගතො පුග්ගලො ඡළභිඤ්ඤො.

28. කතමො ච පුග්ගලො සම්මාසම්බුද්ධො: ඉධෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණාති බලෙසු ච වසීභාවං. අයං වුච්චති පුග්ගලො සම්මාසම්බුද්ධො.

29. කතමො ච පුග්ගලො පච්චෙකසම්බුද්ධො: ඉධෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, න ච තත්ථ සබ්බඤ්ඤුතං පාපුණාති න ච බලෙසු වසීභාවං. අයං වුච්චති පුග්ගලො පච්චෙකසම්බුද්ධො.

30. කතමො ච පුග්ගලො උභතොභාගවිමුත්තො: ඉධෙකච්චො පුග්ගලො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො උභතොභාග විමුත්තො.

1. ඵුසිත්වා-ම ඡ සං

20. කවර පුද්ගලයෙක් ස්ථිතකල්පී වේ ද යත්: මේ පුද්ගලයා ත් සෝවාන්ඵලය පසක් කරන්නට පිළිපන්නේ වේ නම් කල්පය තමාත් දැවෙන වේලාව වේ නම් යම්තාක් මේ පුද්ගල සෝවාන්ඵලය සාක්ෂාත් නො කෙරෙයි ද, ඒ තාක් කල්පය තෙමේ නො දැවේ මැ යි. මේ පුද්ගල ස්ථිතකල්පී යැ යි කියනු ලැබේ. මාර්ගස්ථ වූ සියලු මැ පුද්ගලයෝ ස්ථිතකල්පීහු යි.

21-22. කවර පුද්ගලයෙක් 'ආර්‍ය්‍ය' වේ ද යත්: අෂ්ටාර්‍ය්‍ය පුද්ගලයෝ ආර්‍ය්‍යයෝ යැ, සෙසු පුද්ගලයෝ අනාර්‍ය්‍යයෝ යි.

23-25. කවර පුද්ගලයෙක් 'ශෛක්ෂ' වේ ද යත්: මාර්ගස්ථ පුද්ගලයෝ සතර දෙනා යැ, ඵලස්ථ පුද්ගලයෝ තිදෙනා යැ යන මොහු ශෛක්ෂයෝ යැ, අර්හත් තෙමේ අශෛක්ෂ යැ, සෙසු පුද්ගලයෝ ශෛක්ෂත් අශෛක්ෂත් නො වූවෝ යි.

26. කවර පුද්ගලයෙක් තේවිජ්ජ වේ ද යත්: ත්‍රිවිද්‍යායෙන් යුක්ත වූ පුද්ගල තේවිජ්ජ නම් වෙයි.

27. කවර පුද්ගලයෙක් 'ඡළභිඤ්ඤ' වේ ද යත්: සවැදෑරුම් අභිඥායෙන් යුක්ත වූ පුද්ගල 'ඡළභිඤ්ඤ' නම් වෙයි.

28. කවර පුද්ගලයෙක් 'සම්මාසම්බුද්ධ' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි සත්‍යයන් තෙමේ අවබෝධ කොට ගනියි, යළි එහි සර්වඥ බවට පැමිණෙයි, (දශ) බලඥානයෙහි ද වශීභාවයට පැමිණෙයි. මේ පුද්ගල 'සම්මාසම්බුද්ධ' යැයි කියනු ලැබේ.

29. කවර පුද්ගලයෙක් 'පච්චෙකසම්බුද්ධ' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි සත්‍යයන් තෙමේ අවබෝධ කොට ගනී. එතෙකුදු වත් එහි සර්වඥභාවයට නො පැමිණෙයි. (දශ) බලඥානයෙහි වශීභාවයට ද නො පැමිණෙයි. මේ පුද්ගල 'පච්චෙකසම්බුද්ධ' යැයි කියනු ලැබේ.

30. කවර පුද්ගලයෙක් 'උභතොභාග විමුක්ත' වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් (නාම) කයින් ස්පර්ශ කොට වාස කරයි. (විදර්ශනා – මාර්ග) ප්‍රඥායෙන් දැක මොහු ගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහු ද වෙත්. මේ පුද්ගල 'උභතොභාගවිමුක්ත' යැයි කියනු ලැබේ.

31. කතමො ච පුග්ගලො පඤ්ඤාවිමුත්තො: ඉධෙකච්චො පුග්ගලො නහෙව ඛො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො පඤ්ඤාවිමුත්තො.

32. කතමො ච පුග්ගලො කායසක්ඛී: ඉධෙකච්චො පුග්ගලො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා. විහරති පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො කායසක්ඛී.

33. කතමො ච පුග්ගලො දිට්ඨිප්පත්තො: ඉධෙ කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛ-නිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො දිට්ඨිප්පත්තො.

34. කතමො ච පුග්ගලො සද්ධාවිමුත්තො: ඉධෙකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛ-නිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති, නො ච ඛො යථා දිට්ඨිප්පත්තස්ස අයං වුච්චති පුග්ගලො සද්ධාවිමුත්තො.

35. කතමො ච පුග්ගලො ධම්මානුසාරී: යස්ස පුග්ගලස්ස සොතා-පත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති පඤ්ඤාවාහි පඤ්ඤාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති. අයං වුච්චති පුග්ගලො ධම්මානුසාරී. සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො පුග්ගලො ධම්මානුසාරී. ඵලෙ ඨිතො දිට්ඨිප්පත්තො.

31. කවර පුද්ගලයෙක් 'ප්‍රඥාවිමුක්ත' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් කයින් සපර්ශ කොට නො මැ වසයි, ප්‍රඥායෙන් දැක මොහු ගේ ආශ්‍රවයෝ ක්ෂය වූවාහු ද වෙත්. මේ පුද්ගල 'ප්‍රඥාවිමුක්ත' යැ යි කියනු ලැබේ.

32. කවර පුද්ගලයෙක් 'කායසාක්ෂි' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් කයින් ස්පර්ශ කොට වාස කරයි. යළි ප්‍රඥායෙන් දැක මොහුගේ ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය වූවාහු වෙත්. මේ පුද්ගල තෙමේ 'කාය සාක්ෂි' යි කියනු ලැබේ.

33. කවර පුද්ගලයෙක් 'දෘෂ්ටප්‍රාප්ත' වේ ද යත්: මේ ලොවැ එක් පුද්ගලයෙක් මේ (උපාදානස්කන්ධපඤ්චකය) දුකැ යි ඇති සැටියෙන් දනියි, මේ (තෘෂ්ණාව) දුඃඛසමුදය යැ යි ඇති සැටියෙන් දනියි, මේ (තෘෂ්ණා නිරොධය) දුඃඛනිරොධය යැ යි ඇති සැටියෙන් දනි, මේ (ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය) දුක් නැති කරන පිළිවෙතැ යි ඇති සැටියෙන් දනියි. තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද (චතුස්සත්‍ය) ධර්මයෝ ද මොහු විසින් නුවණින් මොනවට දක්නා ලද්දාහු හසළාහු වෙති, තව ද නුවණින් දැක මොහු ගේ ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය වූවාහු වෙත්. මේ පුද්ගල 'දෘෂ්ටප්‍රාප්ත' යි කියනු ලැබේ.

34. කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධාවිමුක්ත' වේ ද යත්: මෙ ලොවැ එක් පුද්ගලයෙක් මේ දුකැ යි ඇතිසැටියෙන් දනියි, මේ දුක් ඇති වීමේ හෙතු යැ යි ඇති සැටියෙන් දනියි, මේ දුක් නැති වීමැ යි ඇති සැටියෙන් දනියි, මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් දනියි, තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද ධර්මයෝ ද මොහු විසින් නුවණින් මොනවට දක්නා ලද්දාහු හසළාහු වෙති, නුවණින් දැක මොහුගේ ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය වූවාහු ද වෙත්. එහෙත් දෘෂ්ටප්‍රාප්තයා හට බඳු නො වේ. මේ පුද්ගල 'ශ්‍රද්ධාවිමුක්ත' යි කියනු ලැබේ.

35. කවර පුද්ගලයෙක් 'ධර්මානුසාරී' වේ ද යත්: සොතාපත්ති ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් යම් පුද්ගලයකහු ගේ ප්‍රඥෙන්ද්‍රිය බලවත් වේ ද, ප්‍රඥාව එළවන සුලු ප්‍රඥා පූර්වඞ්ගම වූ ආර්‍ය්‍යමාර්ගය වඩා ද මේ පුද්ගල 'ධර්මානුසාරි' යැ යි කියනු ලැබේ. සෝවන් ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් පුද්ගල 'ධර්මානුසාරි' වෙයි. ඵලයෙහි සිටියේ දෘෂ්ටප්‍රාප්ත යි.

36. කතමො ච පුග්ගලො සද්ධානුසාරි: යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස සද්ධින්ද්‍රියං අධිමත්තං හොති සද්ධාවාහිං සද්ධාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති: අයං වුච්චති පුග්ගලො සද්ධානුසාරි, සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නො පුග්ගලො සද්ධානුසාරී, ඵලෙ ඨිතො සද්ධාවිමුත්තො,

37. කතමො ච පුග්ගලො සත්තක්ඛත්තුපරමො: ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො, සො සත්තක්ඛත්තුං දෙවෙ ච මනුස්සෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති. අයං වුච්චති පුග්ගලො සත්තක්ඛත්තුපරමො.

38. කතමො ච පුග්ගලො කොලංකොලො: ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො, සො ද්වෙ වා තීණි වා කුලානි සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරොති. අයං වුච්චති පුග්ගලො කොලඞ්කොලො.

39. කතමො ච පුග්ගලො එකබීජී: ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො, සො එකං යෙව මානුසකං භවං නිබ්බත්තෙත්වා දුක්ඛස්සන්තං කරොති. අයං වුච්චති පුග්ගලො එකබීජී.

40. කතමො ච පුග්ගලො සකදාගාමී: ඉධෙකච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයං වුච්චති පුග්ගලො සකදාගාමී.

41. කතමො ච පුග්ගලො අනාගාමී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, අයං වුච්චති පුග්ගලො අනාගාමී.

36. කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධානුසාරී' වේ ද යත්: සොතාපත්තිඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් යම් පුද්ගලයකුගේ ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වේ ද ශ්‍රද්ධාව එළවන සුලු වූ ශ්‍රද්ධාපූර්වඞ්ගම වූ ආර්‍ය්‍යමාර්ගය වඩා ද මේ පුද්ගල තෙමේ 'ශ්‍රද්ධානුසාරී' යැ යි කියනු ලැබේ. සොවාන්ඵල පසක් කරනු පිණිස පිළිපන් පුද්ගල තෙමේ 'ශ්‍රද්ධානුසාරී' වෙයි, ඵලයෙහි සිටියේ 'ශ්‍රද්ධාවිමුක්ත' යි.

37. කවර පුද්ගලයෙක් 'සත්තක්ඛත්තුපරම' වේ ද යත්: මෙලෙව්හි එක් පුද්ගලයෙක් සංයොජනත්‍රයක්හු ගේ ක්ෂයවීමෙන් අපායගමන රහිත වූයේ මාර්ගනියත වූයේ සම්බොධිය පිහිට කොට ඇත්තේ සොතාපන්න වේ ද හෙතෙම සත් වරක් දෙව්ලොව ද මිනිස් ලොව ද (ප්‍රතිසන්ධි වශයෙන්) දිවැ-සැරිසරා දුක් කෙළවර කරයි. මේ පුද්ගල 'සත්තක්-ඛත්තු පරම' යැ කියනු ලැබේ.

38. කවර පුද්ගලයෙක් 'කොලංකොල' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් සංයෝජනත්‍රයක්හු ගේ ක්ෂය වීමෙන් අපායගමන රහිත වූයේ මාර්ගනියත වූයේ සම්බොධිය පිහිට කොට ඇත්තේ සොතාපන්න වේ ද, හෙතෙම භව දෙකක් හෝ තුනක් දිවැ සැරිසරා දුක් කෙළවර කරයි. මේ පුද්ගල 'කොලංකොල' යි කියනු ලැබේ.

39. කවර පුද්ගලයෙක් 'එකබීජී' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් සංයෝජනත්‍රයක් ක්ෂය වීමෙන් අපායගමන රහිත වූයේ මාර්ගනියත වූයේ සම්බොධිය පිහිට කොට ඇත්තේ සොතාපන්න වේ ද, හෙතෙම එක් මැ මිනිස් භවයක් උපදවා දුක් කෙළවර කරයි. මේ පුද්ගල 'ඒකබීජී' යි කියනු ලැබේ.

40. කවර පුද්ගලයෙක් 'සකදාගාමී' වේ ද යත්: මේ ලොවැ එක් පුද්ගලයෙක් සංයොජන තුනක් ක්ෂය වීමෙන් රාග ද්වේෂ මෝහයන් තුනීවීමෙන් සකෘදගාමී වෙයි. එක් වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළ-වර කරයි. මේ පුද්ගල 'සකෘදගාමී' යි කියනු ලැබේ.

41. කවර පුද්ගලයෙක් 'අනාගාමී' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පස්වැදැරුම් ඔරම්භාගීය සංයොජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වෙයි. ඒ (ශුද්ධාවාස) ලොවින් පෙරළා නො එන සුලු වූයේ එහි පිරිනිවෙන සුලු වෙයි. මේ පුද්ගල 'අනාගාමී' යි කියනු ලැබේ.

42. කතමො ච පුග්ගලො අන්තරාපරිනිබ්බායී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, සො උපපන්නං වා සමනන්තරා, අප්පත්තං වා වෙමජ්ඣං ආයුප්පමාණං අරියමග්ගං සඤ්ජනෙති උපරිට්ඨිමානං සංයොජනානං පහානාය. අයං වුච්චති පුග්ගලො අන්තරාපරිනිබ්බායී.

43. කතමො ච පුග්ගලො උපහච්චපරිනිබ්බායී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, සො අතික්කමිත්වා වෙමජ්ඣං ආයුප්පමාණං උපහච්ච වා කාලකිරියං අරිය මග්ගං සඤ්ජනෙති උපරිට්ඨිමානං සංයොජනානං පහානාය. අයං වුච්චති පුග්ගලො උපහච්චපරිනිබ්බායී.

44. කතමො ච පුග්ගලො අසඞ්ඛාරපරිනිබ්බායී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. සො අසඞ්ඛාරෙන අරියමග්ගං සඤ්ජනෙති උපරිට්ඨිමානං සංයොජනානං පහානාය. අයං වුච්චති පුග්ගලො අසඞ්ඛාරපරිනිබ්බායී.

45. කතමො ච පුග්ගලො සසඞ්ඛාරපරිනිබ්බායී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, සො සසඞ්ඛාරෙන අරියමග්ගං සඤ්ජනෙති උපරිට්ඨිමානං සංයොජනානං පහානාය. අයං වුච්චති පුග්ගලො සසඞ්ඛාරපරිනිබ්බායී.

46. කතමො ච පුග්ගලො උද්ධංසොතො අකනිට්ඨගාමී: ඉධෙකච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, සො අවිහා චුතො අතප්පං ගච්ඡති, අතප්පා චුතො සුදස්සං ගච්ඡති, සුදස්සා චුතො සුදස්සිං ගච්ඡති, සුදස්සීතො චුතො අකනිට්ඨං ගච්ඡති, අකනිට්ඨෙ අරියමග්ගං සඤ්ජනෙති උපරිට්ඨිමානං සංයොජනානං පහානාය. අයං වුච්චති පුග්ගලො උද්ධංසොතො අකනිට්ඨගාමී.

42. කවර පුද්ගලයෙක් 'අන්තරාපරිනිබ්බායී' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පස්වැදෑරුම් වූ ඕරම්භාගිය සංයොජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වෙයි. ඒ (ශුද්ධාවාස) ලොවින් පෙරළා නො එන සුලු වූයේ එහි පිරිනිවෙන සුලු වේ. හෙතෙම උපන් අනතුරු වැ හෝ නො පැමිණි මැද විය ඇති ව හෝ මත්තෙහි වූ සංයොජනයන් ගේ ප්‍රහාණය පිණිස ආර්‍ය්‍ය මාර්ගය උපදවයි. මේ පුද්ගල 'අන්තරාපරිනිබ්බායී' යි කියනු ලැබේ.

43. කවර පුද්ගලයෙක් 'උපහච්චපරිනිබ්බායී' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පස්වැදෑරුම් වූ ඕරම්භාගිය සංයොජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වෙයි, එලොවින් පෙරළා නො එන සුලු ස්වභාව ඇත්තේ එහි පිරිනිවෙන සුලු වේ. හෙතෙම මධ්‍ය ආයුඃප්‍රමාණය ඉක්ම හෝ කාල ක්‍රියාවට ආසන්න ව හෝ මත්තෙහි වූ සංයොජනයන් ගේ ප්‍රහාණය පිණිස ආර්‍ය්‍යමාර්ගය උපදවයි. මේ පුද්ගල 'උපහච්චපරිනිබ්බායී' යි කියනු ලැබේ.

44. කවර පුද්ගලයෙක් 'අසංඛාරපරිනිබ්බායී' වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක් පස්වැදෑරුම් වූ ඕරම්භාගිය සංයෝජනයන් ක්ෂය වීමෙන් 'ඕපපාතික' වෙයි, එලොවින් පෙරළා නො එන්සුලු ස්වභාව ඇත්තේ එහි පිරිනිවෙන සුලු වේ. හෙතෙම මත්තෙහි වූ සංයොජනයන් ගේ ප්‍රහාණය පිණිස නිදුකින් ආර්‍ය්‍යමාර්ගය උපදවයි. මේ පුද්ගල 'අසංඛාර පරිනිබ්බායී' යි කියනු ලැබේ.

45. කවර පුද්ගලයෙක් 'සසංඛාරපරිනිබ්බායී' වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් පස්වැදෑරුම් වූ ඕරම්භාගිය සංයොජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වෙයි, එලොවින් පෙරළා නො එන සුලු ස්වභාව ඇතතේ එහි පිරිනිවෙන සුලු වේ. හෙතෙම මත්තෙහි වූ සංයොජනයන් ගේ ප්‍රහාණය පිණිස දුකින් ආර්‍ය්‍යමාර්ගය උපදවයි. මේ පුද්ගල 'සසඞ්ඛාර පරිනිබ්බායී' යි කියනු ලැබේ.

46. කවර පුද්ගලයෙක් 'උද්ධංසොත අකනිට්ඨගාමී' වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් පස්වැදෑරුම් වූ ඕරම්භාගිය සංයොජනයන් ක්ෂය වීමෙන් ඕපපාතික වෙයි, එලොවින් පෙරළා නො එන සුලු ස්වභාව ඇත්තේ එහි පිරිනිවෙන සුලු වේ. හෙතෙම අවිහයෙන් ච්‍යුත වූයේ අතප්පයට යයි. අතප්පයෙන් ච්‍යුත වූයේ සුදස්සයට යයි. සුදස්සයෙන් ච්‍යුත වූයේ සුදස්සියට යයි. සුදස්සියෙන් ච්‍යුත වූයේ අකනිටාවට යේ අකනිටායෙහි දී මත්තෙහි වූ සංයොජනයන් ගේ ප්‍රහාණය පිණිස ආර්‍ය්‍ය-මාර්ගය උපදවයි. මේ පුද්ගල 'උද්ධංසොත අකනිට්ඨගාමී' යි කියනු ලැබේ.

47. තිණ්ණං සංයොජනානං පහානාය පටිපන්නො පුග්ගලො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො, යස්ස පුග්ගලස්ස තීණි සංයොජනානි පහීනානි. අයං වුච්චති පුග්ගලො සොතාපන්නො.

48. කාමරාගව්‍යාපාදනං තනුභාවාය පටිපන්නො පුග්ගලො සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, යස්ස පුග්ගලස්ස කාමරාගව්‍යාපාද තනුභූතා. අයං වුච්චති පුග්ගලො සකදාගාමී.

49. කාමරාගව්‍යාපාදනං අනවසෙසප්පහානාය පටිපන්නො පුග්ගලො අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො, යස්ස පුග්ගලස්ස කාමරාගව්‍යාපාද අනවසෙසා පහීනා. අයං වුච්චති පුග්ගලො අනාගාමී.

50. රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජාය අනවසෙසප්පහානාය පටිපන්නො පුග්ගලො අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො, යස්ස පුග්ගලස්ස රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා අනවසෙසා පහීනා. අයං වුච්චති පුග්ගලො අරහා.

**එකක නිද්දෙසො නිට්ඨිතො.**

47. සංයොජනත්‍රයක්හු ගේ ප්‍රහාණය පිණිස පිළිපන් පුද්ගල සෝවන්ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන්නෝ වෙයි. යම් පුද්ගලයක්හු ගේ සංයොජනයෝ තිදෙනෙක් ප්‍රහීණ වූවාහු ද, මේ පුද්ගල 'සොතාපන්න' යි කියනු ලැබෙයි.

48. කාමරාග-ව්‍යාපාදයන් ගේ තුනී බව පිණිස පිළිපන් පුද්ගල තෙමේ 'සකෘදගාමී ඵලය' සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නේ ය. යම් පුද්ගලයක්හු ගේ කාමරාග – ව්‍යාපාදයෝ තුනී වූවාහු ද, මේ පුද්ගල 'සකෘදගාමී' යි කියනු ලැබෙයි.

49. කාමරාග–ව්‍යාපාදයන් ගේ නිරවශෙෂ ප්‍රහාණය පිණිස පිළිපන් පුද්ගල 'අනාගාමී ඵලය' සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ වෙයි. යම් පුද්ගලයක්හු ගේ කාමරාග-ව්‍යාපාදයෝ නිරවශෙෂයෙන් ප්‍රහීණ වූවාහු ද, මේ පුද්ගල 'අනාගාමී' යි කියනු ලැබෙයි.

50. රූපරාග යැ, අරූපරාග යැ, මාන යැ, උද්ධච්ච යැ, අවිජ්ජා යැ යන මොවුන් ගේ නිරවශෙෂ ප්‍රහාණය පිණිස පිළිපන් පුද්ගල අර්හත් ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ වෙයි. යම් පුද්ගලයක්හු ගේ රූපරාග යැ, අරූපරාග යැ, මාන යැ, උද්ධච්ච යැ, අවිජ්ජා යැ යන මොහු නිරවශෙෂයෙන් ප්‍රහීණ වූවාහු ද, මේ පුද්ගල 'අර්හත්' යි කියනු ලැබේ.

**ඒකක නිර්දේශය නිමියේ යි.**

# 2. දුක නිද්දෙසො

1. කතමො ච පුග්ගලො කොධනො: තත්ථ කතමො කොධො, යො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං, අසුරොපො අනත්තමනතා චිත්තස්ස. අයං වුච්චති කොධො. යස්ස පුග්ගලස්ස අයං කොධො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො කොධනො.

කතමො ච පුග්ගලො උපනාහී: තත්ථ කතමො උපනාහො: පුබ්බකාලං කොධො අපරකාලං උපනාහො, යො එවරූපො උපනාහො උපනය්හනා උපනය්හිතත්තං අට්ඨපනා ඨපනා සණ්ඨපනා අනුසංසන්දනා අනුප්පබන්ධනා දළ්හීකම්මං කොධස්ස, අයං වුච්චති උපනාහො. යස්ස පුග්ගලස්ස අයං උපනාහො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො උපනාහී.

2. කතමො ච පුග්ගලො මක්ඛී: තත්ථ කතමො මක්ඛො: යො මක්ඛො මක්ඛායනා මක්ඛායිතත්තං[1] නිට්ඨුරියං නිට්ඨුරියකම්මං, අයං වුච්චති මක්ඛො. යස්ස පුග්ගලස්ස අයං මක්ඛො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො මක්ඛී.

කතමො ච පුග්ගලො පලාසී: තත්ථ කතමො පලාසො යො පලාසො පලාසායනා පලාසායිතත්තං පලාසාහාරො විවාදට්ඨානං යුගග්ගාහො අප්පටිනිස්සග්ගො, අයං වුච්චති පලාසො යස්ස පුග්ගලස්ස අයං පලාසො. අප්පහීනො, අයං වුච්චති පුග්ගලො පලාසී.

3. කතමො ච පුග්ගලො ඉස්සුකී: තත්ථ කතමා ඉස්සා: යා පරලාභ සක්කාර ගරුකාර මානන වන්දන පූජනාසු ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං උසූයා උසූයනා උසූයිතත්තං, අයං වුච්චති ඉස්සා. යස්ස පුග්ගලස්ස අයං ඉස්සා අප්පහීනා, අයං වුච්චති පුග්ගලො ඉස්සුකී.

කතමො ච පුග්ගලො මච්ඡරී: තත්ථ කතමං මච්ඡරියං: පඤ්ච මච්ඡරියානි–ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං, යං එවරූපං මච්ඡෙරං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං. යස්ස පුග්ගලස්ස ඉදං මච්ඡරියං අප්පහීනං, අයං වුච්චති පුග්ගලො මච්ඡරී.

1. මක්ඛීයනා මක්ඛීයිතත්තා සී,මු.

## 2. ද්වික නිර්දේශය

1. කවර පුද්ගලයෙක් 'කොධන' වේ ද යත්: එහි ක්‍රොධය කව රේ ද: යම් ක්‍රොධයෙක් කිපීමක් කිපුණු බවක් ද්වේෂයෙක් දූෂ්‍ය වීමක් දූෂිත බවක් විකෘතියක් විකෘත වීමක් විකෘත වූ බවක්, විරොධයෙක් පුනපුනා විරොධයෙක් සැඩ බවක්, චචනයා ගේ අසම්පූර්ණ බවක් චිත්තයා ගේ නො සතුටු බවක් වේ ද මේ ක්‍රොධය යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ ක්‍රොධය ප්‍රහීණ නො වූයේ ද, මෙබඳු පුද්ගල 'කොධන' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'උපනාහී' වේ ද යත්: එහි 'උපනාහය' කවරේ ද: පූර්වකාලය ක්‍රොධය යි, අපරකාලය 'උපනාහය' (බද්ධ වෛරය) යි. යම් මෙබඳු බද්ධවෛරයෙක් වෙරබැඳීමක් බද්ධවෛර වූ බවක්, ක්‍රොධය නභා සිටුවීමක්, හිඳුවීමක් මොනවට හිඳුවීමක් සැසැඳීමක් ලුහු බැඳීමක් දැඩි කිරීමක් වේ ද, මේ 'උපනාහ' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ උපනාහය ප්‍රහීණ නො වූයේ ද, මේ පුද්ගල උපනාහී යැ යි කියනු ලැබේ.

2. කවර පුද්ගලයෙක් 'මක්ඛී' වේ ද යත්: එහි 'මක්ඛය' කවරේ ද: යම් ගුණමකුවක් ගුණ මැකීමක් ගුණමකු බවක් නිර්දයාවක් නිර්දය කමක් වේ ද මේ මක්ඛ යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ 'මක්ඛය' ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'මක්ඛී' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'පලාසී' වේ ද යත්: එහි 'පලාසය' කවරේ ද: යම් සමවලායෙක් සමවලායෙහි පැවැත්මක් සමවලා පැවැතුම් ඇති බවක් සමවලා එළවීමක් විවාදයට කරුණක් යුගග්‍රාහයෙක් නො හැරපීමක් වේ ද මේ 'පලාස' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ පලාසය ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'පලාසී' යැ යි කියනු ලැබේ.

3. කවර පුද්ගලයෙක් 'ඉස්සුකී' (ඊර්ෂ්‍යා ඇත්තේ) වේ ද යත්: එහි 'ඊර්ෂ්‍යා' කවර යත්: අනුන් ගේ ලාභ සත්කාර ගරුකාර වන්දන මානන පූජනයන්හි යම් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යාවෙහි පැවැත්මක් ඊර්ෂ්‍යා පැවැතුම් ඇති බවක් දෙස්පාළ කිරීමක් දෙස් පාළ කිරීමේ පැවැත්මක් දෙස් පාළ කිරීමේ පැවැතුම් ඇති බවක් වේ ද මේ ඊර්ෂ්‍යා යැ යි කියනු ලැබෙයි යම් පුද්ගලයක්හු ගේ මේ ඊර්ෂ්‍යාව ප්‍රහීණ නො වූ වා ද මේ පුද්ගල ඉස්සුකී යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'මච්ඡරී' (මසුරු බව ඇත්තේ) වේ ද යත්: එහි මච්ඡරිය (යනු) කවරේ ද: මාත්සය්‍යීයෝ පස් දෙනෙකි - ආවාසමාත්සය්‍යී යැ, කුලමාත්සය්‍යී යැ, ලාභමාත්සය්‍යී යැ, වර්ණමාත්සය්‍යී යැ, ධර්මමාත්සය්‍යී යැ යි යම මෙබඳු මසුරු බවක් මසුරු බැව්හි පැවැත්මක් මසුරු බැව්හි පැවැතුම් ඇති බවක් හැම සැපත් අයත් කොට ගැන්මක් තද මසුරු බවක් කටුක ලෙස සිත හකුළාලන බවක් දීමෙහි සිත් නො ගත් බවක් වේ ද මේ 'මච්ඡරිය' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ මච්ඡරිය ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'මච්ඡරී' යැ යි කියනු ලැබේ.

4. කතමො ච පුග්ගලො සඨො: තත්ථ කතමං සාඨෙය්‍යං: ඉධෙකච්චො පුග්ගලො සඨො හොති පරිසඨො, යං තත්ථ සඨං සඨතා සාඨෙය්‍යං කක්කරතා කක්කරියං පරික්ඛත්තතා පරික්ඛත්තියං, ඉදං වුච්චති සාඨෙය්‍යං. යස්ස පුග්ගලස්ස ඉදං සාඨෙය්‍යං අප්පහීනං. අයං වුච්චති පුග්ගලො සඨො.

කතමො ච පුග්ගලො මායාවී: තත්ථ කතමා මායා: ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති 'මා මං ජඤ්ඤා'ති ඉච්ඡති, 'මා මං ජඤ්ඤා'ති සංකප්පෙති, 'මා මං ජඤ්ඤා'ති වාචං භාසති, මා මං ජඤ්ඤා'ති කායෙන පරක්කමති, යා එව රූපා මායා මායාවිතා අච්චසරා වඤ්චනා නිකති නිකිරණා පරිහරණං ගුහනා පරිගුහනා ඡාදනා පරිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා. යස්ස පුග්ගලස්ස අයං මායා අප්පහීනා, අයං වුච්චති පුග්ගලො මායාවී.

5. කතමො ච පුග්ගලො අහිරිකො: තත්ථ කතමං අහිරිකං: යං න හිරීයති හිරියිතබ්බෙන, න හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති අහිරිකං, ඉමිනා අහිරිකෙන සමන්නාගතො පුග්ගලො අහිරිකො.

කතමො ච පුග්ගලො අනොත්තප්පී: තත්ථ කතමං අනොත්තප්පං: යං න ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, න ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා. ඉදං වුච්චති අනොත්තප්පං, ඉමිනා අනොත්තප්පෙන සමන්නාගතො පුග්ගලො අනොත්තප්පී.

6. කතමො ච පුග්ගලො දුබ්බචො: තත්ථ කතමා දොවචස්සතා: සහධම්මිකෙ වුච්චමානෙ දොවචස්සායං දොවචස්සියං දොවචස්සතා විප්පටිකුලගාහිතා විපච්චනීකසාතතා අනාදරියං අනාදරියතා අගාරවතා අප්පතිස්සවතා. අයං වුච්චති දොවචස්සතා, තාය සමන්නාගතො පුග්ගලො දුබ්බචො.

4. කවර පුද්ගලයෙක් සඨ (කෛරාටික) වේ ද යත්: එහි 'සඨ' බව කවරේ ද: මෙලොව එක් පුද්ගලයෙක් කෛරාටිකයෙක් අතිශය කෛරාටිකයෙක් වෙයි. එහි යම් කපටයක් සඨතාවක් කෛරාටික බවක් කර්කශ තාවක් රළු බවක් තරයේ සිටුවන ලද්දක් වැනි බවක් වේ ද මේ සාඨෙය්‍ය යැ යි කියනු ලැබේ. යම් පුද්ගලයක්හු ගේ මේ සාඨෙය්‍යය ප්‍රහීණ නො වූයේ ද, මේ පුද්ගල 'සඨ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'මායාවී' (මායා ඇත්තේ) වේ ද යත්: එහි 'මායාව' කවර යත්: මෙලොවැ එකෙක් කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර සිතින් දුසිරිතෙහි හැසිර එය වසාලනු පිණිස ලාමක අපේක්ෂාවක් පිහිටුවයි. මා (පවිටකු ලෙස) නො දනීව යි අපෙක්ෂා කරයි. 'මා නො දනීවා' යි සලකයි. මා නො දනීවා' යි වචන කියයි. 'මා නො දනීව' යි කයින් වෑයම් කරයි. මෙබඳු වූ යම් මායාවක් මායා ඇති බවක් වරද ඉක්මවා යෑමෙක් වඤ්චනයක් නිකෘතියක් නිකිරණයක් බැහැර කිරීමක් සැඟවීමක් හාත්පසින් සැඟවීමක් වැසීමක් හාත්පසින් වැසීමක් එළිදරව් නො කිරීමක් රහස්කමක් පව්කම් වසාලන බවක් පව්කමක් වේ ද, මේ 'මායා' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ මායාව ප්‍රහීණ නො වූවා ද මේ පුද්ගල 'මායාවී' යැයි කියනු ලැබේ.

5. කවර පුද්ගලයෙක් 'අහිරික' වේ ද යත්: එහි අහිරිකය කවරේ ද: 'ලජ්ජා විය යුත්තෙන් ලජ්ජා නො වේ' යන යමක් වේ ද, 'ලාමක වූ අකුශල ධර්මන්ට පැමිණීමෙන් ලජ්ජා නො වේ' යන යමක් වේ ද මේ 'අහිරික' යැ යි කියනු ලැබෙයි. මේ අහිරිකයෙන් යුක්ත වූ පුද්ගල 'අහිරික' නම් වේ.

කවර පුද්ගලයෙක් 'අනොත්තප්පී' නම් වේ ද යත්: එහි 'අනපත්‍රපා' කවර යත්: 'පාපභීරුතායෙන් නො තැවේ' යන යමක් ඇද්ද 'ලාමක වූ අකුශලධර්මයන්ට පැමිණීමෙන් නො තැවේ' යන යමක් ඇද්ද, මෙ අනපත්‍රපා යැ යි කියනු ලැබෙයි. මේ අනපත්‍රපායෙන් යුක්ත වූ පුද්ගල 'අනොත්තප්පී' නම් වේ.

කතමො ච පුග්ගලො පාපමිත්තො: තත්ථ කතමා පාපමිත්තතා: යෙ තෙ පුග්ගලා අස්සද්ධා දුස්සීලා අප්පස්සුතා මච්ඡරිනො දුප්පඤ්ඤා, යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සම්භජනා භත්ති සම්භත්ති තංසම්පවඞ්කතා. අයං වුච්චති පාපමිත්තතා, ඉමාය පාපමිත්තතාය සමන්නාගතො පුග්ගලො පාපමිත්තො.

7. කතමො ච පුග්ගලො ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො: තත්ථ කතමා ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා: ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය න පටිපජ්ජති න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙන සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා- ජිව්හාය රසං සායිත්වා- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා- මනසා ධම්මං විඤ්ඤාය නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං, අභිජ්ඣා දෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං අගුත්ති අගොපනා අනාරක්ඛො අසංවරො. අයං වුච්චති ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා. ඉමාය ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතාය සමන්නාගතො පුග්ගලො ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො.

කතමො ච පුග්ගලො භොජනෙ අමත්තඤ්ඤූ: තත්ථ කතමා භොජනෙ අමත්තඤ්ඤුතා: ඉධෙකච්චො පුග්ගලො අප්පටිසඞ්ඛා අයොනිසො ආහාරං ආහාරෙති, දවාය මදය මණ්ඩනාය විභූසනාය යා තත්ථ අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා අප්පටිසඞ්ඛා භොජනෙ. අය වුච්චති භොජනෙ අමත්තඤ්ඤුතා, ඉමාය භොජනෙ අමත්තඤ්ඤුතාය සමන්නාගතො පුග්ගලො භොජනෙ අමත්තඤ්ඤූ.

6. කවර පුද්ගලයෙක් දුබ්බච වේ ද යත්: එහි දුර්වචස්ක බව කවරේ ද : ශික්ෂාපදය කියනු ලබන කල්හි දුර්වචස්ක බවක් දුර්වච කමක් නො පිළිගැන්විය හැකි බවක් ප්‍රතිපක්ෂය ගන්නා බවක් විපක්ෂයෙහි මධුරත්වයක් අනාදරබවක් අනාදර ආකාරයක් අගෞරව බවක් නිරාශ්‍රය බවක් වේ ද, මේ දුර්වච බව යැ යි කියනු ලැබේ. එයින් යුක්ත වූ පුද්ගල දුර්වච නම් වේ.

කවර පුද්ගලයෙක් 'පාපමිත්‍රයන් ඇත්තේ වේ ද යත්: එහි පාපමිත්‍ර බව කවරේ ද: යම් ඒ පුද්ගල කෙනෙක් ශ්‍රද්ධා රහිත වූවාහු දුශ්ශීලවූවාහු අල්පශ්‍රැත වූවාහු මසුරු වූවාහු නුවණ නැතියාහු වෙත් ද, ඔවුන් ගේ යම් සෙවනයක් බලවත් සේවනයක් හාත්පසින් සේවනයක් භජනයක් දැඩි භජනයක් භක්තියක් දෘඪභක්තියක් ඔවුනට නැමුණු බවක් වේ ද, මෙ පාපමිත්‍රබවයැ යි කියනු ලැබේ. මේ පාපමිත්‍රතායෙන් යුක්ත වූ පුද්ගල පාපමිත්‍රයන් ඇත්තේ යි.

7. කවර පුද්ගලයෙක් ඉන්ද්‍රියයන්හි නො පියන ලද දෙර ඇත්තේ ද යත්: එහි ඉන්ද්‍රියයන්හි නො පියන ලද දෙර ඇති බව කවරේ ද, මෙලොව එකෙක් ඇසින් රූපයක් දක නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් හෙයකින් චක්ෂුරින්ද්‍රිය සංවරණය නො කොට වාස කරන්නාවූ මොහු අභිද්‍යා-දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහු බඳනාහු ද, ඒ චක්ෂුරින්ද්‍රියයා ගේ සංවරය පිණිස නො පිළිපදියි. චක්ෂුරින්ද්‍රිය ය නො රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේ. කනින් ශබ්දයක් අසා- නැහැයෙන් ගඳක් අසා- දිවින් රසයක් විඳ- කයින් පහස ක් පැහැස- මනසින් ධර්මාලම්බනයක් දැන නිමිති ගන්නේ අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් හෙයකින් මනින්ද්‍රියය සංවරණය නො කොට වසන්නා වූ මොහු අභිද්‍යා යැ දෙමනස්ස යැ යි කියන ලද ලාමක වූ අකුශල ධර්මයෝ ලුහු බඳනාහු ද ඒ මනින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදියි. මනින්ද්‍රියය නො රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේ. මේ ඉන්ද්‍රියයන් සදෙනා ගේ යම් අගුත්තියක් නො රැක්මෙක් ආරක්ෂා රහිත බවක් අසංවරයෙක් වේ ද, මේ ඉන්ද්‍රියයන්හි නොපියූ දෙර ඇති බව යැ යි කියනු ලැබේ. මේ ඉන්ද්‍රියයන්හි නො වැසූ දෙර ඇති බැවින් සමන්වාගත වූ පුද්ගල ඉන්ද්‍රියයන්හි 'අගුත්තද්වාර' නම් වේ.

කවර පුද්ගලයෙක් වැළඳීමෙහි පමණ නො දන්නේ ද යත්: එහි වැළඳීමෙහි පමණ නො දන්නා බව කවරේ ද: මෙලොව එක් පුද්ගලයෙක් නො විමසා නුනුවණින් ක්‍රීඩා පිණිස මද පිණිස මණ්ඩනය පිණිස අලංකාරය පිණිස අහර වළඳයි. ඒ නො විමසා වැළඳීමෙහි යම් නො සතුටු බවක් පමණ නො දන්නා බවක් භොජනයෙහි ප්‍රත්‍යවෙක්ෂා රහිත බවක් වේ ද, මෙ වැළඳීමෙහි පමණ නො දන්නා බව යි කියනු ලැබේ. මේ භොජනයෙහි පමණ නො දන්නා බැවින් සමන්විත වූ පුද්ගල භොජනයෙහි පමණ නො දන්නේ යි.

8. කතමො ච පුග්ගලො මුට්ඨස්සති: තත්ථ කතමා මුට්ඨස්සච්චං: යා අසති අනනුස්සති අප්පටිස්සති අස්සති අසරණතා අධාරණතා පිලාපනතා පම්මුස්සනතා. ඉදං වුච්චති මුට්ඨස්සච්චං, ඉමිනා මුට්ඨස්සච්චෙන සමන්නාගතො පුග්ගලො මුට්ඨස්සති.

කතමො ච පුග්ගලො අසම්පජානො: තත්ථ කතමං අසම්පජඤ්ඤං: යං අඤ්ඤාණං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහනා අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං අසම්පජඤ්ඤං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී මොහො අකුසලමූලං, ඉදං වුච්චති අසම්පජඤ්ඤං. ඉමිනා අසම්පජඤ්ඤෙන සමන්නාගතො පුග්ගලො අසම්පජානො.

9. කතමො ච පුග්ගලො සීලවිපන්නො: තත්ථ කතමා සීලවිපත්ති කායිකො වීතික්කමො වාචසිකො වීතික්කමො කායිකවාචසිකො වීතික්කමො, අයං වුච්චති සීලවිපත්ති, සබ්බම්පි දුස්සීල්‍යං සීලවිපත්ති. ඉමාය සීලවිපත්තියා සමන්නාගතො පුග්ගලො සීලවිපන්නො.

කතමො ච පුග්ගලො දිට්ඨිවිපන්නො: තත්ථ කතමා දිට්ඨිවිපත්ති: නත්ථි දින්නං නත්ථි යිට්ඨං නත්ථි හුතං නත්ථි සුකටදුක්කටානං[1] කම්මානං ඵලං විපාකො, නත්ථි අයං ලොකො, නත්ථි පරලොකො, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඔපපාතිකා, නත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිතං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරමාසො කුම්මග්ගො, මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො. අයං වුච්චති දිට්ඨිවිපත්ති, සබ්බාපි මිච්ඡාදිට්ඨි දිට්ඨිවිපත්ති, ඉමාය දිට්ඨිවිපත්තියා සමන්නාගතො පුග්ගලො දිට්ඨිවිපන්නො.

---

1. සුකත දුක්කටානං–සීමු

8. කවර පුද්ගලයෙක් මුළා සිහි ඇත්තේ ද යත්: මුළා සිහි ඇති බව කවරේ ද: යම් නො සිහියක් නො මෙනෙහි වීමක් නැවැත සිහි නොවීමක් අස්මෘතියක් සිහි නො කරන අයුරක් නො දරන බවක් (අරමුණෙහි) ඉල්පෙන බවක් මුළා වන බවක් වේ ද, මේ 'මුළාසිහි' යැ යි කියනු ලැබේ. මේ මුළාසිහියෙන් යුක්ත වූ පුද්ගල තෙමේ 'මුට්ඨස්සති' නම් වේ.

කවර පුද්ගලයෙක් 'අසම්පජාන' වේ ද යත්: එහි 'අසම්පජාන' බව කවරේ ද: යම් නො දැනීමෙක් නො දැකීමෙක් නො වැටහීමෙක් අනනුබොධයෙක් අසම්බෝධයෙක් අප්‍රතිවේධයෙක් නො වැදගැන්මෙක් නො බැස ගැන්මෙක් සමුව නො දැකීමෙක් ධර්මස්වභාවය නො දැකීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් ප්‍රඥා රහිත බවක් බාල බවක් සම්‍යක් ප්‍රඥ රහිත බවක් මුළාවක් බලවත් මුළාවක් සම්මොහයෙක් අවිද්‍යාවක් අවිද්‍යොඝයෙක් අවිද්‍යායොගයෙක් අවිද්‍යානුශයෙක් අවිද්‍යාවගේ නැඟීමක් අවිද්‍යාපලිඝයෙක් මොහ සංඛ්‍යාත අකුශල මූලයෙක් වේ ද මේ 'අසම්පජාන' බව යැ යි කියනු ලැබේ. මේ අසම්පජාන බැවින් යුක්ත වූ පුද්ගල 'අසම්පජාන' නම් වේ.

9. කවර පුද්ගලයෙක් 'සීලවිපන්න' වේ ද යත්: එහි 'සීල විපත්තිය' කවර යත්: කය පිළිබඳ වැරදි හැසිරීම යැ වචනය පිළිබඳ වැරදි හැසිරීම යැ කය පිළිබඳ වූත් වචනය පිළිබඳ වූත් වැරදි හැසිරීම යැ යන ධමක් ඇද්ද, මේ සීල විපත්තිය' යි කියනු ලැබේ. සියලු ම දුසිල් බව සීලවිපත්ති නම. සීලවිපත්තියෙන් යුක්ත වූ පුද්ගල තෙමේ 'සීලවිපන්න' නම් වේ.

කවර පුද්ගලයෙක් 'දිට්ඨිවිපන්න' වේ ද යත්: එහි 'දිට්ඨිවිපත්තිය' කවර යත්: 'දුන්දෙයෙහි විපාක නැත, යාගවශයෙන් දුන් දෙයෙහි විපාක නැත, චෙතට පමුණුවා පුදන ලද්දෙහි විපාක නැත, සුකෘත දුෂ්කෘත කර්මයන් ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොව නැත, පරලොව නැත, මව නැත, පියා නැත, ඔපපාතික සත්වයෝ නැත, යම් කෙනෙක් මෙලොවත් පරලොව ත් තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත් නම් එබඳු වූ සුමඟට බට සුපිළිපන් මහණ බමුණෝ ලොව නැති' යන මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් දෘෂ්ටි නැමැති විෂකටුවක් දෘෂ්ටිකම්පනයක් දෘෂ්ටිසංයොජනයක් ග්‍රාහයෙක් පිහිටා සිටීමෙක් පිවිස ගැන්මෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් වැරදිමඟක් වැරදි බවක් තීර්ථායතනයක් විපර්‍යාසග්‍රහණයෙක් වේ ද, මේ 'දිට්ඨිවිපත්ති' යැ යි කියනු ලැබේ. සියලු ම මිථ්‍යාදෘෂ්ටිය 'දෘෂ්ටිවිපත්ති' යැ, මේ දිට්ඨිවිපත්තියෙන් යුක්ත වූ පුද්ගල 'දිට්ඨිවිපන්න' නම් වේ.

10. කතමො ච පුග්ගලො අජ්ඣත්තසඤ්ඤොජනො: යස්ස පුග්ගලස්ස පඤ්චොරම්භාගියානි සංයොජනානි අප්පහීනානි. අයං වුච්චති පුග්ගලො අජ්ඣත්තසඤ්ඤොජනො.

කතමො ච පුග්ගලො බහිද්ධා සඤ්ඤොජනො: යස්ස පුග්ගලස්ස පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි අප්පහීනානි. අයං වුච්චති පුග්ගලො බහිද්ධාසඤ්ඤොජනො.

11. කතමො ච පුග්ගලො අක්කොධනො: තත්ථ කතමො කොධො: යො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං, අසුරොපො අනත්තමනතා චිත්තස්ස, අයං වුච්චති කොධො. යස්ස පුග්ගලස්ස අයං කොධො පහීනො, අයං වුච්චති පුග්ගලො අක්කොධනො.

කතමො ච පුග්ගලො අනුපනාහී: තත්ථ කතමො උපනාහො: පුබ්බකාලං කොධො අපරකාලං උපනාහො, යො එවරූපො උපනාහො උපනය්හනා උපනය්හිතත්තං අට්ඨපනා ඨපනා සණ්ඨපනා අනුසංසන්දනා අනුප්පබන්ධනා දළ්හීකම්මං කොධස්ස, අයං වුච්චති උපනාහො. යස්ස පුග්ගලස්ස අයං උපනාහො පහීනො, අයං වුච්චති පුග්ගලො අනුපනාහී.

12. කතමො ච පුග්ගලො අමක්ඛී: තත්ථ කතමො මක්ඛො: යො මක්ඛො මක්ඛායනා මක්ඛා නිට්ඨුරියං නිට්ඨුරියකම්මං, අයං වුච්චති මක්ඛො. යස්ස පුග්ගලස්ස අයං මක්ඛො පහීනො, අයං වුච්චති පුග්ගලො අමක්ඛී.

කතමො ච පුග්ගලො අපළාසී: තත්ථ කතමො පළාසො: යො පළාසො පළාසායනා පළාසායිතත්තං පළාසාහාරො විවාදට්ඨානං යුගග්ගාහො අප්පටිනිස්සග්ගො, අයං වුච්චති පළාසො. යස්ස පුග්ගලස්ස අයං පළාසො පහීනො, අයං වුච්චති පුග්ගලො අපළාසී.

10. කවර පුද්ගලයෙක් 'අජ්ඣත්ත සංයොජන' ඇත්තේ වේ ද යත්: යම් පුද්ගලයක්හු ගේ ඔරම්භාගිය සංයොජනයෝ පස් දෙන ප්‍රහීණ නො වූවාහු ද, මේ පුද්ගල 'අජ්ඣත්තසංයොජන' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'බහිද්ධා සංයොජන' ඇත්තේ වේ ද යත්: යම් පුද්ගලයක්හු ගේ 'උද්ධම්භාගිය සංයොජනයෝ පස්දෙන ප්‍රහීණ නො වූවාහු ද, මේ පුද්ගල තෙමේ බහිද්ධාසංයොජන ඇත්තේ යි කියනු ලැබේ.

11. කවර පුද්ගලයෙක් 'අක්කොධන' වේ ද යත්: එහි ක්‍රොධය කවරේ ද: යම් ක්‍රොධයෙක් කිපීමෙක් කිපුණු බවෙක්, ද්වේෂයෙක් දූෂණයෙක් දූෂිත බවෙක් (චිත්තයාගේ විරුද්ධ බවට) පෙරළී මෙක් පෙරළුණු අයුරෙක් පෙරළුණු බවෙක් විරෝධයෙක් පුනපුනා විරොධයෙක් සැඩ බවෙක්, වචනයාගේ අසම්පූර්ණතාවක් චිත්තයා ගේ නො සතුටු බවෙක් වේ ද, මේ ක්‍රොධයැයි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ ක්‍රොධය ප්‍රහීණ වූයේ ද, මේ පුද්ගල තෙමේ 'අක්කොධන' යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'අනුපනාහී' (බද්ධවෛර නැත්තේ) වේ ද යත්: එහි 'උපනාහය' කවරේ ද: පූර්වකාලය 'ක්‍රොධය' යි, අපරකාලය උපනාහය' යි. මෙබඳු වූ යම් උපනාහයෙක් බද්ධවෛරයෙක් වෛර බැඳි බවක් (ක්‍රොධයාගේ) ආදිකොට තිබීමෙක් තබන ආකාරයෙක් සැදීමෙක් (ක්‍රෝධයාගේ) සැසැඳීමෙක් ලු බැඳීමෙක් දැඩි කිරීමෙක් වේ ද, මේ 'උපනාහ' යැයි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ උපනාහය ප්‍රහීණ වූයේ ද, මේ පුද්ගල 'අනුපනාහී' යැ යි කියනු ලැබේ.

12. කවර පුද්ගලයෙක් 'අමක්ඛී' (ගුණමකු නො වූයේ) වේ ද යත්: එහි 'මක්ඛය' කවරේ ද: යම් ගුණමකුවෙක් ගුණමකන අයුරෙක් ගුණ-මකන බවක් නිර්දයබවෙක් නිර්දය කමෙක් වේ ද, මේ 'මක්ඛ' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක් හු ගේ මේ මක්ඛය (මකුගුණය) ප්‍රහීණ වූයේ ද මේ පුද්ගල තෙමේ 'අමක්ඛී' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'අපලාසී' (යුගග්‍රාහ නැත්තේ) වේ ද යත්: එහි 'පලාසය' කවරේ ද: යම් යුගග්‍රාහයෙක් සමවලායෙහි පැවැත්මෙක්, සමවලා පැවැතුම් ඇති බවෙක්, සමවලා එළැවීමෙක්, විවාදයට කරුණෙක් යුගග්‍රාහයෙක් නො හැරපීමෙක් වේ ද, මේ 'පලාස' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ පලාසය ප්‍රහීණ වූයේ ද, මේ පුද්ගල තෙමේ 'අපලාසී' යැ යි කියනු ලැබේ.

13. කතමො ච පුග්ගලො අනිස්සුකී: තත්ථ කතමා ඉස්සා: යා පරලාභසක්කාර ගරුකාර මානන වන්දන පූජනාසු ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං, උසූයා උසූයනා උසූයිතත්තං, අයං වුච්චති ඉස්සා. යස්ස පුග්ගලස්ස අයං ඉස්සා පහීනා, අයං වුච්චති පුග්ගලො අනිස්සුකී.

කතමො ච පුග්ගලො අමච්ඡරී: තත්ථ කතමං මච්ඡරියං: පඤ්චමච්ඡරියානි – ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡෙරං[1] මච්ඡරායනා මච්ඡරායිතත්තං, වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස. ඉදං වුච්චති මච්ඡරියං. යස්ස පුග්ගලස්ස ඉදං මච්ඡරියං පහීනං, අයං වුච්චති පුග්ගලො අමච්ඡරී.

14. කතමො ච පුග්ගලො අසඨො: තත්ථ කතමං සාඨෙය්‍යං: ඉධෙකච්චො පුග්ගලො සඨො හොති පරිසඨො, යං තත්ථ සඨං සඨතා සාඨෙය්‍යං කක්කරතා කක්කරියං පරික්ඛත්තතා පාරික්ඛත්තියං, ඉදං වුච්චති සාඨෙය්‍යං. යස්ස පුග්ගලස්ස ඉදං සාඨෙය්‍යං පහීනං, අයං වුච්චති පුග්ගලො අසඨො.

කතමො ච පුග්ගලො අමායාවී: තත්ථ කතමා මායා: ඉධෙකච්චො පුග්ගලො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා, තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති, 'මා මං ජඤ්ඤා'ති ඉච්ඡති මා 'මං ජඤ්ඤා'ති සඞ්කප්පෙති 'මා මං ජඤ්ඤා'ති වාචං භාසති, 'මා මං ජඤ්ඤා'ති කායෙන පරක්කමති, යා එවරූපා මායා මායාවිතා අච්චසරා වඤ්චනා නිකති නිකිරණා පරිහරණා ගූහණා පරිගූහනා ඡාදනා පරිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා. යස්ස පුග්ගලස්ස අයං මායා පහීනා, අයං වුච්චති පුග්ගලො අමායාවී.

1. මච්ඡරියං—ම.ඡ සං

13. කවර පුද්ගලයෙක් 'අනිස්සුකී' නම් වේ ද යත්: එහි 'ඉස්සා' යනු කවර යත්: අනුන් ගේ ලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජන යන මෙහි යම් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යාවෙහි පැවැත්මෙක් ඊර්ෂ්‍යා පැවැතුම් ඇති බවෙක් දෙස් පහළ කිරීමෙක් දෙස් පෑළකිරීමේ පැවැත්මක් දෙස් පෑළ කිරීමේ පැවැතුම් ඇති බවෙක් වේ ද, මේ 'ඉස්සා' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ ඊර්ෂ්‍යාව ප්‍රහීණ වූයේ ද, මේ පුද්ගල තෙමේ 'අනිස්සුකී' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'අමච්ඡරී' (නොමසුරු) වේ ද යත්: එහි 'මච්ඡරිය' කවර යත්: මාත්සර්‍ය්‍යයෝ පස් දෙනෙක – ආවාස මාත්සර්‍ය්‍ය යැ, කුල-මාත්සර්‍ය්‍ය යැ, ලාභමාත්සර්‍ය්‍ය යැ, වර්ණමාත්සර්‍ය්‍ය යැ, ධර්මමාත්සර්‍ය්‍ය යි. මෙ බඳු වූ යම් මාත්සර්‍ය්‍යයෙක් මසුරු අයුරක් මසුරු වන බවක් සම්පත් සඟවන බවක් දැඩි මසුරු බවෙක් කටුකතාවක් සිත් නො ගන්නා බවෙක් වේ ද, මේ 'මච්ඡරිය' යැ යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ 'මච්ඡරිය' ය ප්‍රහීණ ද, මේ පුද්ගල තෙමේ 'අමච්ඡරී' යැ යි කියනු ලැබේ.

14. කවර පුද්ගලයෙක් 'අසඨ' (කෛරාටික නොවූයේ) වේ ද යත්: එහි 'සඨ' බව කවරේ ද: මෙලොව එක් පුද්ගලයෙක් කෛරාටිකයෙක් හාත්පසින් කෛරාටිකයෙක් වෙයි. එහි යම් කපටයක් සඨතාවක් කෛරාටික භාවයක් කර්කශතාවක් රළු බවක් වේ ද, මේ 'සඨ' බව යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ සඨ බව ප්‍රහීණ ද, මේ පුද්ගල තෙමේ 'අසඨ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'අමායාවී' (මායා නැත්තේ) වේ ද යත්: එහි 'මායාව' කවර යත්: මෙලොව එක් පුද්ගලයෙක් කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට එය වසාලනු පිණිස ලාමක ඉච්ඡාවක් පිහිටුවයි. 'මා (පව්වටකු කොට) නහමක් දනීව' යි කැමැති වෙයි. 'මා නහමක් දනීව' යි සලකයි. 'නහමක් දනීව' යි තෙපුල් බෙනෙයි. මා නහමක් දනීව, යි කයින් වෑයම් කරයි. මෙබඳු වූ යම් මායාවක් මායා ඇති බවක් ඉක්ම යෑමෙක් වඤ්චනයක් නිකෘතියක් නිකිරණයක් බැහැර ලීමෙක් සැඟවීමෙක් හාත්පසින් සැඟවීමෙක් වැසීමෙක් හාත්පසින් වැසීමෙක් එළිදරව් නො කිරීමෙක් ප්‍රකට නො කිරීමෙක් මොනවට වැසීමෙක් වේ ද, මේ 'මායා' යි කියනු ලැබෙයි. යම් පුද්ගලයක්හු ගේ මේ මායාව ප්‍රහීණ වූවා ද, මේ පුද්ගල තෙමේ 'අමායාවී' යැ යි කියනු ලැබේ.

15. කතමො ච පුග්ගලො හිරිමා: තත්ථ කතමා හිරි: යා හිරි හිරීයති හිරීයිතබ්බෙන, හිරීයති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, අයං වුච්චති හිරි, ඉමාය හිරියා සමන්නාගතො පුග්ගලො හිරිමා.

කතමො ච පුග්ගලො ඔත්තප්පී: තත්ථ කතමං ඔත්තප්පං: යං ඔත්තප්පති ඔත්තප්පිතබ්බෙන, ඔත්තප්පති පාපකානං අකුසලානං ධම්මානං සමාපත්තියා, ඉදං වුච්චති ඔත්තප්පං. ඉමිනා ඔත්තප්පෙන සමක්කාගතො පුග්ගලො ඔත්තප්පී.

16. කතමො ච පුග්ගලො සුවචො: තත්ථ කතමා සොවචස්සතා: සහධම්මිකෙ වුච්චමානෙ සොවචස්සායං සොවචස්සියං සොවචස්සතා අවිප්පටිකූලගාහිතා අවිපච්චනිකසාතතා සගාරවතා සප්පතිස්සවතා, අයං වුච්චති සොවචස්සතා. ඉමාය සොවචස්සතාය සමන්නාගතො පුග්ගලො සුවචො.

කතමො ච පුග්ගලො කල්‍යාණමිත්තො: තත්ථ කතමා කල්‍යාණ-මිත්තතා: යෙ තෙ පුග්ගලා සද්ධා සීලවන්තො බහුස්සුතා පඤ්ඤවන්තො චාගවන්තො යා තෙසං සෙවනා නිසෙවනා සංසෙවනා භජනා සම්භජනා භත්ති සම්භත්ති තංසම්පවඞ්කතා, අයං වුච්චති කල්‍යාණමිත්තතා. ඉමාය කල්‍යාණමිත්තතාය සමන්නාගතො පුග්ගලො කල්‍යාණමිත්තො.

17. කතමො ච පුග්ගලො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො: තත්ථ කතමා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා: ඉධෙකච්චො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—ඝානෙන ගන්ධං ඝායිත්වා—ජිව්හාය රසං සායිත්වා—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වා-ධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. යා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං ගුත්ති ගොපනා ආරක්ඛො සංවරො, අයං වුච්චති ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා. ඉමාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය සමන්නාගතො පුග්ගලො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො.

15. කවර පුද්ගලයෙක් 'හිරි ඇත්තේ' ද යත්: එහි 'හිරි' යනු කවර යත්: යමක් ලජ්ජා ව ද, ලජ්ජා විය යුත්තෙන් ලජ්ජා වේ ද, ලාමක වූ අකුශල ධර්මයන්ට පැමිණීමෙන් ලජ්ජා වේ ද, මේ 'හිරි' යැ යි කියනු ලැබේ. මේ හිරියෙන් යුක්ත වූ පුද්ගල තෙමේ 'හිරි ඇත්තේ' යි.

කවර පුද්ගලයෙක් 'ඔතප් ඇත්තේ' ද යත්: එහි 'ඔතප්' යනු කවරේ ද: යම් චිත්තාංගයක් තැවිය යුත්තෙන් තැවේ ද, ලාමක වූ අකුශල ධර්මයන්ට පැමිණීමෙන් තැවේ ද, මේ ඔතප් යැ යි කියනු ලැබේ. මේ අපත්‍රපායෙන් යුක්ත වූ පුද්ගල තෙමේ 'ඔතප් ඇත්තේ' යි.

16. කවර පුද්ගලයෙක් 'සුවච' වේ ද යත්: එහි 'සුවච' බව කවරේ ද: ශික්ෂාපදය කියන කල්හි සුවච බවෙක් සුවචකමෙක් විපක්ෂය නො ගන්නා බවෙක් විපක්ෂය මිහිරි නො වීමෙක් ගෞරව සහිත බවෙක් සාශ්‍රය බවෙක් වේ ද මේ 'සුවච' බව යැ යි කියනු ලැබේ. මේ සුවච බැවින් යුක්ත වූ පුද්ගල තෙමේ 'සුවච' නම් වේ.

කවර පුද්ගලයෙක් 'කල්‍යාණමිත්‍ර' වේ ද යත්: එහි 'කල්‍යාණ මිත්‍ර' බව කවරේ ද: යම් ඒ පුද්ගල කෙනෙක් ශ්‍රද්ධා ඇත්තාහු ද සිල්වත්තු ද බහුශ්‍රැතයෝ ද ත්‍යාගවත්හු ද ප්‍රඥා ඇත්තාහු ද ඔවුන්ගේ යම් සෙවනයෙක් ආශ්‍රයෙක් සමාශ්‍රයෙක් භජනයෙක් දෘඪභජනයෙක් භක්තියක් දෘඪභක්තියක් ඔවුනට නැමුණු බවෙක් වේ ද, මේ 'කල්‍යාණ මිත්‍ර' බව යැ යි කියනු ලැබේ. මේ කල්‍යාණමිත්‍ර බැවින් සමන්වාගත පුද්ගල තෙමේ 'කල්‍යාණමිත්‍ර' නම් වේ.

17. කවර පුද්ගලයෙක් 'ඉන්ද්‍රියයන්හි වසන ලද දොර ඇත්තේ' ද යත්: එහි 'ඉන්ද්‍රියයන්හි වසන ලද දොර ඇති බව' කවරේ ද: මෙලොව එකෙක් ඇසින් රූපයක් දැක නිමිතිගන්නේ නො වෙයි, අනුව්‍යඤ්ජන ගන්නේ නො වෙයි, යම් හෙයකින් මේ චක්ෂුරින්ද්‍රියය සංවරණය නො කොට වසන්නාහු අභිධ්‍යා දෞර්මනස්‍ය යන ලාමක වූ අකුශල ධර්මයෝ ලුහු බඳනාහු ද ඒ චක්ෂුරින්ද්‍රියයා ගේ සංවරය පිණිස පිළිපදියි, චක්ෂුරින් ද්‍රියය රකියි, චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා-නැහැයෙන් ගඳක් අසා-දිවින රසයක් විඳ-කයින් පහසක් විඳ-මනසින් ධර්මාරම්මණයක් දැන නිමිතිගන්නේ නො වෙයි, අනුව්‍යඤ්ජන ගන්නේ නො වෙයි යම් හෙයකින් මනින්ද්‍රියය අසංවෘත ව වසන්නා වූ මොහු අභිධ්‍යා දෞර්මනස්‍ය යන ලාමක වූ අකුශල ධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයා ගේ සංවරය පිණිස පිළිපදියි, මනින්ද්‍රියය රකියි, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. මේ ඉඳුරන් සදෙනා ගේ යම් ගුත්තියක් ගොපනයක් ආරක්ෂාවක් සංවරයක් වේ ද, මේ 'ඉඳුරන්හි වසන ලද දොර ඇති බව යැ යි කියනු ලැබේ. මේ ඉඳුරන්හි වසන ලද දොර ඇති බැවින් යුක්ත වූ පුද්ගල තෙමේ 'ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාර' නම් වේ.

කතමො ච පුග්ගලො භොජනෙ මත්තඤ්ඤූ: තත්‍ථ කතමා භොජනෙ මත්තඤ්ඤුතා: ඉධෙකච්චො පුග්ගලො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියා—නුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති යා තත්‍ථ සන්තුට්ඨිතා මත්තඤ්ඤුතා පටිසඞ්ඛා භොජනෙ, අයං වුච්චති භොජනෙ මත්තඤ්ඤුතා. ඉමාය භොජනෙ මත්තඤ්ඤුතාය සමන්නාගතො පුග්ගලො භොජනෙ මත්තඤ්ඤූ.

18. කතමො ච පුග්ගලො උපට්ඨිතස්සති: තත්‍ථ කතමා සති: යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අපම්මුස්සනතා සති සතින්ද්‍රියං සති බලං සම්මාසති. අයං වුච්චති සති. ඉමාය සතියා සමන්නාගතො පුග්ගලො උපට්ඨිතස්සති.

කතමො ච පුග්ගලො සම්පජානො: තත්‍ථ කතමං සම්පජඤ්ඤං: යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛනා උපලක්ඛනා පච්චුපලක්ඛනා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදෙ පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්‍ථං පඤ්ඤාපාසාදෙ පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, ඉදං වුච්චති සම්පජඤ්ඤං. ඉමිනා සම්පජඤ්ඤෙන සමන්නාගතො පුග්ගලො සම්පජානො.

19. කතමො ච පුග්ගලො සීලසම්පන්නො: තත්‍ථ කතමා සීලසම්පදා: කායිකො අවීතික්කමො වාචසිකො අවීතික්කමො කායිකවාචසිකො අවීතික්කමො, අයං වුච්චති සීලසම්පදා, සබ්බො'පි සීලසංවරො සීලසම්පදා. ඉමාය සීලසම්පදාය සමන්නාගතො පුග්ගලො සීලසම්පන්නො.

කවර පුද්ගලයෙක් වැළඳීමෙහි පමණ දන්නේ' වේ ද යත්: එහි 'වැළඳී මෙහි පමණ දන්නා බව' කවරේ ද: මෙලොව එක් පුද්ගලයෙක් ප්‍රත්‍යවෙක්ෂා කොට නුවණින් අහර වළඳයි. 'ක්‍රීඩා පිණිස නො වේ මැ යැ, මද පිණිස නො වේ මැ යැ, සිරුර සරසනු පිණිස නො වේ මැ යැ, සිරුරු මසෙහි අලංකාරය පිණිස නො වේ මැ යි. හුදෙක් මේ ශරීරයා ගේ පැවැත්ම පිණිස යැ, යැපීම පිණිස යැ, සාදුක් නිවනු පිණිස යැ, බඹසරට අනුග්‍රහ පිණිස යැ මෙසේ පැරැණි (සාදුක්) වෙදනාවත් නසන්නෙමි, (අධික භොජන හෙතුවින් වන) නව වෙදනාවත් නො උපදවන්නෙමි, ජීවිත-යාත්‍රාවත් නිරවද්‍යතාවත් ඵාසුවිහරණයත් වන්නීය යි, ඒ ප්‍රත්‍යවෙක්ෂා කොට වැළඳීමෙහි යම් සතොස් බවක් පමණ දන්නා බවක් වේ ද, මේ භොජනයෙහි පමණ දන්නා බව' යැ යි කියනු ලැබෙ. මේ වැළඳීමෙහි පමණ දන්නා බැවින් යුක්ත වූ පුද්ගල තෙමේ 'වැළඳීමෙහි පමණ දන්නේ' යි

18. කවර පුද්ගලයෙක් 'එළඹ සිටි සිහි ඇත්තේ' වේ ද යත්: එහි 'සති' යනු කවර යත්: යම් සිහියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක් සඳහ-නෙක් ධාරණය වන බවෙක් (අරමුණෙහි) කිඳෙන බවෙක් මුළා නො වන බවෙක් ස්මෘතින්ද්‍රියයක් සතිබලයක් සම්මාසතියක් වන්නී ද මේ 'සති' යැ යි කියනු ලැබෙ. මේ සතියෙන් යුක්ත වූ පුද්ගල තෙමේ 'එළඹ සිටි සිහි ඇත්තේ' යි.

කවර පුද්ගලයෙක් 'සම්පජාන' වේ ද යත්: එහි 'සම්පජාන' බව කවරේ ද: යම් ප්‍රකර්ෂඥානයක් ප්‍රකාරයෙන් දැනුමක් (අනිත්‍යාදිය) විමසීමෙක් වෙසෙසින් විමසීමෙක් සිවසස් දම් විමසීමෙක් (අනිත්‍යාදිය) සැලකීමෙක් උපලක්ෂණයෙක් ප්‍රත්‍යුපලක්ෂණයෙක් පණ්ඩිත බවෙක් කුශල බවෙක් නිපුණ බවෙක් (අනිත්‍යාදිය) සැලකීමෙක් චින්තාවක් උප්පරික්ෂාවක් පුළුල් දැනුමෙක් ධාරණ ප්‍රඥාවෙක් පමුණුවන නුවණෙක් විදර්ශනාවක් මැනැවින් දන්නා බවෙක් පතොදය වැනි නුවණෙක් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයක් ප්‍රඥාශස්ත්‍රයක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥා-ආලොකයෙක් ප්‍රඥාඅවභාසයෙක් ප්‍රඥාප්‍රදීපයෙක් ප්‍රඥාරත්නයක් අමොහ-යෙක් ධර්මවිචයයෙක් සම්‍යක්දෘෂ්ටියක් වේ ද, මේ 'සම්පජාන' බව යැ යි, කියනු ලැබෙ. මේ සම්පජාන බැවින් යුත් පුද්ගල තෙමේ 'සම්පජාන' නම් වේ.

19. කවර පුද්ගලයෙක් 'සීලසම්පන්න' වේ ද යත්: එහි 'සීල සම්පදව' කවර යත්: කායික අව්‍යතික්‍රමයෙක් වාචසික අව්‍යතික්‍රමයෙක් කායික වූ ත් වාචසික වූ ත් අව්‍යතික්‍රමයෙක් වේ ද මේ 'සීලසම්පද' යැ යි කියනු ලැබේ, සියලු ම ශීල සංවරය 'සීලසම්පද' යි. මේ සීලසම්පදයෙන් යුත් පුද්ගල තෙමේ 'සීලසම්පන්න' නම් වේ.

කතමො ච පුග්ගලො දිට්ඨිසම්පන්නො: තත්ථ කතමා දිට්ඨිසම්පදා –අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා, යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්ති'ති. යා එවරූපා පඤ්ඤා පජානනා –පෙ– අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි අයං වුච්චති දිට්ඨිසම්පදා, සබ්බා'පි සම්මාදිට්ඨි දිට්ඨිසම්පදා ඉමායදිට්ඨිසම්පදාය සමන්නාගතො පුග්ගලො දිට්ඨිසම්පන්නො.

20. කතමෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ‘ලොකස්මිං: යො ච පුබ්බකාරී යො ච කතඤ්ඤූ කතවෙදී. ඉමෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං.

21. කතමෙ ද්වෙ පුග්ගලා දුත්තප්පයා? යො ච ලද්ධං ලද්ධං නික්ඛිපති,[1] යො ච ලද්ධං ලද්ධං විස්සජ්ජෙති, ඉමෙ ද්වෙ පුග්ගලා දුත්තප්පයා.

22. කතමෙ ද්වෙ පුග්ගලා සුතප්පයා: යො ච ලද්ධං ලද්ධං න නික්ඛිපති, යො ච ලද්ධං ලද්ධං න විස්සජ්ජෙති, ඉමෙ ද්වෙ පුග්ගලා සුතප්පයා.

23. කතමෙසං ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති, යො ච කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති, ඉමෙසං ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති.

24. කතමෙසං ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච න කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති, යො ච කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති, ඉමෙසං ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති.

1. නිකම්පති–සී මු

කවර පුද්ගලයෙක් 'දිට්ඨිසම්පන්න' වේ ද යත්: එහි 'දිට්ඨි සම්පදව කවර යත්: දුන් දෙයෙහි විපාක ඇත, යාග වශයෙන් දුන් දෙයෙහි විපාක ඇත, පුදන ලද්දෙහි විපාක ඇත, සුකෘත දුෂ්කෘත කර්මයන් ගේ ඵල–විපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත. මව ඇත. පියා ඇත. ඕපපාතික සත්වයෝ ඇත, යම් කෙනෙක් මෙලොවත් පරලොවත් තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරත් ද එබඳු වූ සුමහට බට සුපිළිපන් මහණ බමුණෝ ලොව ඇත. යන මෙබඳු වූ යම් උසස් දැනුමෙක් වෙසෙස් දැනුමෙක් –පෙ– අමොහයෙක් (නොමුළාවක්) ධර්මවිචයයෙක් සම්‍යක් දෘෂ්ටියක් (නිවැරැදි දැනුමක්) වේ ද, මේ 'දිට්ඨිසම්පද' යැ යි කියනු ලැබේ. සියලු මැ සම්‍යක් දෘෂ්ටිය 'දිට්ඨිසම්පද' යි. මේ දිට්ඨිසම්පදයෙන් යුක්තවූ පුද්ගල තෙමේ 'දිට්ඨිසම්පන්න' නම් වේ.

20. කවර පුද්ගලයෝ දෙදෙනෙක් ලෝකයෙහි 'දුර්ලභ වෙත් ද යත්: යමෙකුත් පළමු ව උපකාර කරන සුලු වූයේ ද, යමෙකුත් කෘත ඥ වූයේ කළගුණ දන්නා සුලු වූයේ ද, මේ පුද්ගලයෝ දෙදෙනා ලොකයෙහි දුර්ලභයෝ යි.

21. කවර පුද්ගලයො දෙදෙනෙක් 'පිණවිය නො හැක්හානු ද යත්: යමෙකුත් ලද ලද දැය බහා තබා ද, යමෙකුත් ලද ලද දැය වියදම් කෙරේ ද මේ පුද්ගලයෝ දෙදෙනා පිණවිය නො හැක්කාහු යි.

22. කවර පුද්ගලයෝ දෙදෙනෙක් 'සුවසේ පිණවිය හැක්කාහු ද යත්: යමෙකුත් ලද ලද දැය බහා නො තබා ද, යමෙකුත් ලද ලද දැය වියදම් නො කෙරේ ද, මේ පුද්ගලයෝ දෙදෙනා සුවසේ පිණවිය හැක්කාහු යි.

23. කවර පුද්ගලයන් දෙදෙනකුන් ගේ 'ආස්‍රවයෝ වැඩෙත් ද යත්: යමෙකුත් කුකුස් නො කළ යුත්තෙහි කුකුස් කෙරේ ද, යමෙකුත් කුකුස් කළ යුත්තෙහි කුකුස් නො කෙරේ ද, මේ පුද්ගලයන් දෙදෙනා ගේ ආස්‍රවයෝ වැඩෙත්.

24. කවර පුද්ගලයන් දෙදෙනකුන් ගේ 'ආස්‍රවයෝ නො වැඩෙත් ද යත්: යමෙකුත් කුකුස් නො කළ යුත්තෙහි කුකුස් නො කෙරේ ද, යමෙකුත් කුකුස් කළ යුත්තෙහි කුකුස් කෙරේ ද, මේ පුද්ගලයන් දෙදෙනා ගේ 'ආස්‍රවයෝ නො වැඩෙත්.

25. කතමො ච පුග්ගලො හීනාධිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො, සො අඤ්ඤං දුස්සීලං පාපධම්මං සෙවති භජති පයිරුපාසති, අයං වුච්චති පුග්ගලො හීනාධිමුත්තො.

කතමො ච පුග්ගලො පණීතාධිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො, සො අඤ්ඤං සීලවන්තං කල්‍යාණධම්මං සෙවති භජති පයිරුපාසති, අයං වුච්චති පුග්ගලො පණීතාධිමුත්තො.

26. කතමො ච පුග්ගලො තිත්තො: පච්චෙකබුද්ධා[1] යෙ ච තථාගතසාවකා අරහන්තො තිත්තා. සම්මාසම්බුද්ධො තිත්තො ච තප්පෙතා ච. අයං වුච්චති පුග්ගලො තිත්තො.

දුකනිද්දෙසො නිට්ඨිතො.

1. පච්චෙකසම්බුද්ධා-මජසං

25. කවර පුද්ගලයෙක් 'හීනාධිමුක්ත' (පහත් අදහස් ඇත්තේ) වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් දුශ්ශීලයෙක් ලාමක ධර්ම ඇත්තෙක් වේ ද, හෙතෙම අනිත් දුශ්ශීලයකු පවිටකු සෙවනය කෙරෙයි භජනය කෙරෙයි පර්යුපාසනය කෙරෙයි. මේ පුද්ගල තෙමේ 'හීනාධිමුක්ත' යැයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'පණීතාධිමුක්ත' වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් සිල්වතෙක් කල්‍යාණධර්ම ඇත්තෙක් වේ ද, හෙතෙම අනිත් සිල්වතකු කල්‍යාණ ධර්ම ඇතියකු සෙවනය කෙරෙයි, භජනය කෙරෙයි, ළං ව ඇසිරි කෙරෙයි. මේ පුද්ගල තෙමේ 'පණීතාධිමුක්ත' යැ යි කියනු ලැබේ.

26. කවර පුද්ගලයෙක් 'තෘප්ත වූයේ' ද යත්: පසේ බුදුන් වහන්සේත් තථාගත ශ්‍රාවක වූ අර්හත් වූ යම් කෙනෙක් වෙත් නම් ඔහුත් 'තෘප්තයෝ' යි, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ 'තෘප්ත වූ වාහු ද තර්පණය කරවන්නාහු ද වෙත්. මේ පුද්ගල තෙමේ 'තෘප්ත' යැ යි කියනු ලැබේ.

**ඒක නිර්දේශය නිමියේ යි.**

## 3. තික නිද්දෙසො

1. කතමො ච පුග්ගලො නිරාසො: ඉධෙ'කච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචි සංකස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. සො සුණාති ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව-ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. තස්ස න එවං හොති: 'කුදස්සු නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමී'ති, අයං වුච්චති පුග්ගලො නිරාසො.

කතමො ච පුග්ගලො ආසංසො: ඉධෙ'කච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො, සො සුණාති 'ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති. තස්ස එවං හොති 'කුදස්සු නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමී'ති, අයං වුච්චති පුග්ගලො ආසංසො.

කතමො ච පුග්ගලො විගතාසො: ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං. චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤාසච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. සො සුණාති 'ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤාසච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතී'ති තස්ස න එවං හොති. 'කුදස්සු නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමී'ති. තං කිස්සහෙතු: යාහි'ස්ස පුබ්බෙ අවිමුත්තස්ස විමුත්තාසා සාස්ස[1]. පටිප්පස්සද්ධා, අයං වුච්චති පුග්ගලො විගතාසො.

---

1. සා—ම ඡ සං

## 3. ත්‍රික නිර්දේශය

1. කවර පුද්ගලයෙක් 'නිරාස' (ආශා නැත්තේ) වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් දුශ්ශීලයෙක් ලාමක ස්වභාව ඇත්තෙක් අපිරිසුදු කායකර්මාන්තාදිය ඇත්තෙක් සැකයෙන් සිහිකළයුතු පැවැතුම් ඇත්තෙක් සැඟවිය යුතු ක්‍රියා ඇත්තෙක් ශ්‍රමණප්‍රතිරූපක ව 'ශ්‍රමණයෙමි' යි ප්‍රතිඥා කරන්නෙක් බ්‍රහ්මචාරි ප්‍රතිරූපක ව 'බ්‍රහ්මචාරියෙමි' යි ප්‍රතිඥා කරන්නෙක් ඇතුළත කුණු වූයෙක් රාගාදීන් තෙත් වූයෙක් හට ගත් රාගාදි කසළ ඇත්තෙක් වේ ද, හෙතෙම ''මෙ නම් මහණ ආසුවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කරන්නේ ල''යි අසයි. ඔහුට ''කවරද නම් මම ද ආස්‍රවයන් ක්ෂය වීමෙන් නිරාස්‍රව වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන සාක්ෂාත් කොට ඊට පැමිණ වාස කරන්නෙම් ද'' යි මෙ බඳු සිතෙක් නො වෙයි. මේ පුද්ගල 'නිරාස' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ආසංස' (ප්‍රාර්ථනා ඇත්තේ) වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් සිල්වතෙක් යහපත් ධර්ම ඇත්තෙක් වේ ද, හෙතෙම ''මෙ නම් මහණ ආස්‍රවයන් ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්ත විමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන සාක්ෂාත් කොට ඊට පැමිණ වාස කරන්නේ ල'' යි අසයි. ඔහුට 'කවරද නම් මම ද ආස්‍රවයන් ක්ෂය වීමෙන් නිරාස්‍රව වූ චිත්ත විමුක්තිය ප්‍රඥා විමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන සාක්ෂාත් කොට ඊට පැමිණ වාස කරන්නෙම් ද' යි මෙ බඳු සිතෙක් වෙයි. මේ පුද්ගල 'ආසංස' යැයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'විගතාස' (පහ වූ ආසා ඇත්තේ) වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් ආසුවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත් බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේ ද, හෙතෙම ''මෙ නම් මහණ ආස්‍රවයන් ක්ෂය වීමෙන් අනාසුව වූ චෙතොවිමුක්තිය ප්‍රඥා විමුක්තිය මෙ අත් බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කරන්නේ ල'' යි අසයි. ඔහුට ''කවරද නම් මම ද ආසුවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ චෙතොවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කරන්නෙම්ද'' යි මෙ බඳු සිතෙක් නො වෙයි. එ කවර හෙයින යත්: යම් හෙයකින් පෙර විමුක්තියට නො පත් මොහු ගේ යම් විමුක්ති ආශාවක් වූ නම් ඒ ආශාව සන්හිඳුණි ද එහෙයිනි. මෙ බිඳු පුද්ගල 'විගතාස' යැ යි කියනු ලැබේ.

2. තත්‍ථ කතමෙ තයො ගිලානූපමා පුග්ගලා: තයො ගිලානා- ඉධෙ'කච්චො ගිලානො ලභන්තො වා සප්පායානි භොජනානි, අලභන්තො වා සප්පායානි භොජනානි, ලභන්තො වා සප්පායානි භෙසජ්ජානි අලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, ලභන්තො වා පතිරූපං උපට්ඨාකං අලභන්තො වා පතිරූපං උපට්ඨාකං, නෙව වුට්ඨාති තම්හා ආබාධා, ඉධ පන එකච්චො ගිලානො ලභන්තො වා සප්පායානි භොජනානි, අලභන්තො වා සප්පායානි භොජනානි, ලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, අලභන්තො වා සප්පායානි භෙසජ්ජානි, ලභන්තො වා පතිරූපං උපට්ඨාකං අලභන්තො වා පතිරූපං උපට්ඨාකං වුට්ඨාති තම්හා ආබාධා. ඉධ පන එකච්චො ගිලානො ලභන්තොව සප්පායානි භොජනානි නො අලභන්තො, ලභන්තොව සප්පායානි භෙසජ්ජානි නො අලභන්තො, ලභන්තොව පතිරූපං උපට්ඨාකං නො අලභන්තො, වුට්ඨාති තම්හා ආබාධා. තත්‍ර ස්වායං ගිලානො ලභන්තොව සප්පායානි භොජනානි නො අලභන්තො, ලභන්තොව සප්පායානි භෙසජ්ජානි නො අලභන්තො, ලභන්තොව පතිරූපං උපට්ඨාකං නො අලභන්තො වුට්ඨාති තම්හා ආබාධා. ඉමං ගිලානං පටිච්ච ගිලානභත්තං අනුඤ්ඤාතං, ගිලානභෙසජ්ජං අනුඤ්ඤාතං, ගිලානුපට්ඨාකො අනුඤ්ඤාතො, ඉමඤ්ච පන ගිලානං පටිච්ච අඤ්ඤෙ'පි ගිලානා උපට්ඨාතබ්බා.

එවමෙව[1] තයො ගිලානූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො: ඉධෙ'කච්චො පුග්ගලො ලභන්තො වා තථාගතං දස්සනාය, අලභන්තො වා තථාගතං දස්සනාය, ලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය, අලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය, නෙව ඔක්කමති නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉධ පන එකච්චො පුග්ගලො ලභන්තො වා තථාගතං දස්සනාය අලභන්තො වා තථාගතං දස්සනාය, ලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය, අලභන්තො වා තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය. ඔක්කමති නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉධ පන එකච්චො පුග්ගලො ලභන්තොව තථාගතං දස්සනාය නො අලභන්තො, ලභන්තොව තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය නො අලභන්තො, ඔක්කමති නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. තත්‍ර ස්වායං පුග්ගලො ලභන්තොව තථාගතං දස්සනාය නො අලභන්තො, ලභන්තොව තථාගතප්පවෙදිතං ධම්මවිනයං සවනාය නො අලභන්තො ඔක්කමති නියාමං කුසලෙසු ධම්මෙසු සම්මත්තං. ඉමං පුග්ගලං පටිච්ච භගවතා ධම්මදෙසනා අනුඤ්ඤාතා, ඉමඤ්ච පන පුග්ගලං පටිච්ච අඤ්ඤෙසම්පි ධම්මො දෙසෙතබ්බො. ඉමෙ තයො ගිලානූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

1. එවමෙවං - ම ඡ සං

2. එහි ගිලනුන්ට බඳු පුද්ගලයෝ තිදෙනා කවරහු ද යත්: ගිලන්නු තිදෙනෙකි. මෙලොව එක් ගිලනෙක් පථ්‍ය වූ භොජනයන් ලබන්නේ හෝ පථ්‍ය වූ භෝජනයන් නො ලබන්නේ හෝ පථ්‍ය වූ බෙහෙත් ලබන්නේ හෝ පථ්‍ය වූ බෙහෙත් නො ලබන්නේ හෝ සුදුසු උපස්ථායකයකු ලබන්නේ හෝ සුදුසු උපස්ථායකයකු නො ලබන්නේ හෝ ඒ ආබාධයෙන් නො නැඟෙන්නේ මැ යි. යළි මෙහි එක් ගිලනෙක් පථ්‍ය වූ භෝජනයන් ලබන්නේ හෝ පථ්‍ය වූ භොජනයන් නො ලබන්නේ හෝ පථ්‍ය වූ බෙහෙත් ලබන්නේ හෝ පථ්‍ය වූ බෙහෙත් නො ලබන්නේ හෝ සුදුසු උපස්ථායකයකු ලබන්නේ හෝ සුදුසු උපස්ථායකයකු නො ලබන්නේ හෝ ඒ ආබාධයෙන් නැඟීසිටියි. තව ද මෙහි එක් ගිලනෙක් පථ්‍ය වූ භෝජනයන් ලබන්නේ මැ (රොගින් නැඟී සිටියි) නොලබන්නේ (නො නැඟී සිටියි) පථ්‍ය වූ බෙහෙත් ලබන්නේ මැ (රොගින් නැඟී සිටියි) නො ලබන්නේ (නො නැඟී සිටියි) සුදුසු උපස්ථායකයකු ලබන්නේ මැ නැඟීසිටියි, නො ලබන්නේ ඒ ආබාධයෙන් නො නැඟී සිටියි. ඔවුනතුරෙහි යම් මේ ගිලනෙක් පථ්‍ය වූ භෝජනයන් නො ලබන්නේ නො වැ ලබන්නේ මැ පථ්‍ය වූ බෙහෙත් නො ලබන්නේ නො වැ ලබන්නේ මැ සුදුසු උපස්ථායකයකු නො ලබන්නේ නො වැ ලබන්නේ මැ ඒ ආබාධයෙන් නැඟී සිටී ද, මේ ගිලනා සඳහා ගිලන් බත් අනුදන්නා ලදී. ගිලන් බෙහෙත් අනුදන්නා ලදී, ග්ලානො පස්ථායකයෙක් අනුදන්නා ලද්දේ යි. තව ද මේ ගිලනා නිසා සෙසු ගිලන්හු ද උපස්ථාන කළ යුත්තාහ.

මෙසේ මැ ලෝකයෙහි ඇත්තා වූ විද්‍යමාන වූ 'ගිලානොපම පුද්ගලයෝ තිදෙනෙක්' වෙති: කවර තිදෙනෙක් ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ දක්නට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ දක්නට නො ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම විනය අසන්නට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම විනය අසන්නට නො ලබන්නේ හෝ කුශල ධර්මයන්හි නියාම ය යි කියන ලද ආර්‍ය්‍යමාර්ගයට නො පිවිසේ මැ යැ. යළි මෙහි එක් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ දක්නට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ දක්නට නො ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම විනය අසන්නට ලබන්නේ හෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම විනය අසන්නට නො ලබන්නේ හෝ කුශලධර්මයන්හි නියාම යැ යි කියන ලද ආර්‍ය්‍ය මාර්ගයට පිවිසෙයි. යළි මෙහි එක් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ දක්නට නො ලබන්නේ නො වැ ලබන්නේ මැ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම-විනය අසන්නට නො ලබන්නේ නො වැ ලබන්නේ මැ කුශල ධර්මයන්හි නියාමයැ යි කියන ලද ආර්‍ය්‍යමාර්ගයට පිවිසෙයි. ඔවුනතුරෙහි යම් මේ පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ දක්නට නො ලබන්නේ නො වැ ලබන්නේ මැ තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කළ ධර්ම විනය අසන්නට නො ලබන්නේ නො වැ ලබන්නේ මැ කුශල ධර්මයන්හි නියාම යැ යි කියන ලද ආර්‍ය්‍ය මාර්ගයට පිවිසේ ද, මේ පුද්ගලයා උදෙසා භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසීම අනුදන්නා ලදී. තව ද මේ පුද්ගලයා උදෙසා අන්‍යයන්ට ද දහම් දෙසිය යුතු යැ. මොහු තිදෙනා ලොකයෙහි ඇති විද්‍යාමාන වූ 'ගිලානොපම පුද්ගලයෝ' යි.

3. කතමො ච පුග්ගලො කායසක්ඛී: ඉධෙ'කච්චො පුග්ගලො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵුසිත්වා[1] විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො කායසක්ඛී.

කතමො ච පුග්ගලො දිට්ඨිප්පත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො දිට්ඨිප්පත්තො.

කතමො ච පුග්ගලො සද්ධාවිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති. නො ච ඛො යථා දිට්ඨිප්පත්තස්ස. අයං වුච්චති පුග්ගලො සද්ධාවිමුත්තො.

4. කතමො ච පුග්ගලො ගූථභාණී: ඉධෙකච්චො පුග්ගලො මුසාවාදී හොති, සභග්ගතො[2] වා, පරිසග්ගතො[3] වා ඤාතිමජ්ඣගතො වා, පූගමජ්ඣගතො වා, රාජකුලමජ්ඣගතො වා, අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස[4] යං ජානාසි තං වදෙහී'ති සො අජානං වා ආහ[5] ජානාමීති, ජානං වා ආහ න ජානාමීති, අපස්සං වා ආහ පස්සාමීති, පස්සං වා ආහ න පස්සාමීති, ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා, සම්පජානමුසා භාසිතා හොති. අයං වුච්චති පුග්ගලො ගූථභාණී.

1. ඵුසිත්වා – ම ඡ සං
2. සභාගතො – සී
3. පරිසගතො – සී
4. එහි භො පුරිස – ස්‍යා
5. අහං – සී මු

3. කවර පුද්ගලයෙක් 'කායසාක්ෂී' වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක් 'අෂ්ටවිමොක්ෂයන්' (නාම) කයින් ස්පර්ශ කොට වාස කෙරේ. යළි ඔහු විසින් මාර්ගප්‍රඥාවෙන් දැක ඇතැම් ආස්‍රව කෙනෙක් ක්ෂය කරන ලද්දහු වෙත් ද, මේ පුද්ගල 'කායසාක්ෂී' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'දෘෂ්ටප්‍රාප්ත' වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක් මේ (පඤ්චස්කන්ධය) දුකැ යි ඇති සැටියෙන් දනියි. මේ (තෘෂ්ණාව) දුක් ඇති කිරීමේ හේතුව යැ යි ඇති සැටියෙන් දැන ගනියි. මේ (තෘෂ්ණාව නැතිවීම) දුක් නැති වීම යැ යි ඇති සැටියෙන් දැන ගනියි. මේ (ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය) දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් දැන ගනී. තථාගතයන් වහන්සේ විසින් දක්නා ලද ධර්මයෝ ද මොහු විසින් නුවණින් මොනවට දක්නා ලද්දහු මැනැවින් හසළාහු වෙති. තවද නුවණින් දැක මොහු විසින් ඇතැම් ආස්‍රව කෙනෙක් ක්ෂය කරන ලද්දහු වෙත්. මේ පුද්ගල 'දෘෂ්ටප්‍රාප්ත' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධා විමුක්ත' වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක් මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනියි. මේ දුක් ඇතිවීමේ හෙතු යැ යි ඇති සැටියෙන් දැනගනියි. මේ දුක් නැති වීමැ යි ඇති සැටියෙන් දැන ගනියි. මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. තථාගතයන් වහන්සේ විසින් දක්නා ලද ධර්මයෝ ද මොහු විසින් නුවණින් මොනවට දක්නා ලද්දහු හසළාහු වෙති. තවද නුවණින් දැක මොහු විසින් ඇතැම් ආස්‍රව කෙනෙක් ක්ෂය කරන ලද්ද හු වෙත්. එතෙකුදු වුවත් දෘෂ්ටිප්‍රාප්තයාහට බඳු නො වේ. මේ පුද්ගල 'ශ්‍රද්ධාවිමුක්ත' යැ යි කියනු ලැබේ.

4. කවර පුද්ගලයෙක් 'ගූථභාණී' (අසූචියට බඳු කථා ඇත්තේ) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් මුසා බස් කියන්නේ වෙයි සභායෙහි සිටියේ හෝ පිරිසෙහි සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ මහපිරිස් මැද සිටියේ හෝ රජකුලන් හමුවට ගියේ හෝ 'එව එම්බා පුරුෂය, යමක් දන්නෙහි නම් එය කියව' යි ඉදිරියට පමුණුවනු ලැබ සාක්ෂි විචාරන ලද හෙතෙම නො දන්නේ හෝ දනිමි යි කියයි, දන්නා දැය හෝ නො දනිමි යි කියයි, නො දක්නේ හෝ දිටිමි යි, දක්නේ හෝ නො දිටිමි යි කියයි. මෙසෙයින් තමා නිසා හෝ මෙරමා නිසා හෝ මඳ පමණ අල්ලසක් නිසා හෝ දැන දැන මුසවා කියන්නේ වෙයි. මෙ බඳු පුද්ගල 'ගූථභාණී' යැයි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො පුප්ඵභාණී: ඉධෙ'කච්චො පුග්ගලො මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සභග්ගතො වා පරිසග්ගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ න ජානාමීති, ජානං වා ආහ ජානාමීති, අපස්සං වා ආහ න පස්සාමීති, පස්සං වා ආහ පස්සාමීති, ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා න සම්පජානමුසා භාසිතා හොති, අයං වුච්චති පුග්ගලො පුප්ඵභාණී.

කතමො ච පුග්ගලො මධුභාණී: – ඉධෙ'කච්චො පුග්ගලො යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං වාචං භාසිතා හොති. අයං වුච්චති පුග්ගලො මධුභාණී.

5. කතමො ච පුග්ගලො අරුකූපමචිත්තො: ඉධෙ'කච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති[1] කොපඤ්ච දෙසඤ්ච අප්පච්චයඤ්ච පාතු කරොති සෙය්‍යථාපි නාම දුට්ඨාරුකා[2] කට්ඨෙන වා කඨලෙන වා ඝට්ටිතා[3] භිය්‍යොසොමත්තාය අස්සවති.[4] එවමෙව ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො. අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති බ්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපඤ්ච දෙසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං වුච්චති පුග්ගලො අරුකූපමචිත්තො.

කතමො ච පුග්ගලො විජ්ජූපමචිත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. සෙය්‍යථාපි නාම චක්ඛුමා පුරිසො රත්තන්ධකාරතිමිසායං[5] විජ්ජන්තරිකාය රූපානි පස්සෙය්‍ය, එවමෙව ඉධෙකච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති, අයං වුච්චති පුග්ගලො විජ්ජූපමචිත්තො.

---

1. පතිට්ඨීයති – ස්‍යා.
2. දුට්ඨාරුකො – ම ජ සං
3. ඝට්ටිතො–ම ජ සං
4. ආසවංදෙති – සිමු, ම ජ සං
5. රත්තන්ධකාරතිමිසාය–ම ජ සං

කවර පුද්ගලයෙක් 'පුප්ඵභාණී' (පුෂ්පයට බඳු කථා ඇත්තේ) වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක් මුසවා හැරදමා මුසවායෙන් වෙන් වූයේ වෙයි. සභාවට ගියේ හෝ පිරිසට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ මහපිරිස් මැදට ගියේ හෝ රජකුලන් මැදට ගියේ හෝ එව එම්බා පුරුෂය! යමක් දන්නෙහි නම් එය කියව යි ඉදිරියට පමුණුවනු ලැබ සාක්ෂි විචාරන ලද්දේ නො දන්නේ හෝ නො දනිමි යි කියයි දන්නේ හෝ දනිමි යි කියයි හෝ නො දක්නේ හෝ නො දක්මියි කියයි දක්නේ හෝ දක්මියි කියයි. මෙසෙයින් තමා නිසා හෝ මෙරමා නිසා හෝ මඳ පමණ අල්ලසක් නිසා දැන දැන මුසවා නො කියන්නේ වෙයි. මේ පුද්ගල 'පුප්ඵභාණී' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'මධුභාණී' (මිහිරිකථා ඇත්තේ) වේ ද යත්: මෙලොවැ කිසි පුද්ගලයෙක්, යම් ඒ වචනයක් නිදෙස් ද කනට සුව එළවන්නේ ද පෙම් උපදවන්නේ ද සිත්හි වැදගන්නේ ද නාගරික ද බොහෝ දෙනා ගේ සිත් අදනේ ද බොහෝ දෙනා ගේ මන වඩනේ ද, එබඳු වචන කියන්නේ වෙයි. මේ පුද්ගල 'මධුභාණී' යැ යි කියනු ලැබේ.

5. කවර පුද්ගලයෙක් 'ව්‍රණයකට බඳු සිත් ඇත්තේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙනසුලු වූයේ දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි. යම්තමකුදු කියන ලද පමණින් ලැගෙයි. කිපෙයි, තතු වෙනස් කෙරේ. තද බවට පැමිණෙයි. කෝපයත්, ද්වේෂයත් නො සතුටත් පළ කෙරේ. යම් සේ නම් ව්‍රණයක් දණ්ඩකින් හෝ කැබිත් පහරන ලද්දේ බොහෝ සෙයින් පූයා වගුරවනු වේ ද මෙසේ මැ මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙනසුලු වූයේ දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි. යම්තමකුදු කියන ලද පමණින් ලැගෙයි, කිපෙයි, තතු වෙනස් කරයි. තද බවට පැමිණෙයි. කෝපයත් ද්වේෂයත් නො සතුටත් පළ කෙරේ. මේ පුද්ගල 'ව්‍රණයකට බඳු සිත් ඇත්තේ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'විදුලියට බඳු සිත් ඇත්තේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් මේ දුකැ යි ඇති සැටියෙන් දැන ගනී. මේ දුක් උපදනා හෙතුව යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති වීමැ යි ඇති සැටියෙන් දැන ගනී. මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. යම් සේ නම් ඇස් ඇති පුරුෂයෙක් රැය බොල්අඳුරෙහි විදුලිය අතුරින් රූපයන් දක්නේ ද එපරිද්දෙන් මැ මෙලොව කිසි පුද්ගලයෙක් මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් උපදනා හේතුවැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති වීම යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. මේ පුද්ගල 'විදුලියට බඳු සිත් ඇත්තේ' යැ යි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො වජිරූපමචිත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. සෙය්‍යථාපි නාම වජිරස්ස නත්ථි කිඤ්චි අභෙජ්ජං මණි වා පාසාණො වා, එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති පුග්ගලො වජිරූපමචිත්තො.

6. කතමො ච පුග්ගලො අන්ධො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය,[1] තථාරූපම්පනස්ස[2] චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය, අයං වුච්චති පුග්ගලො අන්ධො.

කතමො ච පුග්ගලො එකචක්ඛු: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති. යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය, තථාරූපම්පනස්ස චක්ඛු න හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය. හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය, අයං වුච්චති පුග්ගලො එකචක්ඛු.

කතමො ච පුග්ගලො ද්විචක්ඛු: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය; තථාරූපම්පනස්ස චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙ ජානෙය්‍ය, සාවජ්ජානවජ්ජෙ ධම්මෙ ජානෙය්‍ය හීනප්පණීතෙ ධම්මෙ ජානෙය්‍ය, කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය. අයං වුච්චති පුග්ගලො ද්විචක්ඛු.

1. ඵාතිං කරෙය්‍ය-ම ඡ සං
2. තථාරූපම්පිස්ස-ම ඡ සං.

කවර පුද්ගලයෙක් 'විදුරු බඳු සිත් ඇත්තේ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ආස්‍රවයන් ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්ත විමුක්ති-යත් ප්‍රඥාවිමුක්තියත් මෙ අත් බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාස කරයි. යම් සේ නම් විදුරට නො බිඳෙන කිසි මැණිකක් හෝ ගලක් නැත්තේ ද එපරිද්දෙන් මැ මෙලොව එක් පුද්ගල යෙක් ආස්‍රවයන් ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තියත් ප්‍රඥා විමුක්තියත් තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. මේ පුද්ගල 'විදුරට බඳු සිත් ඇත්තේ' යැ යි කියනු ලැබේ.

6. කවර පුද්ගලයෙක් 'අන්ධ' වේ ද යත්: යම් බඳු පැනැසකින් නො ලද සම්පත් ලබන්නේ නම් හෝ ලද සම්පත් දියුණු කරන්නේ නම් එබඳු ඇසක් මෙලොව කිසි පුද්ගලයකුට නැත. තව ද යම් බඳු ඇසකින් කුසල් අකුසල් දහම් දන්නේ නම්, වරද නිවරද දහම් දන්නේ නම්, උස් පහත් දහම් දන්නේ නම් අන්‍යොන්‍ය ප්‍රතිපක්ෂ වූ කෘෂ්ණ ශුක්ලධර්මයන් දන්නේ නම් එබඳු ඇසකුදු ඔහුට නැත. මේ පුද්ගල 'අන්ධ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'එකැස් ඇත්තේ වේ ද යත්: යම් බඳු ඇසකින් නො ලද සම්පතක් ලබන්නේ නම් හෝ ලද සම්පත දියුණු කරන්නේ නම් එබඳු ඇස මෙලොව කිසි පුද්ගලයක් හට ඇත. එතෙකුදු වුවත් යම් බඳු ඇසකින් කුසල් අකුසල් දහම් දන්නේ නම් වරද නිවරද දහම් දන්නේ නම් උස් පහත් දහම් දන්නේ නම් අන්‍යොන්‍ය ප්‍රතිපක්ෂ වූ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දන්නේ නම් එබඳු ඇස ඔහුට නැත. මේ පුද්ගල 'එකැස් ඇත්තේ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'දැස් ඇත්තේ ' වේ ද යත්: යම් බඳු ඇසකින් නො ලද සම්පතක් ලබන්නේ නම් හෝ ලද සම්පත දියුණු කරන්නේ නම් එබඳු ඇස මෙලොව කිසි පුද්ගලයක් හට ඇත. තවද යම් බඳු ඇසකින් කුසල් අකුසල් දහම් දන්නේ නම්, වරද නිවරද දහම් දන්නේ නම්, උස් පහත් දහම් දන්නේ නම් අන්‍යොන්‍ය ප්‍රතිපක්ෂ වූ කෘෂ්ණ ශුක්ල ධර්මයන් දන්නේ නම් එබඳු ඇසකුදු ඔහුට ඇත. මේ පුද්ගල 'දැස් ඇත්තේ' යැ යි කියනු ලැබේ.

7. කතමො ච පුග්ගලො අවකුජ්ජපඤ්ඤො: ඉධෙ'කච්චො පුග්ගලො ආරාමං ගන්තා[1] හොති, අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය,[2] තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති: ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති, සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය නෙව ආදිං මනසිකරොති. න මජ්ඣං මනසිකරොති න පරියොසානං මනසිකරොති වුට්ඨිතො'පි තම්හා ආසනා තස්සා කථාය නෙව ආදිං මනසිකරොති. න මජ්ඣං මනසිකරොති, න පරියොසානං මනසිකරොති. සෙය්‍යථාපි නාම කුම්භො නික්කුජ්ජො[3] තත්‍ර උදකං ආසිත්තං විවට්ටති නො සණ්ඨාති, එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය, තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති, ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය නෙව ආදිං මනසිකරොති,න මජ්ඣං මනසිකරොති, න පරියොසානං මනසිකරොති, වුට්ඨිතො'පි තම්හා ආසනා තස්සා කථාය නෙව ආදිං මනසිකරොති, න මජ්ඣං මනසිකරොති න පරියොසානං මනසිකරොති, අයං වුච්චති පුග්ගලො අවකුජ්ජපඤ්ඤො.

කතමො ච පුග්ගලො උච්ඡඞ්ගපඤ්ඤො: ඉධෙ කච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති, සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසිකරොති. පරියොසානම්පි මනසිකරොති, වුට්ඨිතො ච ඛො තම්හා ආසනා තස්සා කථාය නෙව ආදිං මනසිකරොති, න මජ්ඣං මනසිකරොති,න පරියොසානං මනසිකරොති, සෙය්‍යථාපි නාම පුරිසස්ස උච්ඡඞ්ගෙ නානා ඛජ්ජකානි ආකිණ්ණානි තිලා තණ්ඩුලා[4] මොදකා බදරා, සො තම්හා ආසනා වුට්ඨහන්තො සතිසම්මොසා පකිරෙය්‍ය. එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති, අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය, තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන-කල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති, සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසිකරොති, පරියොසානම්පි මනසිකරොති වුට්ඨිතො තම්හා ආසනා තස්සා කථාය නෙව ආදිම්පි මනසිකරොති න මජ්ඣිම්පි මනසිකරොති න පරියොසානම්පි මනසිකරොති. අයං වුච්චති පුග්ගලො උච්ඡඞ්ගපඤ්ඤො

1. ගතො සිමු, ගන්ත්වා – සයා
2. ධම්මස්සවණාය–ම ඡ සං, සයා.
3. නිකුජ්ජො – සයා.
4. තිලතණ්ඩුලා – ම ඡ සං

7. කවර පුද්ගලයෙක් 'අවකුජ්ජපඤ්ඤ' (යටිහුරු කළ නුවණ ඇත්තේ) වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ කෙළවර යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති සියල්ල පිරිපුන් වූ පිරිසුදු වූ දහම් දෙසත්. ශ්‍රෙෂ්ඨචයර්‍යාව (ආර්‍ය අෂ්ටාංගික මාර්ගය) ප්‍රකාශ කරත්. හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි මුල නො මැ මෙනෙහි කෙරේ. මැද නො මෙනෙහි කෙරේ. අවසන නො මෙනෙහි කෙරේ. එ අසුනින් නැඟී සිටියේ ද එ කථායෙහි මුල නො මැ මෙනෙහි කෙරෙයි. මැද නො මෙනෙහි කෙරෙයි. අවසන නො මෙනෙහි කෙරෙයි. යම් සේ කළයක් යටිහුරු කරන ලද්දේ එහි වත් කරන ලද ජලය පිටතට ගලායේ ද නො සිටී ද, එපරිද්දෙන් මැ මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ කෙළවර යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති (සියල්ල) පිරිපුන් වූ පිරිසුදු වූ දහම් දෙසත්, (ශ්‍රෙෂ්ඨචයර්‍යාව) ප්‍රකාශ කරත්. හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි මුල නො මැ මෙනෙහි කෙරේ. මැද නො මෙනෙහි කෙරේ. අවසන නො මෙනෙහි කෙරේ. එ අසුනින් නැඟී සිටියේ ද එ කථායෙහි මුල නො මැ මෙනෙහි කෙරෙයි. මැද නො මෙනෙහි කෙරෙයි. අවසන නො මෙනෙහි කෙරෙයි. මේ පුද්ගල 'අවකුජ්ජපඤ්ඤ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'උච්ඡඞ්ගපඤ්ඤ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ කෙළවර යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති සියල්ල පිරිපුන් වූ පිරිසුදු වූ දහම් දෙසත් ශ්‍රෙෂ්ඨචයර්‍යාව ප්‍රකාශ කරත්. හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි මුලත් මෙනෙහි කෙරෙයි. මැදත් මෙනෙහි කෙරෙයි. අවසනත් මෙනෙහි කෙරේ, එතෙකුදු වුවත් එ අසුනින් නැඟීසිටියේ එ කථායෙහි මුල නො මැ මෙනෙහි කෙරෙයි. මැද නො මෙනෙහි කෙරෙයි. අවසන නො මෙනෙහි කෙරේ. යම් සේ පුරුෂයකු ගේ ඇකයෙහි තල, සහල්, අග්ගලා, ඩෙබර ආදි නොයෙක් කෑ යුතු දෑ බහා තබන ලද්ද හු ද, හෙතෙම එ අසුනින් නැඟීසිටින්නේ සිහිමුළායෙන් විසුරුවන්නේ ද එපරිද්දෙන් ම මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති සියල්ල පිරිපුන් වූ පිරිසුදු වූ දහම් දෙසත්. ශ්‍රෙෂ්ඨචයර්‍යාව ප්‍රකාශ කරත්. හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි ආදියත් මෙනෙහි කෙරෙයි. මධ්‍යයත් මෙනෙහි කෙරෙයි. අවසානයත් මෙනෙහි කෙරේ. එ-අසුනින් නැඟී සිටියේ එ කථායෙහි මුලත් නො ම මෙනෙහි කෙරෙයි. මැදත් නො මෙනෙහි කෙරෙයි. අගත් නො මෙනෙහි කෙරේ. මේ පුද්ගල 'උච්ඡඞ්ග පඤ්ඤ' යැයි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො පුථුපඤ්ඤො: ඉධෙ'කච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති, ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසිකරොති, පරියොසානම්පි මනසිකරොති; වුට්ඨිතො'පි තම්හා ආසනා තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසිකරොති, පරියොසානම්පි මනසිකරොති. සෙය්‍යථාපි නාම කුම්භො උක්කුජ්ජො. තත්‍ර උදකං ආසිත්තං සණ්ඨාති නො විවට්ටති. එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති; අභික්ඛණං භික්ඛූනං සන්තිකෙ ධම්මසවනාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මනසිකරොති. මජ්ඣම්පි මනසිකරොති, පරියොසානම්පි මනසිකරොති, වුට්ඨිතො'පි තම්හා ආසනා තස්සා කථාය ආදිම්පි මනසිකරොති, මජ්ඣම්පි මනසිකරොති, පරියොසානම්පි මනසික-රොති. අයං වුච්චති පුග්ගලො පුථුපඤ්ඤො.

8. කතමො ච පුග්ගලො කාමෙසු ච භවෙසු ච අවීතරාගො: සොතාපන්නසකදාගාමිනො, ඉමෙ වුච්චන්ති පුග්ගලා කාමෙසු ච භවෙසු ච අවීතරාගා.

කතමො ච පුග්ගලො කාමෙසු වීතරාගො භවෙසු අවීතරාගො: අනාගාමී. අයං වුච්චති පුග්ගලො කාමෙසු වීතරාගො, භවෙසු අවීතරාගො.

කතමො ච පුග්ගලො ච කාමෙසු ච භවෙසු ච වීතරාගො: අරහා. අයං වුච්චති පුග්ගලො කාමෙසු ච භවෙසු ච වීතරාගො.

9. කතමො ච පුග්ගලො පාසාණලෙඛූපමො: ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො චිරං දීඝරත්තං අනුසෙති. සෙය්‍යථාපි නාම පාසාණලෙඛා න ඛිප්පං ලුජ්ජති වාතෙන වා උදකෙන වා චිරට්ඨිතිකා හොති. එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො චිරං දීඝරත්තං අනුසෙති. අයං වුච්චති පුග්ගලො පාසාණලෙඛූපමො.

කවර පුද්ගලයෙක් 'පුථුපඤ්ඤ' (පුළුල් නුවණැත්තේ) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති සියල්ල පිරිපුන් වූ පිරිසුදු වූ දහම් දෙසති. ශ්‍රෙෂ්ඨචර්‍ය්‍යාව ප්‍රකාශ කරත්. හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි මුලත් මෙනෙහි කෙරෙයි. මැදත් මෙනෙහි කෙරෙයි. අගත් මෙනෙහි කෙරෙයි. එ අසුනින් නැඟීසිටියේ ද එ කථායෙහි මුලත් මෙනෙහි කෙරෙයි. මැදත් මෙනෙහි කෙරෙයි. අගත් මෙනෙහි කෙරේ. යම් සේ කළයක් උඩුහුරු කරන ලද්දේ එහි වත්කරන ලද ජලය රඳා ද පිටතට ගලා නො යේ ද එසේ ම මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර භික්ෂූන් වෙත දහම් අසනු පිණිස අරමට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ අරුත් සහිත වූ පැහැදිලි අකුරු ඇති සියල්ල පිරිපුන් වූ දහම් දෙසත්. බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශකරත්, හෙතෙම එ අසුන්හි හුන්නේ එ කථායෙහි මුලත් මෙනෙහි කෙරෙයි. මැද ත් මෙනෙහි කෙරෙයි. අගත් මෙනෙහි කෙරෙයි. එ අසුනින් නැඟී සිටියේ ද එ කථායෙහි මුල ත් මෙනෙහි කෙරෙයි. මැද ත් මෙනෙහි කෙරෙයි, අගත් මෙනෙහි කෙරේ. මේ පුද්ගල 'පුථුපඤ්ඤ' ය යි කියනු ලැබේ.

8. කවර පුද්ගලයෙක් පඤ්චකාම ගුණයෙහි ද (රූපාරූප) භවයෙහි ද පහ නො කළ රාග ඇත්තේ වේ ද යත්: ශ්‍රොතාපන්න සකෘදගාමීහු යැ. මේ පුද්ගලයෝ 'කාමයෙහි ද භවයෙහි ද පහ නො කළ රාග ඇත්තාහු' යැ යි කියනු ලැබෙත්.

කවර පුද්ගලයෙක් 'කාමයෙහි පහකළ රාග ඇත්තේ භවයෙහි පහ නො කළ රාග ඇත්තේ' වේ ද යත්: අනාගාමී තෙමේ යැ, මේ පුද්ගල තෙමේ කාමයෙහි පහකළ රාග ඇත්තේ භවයෙහි නො පහකළ රාග ඇත්තේ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'කාමයෙහි ද භවයෙහි ද පහකළ රාග ඇත්තේ ද ද යත්: රහතුන් වහන්සේ යි. මේ පුද්ගල 'කාමයෙහි ද භවයෙහි ද පහකළ රාග ඇත්තේ' යැ යි කියනු ලැබේ.

9. කවර පුද්ගලයෙක් 'පාසාණ ලෙඛූපම' (ගලෙහි ඇඳි ඉරට බඳු) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර කිපෙයි. ඔහු ගේ ඒ ක්‍රෝධයත් බොහෝ කලක් දිගුකලක් රඳා සිටී. යම් සේ ගලෙහි ඇඳි ඉර සුළඟින් හෝ දියෙන් හෝ වහා නො නැසේ ද බොහෝ කල් පවතින්නේ වේ ද එසේ මැ මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර කිපෙයි, ඔහු ගේ ඒ ක්‍රොධයත් බොහෝ කලක් දිගු කලක් රඳා සිටී. මේ පුද්ගල පාසාණ ලෙඛූපම' යැ යි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො පඨවිලෙඛූපමො: ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො න චිරං දීඝරත්තං අනුසෙති. සෙය්‍යථාපි නාම පඨවියා ලෙඛා ඛිප්පං ලුජ්ජති වාතෙන වා උදකෙන වා න චිරට්ඨිතිකා හොති. එවමෙවං ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති සො ච ඛ්වස්ස කොධො න චිරං දීඝරත්තං අනුසෙති. අයං වුච්චති පුග්ගලො පඨවිලෙඛූපමො.

කතමො ච පුග්ගලො උදකලෙඛූපමො: ඉධෙ'කච්චො පුග්ගලො ආගාළ්හෙන පි වුච්චමානො ඵරුසෙන'පි වුච්චමානො අමනාපෙන'පි වුච්චමානො සංසන්දතිමෙව, සන්ධියතිමෙව; සම්මොදතිමෙව සෙය්‍යථාපි නාම උදකෙ ලෙඛා ඛිප්පං ලුජ්ජති, න චිරට්ඨිතිකා හොති, එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො ආගාළ්හෙන'පි වුච්චමානො ඵරුසෙන'පි වුච්චමානො අමනාපෙන'පි වුච්චමානො සංසන්දතිමෙව, සන්ධියතිමෙව, සම්මොදතිමෙව. අයං වුච්චති පුග්ගලො උදකලෙඛූපමො.

10. තත්‍ථ කතමෙ තයො පොත්ථකූපමා පුග්ගලා: තයො පොත්ථකා, නවො'පි පොත්ථකො දුබ්බණ්ණොචෙව හොති දුක්ඛසම්ඵස්සො ච අප්පග්ඝො ච, මජ්ඣිමො ච පොත්ථකො දුබ්බණ්ණොචෙව හොති දුක්ඛ-සම්ඵස්සො ච අප්පග්ඝො ච. ජිණ්ණො'පි පොත්ථකො දුබ්බණ්ණො චෙව හොති දුක්ඛසම්ඵස්සො ච අප්පග්ඝො ච. ජිණ්ණම්පි පොත්ථකං උක්ඛලි-පරිමජ්ජනං වා කරොන්ති. සඞ්කාරකූටෙ වා නං ඡඩ්ඩෙන්ති. 'එවමෙව තයො පොත්ථකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛුසු.

කතමෙ තයො: නවොචෙ'පි භික්ඛු හොති දුස්සීලො පාපධම්මො ඉදමස්ස දුබ්බණ්ණතාය, සෙය්‍යථාපි සො පොත්ථකො දුබ්බණ්ණො තථූපමො අයං පුග්ගලො යෙ ඛො පනස්ස සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. ඉදමස්ස දුක්ඛසම්ඵස්සතාය. සෙය්‍යථාපි සො පොත්ථකො දුක්ඛසම්ඵස්සො තථූපමො අයං පුග්ගලො යෙසං ඛො පන පතිගණ්හාති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරං, තෙසං තං න මහප්ඵලං හොති න මහානිසංසං,

කවර පුද්ගලයෙක් 'පඨවිලෙඛූපම' (පොළොවෙහි ඇඳි ඉරට බඳු) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර කිපෙයි. ඔහුගේ ඒ ක්‍රෝධය ද බොහෝ කලක් දිගුකලක් රඳා සිටින්නේ නො වෙයි, යම් පරිදි පොළොවෙහි ඇඳි ඉර සුළඟින් හෝ ජලයෙන් හෝ වහා මැකී යේ ද බොහෝ කල් නො පවත්නේ වේ ද එසේ මැ මෙලොව කිසි පුද්ගලයෙක් නිතොර කිපෙයි ඔහුගේ ඒ ක්‍රොධයත් බොහෝ කලක් දිගුකලක් රඳා නො සිටී, මේ පුද්ගල 'පඨවිලෙඛූපම' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'උදකලෙඛූපම' (දියෙහි ඇඳි ඉරට බඳු) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ඉතා තදබසිනුදු කියනු ලබන්නේ රළු බසිනුදු කියනු ලබන්නේ නො මනාපයෙනුදු කියනු ලබන්නේ සැසැඳේ (එක් වේ) මැ යැ ගැළපේ මැ යැ, සතුටු වේ මැ යි, සේ නම් දියෙහි ඇඳි ඉර වහා මැකේ ද, බොහෝ කල් නො පවත්නේ ද එසේ මැ මෙලොව කිසි පුද්ගලයෙක් ඉතා තද බසිනුදු කියනු ලබන්නේ රළු බසිනුදු කියනු ලබන්නේ නො මනාපයෙනුදු කියනු ලබන්නේ සැසැඳේ මැ යැ. ගැළපේ මැ යැ, සතුටු වේ මැ යි. මේ පුද්ගල 'උදකලෙඛූපම' යැ යි කියනු ලැබේ.

10. එහි කවරහු තිදෙනෙක් 'පොත්ථකූපම' (හණවැහැරියට බඳු) පුද්ගලයෝ වෙත් ද යත්: සණවැහැරි තුනෙකි. අළුත් වුවද සණවැහැරිය දුර්වර්ණ වූයේ මැ රළුපහස් ඇත්තේ ද මඳක් අගනේ ද වෙයි. මධ්‍යම සණවැහැරිය ද දුර්වර්ණ වූයේ මැ රළුපහස් ඇත්තේ ද මඳක් අගනේ ද වෙයි. දිරාගිය සණවැහැරිය ද දුර්වර්ණ වූයේ මැ රළු පහස් ඇත්තේ ද මඳක් අගනේ ද වේ. දිරාගිය සණවැහැරිය ද වළන් පිස්නක් හෝ කරති. කසළ ගොඩෙහි හෝ දමත්. එපරිද්දෙන් මැ භික්ෂූන් අතුරෙහි ඇත්තා වූ විද්‍යමාන වූ 'සණවැහැරියට බඳු පුද්ගලයෝ' තිදෙනෙකි.

කවර තිදෙනෙක් ද යත්: ඉදින් නවක මහණ තෙමේ ත් දුසිල් වූයේ ලාමකගති ඇත්තේ වේ නම් මේ ඔහු ගේ දුර්වර්ණ බව පිණිස වෙයි. යම් සේ ඒ සණවැහැරිය දුර්වර්ණ වූයේ ද මේ පුද්ගල එබඳු වෙයි. යළි යම් කෙනෙක් ඔහු සේවනය කරත් ද භජනය කරත් ද පර්යුපාසනය කරත් ද ඔහුගේ දෘෂ්ටිය අනුගමනය කරත් ද ඔවුනට එය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වෙයි. මේ ඔහු ගේ රළුපහස වෙයි. යම්සේ ඒ සණවැහැරිය රළුපහස් ඇත්තේ ද මේ පුද්ගල එබඳු යි. තවද යම් කෙනෙකුන් ගේ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනී ද ඔවුනට එය මහත් ඵල නො වෙයි. මහානිසංස නො වේ.

ඉදමස්ස අප්පග්ඝතාය සෙය්‍යථාපි සො පොත්ථකො අප්පග්ඝො තථූපමො අයං පුග්ගලො. මජ්ඣිමො චෙ'පි භික්ඛු හොති -පෙ- ථෙරො චෙ'පි භික්ඛු හොති, දුස්සීලො පාපධම්මො, ඉදමස්ස දුබ්බණ්ණතාය, සෙය්‍යථාපි සො පොත්ථකො දුබ්බණ්ණො තථූපමො අයං පුග්ගලො. යෙ ඛො පනස්ස සෙවන්ති, භජන්ති, පයිරුපාසන්ති, දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. ඉදමස්ස දුක්ඛසම්ඵස්සතාය. සෙය්‍යථාපි සො පොත්ථකො දුක්ඛසම්ඵස්සො තථූපමො අයං පුග්ගලො. යෙසං ඛො පන පතිගණ්හාති[1]. චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, තෙසං තං න මහප්ඵලං හොති න මහානිසංසං ඉදමස්ස අප්පග්ඝතාය. සෙය්‍යථාපි සො පොත්ථකො අප්පග්ඝො තථූපමො අයං පුග්ගලො. එවරූපො ථෙරො චෙ'පි භික්ඛු සඞ්ඝමජ්ඣෙ භණති. තමෙනං භික්ඛූ එවමාහංසු: කිං නු ඛො තුය්හං බාලස්ස අව්‍යත්තස්ස භණිතෙන ත්වම්පි නාම භණිතබ්බං මඤ්ඤසීති. සො කුපිතො අනත්තමනො තථාරූපිං වාචං නිච්ඡාරෙති. යථාරූපාය වාචාය සඞ්ඝො උක්ඛිපති සඞ්කාරකූටෙ'ව නං පොත්ථකං. ඉමෙ තයො පොත්ථකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසු.

11. තත්ථ කතමෙ තයො කාසිකවත්ථූපමා පුග්ගලා: තීණි කාසිකවත්ථානි, නවම්පි කාසිකං වත්ථං වණ්ණවන්තඤ්චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච, මජ්ඣිමම්පි කාසිකං වත්ථං වණ්ණවන්තඤ්චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච. ජිණ්ණම්පි කාසිකං වත්ථං වණ්ණවන්තඤ්චෙව හොති සුඛසම්ඵස්සඤ්ච මහග්ඝඤ්ච. ජිණ්ණම්පි කාසිකං වත්ථං රතනපළිවෙඨනං වා කරොන්ති, ගන්ධකරණ්ඩකෙ වා. නං නික්ඛිපන්ති, එවමෙව තයො කාසිකවත්ථූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසු.

කතමෙ තයො: නවො චෙ'පි භික්ඛු හොති සීලවා කල්‍යාණධම්මො ඉදමස්ස සුවණ්ණතාය. සෙය්‍යථාපි තං කාසිකං වත්ථං වණ්ණවන්තං තථූපමො අයං පුග්ගලො. යෙ ඛො පනස්ස සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං තං හොති දීඝරත්තං හිතාය සුඛාය. ඉදමස්ස සුඛසම්ඵස්සතාය.

---

1. පටිග්ගණ්හාති—ම ජ සං

මේ ඔහු ගේ මඳක් අගනා බව යැ, යම් පරිදි ඒ සණ වැහැරිය මඳක් අගනේද මේ පුද්ගල එ බඳු යි. ඉදින් මධ්‍යම වූ මහණ තෙමේ ත් ... ස්ථවිර වූ මහණ තෙමේත් දුසිල් වේ නම් ලාමක ගති ඇත්තේ නම් මේ ඔහුගේ දුර්වර්ණ බව වෙයි. යම් සේ ඒ සණවැහැරිය දුර්වර්ණ වූයේ ද මේ පුද්ගල එ බඳු යි. යම් කෙනෙක් වනාහි ඔහු සෙවන භජන පර්යුපාසන කෙරෙත් ද (ඔහුගේ) දෘෂ්ටිය අනුගමනය කෙරෙත් ද ඔවුනට එය බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වෙයි. මේ ඔහුගේ රළුපහස වෙයි. යම් සේ ඒ සණ වැහැරිය රළු පහස් ඇත්තේ ද මේ පුද්ගල එ බඳු යි. යම් කෙනකුන් ගේ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනී ද ඔවුනට එය මහත් ඵල නො වෙයි, මහ අනුසස් ඇත්තේ නො වේ. මේ ඔහු ගේ මඳ අගනා බව යි. යම්සේ සණ වැහැරිය මඳ වූ අගය ඇත්තේ ද මේ පුද්ගල එ බඳු යි, ඉදින් මෙබඳු වූ ස්ථවිර මහණ තෙමේ ත් සඟ මැද කථා කෙරේ නම් ඒ ඔහුට භික්ෂූහු මෙසේ කියත්. 'කිම බාල වූ නො වියත් වූ තොප ගේ කථායෙන්, තොප වැන්නවුන් පවා කථා කළ යුතු යැ යි සිතන්නහු දැ' යි. හෙතෙම කිපියේ නො සතුටු සිත් ඇත්තේ යම් බඳු වචනයකින් සංඝ තෙමේ කසළ ගොඩෙහි ලන සණවැහැරියක් මෙන් ඔහු උත්ක්ෂේපනය කෙරේ ද එබඳු වූ වචන පිට කරයි. මොහු තිදෙන භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන 'සණවැහැරි බඳු පුද්ගලයෝ' යි.

11. එහි කවරහු තිදෙනෙක් 'කසීවතට බඳු' පුද්ගලයෝ වෙත් ද යත්: කසීවත් තුනෙකි, අළුත් වූ ද කසීවත වර්ණවත් මැ වූයේ ද සුවපහස් ඇත්තේ ද මහඇඟි ද වෙයි. මධ්‍යම කසීවත ද වර්ණවත් මැ වූයේත් සුවපහස් ඇත්තේ ද මහඇඟි ද වෙයි. දිරාගිය කසීවත ද වර්ණවත් මැ වූයේ ද සුවපහස් ඇත්තේ ද මහඇඟි ද වේ. දිරාගිය කසීවත පවා රුවන් ඔතන්නක් හෝ කරති, සුවඳ කරඬුවෙක හෝ එය බහා තබත්. එසේ මැ භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන 'කසීවතට බඳු පුද්ගලයෝ තිදෙනෙක්' වෙති.

කවර තිදෙනෙක් ද යත්: ඉදින් නවක භික්ෂු තෙමේ ත් සිල්වත් වූයේ යහපත් ගති ඇත්තේ වේ නම් මේ ඔහුගේ සුවර්ණ බව යැ, යම් සේ ඒ කසීවත වර්ණවත් නම් මේ පුද්ගල තෙමේ එ බඳුයි. තව ද යම්කෙනෙක් ඔහු සේවනය කරත් ද භජනය කරත් ද පර්යුපාසනය කරත් ද ඔහුගේ දෘෂ්ටානු ගතියට, යෙත් ද ඔවුනට ඒ බොහෝ කලක් හිත පිණිස සුව පිණිස වෙයි. මේ ඔහුගේ සුවපහස් බව වේ. යම් සේ ඒ කසීවත සුව පහස් ඇත්තේ නම් මේ පුද්ගල එබඳු යි. තව ද යම් කෙනකුන් ගේ සිවුරු පිඩුවා ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනී ද ඔවුනට ඒ මහත් ඵල මහ අනුසස් ඇත්තේ වේ. මේ ඔහු ගේ මහඇඟි බව වේ. යම් සේ ඒ කසීවත මහඇඟි නම් මේ පුද්ගල එ බඳු යි.

සෙය්‍යථාපි තං කාසිකං වත්ථං සුඛසම්ඵස්සං තථූපමො අයං පුග්ගලො. යෙසං ඛො පන පතිගණ්හාති[1] චීවරපිණ්ඩපාත සෙනාසන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං තෙසං තං මහප්ඵලං හොති මහානිසංසං. ඉදමස්ස මහග්ඝතාය. සෙය්‍යථාපි තං කාසිකං වත්ථං මහග්ඝං තථූපමො අයං පුග්ගලො. මජ්ඣිමො චෙ'පි භික්ඛු—පෙ— ථෙරො-චෙ'පි භික්ඛු හොති සීලවා කල්‍යාණධම්මො ඉදමස්ස සුවණ්ණතාය. සෙය්‍යථාපි තං කාසිකං වත්ථං වණ්ණවන්තං, තථූපමො අයං පුග්ගලො යෙ ඛො පනස්ස සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති. තෙසං තං හොති දීඝරත්තං හිතාය සුඛාය, ඉදමස්ස සුඛසම්ඵස්සතාය. සෙය්‍යථාපි තං කාසිකං වත්ථං සුඛසම්ඵස්සං, තථූපමො අයං පුග්ගලො. යෙසං ඛො පන පතිගණ්හාති' චීවරපිණ්ඩපාතසෙනා-සනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං. තෙසං තං මහප්ඵලං හොති මහානිසංසං. ඉදමස්ස මහග්ඝතාය. සෙය්‍යථාපි තං කාසිකං වත්ථං මහග්ඝං, තථූපමො අයං පුග්ගලො. එවරූපො ච ථෙරො භික්ඛුසඞ්ඝමජ්ඣෙ භණති, තමෙනං භික්ඛූ එවමාහංසු අප්පසද්දා ආයස්මන්තො හොථ, ථෙරො භික්ඛු ධම්මඤ්ච විනයඤ්ච භණතීති. තස්ස තං වචනං ආධෙය්‍යං ගච්ඡති ගන්ධකරණ්ඩකෙ'ව නං කාසිකං වත්ථං, ඉමෙ තයො කාසිකවත්ථූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසු.

12. කතමො ච පුග්ගලො සුප්පමෙය්‍යො: ඉධෙ කච්චො පුග්ගලො උද්ධතො හොති උන්නලො චපලො මුඛරො විකිණ්ණවාචො මුට්ඨස්සති අසම්පජානො අසමාහිතො විබ්භන්තචිත්තො අසංවුතින්ද්‍රියො. අයං වුච්චති පුග්ගලො සුප්පමෙය්‍යො.

කතමො ච පුග්ගලො දුප්පමෙය්‍යො: ඉධෙ'කච්චො පුග්ගලො අනුද්ධතො හොති අනුන්නලො අචපලො අමුඛරො අවිකිණ්ණවාචො උපට්ඨිතසති සම්පජානො සමාහිතො එකග්ගචිත්තො සංවුතින්ද්‍රියො. අයං වුච්චති පුග්ගලො දුප්පමෙය්‍යො.

කතමො ච පුග්ගලො අප්පමෙය්‍යො: ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයං වුච්චති පුග්ගලො අප්පමෙය්‍යො.

1. පටිගණ්හාති - ම ඡ සං

ඉදින් මධ්‍යම භික්ෂු තෙමේ ත් -පෙ- ඉදින් ස්ථවිර භික්ෂු තෙමේ ත් සිල්වත් වූයේ කල්‍යාණ ගති ඇත්තේ වේ නම් මේ ඔහු ගේ සුවර්ණ බව වෙයි. යම් සේ ඒ කසීවත වර්ණවත් නම් මේ පුද්ගල එ බඳු යි. තව ද යම් කෙනෙක් ඔහු සේවනය කෙරෙත් ද භජනය කෙරෙත් ද පර්යුපාසනා කෙරෙත් ද ඔහුගේ දෘෂ්ටානුගතියට යෙත් ද ඔවුනට ඒ දිගු කලක් හිත පිණිස සුව පිණිස වෙයි. මේ ඔහුගේ සුවපහස් බව වෙයි. යම් සේ ඒ කසීවත සුවපහස් නම් මේ පුද්ගල එ බඳු යි. තවද යම් කෙනකුන් ගේ සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර පිළිගනී ද ඔවුනට ඒ මහත්ඵල වෙයි. මහ අනුසස් ඇත්තේ වෙයි. මේ ඔහුගේ 'මහ ඇගි බව' වේ. යම් සේ ඒ කසීවත මහ ඇගි නම් මේ පුද්ගල එ-බඳු යි. තව ද මෙ බඳු ස්ථවිර මහණ සඟමැද කථා කෙරෙයි ද ඒ මොහුට භික්ෂූහු මෙසේ කියත්. ''ඇවැත්නි නිහඬ වවූ ස්ථවිර මහණ ධර්මයත් විනයත් දෙසයි කියා යි. ඔහු ගේ ඒ වචනය ඒ කසීවත සුවඳ කරඬුවෙක නිදන් කරන්නා සේ නිදන් කළ යුතු බවට යෙයි. මොහු තිදෙන භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන 'කසීවතට බඳු පුද්ගලයෝ' යි.

12. කවර පුද්ගලයෙක් 'සුවසේ ප්‍රමාණ කළ හැක්කෝ' වේ ද යත්: මෙසස්නෙහි එක් පුද්ගලයෙක් උඩඟු යැ. උස් වූ මාන ඇත්තේ යැ, චපල යැ, වාචාල යැ. විසුරුණු වචන ඇත්තේ යැ. මුළා වූ සිහි ඇත්තේ යැ. සම්‍යක්ප්‍රඥා නැත්තේ යැ. එකඟ වූ සිත් නැත්තේ යැ. විසුරුණු සිත් ඇත්තේ යැ. සංවරණය නො කළ ඉඳුරන් ඇත්තේ යි. මේ පුද්ගල 'සුවසේ ප්‍රමාණ කළ හැක්කෝ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'දුකසේ ප්‍රමාණ කළ හැක්කෝ' වේ ද යත්: මෙසස්-නෙහි එක් පුද්ගලයෙක් උඩඟු නො වෙයි, උස් වූ මාන නැත්තේ වෙයි. චපල නො වෙයි, වාචාල නො වෙයි. විසුරුණු වචන ඇත්තේ නො වෙයි. එළඹ සිටි සිහි ඇත්තේ වෙයි. සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙයි. සන්සුන් සිත් ඇත්තේ වෙයි. එකඟ වූ සිත් ඇත්තේ වෙයි. සංවරණය කළ ඉඳුරන් ඇත්තේ වේ. මේ පුද්ගල 'දුකසේ ප්‍රමාණ කළ හැක්කෝ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ප්‍රමාණ කළ නො හැක්කෝ වේ ද යත්: මෙසස්නෙහි කිසි පුද්ගලයෙක් ආස්‍රවයන් ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ චිත්ත විමුක්ති-යත් ප්‍රඥාවිමුක්තියත් මෙ අත් බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේ ද මේ පුද්ගල 'ප්‍රමාණ කළ නො හැක්කෝ' යැ යි කියනු ලැබේ.

13. කතමො ච පුග්ගලො න සෙවිතබ්බො, න භජිතබ්බො න පයිරුපාසිතබ්බො: ඉධෙ'කච්චො පුග්ගලො හීනො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය. එවරූපො පුග්ගලො න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො අඤ්ඤත්‍ර අනුද්දයා, අඤ්ඤත්‍ර අනුකම්පා.

කතමො ච පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො පයිරුපාසිතබ්බො: ඉධෙකච්චො පුග්ගලො සදිසො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය, එවරූපො පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො, තං කිස්සහෙතු: සීලසාමඤ්ඤගතානං සතං සීලකථා ච නො භවිස්සති සා ච නො ඵාසු භවිස්සති. සා ච නො පවත්තනී[1] භවිස්සති. සමාධිසාමඤ්ඤගතානං සතං සමාධිකථා ච නො භවිස්සති. සා ච නො ඵාසු භවිස්සති, සා ච නො පවත්තනී[1] භවිස්සති. පඤ්ඤාසාමඤ්ඤගතානං සතං පඤ්ඤාකථා ච නො භවිස්සති. සා ච නො ඵාසු භවිස්සති, සා ච නො පවත්තනී භවිස්සති. තස්මා එවරූපො පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො.

කතමො ච පුග්ගලො සක්කත්වා ගරුකත්වා[2] සෙවිතබ්බො, භජිතබ්බො පයිරුපාසිතබ්බො ඉධෙ'කච්චො පුග්ගලො අධිකො හොති සීලෙන සමාධිනා පඤ්ඤාය. එවරූපො පුග්ගලො සක්කත්වා ගරුකත්වා සෙවිතබ්බො භජිතබ්බො, පයිරුපාසිතබ්බො. තං කිස්සහෙතු අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමි, අපරිපූරං වා සමාධික්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා සමාධික්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමි. අපරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙස්සාමි, පරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගහෙස්සාමී'ති. තස්මා එවරූපො පුග්ගලො සක්කත්වා ගරුකත්වා[2] සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො.

1. පවත්තිනී- ම ජ සං
2. ගරුං කත්වා - ම ජ සං

13. කවර පුද්ගලයෙක් 'සේවනය නො කළ යුත්තේ භජනය නො කළ යුත්තේ පර්යුපාසනය නො කළ යුත්තේ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් හීන වූයේ වෙ යි ද මෙබඳු පුද්ගල දයාවෙන් මිස අනුකම්පාවෙන් මිස සේවනය නො කළ යුත්තේ යැ. භජනය නො කළ යුත්තේ යැ පර්යුපාසනය නො කළ යුත්තේ යි.

කවර පුද්ගලයෙක් 'සෙවනය කළ යුත්තේ භජනය කළ යුත්තේ පර්යුපාසනය කළ යුත්තේ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් (තමා) සම වූයේ වේ ද මෙ බඳු පුද්ගල සෙවනය කළ යුත්තේ යැ. භජනය කළ යුත්තේ යැ. පර්යුපාසනය කළ යුත්තේ යි. එයට හෙතු කවරේ ද යත්: ශීලයෙන් සම බවට ගියා වූ අප ගේ ශීලකථාව ද වන්නී යැ. එ කථාව ද අපට සැප විහරණ පිණිස වන්නී යැ තව ද අපගේ ඒ කථාව පවත්නක් වන්නීය. සමාධියෙන් සම බවට ගියා වූ අපගේ සමාධිකථාවත් වන්නීය. ඒ කථාව ද අපට සැපවිහරණ පිණිස වන්නී යැ. තව ද අප ගේ ඒකථාව පවත්නක් වන්නී යැ. ප්‍රඥායෙන් සම බවට ගියා වූ අපගේ ප්‍රඥාකථාවත් වන්නී යැ. ඒ කථාව ද අපට සැපවිහරණ පිණිස වන්නී යැ. තව ද අප ගේ ඒ කථාව පවත්නක් වන්නීයැ. එහෙයින් මේ පුද්ගල සේවනය කටයුත්තේ යැ. භජනය කටයුත්තේ යැ. පර්යුපාසනය කටයුත්තේ යි.

කවර පුද්ගලයෙක් 'සත්කාර කොට ගරුකාර කොට සේවනය කළ යුත්තේ භජනය කළ යුත්තේ පර්යුපාසනය කළ යුත්තේ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ශීලයෙන් සමාධියෙන් ප්‍රඥායෙන් අධික වෙයි. මෙ බඳු පුද්ගල සත්කාර කොට ගරුකාර කොට සේවනය කළ යුත්තේ යැ. භජනය කළ යුත්තේ යැ. පර්යුපාසනය කළ යුත්තේ යි. එ කවර හෙයින යත්: අසම්පූර්ණ වූ හෝ ශීලස්කන්ධය සම්පූර්ණ කරන්නෙමි. සම්පූර්ණ වූ හෝ ශීලස්කන්ධයට ඒ ඒ තැන්හි ප්‍රඥායෙන් අනුග්‍රහ කරන්නෙමි. අසම්පූර්ණ වූ හෝ සමාධිස්කන්ධය සම්පූර්ණ කරන්නෙමි. සම්පූර්ණ වූ හෝ සමාධිස්කන්ධයට ඒ ඒ තැන්හි ප්‍රඥායෙන් අනුග්‍රහ කරන්නෙමි. අසම්පූර්ණ වූ හෝ ප්‍රඥාස්කන්ධය සම්පූර්ණ කරන්නෙමි, සම්පූර්ණ වූ හෝ ප්‍රඥාස්කන්ධයට ඒ ඒ තැන්හි ප්‍රඥායෙන් අනුග්‍රහ කරන්නෙමි' යි එහෙයින් මේ පුද්ගල සත්කාර කොට ගරුකාර කොට සේවනය කළ යුත්තේ යැ භජනය කළ යුත්තේ යැ පර්යුපාසනය කළ යුත්තේ යි.

14. කතමො ච පුග්ගලො ජිගුච්ඡිතබ්බො න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො: ඉධෙ'කච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචි සඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො, අබ්‍රහ්මචාරි බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තො පූති අවස්සුතො කසම්බුජාතො එවරූපො පුග්ගලො ජිගුච්ඡිතබ්බො න සෙවිතබ්බො. න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො' තං කිස්සහෙතු: කිඤ්චාපි එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති අථ ඛො නං පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති පාපමිත්තො පුරිසපුග්ගලො පාපසහායො පාපසම්පවඞ්කො'ති. සෙය්‍යථාපි නාම අහි ගූථගතො කිඤ්චාපි න දංසති අථ ඛො නං මක්ඛෙති, එවමෙව කිඤ්චාපි එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති අථ ඛො නං පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති පාපමිත්තො පුරිසපුග්ගලො පාපසහායො පාපසම්පවඞ්කොති තස්මා එවරූපො පුග්ගලො ජිගුච්ඡිතබ්බො න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො.

කතමො ච පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො: ඉධෙ'කච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, සෙය්‍යථාපි නාම දුට්ඨාරුකා කට්ඨෙන වා කඨලාය වා සට්ටිතා භිය්‍යොසොමත්තාය අස්සන්දති, එවමෙව ඉධෙ'කච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති, පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, සෙය්‍යථාපි නාම තින්දුකාලාතං කට්ඨෙන වා කඨලයා වා සට්ටිතං භිය්‍යොසොමත්තාය චිච්චිටායති චිටිච්චිටායති, එවමෙව ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, සෙය්‍යථාපි නාම ගූථකූපො කට්ඨෙන වා කඨලාය වා සට්ටිතො භිය්‍යොසොමත්තාය දුග්ගන්ධො හොති, එවමෙව ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාසබහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති, එවරූපො පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරුපාසිතබ්බො. තං කිස්සහෙතු: අක්කොසෙය්‍යපි මං පරිභාසෙය්‍යපි මං අනත්ථම්පි මෙ[1] කරෙය්‍යාති, තස්මා එවරූපො පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො, න භජිතබ්බො, න පයිරුපාසිතබ්බො.

---

1. අනත්ථම්පි මං - සිමු.

14. කවර පුද්ගලයෙක් පිළිකුල් කළ යුත්තේ සේවනය නො කළ යුත්තේ භජනය නො කළ යුත්තේ පර්යුපාසනය නො කළ යුත්තේ ද: මෙලොව එක් පුද්ගලයෙක් දුසිල් වූයේ වෙයි ලාමක ගති ඇත්තේ අපිරිසිදු කායකර්මාදිය ඇත්තේ සැකයෙන් සිහි කටයුතු පැවැතුම් ඇත්තේ සැඟැවිය යුතු ක්‍රියා ඇත්තේ ශ්‍රමණ ප්‍රතිරූපක වූයේ ශ්‍රමණයෙමි ප්‍රතිඥා කරන්නේ බ්‍රහ්මචාරී ප්‍රතිරූපක වූයේ බ්‍රහ්මචාරි-යෙමි' යි ප්‍රතිඥා කරන්නේ ඇතුළත කුණු වූයේ රාගාදීන් තෙත් වූයේ හටගත් රාගාදි කසළ ඇත්තේ වෙයි, මෙ බඳු පුද්ගල පිළිකුල් කළ යුත්තේ ය, සෙවනය නො කළ යුත්තේ ය, භජනය නො කළ යුත්-තේ ය, පර්යුපාසනය නො කළ යුත්තේ යි. එ කවර හෙයින යත්: මෙ බඳු පුද්ගලයා ගේ දෘෂ්ටානුගතියට නො පැමිණෙයි එතෙකුදු වුවත් 'පවිටු මිතුරන් ඇති පවිටු සහායයන ඇති පවට නැඹුරු වූ පුද්ගලයෙකි' යන ඔහු පිළිබඳ ලාමක වූ කීර්තිශබ්දය උස් ව නැඟෙයි. යම් සේ අසූචියෙහි සිටි සර්පයා දෂ්ට නොකෙරේ නමුදු වැලි (අසූචියෙන්) ඔහු තවරයි එසේ ම මෙබඳු වූ පුද්ගලයාගේ දෘෂ්ටානුගතියට නො පැමිණේ නමුදු වැලි 'පවිටු මිතුරන් ඇති පවිටු සහායයන් ඇති පවට නැඹුරු වූ පුරුෂ පුද්ගල-යෙක' යන ඔහු පිළිබඳ ලාමක කථාහඬ උස්ව නැඟෙයි, එහෙයින් මෙබඳු වූ පුද්ගල පිළිකුල් කළ යුත්තේ සෙවනය නො කළ යුත්තේ ය. භජනය නො කළ යුත්තේ ය. පර්යුපාසනය නො කළ යුත්තේ යි.

උපේක්ෂා කළ යුතු සේවනය නො කළ යුතු භජනය නො කළ යුතු පර්යුපාසනය නො කළ යුතු පුද්ගල කවරේ ද: මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙනසුලු ය, දැඩි ආයාස බහුල කොට ඇත්තේ ය. යම්ත-මක් කියන ලද පමණිනුදු ලැගෙයි, කිපෙයි, ප්‍රකෘතිය හරී, තද බවට පැමිණෙයි, කොපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි. යම් සේ පැරණි ව්‍රණය දණ්ඩකින් හෝ කැබිලිත්තකින් පහරන ලද්දේ බොහෝ සෙයින් පූයා වගුරුවා ද එසේ ම මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙනසුලු ය. දැඩි ආයාස බහුල කොට ඇත්තේ ය. මදකුදු කියන ලද්දෙ ලැගෙයි, කිපෙයි, ප්‍රකෘතිය හරී තද බවට පැමිණෙයි. කොපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි. යම් සේ තිඹිරි පෙනහෙල්ලක් දණ්ඩෙන් හෝ කැබිලිත්තෙන් ගටනා ලද්දේ බොහෝ සෙයින් 'චිච්චිට' හඬ නඟා ද 'චිට චිට' හඬ නඟා ද එපරිද්දෙන් ම මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙන-සුලු වෙයි. දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි, මදකුදු කියන ලද්දේ ලැගෙයි, කිපෙයි, ප්‍රකෘතිය හරී. තද බවට පැමිණෙයි, කොපයත් ද්වේෂයත් නොසතුටත් පහළ කෙරෙයි. යම්සේ ගූථකූපය දණ්ඩකින් හෝ කැබිලිත්තකින් හෝ ගටනා ලද්දේ බොහෝ සෙයින් දු ගඳ වෙයි ද එපරිද්-දෙන් ම මෙලොව කිසි පුද්ගලයෙක් කිපෙන සුලු වෙයි, දැඩි ආයාස බහුල කොට ඇත්තේ වෙයි, මදකුදු කියන ලද්දේ ලැගෙයි, කිපෙයි ප්‍රකෘතිය හරී, තද බවට පැමිණෙයි. කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි, මෙ බඳු පුද්ගල උපෙක්ෂා කටයුත්තේ ය. සේවනය නො කළ යුත්තේ ය, භජනය නො කළ යුත්තේ ය, පර්යුපාසනය නො කළ යුත්තේ යි. එයට හේතු කවරේ ද යත්: මට ආක්‍රෝෂ කරනු ඇතැයි ද මට අවමන් කරනු ඇතැ යි ද මට අවැඩ කරනු ඇතැයි ද කියා යි. එහෙයින් මෙ බඳු පුද්ගල උපේක්ෂා කටයුතුය, සෙවනය නො කළ යුත්තේය, භජනය නො කළ යුත්තේ ය, පර්යුපාසනය නො කළ යුත්තේයි.

කතමො ච පුග්ගලො සෙවිතබ්බො භජිතබ්බො, පයිරුපාසිතබ්බො: ඉධෙ'කච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො, එවරූපො පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො, තං කිස්ස හෙතු: කිඤ්චාපි එවරූපස්ස පුග්ගලස්ස න දිට්ඨානුගතිං ආපජ්ජති අථ ඛො නං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති. කල්‍යාණමිත්තො පුරිසපුග්ගලො, කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො'ති තස්මා එවරූපො පුග්ගලො සෙවිතබ්බො, භජිතබ්බො, පයිරුපාසිතබ්බො.

15. කතමො ච පුග්ගලො සීලෙසු පරිපූරකාරී සමාධිස්මිං මත්තසොකාරී පඤ්ඤාය මත්තසොකාරී: සොතාපන්නසකදාගාමිනො. ඉමෙ වුච්චන්ති පුග්ගලා සීලෙසු පරිපූරකාරිනො, සමාධිස්මිං මත්තසොකාරිනො, පඤ්ඤාය මත්තසොකාරිනො.

කතමො ච පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී, සමාධිස්මිඤ්ච පරිපූරකාරී පඤ්ඤාය මත්තසොකාරී: අනාගාමී. අයං වුච්චති පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී සමාධිස්මිඤ්ච පරිපූරකාරී, පඤ්ඤාය මත්තසොකාරී.

කතමො ච පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී, සමාධිස්මිඤ්ච පරිපූරකාරී, පඤ්ඤාය ච පරිපූරකාරී: අරහා. අයං වුච්චති පුග්ගලො සීලෙසු ච පරිපූරකාරී සමාධිස්මිඤ්ච පරිපූරකාරී, පඤ්ඤාය ච පරිපූරකාරී.

16. තත්‍ථ කතමෙ තයො සත්‍ථාරො: ඉධෙ'කච්චො සත්‍ථා කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති. ඉධ පන එකච්චො සත්‍ථා කාමානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති. රූපානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති, ඉධ පන එකච්චො සත්‍ථා කාමානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති, රූපානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති වෙදනානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති. තත්‍ර යවායං සත්‍ථා කාමානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න රූපානං පරිඤ්ඤං පඤ්ඤපෙති, න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති[1] රූපාවචරසමාපත්තියා ලාභී සත්‍ථා තෙන දට්ඨබ්බො තත්‍ර යවායං සත්‍ථා කාමානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති රූපානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති න වෙදනානං පරිඤ්ඤං පඤ්ඤපෙති අරූපාවචරසමාපත්තියා ලාභී සත්‍ථා තෙන දට්ඨබ්බො. තත්‍ර යවායං සත්‍ථා කාමානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති, රූපානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති, වෙදනානඤ්ච පරිඤ්ඤං පඤ්ඤපෙති, සම්මාසම්බුද්ධො සත්‍ථා තෙන දට්ඨබ්බො, ඉමෙ තයො සත්‍ථාරො.

---

1. පඤ්ඤාපෙති-ම ජ සං.

කවර පුද්ගලයෙක් සේවනය කළ යුත්තේ භජනය කළ යුත්තේ පර්යුපාසනය කළ යුත්තේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් සිල්වත් වෙයි, යහපත් ගති ඇත්තේ ය, මෙ බඳු පුද්ගල සේවනය කළ යුත්තේය. භජනය කළ යුත්තේ ය, පර්යුපාසනය කළ යුත්තේ යි. එයට හෙතු කවරේ ද යත්: මෙබඳු පුද්ගලයා ගේ දෘෂ්ටානුගතියට නො පැමිණේ නමුදු වැලි ''කලණ මිතුරන් ඇති 'කලණ සහායයන් ඇති' කලණ යන්ට නැඹුරු වූ පුරුෂ පුද්ගලයෙක'' යන ඔහු පිළිබඳ වූ යහපත් කීර්ති ශබ්දය උස් ව නැඟෙයි. එහෙයින් මෙ බඳු වූ පුද්ගල සෙවනය කළ යුත්තේය. භජනය කළ යුත්තේ ය. පර්යුපාසනය කළ යුත්තේ යි.

15. කවර පුද්ගලයෙක් සීලයන් සපුරා කරන්නේ සමාධිය එක් දෙසක් කරන්නේ ප්‍රඥාව එක් දෙසක් කරන්නේ වේ ද යත්: සොතාපන්න සකදගාමීහු ය. මොහු සීලයන්හි සපුරා කරන සුලු සමාධියෙහි එක් දෙසක් කරන සුලු ප්‍රඥායෙහි එක්දෙසක් කරන සුලු පුද්ගලයෝ ය යි කියනු ලැබෙත්.

කවර පුද්ගලයෙක් සීලයන් ද සපුරා කරන්නේ සමාධිය ද සපුරා කරන්නේ ප්‍රඥාව එක් දෙසක් කරන්නේ වේ ද යත්: අනාගාමී තෙමේ යි. මේ තෙමේ සීලයන් ද සපුරා කරන සුලු සමාධිය ද සපුරා කරන ප්‍රඥාව එක් දෙසක් කරන පුද්ගලයා යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් සීලයන් ද සපුරා කරන්නේ සමාධිය ද සපුරා කරන්නේ ප්‍රඥාව ද සපුරා කරන්නේ වේ ද යත්: රහතුන් වහන්සේ යි. මේ තෙමේ සීලයන් ද සපුරා කරන සමාධිය ද සපුරා කරන ප්‍රඥාව ද සපුරා කරන පුද්ගලයා යැ යි කියනු ලැබේ.

16. එහි ශාස්තෘහු තිදෙනා කවරහු ද යත්: මෙලොව එක් ශාස්තෘ වරයෙක් කාමයන් ගේ ප්‍රහාණය පනවයි. රූපයන් ගේ ප්‍රහාණය නො පනවයි. වෙදනාවන් ගේ ප්‍රහාණය නො පනවයි. යළි මෙහි එක් ශාස්තෘ වරයෙක් කාමයන් ගේ ද ප්‍රහාණය පනවයි. රූපයන් ගේ ද ප්‍රහාණය පනවයි. වෙදනාවන් ගේ ප්‍රහාණය නො පනවයි. තවද මෙහි එක් ශාස්තෘ-වරයෙක් කාමයන් ගේ ද ප්‍රහාණය පනවයි. රූපයන් ගේ ද ප්‍රහාණය පනවයි. වෙදනාවන්ගේ ද ප්‍රහාණය පනවයි. ඔවුනතුරෙහි යම් මේ ශාස්තෘ වරයෙක් කාමයන් ගේ ප්‍රහාණය පනවා ද රූපයන් ගේ ප්‍රහාණය නො පනවා ද වෙදනාවන් ගේ ප්‍රහාණය නො පනවා ද එකරුණෙන් රූපාවචර සමාපත්තිය ලබනසුලු ශාස්තෘවරයෙකැ යි දත යුත්තේ ය. ඔවුනතුරෙහි යම් ශාස්තෘවරයෙක් කාමයන් ගේ ත් ප්‍රහාණය පනවා ද රූපයන් ගේ ත් ප්‍රහාණය පනවා ද වෙදනාවන් ගේ ත් ප්‍රහාණය නො පනවාද එකරුණින් අරූපාවචර සමාපත්තිය ලබන සුලු ශාස්තෘ වරයෙකැයි දත යුත්තේ ය. ඔවුනතුරෙහි යම් ශාස්තෘවරයෙක් කාමයන්ගේත් ප්‍රහාණය පනවා ද රූපයන්ගේ ත් ප්‍රහාණය පනවා ද වේදනාවන්ගේත් ප්‍රහාණය පනවා ද එකරුණෙන් සම්‍යක් සම්බුද්ධ වූ ශාස්තෘන් වහන්සේ ය යි දත යුත්තා හ. මොහු තිදෙන ශාස්තෘහු යි.

17. තත්ථ කතමෙ අපරෙපි තයො සත්ථාරො: ඉධෙකච්චො සත්ථා දිට්ඨෙචෙව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති, අභි-සම්පරායඤ්ච අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති ඉධ පන එකච්චො සත්ථා දිට්ඨෙව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති, නො ච ඛො අභිසම්පරායං අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති, ඉධ පන එකච්චො සත්ථා දිට්ඨෙචෙව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො න පඤ්ඤපෙති. අභිසම්පරායඤ්ච අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤ-පෙති. තත්‍ර යවායං සත්ථා දිට්ඨෙචෙව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති, අභිසම්පරායඤ්ච අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති සස්සතවාදො සත්ථා තෙන දට්ඨබ්බො, තත්‍ර යවායං සත්ථා දිට්ඨෙ'ව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති නො ච ඛො අභිසම්පරායං අත්තානං සච්චතො ථෙතතො පඤ්ඤපෙති උච්ඡෙදවාදො සත්ථා තෙන දට්ඨබ්බො, තත්‍ර යාවායං සත්ථා දිට්ඨෙචෙව ධම්මෙ අත්තානං සච්චතො ථෙතතො න පඤ්ඤපෙති, අභිසම්පරායඤ්ච අත්තානං සච්චතො ථෙතතො න පඤ්ඤපෙති, සම්මා සම්බුද්ධො සත්ථා තෙන දට්ඨබ්බො, ඉමෙ අපරෙ'පි තයො සත්ථාරො.

**තික නිද්දෙසො නිට්ඨිතො.**

17. එහි අන්‍ය වූ ද ශාස්තෘහු තිදෙනා කවරහු ද යත්: මෙලොව එක් ශාස්තෘවරයෙක් මෙ අත් බැව්හි ම සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනව යි. පර අත් බැව් හි ද සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනවයි. යළි මෙහි එක් ශාස්තෘවරයෙක් මෙ අත්බැව්හි ම සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනවයි. එතෙකුදු වත් පෙර අත් බැව්හි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනවයි. තවද මෙහි එක් ශාස්තෘ වරයෙක් මෙ අත්බැව්හි ද සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනවයි. පරඅත් බැව්හි ද සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනව යි. ඔවුනතුරෙහි යම් ශාස්තෘ වරයෙක් මෙ අත් බැව්හි ද සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනවා ද, පර අත්බැව්හි ද සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනවාද එකරුණින් ශාස්වතවාදී ශාස්තෘ වරයෙකැයි දත යුත්තේ ය. ඔවුනතුරෙහි යම් ශාස්තෘවරයෙක් මෙ අත්බැව්හි ම සත්‍යවශයෙන් ස්ථිර වශයෙන් ආත්මය පනවාද එතෙකුදු වත් පර අත්බැව්හි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනවාද එකරුණින් උච්ඡේදවාදී ශාස්තෘවරයෙකැයි දත යුත්තේ ය. ඔවුනතුරෙහි යම් ශාස්තෘ වරයෙක් මෙ අත්බැව්හි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනවා ද පර අත්බැව්හි ත් සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් ආත්මය නො පනවා ද එකරුණෙන් සම්‍යක් සම්බුද්ධ වූ ශාස්තෘන් වහන්සේ ය යි දත යුත්තාහ. මොහු අන්‍ය වූ ද ශාස්තෘහු තිදෙනා යි.

**ත්‍රික නිර්දේශය නිමියේ යි.**

## 4. චතුක්ක නිද්දෙසො

1. කතමො ච පුග්ගලො අසප්පුරිසො; ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතී හොති, අදින්නාදයී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති මුසාවාදී හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති. අයං වුච්චති පුග්ගලො අසප්පුරිසො.

කතමො ච පුග්ගලො අසප්පුරිසෙන අසප්පුරිසතරො: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. අත්තනා ච අදින්නාදයී හොති, පරඤ්ච අදින්නාදනෙ සමාදපෙති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති. අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨායී හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානෙ සමාදපෙති. අයං වුච්චති පුග්ගලො අසප්පුරිසෙන අසප්පුරිසතරො.

කතමො ච පුග්ගලො සප්පුරිසො: ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදනා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාද පටිවිරතො හොති, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, අයං වුච්චති පුග්ගලො සප්පුරිසො.

කතමො ච පුග්ගලො සප්පුරිසෙන සප්පුරිසතරො: ඉධෙ'-කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතාවෙරමණියා සමාදපෙති. අත්තනා ච අදින්නාදනා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදනා වෙරමණියා සමාදපෙති. අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා ච මුසාවාද පටිවිරතො හොති, පරඤ්ච මුසාවාද වෙරමණියා සමාදපෙති. අත්තනා ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති, පරඤ්ච සුරාමෙරයමජ්ජපමාදට්ඨානා වෙරමණියා සමාදපෙති. අයං වුච්චති පුග්ගලො සප්පුරිසෙන සප්පුරිසතරො.

# 4. චතුෂ්ක නිර්දේශය

1. කවර පුද්ගලයෙක් අසත්පුරුෂ වේ ද යත්; මෙලොවැ කිසි පුද්ගලයෙක් ප්‍රාණීන් නසන්නේ වෙයි. නුදුන් දෑය ගන්නේ වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නේ වෙයි. බොරු කියන්නේ වෙයි. රහමෙර පානයෙහි යෙදුණේ වේ. මේ පුද්ගල අසත්පුරුෂ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් අසත්පුරුෂයාට වඩා අතිශයින් අසත්පුරුෂ වේ ද යත්: මෙලොවැ එක් පුද්ගලයෙක් තෙමේත් ප්‍රාණීන් නසන්නේ වෙයි. අනුනුදු ප්‍රාණීන් නැසීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් නුදුන් දෑය ගන්නේ වෙයි. අනුනුදු නුදුන් දෑය ගැන්මෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි වරදවා හැසිරෙන්නේ වෙයි. අනුනුදු කාමයෙහි වරදවා හැසිරීමෙහි සමාදන් කවරයි. තෙමේත් බොරු කියන්නේ වෙයි. අනුනුදු බොරුකීමෙහි සමාදන් කරවයි. තෙමේත් රහමෙර පානයෙහි යෙදුණේ වෙයි. අනුනුදු රහමෙර පානයෙහි සමාදන් කරවයි. මේ පුද්ගල අසත්පුරුෂයාට වඩා අතිශයින් අසත්පුරුෂ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් සත්පුරුෂ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ප්‍රාණඝාතයෙන් වෙන් වූයේ වෙයි. නුදුන් දෑය ගැන්මෙන් වෙන් වූයේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වූයේ වෙයි. මුසවා කීමෙන් වෙන් වූයේ වෙයි. රහමෙර පානයෙන් වෙන් වූයේ වේ. මේ පුද්ගල සත්පුරුෂ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් සත්පුරුෂයාට වඩා අතිශයින් සත්පුරුෂ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් තෙමේත් ප්‍රාණඝාතයෙන් වෙන් වූයේ වෙයි, මෙරමා ද ප්‍රාණඝාතයෙන් වෙන්වීමෙහි සමාදන් කරවයි. තෙමේත් නුදුන් දෑය ගැන්මෙන් වෙන් වූයේ වෙයි. මෙරමා ද නුදුන් දෑය ගැන්මෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වූයේ වෙයි. මෙරමා ද කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි. තෙමේත් මුසවා කීමෙන් වෙන් වූයේ වෙයි, මෙරමා ද මුසවා කීමෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි, තෙමේත් රහමෙර පානයෙහි ගැලීමෙන් වෙන් වූයේ වෙයි, මෙරමා ද රහමෙර පානයෙහි ගැලීමෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි. මේ පුද්ගල සත්පුරුෂයාට වඩා අතිශයින් සත්පුරුෂයැ යි කියනු ලැබේ.

2. කතමො ච පුග්ගලො පාපො: ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතී හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුනවාචො[1] හොති, ඵරුසවාචො[2] හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තො හොති, මිච්ඡාදිට්ඨි හොති, අයං වුච්චති පුග්ගලො පාපො.

කතමො ච පුග්ගලො පාපෙන පාපතරො: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතී හොති. පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති, අත්තනා ච මුසාවාදී හොති, පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, අත්තනා ච පිසුනවාචො[1] හොති, පරඤ්ච පිසුනාය වාචාය සමාදපෙති, අත්තනා ච ඵරුසවාචො හොති, පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති, අත්තනා ච සම්ඵප්පලාපී හොති, පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, අත්තනා ච අභිජ්ඣාලු හොති, පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අත්තනා ච ව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, අත්තනා ච මිච්ඡාදිට්ඨි හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති: අයං වුච්චති පුග්ගලො පාපෙන පාපතරො.

කතමො ච පුග්ගලො කල්‍යාණො: ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති. පිසුනාය වාචාය පටිවිරතො හොති, ඵරුසාය වාචාය පටිවිරතො හොති, සම්ඵප්පලාපා පටිවිරතො හොති, අනභිජ්ඣාලු හොති, අව්‍යාපන්නචිත්තො හොති, සම්මාදිට්ඨි හොති. අයං වුච්චති පුග්ගලො කල්‍යාණො.

කතමො ච පුග්ගලො කල්‍යාණෙන කල්‍යාණතරො: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, අත්තනා ච අදින්නාදානා පටිවිරතො හොති, පරඤ්ච අදින්නාදානා වෙරමණියා සමාදපෙති, අත්තනා ච කාමෙසු මිච්ඡාචාරා පටිවිරතො හොති, පරඤ්ච කාමෙසු මිච්ඡාචාරා වෙරමණියා සමාදපෙති. අත්තනා ච මුසාවාදා පටිවිරතො හොති,

---

1. { පිසුනාවාචො - සීමු.
   { පිසුණවාචො – මජ්ඣ.
2. ඵරුසාවාචො - සී මු.

2. කවර පුද්ගලයෙක් පාපී වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ප්‍රාණීන් නසන්නේ වෙයි. නුදුන් දෑය ගන්නේ වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නේ වෙයි. මුසවා කියනනේ වෙයි. පෙහෙසුන් බස් (කේලාම්) කියන්නේ වෙයි. රළු වදන් කියන්නේ වෙයි. ප්‍රලාප (හිස් වදන්) කියන්නේ වෙයි. අනුන් අයත් දෑය තමා සතු කරන රිසි ඇත්තේ වෙයි. මෙරමා නසන සිත් ඇත්තේ වෙයි. මිසදිටු වේ. මේ පුද්ගල පාපී (පව් ඇත්තේ) යයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් පාපියාහට වඩා අතිශයින් පාපී වේ ද යත්: මෙලොව් කිසි පුද්ගලයෙක් තෙමේත් ප්‍රාණීන් නසන්නේ වෙයි. මෙරමාත් ප්‍රාණීන් නැසීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් නුදුන් දෑය ගන්නේ වෙයි. මෙරමාත් නුදුන් දෑය ගැන්මෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි වරදවා හැසිරෙන්නේ වෙයි. මෙරමා ත් කාමයෙහි වරදවා හැසිරීමෙහි සමාදන් කරවයි. තෙමේත් මුසවා කියන්නේ වෙයි. මෙරමාත් මුසවා කීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් පිසුනු බස් කියන්නේ වෙයි. මෙරමාත් පිසුනු වදන්හි සමාදන් කරවයි. තෙමේත් රළුවදන් කියන්නේ වෙයි. මෙරමාත් රළුවදන් කීමෙහි සමාදන් කරවයි. තෙමේත් සිස් තෙපුල් කියන්නේ වෙයි. මෙරමාත් සිස් තෙපුල් කීමෙහි සමාදන් කරවයි. තෙමේත් අන්සතු දෑ තමා සතු කරන රිසි ඇත්තේ වෙයි මෙරමාත් අන්සතු දෑය තමා සතු කරන රිසියෙහි සමාදන් කරවයි. තෙමේත් මෙරමා නසන සිත් ඇත්තේ වෙයි. මෙරමාත් මෙරමා නසන සිත්හි සමාදන් කරවයි. තෙමේ ත් මිසදිටු වෙයි. මෙරමාත් මිසදිටුයෙහි සමාදන් කරවයි. මේ පුද්ගල පාපියාට වඩා අතිශයින් පාපීය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් කල්‍යාණ වේ ද යත්: මෙලොව් කිසි පුද්ගලයෙක් ප්‍රාණඝාතයෙන් වැළැකුණේ වෙයි. නුදුන්දෑය ගැන්මෙන් වැළැකුණේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකුණේ වෙයි. මුසවාකීමෙන් වැළැකුණේ වෙයි, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකුණේ වෙයි, මුසවා කීමෙන් වැළැකුණේ වෙයි. රළු වදන් කීමෙන් වැළැකුණේ වෙයි. හිස් වදන් කීමෙන් වැළැකුණේ වෙයි. අන්සතු දෑය තමා සතු කරන රිසි නැත්තේ වෙයි. අනුන් නසන සිත් නැත්තේ වෙයි. සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේ. මේ පුද්ගල කල්‍යාණය යී කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් කල්‍යාණයාට වඩා අතිශයින් කල්‍යාණ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් තෙමේ ත් ප්‍රාණඝාතයෙන් වැළැකුණේ වෙයි. මෙරමාත් ප්‍රාණඝාතයෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේත් නුදුන් දෑය ගැන්මෙන් වැළැකුණේ වෙයි. මෙරමාත් නුදුන් දෑය ගැන්මෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේත් කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකුණේ වෙයි, මෙරමාත් කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේත් මුසවා කීමෙන් වැළැකුණේ වෙයි.

පරඤ්ච මුසාවාද වෙරමණියා සමාදපෙති, අත්තනා ච පිසුනාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච පිසුනාය වාචාය වෙරමණියා සමාදපෙති. අත්තනා ච ඵරුසාය වාචාය පටිවිරතො හොති, පරඤ්ච ඵරුසාය වාචාය වෙරමණියා සමාදපෙති. අත්තනා ච සම්ඵප්පලාපා පටිවිරතො හොති, පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති. අත්තනා ච අනභිජ්ඣාලු හොති, පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති. අත්තනා ච අව්‍යාපන්නචිත්තො හොති, පරඤ්ච අව්‍යාපාදෙ සමාදපෙති. අත්තනා ච සම්මාදිට්ඨි හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති පුග්ගලො කල්‍යාණෙන කල්‍යාණතරො.

3. කතමො ච පුග්ගලො පාපධම්මො: ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතී හොති — පෙ — මිච්ඡාදිට්ඨි හොති, අයං වුච්චති පුග්ගලො පාපධම්මො.

කතමො ච පුග්ගලො පාපධම්මෙන පාපධම්මතරො: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතී හොති, පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති. අත්තනා ච අදින්නාදායී හොති, පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති — පෙ — අත්තනා ච මිච්ඡාදිට්ඨි හොති, පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති පුග්ගලො පාපධම්මෙන පාපධම්මතරො.

කතමො ච පුග්ගලො කල්‍යාණධම්මො: ඉධෙ'කච්චො පුග්ගලො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති—පෙ— සම්මාදිට්ඨි හොති. අයං වුච්චති පුග්ගලො කල්‍යාණධම්මො.

කතමො ච පුග්ගලො කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරො: ඉධෙ' කච්චො පුග්ගලො අත්තනා ච පාණාතිපාතා පටිවිරතො හොති, පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති. —පෙ— අත්තනා ච සම්මාදිට්ඨි හොති, පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති පුග්ගලො කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරො.

4. කතමො ච පුග්ගලො සාවජ්ජො: ඉධෙ'කච්චො පුග්ගලො සාවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, සාවජ්ජෙන වචීකම්මෙන සමන්නාගතො හොති, සාවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති. අයං වුච්චති පුග්ගලො සාවජ්ජො.

මෙරමා ත් මුසවා කීමෙන් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් පිසුණු වදන් වැළැකුණේ වෙයි, මෙරමා ත් පිසුණු වදනින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් ඵරුවදනින් වැළැකුණේ වෙයි, මෙරමා ත් ඵරු වදනින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් සිස් තෙපුලින් වැළැකුණේ වෙයි, මෙරමා ත් සිස් තෙපුලින් වැළැකීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් අන්සතු දූය තමා සතු කරන රිසි නැත්තේ වෙයි, මෙරමා ත් අන්සතු දූය තමා සතු කරන රිසි නැති වීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් මෙරමා නසනසිත් නැත්තේ වෙයි, මෙරමාත් මෙරමා නසන සිත් නැති වීමෙහි සමාදන් කරවයි. තෙමේ ත් සම්‍යග් දෘෂ්ටි ඇත්තේ වෙයි, මෙරමා ත් සම්‍යග්දෘෂ්ටියෙහි සමාදන් කරවයි. මේ පුද්ගල කල්‍යාණයාට වඩා අතිශයින් කල්‍යාණ යයි කියනු ලැබේ.

3. කවර පුද්ගලයෙක පාපධර්ම ඇත්තේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ප්‍රාණීන් නසන්නේ වෙයි -පෙ- මිසදිටු වේ. මේ පුද්ගල පාපධර්ම ඇත්තේ යයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් පාපධර්ම ඇත්තාට වඩා අතිශයින් පාපධර්ම ඇත්තේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් තෙමේ ත් ප්‍රාණීන් නසන්නේ වෙයි, මෙරමා ත් ප්‍රාණීන් නැසීමෙහි සමාදන් කරවයි -පෙ- තෙමේ ත් මිසදිටු වෙයි. මෙරමා ත් මිසදිටුයෙහි සමාදන් කරවයි. මේ පුද්ගල පාපධර්ම ඇත්තාහට වඩා අතිශයින් පාපධර්ම ඇත්තේ යයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් කල්‍යාණ ධර්ම ඇත්තේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ප්‍රාණඝාතයෙන් වැළැකුණේ වෙයි, -පෙ- සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වේ. මේ පුද්ගල කල්‍යාණ ධර්ම ඇත්තේ යයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් කල්‍යාණ ධර්ම ඇත්තාහට වඩා අතිශයින් කල්‍යාණ-ධර්ම ඇත්තේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් තෙමේ ත් ප්‍රාණ-ඝාතයෙන් වැළැකුණේ වෙයි, මෙරමා ත් ප්‍රාණඝාතයෙන් වෙන් වීමෙහි සමාදන් කරවයි -පෙ- තෙමේ ත් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි. මෙරමාත් සම්‍යග් දෘෂ්ටියෙහි සමාදන් කරවයි. මේ පුද්ගල කල්‍යාණ ධර්ම ඇත්තාට වඩා අතිශයින් කල්‍යාණධර්ම ඇත්තේ යයි කියනු ලැබේ.

4. කවර පුදගලයෙක් සාවද්‍ය වේ ද යත්: මෙලොව කිසි පුද්ගල යෙක් සදොස් වූ කායකර්මයෙන් යුක්ත වූයේ වෙයි, සදොස් වූ වාක් කර්ම-යෙන් යුක්ත වූයේ වෙයි, සදොස් වූ මනඃකර්මයෙන් යුක්ත වූයේ වේ. මේ පුද්ගල සාවද්‍ය යයි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො සාවජ්ජබහුලො: ඉධෙකච්චො පුග්ගලො සාවජ්ජෙන බහුලං කායකම්මෙන සමන්නාගතො හොති අප්පං අනවජ්ජෙන, සාවජ්ජෙන බහුලං වචීකම්මෙන සමන්නාගතො හොති–අප්පං අනවජ්ජෙන, සාවජ්ජෙන බහුලං මනොකම්මෙන සමන්නාගතො හොති අප්පං අනවජ්ජෙන, අයං වුච්චති පුග්ගලො සාවජ්ජ බහුලො.

කතමො ච පුග්ගලො අප්පසාවජ්ජො: ඉධෙ'කච්චො පුග්ගලො අනවජ්ජෙන බහුලං කායකම්මෙන සමන්නාගතො හොති අප්පං සාවජ්ජෙන, අනවජ්ජෙන බහුලං වචීකම්මෙන සමන්නාගතො හොති අප්පං සාවජ්ජෙන, අනවජ්ජෙන බහුලං මනොකම්මෙන සමන්නාගතො හොති අප්පං සාවජ්ජෙන. අයං වුච්චති පුග්ගලො අප්පසාවජ්ජො.

කතමො ච පුග්ගලො අනවජ්ජො: ඉධෙ'කච්චො පුග්ගලො අනවජ්ජෙන කායකම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන වචී-කම්මෙන සමන්නාගතො හොති, අනවජ්ජෙන මනොකම්මෙන සමන්නාගතො හොති, අයං වුච්චති පුග්ගලො අනවජ්ජො.

5. කතමො ච පුග්ගලො උග්ඝටිතඤ්ඤූ: යස්ස පුග්ගලස්ස සහ-උදාහටවෙලාය ධම්මාභිසමයො හොති. අයං වුච්චති පුග්ගලො උග්ඝටිතඤ්ඤූ.

කතමො ච පුග්ගලො විපඤ්චිතඤ්ඤූ: යස්ස පුග්ගලස්ස සඞ්ඛිත්තෙන භාසිතස්ස විත්ථාරෙන අත්ථෙ විභජියමානෙ. ධම්මාභිසමයො හොති, අයං වුච්චති පුග්ගලො විපඤ්චිතඤ්ඤූ.

කතමො ච පුග්ගලො නෙය්‍යො: යස්ස පුග්ගලස්ස උද්දෙසතො පරිපුච්ඡතො යොනිසො මනසිකරොතො කල්‍යාණමිත්තෙ සෙවතො භජතො පයිරුපාසතො එවං අනුපුබ්බෙන ධම්මාභිසමයො හොති. අයං වුච්චති පුග්ගලො නෙය්‍යො.

කතමො ච පුග්ගලො පදපරමො: යස්ස පුග්ගලස්ස බහුම්පි සුණතො බහුම්පි භණතො බහුම්පි ධාරයතො බහුම්පි වාචයතො, න තාය ජාතියා ධම්මාභිසමයො හොති. අයං වුච්චති පුග්ගලො පදපරමො.

කවර පුද්ගලයෙක් සාවද්‍ය බහුල වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් සදෙස් වූ කායකර්මයෙන් බහුලව නිදෙස් වූ කායකර්මයෙන් අල්ප ව ද සමන්වාගත (යුක්ත) වෙයි, සදෙස් වූ වාක් කර්මයෙන් බහුල ව ද නිදෙස් වූ වාක් කර්මයෙන් අල්පව ද සමන්වාගත වෙයි, සදෙස් වූ මනඃකර්මයෙන් බහුලව ද නිදෙස් වූ මනඃකර්මයෙන් අල්පව ද සමන්වාගත වේ. මේ පුද්ගල සාවද්‍ය බහුල ය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් අල්පසාවද්‍ය වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් නිදෙස් වූ කායකර්මයෙන් බහුල ව ද සදෙස් වූ කාය කර්මයෙන් අල්ප ව ද යුක්ත වෙයි. නිදෙස් වූ වාක්කර්ම බහුල ව ද සදෙස්වූ වාක්කර්මයෙන් අල්පව ද යුක්ත වූයේ වෙයි. නිදෙස් වූ මනඃකර්මයෙන් බහුලව ද සදෙස් වූ මනඃ කර්මයෙන් අල්පව ද යුක්ත වූයේ වේ. මේ පුද්ගල අල්පසාවද්‍ය ය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් අනවද්‍ය වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිදෙස් වූ කාය කර්මයෙන් සමන්වාගත වෙයි, නිදෙස් වූ වාක්කර්මයෙන් සමන්වාගත වෙයි, නිදෙස් වූ මනඃ කර්මයෙන් සමන්වාගත වේ. මේ පුද්ගල අනවද්‍ය ය යි කියනු ලැබේ.

5. කවර පුද්ගලයෙක් උද්ඝටිතඥ වේ ද යත්: යම් පුද්ගලයකුට උදාහෘත වේලායෙහි ම (යම්තම් කරුණ නහා දක්වූ කල්හි ම යි සේයි) (චතුස්සත්‍ය) ධර්මාවබොධය වේ ද, මේ පුද්ගල උද්ඝටිතඥය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් විපඤ්චිතඥ (කරුණ විස්තර කළ කල්හි ම අරුත දන්නේ) වේ ද යත්: යම් පුද්ගලයකුට සැකෙවින් කියන ලද ධර්මයාගේ අර්ත්ථය විස්තරයෙන් විභාග කරනු ලබන කල්හි ම ධර්මාභිසමය වේ ද, මෙ බඳු පුද්ගල විපඤ්චිතඥ ය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් නෙය්‍ය වේ ද යත්: යම් පුද්ගලයකු ට උදෙසීමෙන් පිළිවිසීමෙන් කරුණු වශයෙන් මෙනෙහි කිරීමෙන් කළණ මිතුරන් සෙවනයෙන් භජනයෙන් ළංව ඇසුරු කිරීමෙන් මෙසේ අනුපිළිවෙළින් ධර්මාභිසමය වේ ද, මේ පුද්ගල තෙමේ නෙය්‍ය ය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් පදපරම වේ ද යත්: බොහෝ කොට අසන්නා වූ ද බොහෝ කොට කියන්නා වූ ද බොහෝ කොට දරන්නා වූ ද බොහෝ කොට කියවන්නා වූ ද යම් පුද්ගලයෙකුට ඒ ආත්මභාවයෙහි ධර්මාභිසමය නො වේ ද මේ පුද්ගල පදපරම ය යි කියනු ලැබේ.

6. කතමො ච පුග්ගලො මුත්තපටිභානො, නො යුත්තපටිභානො: ඉධෙ'කච්චො පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො යුත්තං වදති නො සීඝං. අයං වුච්චති පුග්ගලො යුත්තපටිභානො නො මුත්තපටිභානො.

කතමො ච පුග්ගලො මුත්තපටිභානො, නො යුත්තපටිභානො: ඉධෙ'කච්චො පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො සීඝං වදති නො යුත්තං. අයං වුච්චති පුග්ගලො මුත්තපටිභානො, නො යුත්තපටිභානො.

කතමො ච පුග්ගලො යුත්තපටිභානො ච මුත්තපටිභානො ච: ඉධෙ' කච්චො පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො යුත්තඤ්ච වදති. සීඝඤ්ච අයං වුච්චති පුග්ගලො යුත්තපටිභානො ච මුත්තපටිභානො ච.

කතමො ච පුග්ගලො නෙව යුත්තපටිභානො නො මුත්තපටිභානො: ඉධෙ'කච්චො පුග්ගලො පඤ්හං පුට්ඨො සමානො නෙව යුත්තං වදති, නො සීඝං. අයං වුච්චති පුග්ගලො තෙව යුත්තපටිභානො නො මුත්තපටිභානො.

7. තත්ථ කතමෙ චත්තාරො ධම්මකථිකා පුග්ගලා: චත්තාරො ධම්මකථිකා – ඉධෙ'කච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති, අසහිතඤ්ච පරිසා චස්ස න කුසලා හොති සහිතාසහිතස්ස, එවරූපො ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉධ පන එකච්චො ධම්මකථිකො අප්පඤ්ච භාසති සහිතඤ්ච, පරිසාය චස්ස කුසලා හොති සහිතාසහිතස්ස, එවරූපො ධම්මකථිකො එවරූපාය පරිසා ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉධ පන එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති අසහිතඤ්ච පරිසාචස්ස න කුසලා හොති සහිතාසහිතස්ස, එවරූපො ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉධ පන එකච්චො ධම්මකථිකො බහුඤ්ච භාසති සහිතඤ්ච, පරිසා චස්ස කුසලා හොති සහිතාසහිතස්ස, එවරූපො ධම්මකථිකො එවරූපාය පරිසාය ධම්මකථිකොත්වෙව සඞ්ඛං ගච්ඡති. ඉමෙ චත්තාරො ධම්මකථිකා පුග්ගලා.

6. කවර පුද්ගලයෙක් යුත්තපටිභාන වූයේ (සාර්තථක සකාරණ වචන ඇත්තේ) මුත්තපටිභාන (වහා පිළිතුරු දෙන්නේ) නො වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් ප්‍රශ්නය විචාරන ලදුයේ සාර්ත්ථක සකාරණ කොට කියයි. ශීඝ්‍ර ව නො කියයි. මේ පුද්ගල මුත්තපටිභාන නො වූ යුත්තපටිභාන යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් යුත්තපටිභාන නො වූ මුත්තපටිභාන වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් ප්‍රශ්නය විචාරන ලද්දේ වහා පිළිතුරු දෙයි, සාර්ත්ථක සකාරණ කොට පිළිතුරු නො දෙයි. මේ පුද්ගල යුක්තපටිභාන නො වූ මුක්තපටිභාන යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් යුත්තපටිභාන ත් මුත්තපටිභාන ත් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් ප්‍රශ්නය විචාරන ලද්දේ සාර්ත්ථක සකාරණ කොට ද පිළිතුරු දෙයි වහ වහා පිළිතුරු දෙයි. මේ පුද්ගල යුත්තපටිභානත් මුත්තපටිභාන ත් වූයේ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් යුත්තපටිභාන නො වූයේ ම මුත්තපටිභාන ත් නො වූයේ වේ ද යත්: මෙලොව එක් පුහුලෙක් පැන පුළුවුස්නා ලද්දේ සාර්ථක සකාරණ කොට නො ම කියයි, යුහු වැ ද නො කියයි. මේ පුද්ගල යුත්තපටිභාන නො වූයේ ම මුත්තපටිභාන නො වූයේ යි කියනු ලැබේ.

7. එහි ධර්මකථික පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: ධර්ම කථිකයෝ සතර දෙනෙකි – මෙලොව එක් ධර්මකථිකයෙක් මඳක් ද කියයි. නිරර්ථක නිෂ්කාරණ දෑයක් ද කියයි, ඔහු ගේ පිරිස ද සාර්ථක නිරර්ථක බව දැනුමට නො සමත් වෙයි. මෙ බඳු ධර්මකථික මෙ බඳු පිරිසෙහි ධර්මකථික යන සංඛ්‍යාවට යෙයි. තව ද මෙහි එක් ධර්ම කථිකයෙක් ස්වල්ප වූත් සාර්ථක සකාරණ වූත් දෑයක් කියයි, ඔහුගේ පිරිස ද සාර්ථක නිරර්ථක බව දැනුමට සමත් වෙයි, මෙ බඳු ධර්මකථික තෙමේ මෙ බඳු පිරිසෙහි ධර්මකථික යන සංඛ්‍යාවට යෙයි. තව ද මෙහි එක් ධර්මකථිකයෙක් බොහෝ වූත් නිරර්ථක නිෂ්කාරණ වූ ත් දෑයක් කියයි. ඔහුගේ පිරිස ද සාර්ථක සකාරණ නිරර්ථක නිෂ්කාරණ බව දැනුමට නො සමත් වෙයි, මෙ බඳු ධර්මකථික තෙමේ මෙ බඳු පිරිසෙහි ධර්ම-කථික යන සංඛ්‍යාවට යෙයි. තව ද මෙහි එක් ධර්ම කථිකයෙක් බොහෝ වූ ත් සාර්ථක සකාරණ වූ ත් දෑයක් කියයි, ඔහු ගේ පිරිස ද සාර්ථක සකාරණ නිරර්ථක නිෂ්කාරණ බව දැනුමට සමත් වෙයි. මෙබඳු ධර්මකථික තෙමේ මෙ බඳු පිරිසෙහි ධර්මකථික යන සංඛ්‍යාවට යෙයි. මොහු ධර්මකථික පුද්ගලයෝ සතර දෙනා යි.

8. තත්‍ථ කතමෙ චත්තාරො වලාහකූපමා පුග්ගලා: චත්තාරො වලාහකා; ගජ්ජිතා නො වස්සිතා වස්සිතා, නො ගජ්ජිතා, ගජ්ජිතා ච වස්සිතා ච, නෙව ගජ්ජිතා නො වස්සිතා. එවමෙව චත්තාරො වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ගජ්ජිතා නො වස්සිතා, වස්සිතා නො ගජ්ජිතා, ගජ්ජිතා ච වස්සිතා ච, නෙව ගජ්ජිතා නො වස්සිතා.

කථඤ්ච පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා: ඉධෙ'කච්චො පුග්ගලො භාසිතා හොති නො කත්තා. එවං පුග්ගලො ගජ්ජිතා හොති නො වස්සිතා. සෙය්‍යථාපි සො වලාහකො ගජ්ජිතා නො වස්සිතා. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා: ඉධෙ'කච්චො පුග්ගලො කත්තා හොති නො භාසිතා. එවං පුග්ගලො වස්සිතා හොති නො ගජ්ජිතා. සෙය්‍යථාපි සො වලාහකො වස්සිතා නො ගජ්ජිතා. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච: ඉධෙ කච්චො පුග්ගලො භාසිතා ච හොති කත්තා ච එවං පුග්ගලො ගජ්ජිතා ච හොති වස්සිතා ච. සෙය්‍යථාපි සො වලාහකො ගජ්ජිතා ච වස්සිතා ච. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා: ඉධෙ කච්චො පුග්ගලො නෙව භාසිතා හොති නො කත්තා, එවං පුග්ගලො නෙව ගජ්ජිතා හොති නො වස්සිතා, සෙය්‍යථාපි සො වලාහකො නෙව ගජ්ජිතා නො වස්සිතා, තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො වලාහකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

9. තත්‍ථ කතමෙ චත්තාරො මූසිකූපමා පුග්ගලා: චතස්සො මූසිකා: ගාධං කත්ත නො වසිතා, වසිතා නො ගාධං කත්තා. ගාධං කත්තා ච වසිතා ච, නෙව ගාධං කත්තා නො වසිතා. එවමෙව චත්තාරො මූසිකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ගාධං කත්තා නො වසිතා, වසිතා නො ගාධං කත්තා, ගාධං කත්තා ච, වසිතා ච, නෙව ගාධං කත්තා නො වසිතා.

8. එහි මේඝයට බඳු පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: මේඝයෝ සතර දෙනෙකි: ගුගුරන නො වස්නා මේඝ ය යෑ, වස්නා නො ගුගුරන මේඝය යෑ, ගුගුරන්නා වූ ත් වස්නා වූ ත් මේඝය යෑ, නො මැ ගුගුරන්නා වූ ත් නො වස්නා මේඝ යි. මෙසේ මා ලෝකයෙහි මේඝයට බඳු පුද්ගලයෝ සතර දෙන විද්‍යමානයහ. කවරක් සතර දෙනෙක් ද යත්: ගුගුරන නො වස්නා පුද්ගල යෑ. වස්නා නො ගුගුරන පුද්ගල යෑ, ගුගුරන්නා වූ ත් වස්නා වූ ත් පුද්ගල යෑ, නො ගුගුරන නො වස්නා පුද්ගල යි.

කෙසේ නම් පුද්ගල තෙමේ ගුගුරන්නේ නො වස්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් කියන්නේ වෙයි, කරන්නේ නො වෙයි. මෙසෙයින් පුද්ගල ගුගුරනුයේ වෙයි, වස්නේ නො වෙයි. යම් සේ ඒ මේඝය ගර්ජනා කරන්නේ නො වස්නේ වේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල වස්නේ නො ගුගුරන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් කරන්නේ නො කියන්නේ වෙයි, මෙසේ පුද්ගල වස්නේ නො ගුගුරන්නේ වෙයි. යම් සේ ඒ මේඝය වස්නේ නො ගුගුරන්නේ වේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල ගුගුරන්නේ ත් වස්නේ ත් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් කියන්නේ ත් කරන්නේ ත් වෙයි. මෙසේ පුද්ගල ගුගුරන්නේ ත් වස්නේ ත් වෙයි. යම් සේ ඒ මේඝය ගුගුරන්නේ ත් වස්නේ ත් වේ දැ මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල නො ගොරවන්නේ ම නො වස්නේ ත් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නො ම කියයි. නො ද කරයි. මෙසේ පුද්ගල තෙමේ නො මැ ගුගුරන්නේ ත් නො වස්නේ ත් වෙයි. යම් සේ ඒ මේඝය නො ගුගුරන්නේ ම නො වස්නේ මැ වේදත් මේ පුද්ගල එ බඳුයි. මේඝයට බඳු උපමා ඇතිමේ පුද්ගලයෝ සතර දෙන ලෝකයෙහි විද්‍යමානයහ.

9. එහි මූෂිකොපම (මීයනට බඳු) පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: මූෂිකාවෝ සතර දෙනෙකි: බිල සාදන්නී නො වසන්නී යෑ, (අනෙකකු කළ බිලයෙහි) වසන්නී බිල නො සාදන්නී යෑ, බිල සාදන්නී වසන්නි ත් යෑ, බිල නො සාදන්නී ම නො වසන්නී යෑ යි මෙසේ ම ලෝකයෙහි මූෂිකොපම පුද්ගලයෝ සතර දෙනෙ විද්‍යමානයහ. කවර සතර දෙනෙක් ද යත්: බිලය කරන්නේ නො වසන්නේ යෑ, වසන්නේ බිල නොකරන්නේ යෑ, බිල කරන්නේ ත් වසන්නේ ත් යෑ, බිලය නො කරන්නේ ම නො වසන්නේ යෑ යි.

කථඤ්ච පුග්ගලො ගාධං කත්තා හොති නො වසිතා: ඉධෙ'කච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං. වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො ගාධං කත්තා හොති නො වසිතා. සෙය්‍යථාපි සා මූසිකා ගාධං කත්තා නො වසිතා, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො වසිතා හොති නො ගාධං කත්තා: ඉධෙ'කච්චො පුග්ගලො න ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති. එවං පුග්ගලො වසිතා හොති නො ගාධං කත්තා සෙය්‍යථාපි සා මූසිකා වසිතා නො ගාධං කත්තා. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ගාධං කත්තා ච හොති වසිතා ච; ඉධෙ'කච්චො පුග්ගලො ධම්මං පරියාපුණාති: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදති යථාභූතං පජානාති, එවං පුග්ගලො ගාධං කත්තා ච හොති වසිතා ච. සෙය්‍යථාපි සා මූසිකා ගාධං කත්තා ච හොති වසිතා ච–තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො නෙව ගාධං කත්තා හොති නො වසිතා; ඉධෙ'කච්චො පුග්ගලො න ධම්මං පරියාපුණාති; සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං නප්පජානාති, එවං පුග්ගලො නෙව ගාධං කත්තා හොති නො වසිතා. සෙය්‍යථාපි සා මූසිකා. නෙව ගාධං කත්තා නො වසිතා, තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො මූසිකූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

කෙසේ නම් පුද්ගල බිල කරන්නේ නො වසන්නේ වේ ද යත්: මෙසස්නෙහි ඇතැම් පුද්ගලයෙක් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදන ඉතිවුත්තක ජාතක අබ්භූතධම්ම වෙදල්ල සංඛ්‍යාත ධර්මය උගනියි, හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනියි, මේ දුක් උපදනා හෙතුව යැ යි ඇති සැටියෙන් නො දනියි, මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් නො දනියි, මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් නො දනී. මෙසේ පුද්ගල බිල කරන්නේ නො වසන්නේ වෙයි. යම් සේ ඒ මූෂිකා බිලය සාදන්නී නො වසන්නී ද මේ පුද්ගල තෙමෙ එබඳු යි.

කෙසේ නම් පුද්ගල වසන්නේ බිල නො කරන්නේ වේ ද යත්: මෙසස්නෙහි එක් පුද්ගලයෙක් සූත්‍ර ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදන ය, ඉතිවුත්තක ය, ජාතක ය, අබ්භූතධම්ම ය, වෙදල්ල ය යන ධර්මය නො උගනියි, හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දනියි, මේ දුක් උපදනා හෙතුවැ යි ඇති සැටියෙන් දන ගනියි, මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් දන ගනියි, මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් දන ගනි. මෙසේ පුද්ගල වසන්නේ බිල නො කරන්නේ වෙයි. යම්සේ ඒ මූෂිකා වසන්නී බිල නො සාදන්නී ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල බිල කරන්නේ ත් වසන්නේ ත් වේ ද යත්: මෙසස්නෙහි එක් පුද්ගලයෙක් සූත්‍ර ය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදන ය, ඉතිවුත්තක ය, ජාතකය අබ්භූතධම්ම ය, වෙදල්ල ය යන ධර්මය උගනියි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දනියි, මෙ දුක් උපදනා හෙතු වැ යි ඇති සැටියෙන් දනියි, මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් දනියි, මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් දන ගනි. මෙසේ පුද්ගල තෙමේ බිලය කරන්නේ ත් වසන්නේත් වෙයි. යම් සේ ඒ මූෂිකා බිලය සාදන්නී ත් වසන්නී ත් වේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල බිල නො කරනනේ ම නො වසන්නේ වේ ද යත්: මෙසස්නෙහි එක් පුද්ගලයෙක් සූත්‍රය, ගෙය්‍ය ය, වෙය්‍යාකරණ ය, ගාථා ය, උදනය, ඉතිවුත්කක ය, ජාතක ය, අබ්භූත ධම්ම ය, වෙදල්ල ය යන ධර්මය නො උගනියි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනියි, මේ දුක් උපදනා හෙතු වැ යි ඇති සැටියෙන් නො දනියි. මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් නො දනියි. මේ දුක් නැති කිරීමේ පිළිවෙතැයි ඇති සැටියෙන් නො දනී. මෙසේ පුද්ගල බිල නො කරන්නේ ම නො වසන්නේ වේ. යම් සේ ඒ මූෂිකා බිලය නො කරන්නී ම නො වසන්නී වේ ද, මේ පුද්ගල එබඳු යි. මොහු සතර දෙන ලොකයෙහි විද්‍යමාන මූෂිකොපම පුද්ගලයෝ යි.

10. තත්‍ථ කතමෙ චත්තාරො අම්බූපමා පුග්ගලා: චත්තාරි අම්බානි, ආමං පක්කවණ්ණි, පක්කං ආමවණ්ණි, ආමං ආමවණ්ණි, පක්කං පක්කවණ්ණි. එවමෙව[1] චත්තාරො අම්බූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ආමො පක්කවණ්ණි, පක්කො ආමවණ්ණි, ආමො ආමවණ්ණි, පක්කො පක්කවණ්ණි.

කථඤ්ච පුග්ගලො ආමො හොති පක්කවණ්ණි: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො ආමො හොති පක්කවණ්ණි. සෙය්‍යථාපි තං අම්බං ආමං පක්කවණ්ණි, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො පක්කො හොති ආමවණ්ණි: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති. එවං පුග්ගලො පක්කො හොති ආමවණ්ණී. සෙය්‍යථාපි තං අම්බං පක්කං ආමවණ්ණි, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ආමො හොති ආමවණ්ණී: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො ආමො හොති ආමවණ්ණි. සෙය්‍යථාපි තං අම්බං ආමං ආමවණ්ණි, තථූපමො අයං පුග්ගලො.

1. එවමෙවං - මජසං

10. එහි අම්බූපම (අඹඵලයට බඳු) පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: අඹපල සතරෙකි: අමු වූ පැසුණු පැහැ ඇත්තේ යැ, පැසුණු අමු පැහැඇත්තේ යැ, අමු වූ අමුපැහැ ඇත්තේ යැ, පැසුණු, පැසුණුපැහැඇත්තේ යැ යි. මෙසේ ම ලෝකයෙහි අම්බූපම පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමාන වෙත්: කවර සතර දෙනෙක් ද යත්: අමු වූ පැසුණු පැහැ ඇත්තේ යැ, පැසුණා වූ අමුපැහැ ඇත්තේ යැ, අමු වූ අමු පැහැ ඇත්තේ යැ, පැසුණු, පැසුණ පැහැ ඇත්තේ යැ යි.

කෙසේ නම් පුද්ගල අමු වූයේ පැසුණු පැහැ ඇත්තේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම,ඊම,ඉදිරි බැල්ම,අවට බැල්ම,අත්පා හැකිළීම, අත් පා දිග හැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාදය එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැයි ඇති සැටියෙන් නො දැනගනියි,මේ දුක් උපදනා හෙතුවැ යි ඇති සැටියෙන් නො දැනගනියි, මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් නො දැන ගනියි, මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් නො දැන ගනී. මෙසේ පුද්ගල අමු වූයේ පැසුණුපැහැ ඇත්තේ වෙයි. යම් සේ ඒ අඹය අමු වූයේ පැසුණුපැහැ ඇත්තේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල පැසුණේ අමු පැහැ ඇත්තේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම,ඊම,ඉදිරි බැල්ම,අවට බැල්ම,අත්පා හැකිළීම, අත්පා දිග හැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාදය එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනියි,මේ දුක් උපදනා හෙතු වැ යි ඇති සැටියෙන් දන ගනියි,මේ දුක් නැති කිරීමැ යි ඇති සැටි-යෙන් දැන ගනියි, මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් දැන ගනී. මෙසේ පුද්ගල පැසුණේ අමු පැහැ ඇත්තේ වෙයි. යම් සේ ඒ අඹය පැසුණේ අමුපැහැ ඇත්තේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල අමු වූයේ අමු පැහැ ඇත්තේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම,ඊම ඉදිරි බැල්ම,අවට බැල්ම,අත්පා හැකිළීම, අත් පා දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාදය එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනියි . . . මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් නො දනී. මෙසේ පුද්ගල අමු වූයේ අමු පැහැ ඇත්තේ වෙයි. යම්සේ ඒ අඹය අමු වූයේ අමු පැහැ ඇත්තේ ද, මේ පුද්ගල තෙමේ එබඳු යි.

කථඤ්ච පුග්ගලො පක්කො හොති පක්කවණ්ණී: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං පුග්ගලො පක්කො හොති පක්කවණ්ණී. සෙය්‍යථාපි තං අම්බං පක්කං පක්කවණ්ණී. තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො අම්බූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

11. තත්ථ කතමෙ චත්තාරො කුම්භූපමා පුග්ගලා: චත්තාරො කුම්භා: තුච්ඡො පිහිතො, පූරො විවටො, තුච්ඡො විවටො, පූරො පිහිතො. එවමෙව චත්තාරො කුම්භූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: තුච්ඡො පිහිතො, පූරො විවටො, තුච්ඡො විවටො, පූරො පිහිතො.

කථඤ්ච පුග්ගලො තුච්ඡො හොති පිහිතො: ඉධෙ'කච්චස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො තුච්ඡො හොති පිහිතො. සෙය්‍යථාපි සො කුම්භො තුච්ඡො පිහිතො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො පූරො හොති විවටො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. එවං පුග්ගලො පූරො හොති විවටො. සෙය්‍යථාපි සො කුම්භො පූරො විවටො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො තුච්ඡො හොති විවටො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො තුච්ඡො හොති විවටො. සෙය්‍යථාපි සො කුම්භො තුච්ඡො විවටො, තථූපමො අයං පුග්ගලො.

කෙසේ නම් පුද්ගල පැසුණේ පැසුණු පැහැ ඇත්තේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යැම ඊම ඉදිරි බැල්ම අවට බැල්ම අත්පා හැකිළීම අත් පා දිග හැරීම සඟළ පා සිවුරු දැරීම ප්‍රසාදය එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනියි. මේ දුක් උපදනා හෙතු වැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් දැන ගනියි, මේ දුක් නැති කිරීමට යන මගැ යි ඇති සැටියෙන් දැනගනී. මෙසේ පුද්ගල පැසුණේ පැසුණු පැහැ ඇත්තේ වේ. යම්සේ ඒ අඹය පැසුණේ පැසුණු පැහැ ඇත්තේ ද, මේ පුද්ගල තෙමේ එබඳු යි. මොහු සතර දෙන ලොකයෙහි විද්‍යමාන අම්බූපම පුද්ගලයෝ යි.

11. එහි කුම්භූපම (කළයට බඳු) පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: කුම්භයෝ (කළ) සතර දෙනෙකි: හිස් වූ වසන ලද්ද ය, පිරුණු නො වසන ලද්ද ය, හිස් වූ නො වසන ලද්ද ය, පිරුණු වසන ලද්ද යි. මෙසේ ම ලොකයෙහි විද්‍යමාන කුම්භූපම පුද්ගලයෝ සතර දෙනෙකි. කවරහු සතර දෙනෙක් ද යත්: හිස් වූ වසන ලද්දේ යැ, පිරුණා වූ නො වසන ලද්දේ යැ, හිස් වූ නො වසන ලද්දේ යැ, පිරුණා වූ වසන ලද්දේ යැ යි.

කෙසේ නම් පුද්ගල හිස්වූයේ වසන ලද්දේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යැම, ඊම, ඉදිරි බැල්ම, අවට බැල්ම, අත් පා හැකිළීම, අත් පා දිග හැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනියි. . . . මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් නො දනී.මෙසේ පුද්ගල තෙමේ හිස් වූයේ වසන ලද්දේ වෙයි. ඒ හිස් වූ වසන ලද කුම්භය යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල පිරුණේ නො වසන ලද්දේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යැම ඊම ඉදිරි බැල්ම අවට බැල්ම අත්පා හැකිළීම, අත්පා දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැන ගනියි. . . . මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් දැන ගනියි. මෙසේ පුද්ගල පිරුණේ නො වසන ලද්දේ වේ. ඒ කුම්භය පිරුණේ නො වසන ලද්දේ යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල හිස් වූයේ නො වසන ලද්දේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යැම,ඊම,ඉදිරි බැල්ම,අවට බැල්ම,අත් පා හැකිළීම, අත්පා දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැයි ඇති සැටියෙන් නො දැනගනියි. . . . මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් නො දැන ගනී. මෙසේ පුද්ගල තෙමේ හිස් වූයේ නො වසන ලද්දේ වෙයි, ඒ කුම්භය හිස් වූයේ නො වසන ලද්දේ යම් සේ ද, මේ පුද්ගල එබඳු යි.

කථඤ්ච පුග්ගලො පූරො හොති පිහිතො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං[1]. පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං පුග්ගලො පූරො හොති පිහිතො. සෙය්‍යථාපි සො කුම්භො පූරො පිහිතො තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො කුම්භූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

12. තත්‍ථ කතමෙ චත්තාරො උදකරහදූපමා පුග්ගලා; චත්තාරො උදකරහදා: උත්තානො ගම්භීරොභාසො, ගම්භීරො උත්තානොභාසො උත්තානො උත්තානොභාසො, ගම්භීරො ගම්භීරොභාසො. එවමෙව චත්තාරො උදකරහදූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: උත්තානො ගම්භීරොභාසො, ගම්භීරො උත්තානො භාසො, උත්තානො උත්තානොභාසො, ගම්භීරො ගම්භීරොභාසො.

කථඤ්ච පුග්ගලො උත්තානො හොති ගම්භීරොභාසො: ඉධෙකච්චස්ස පුග්ගලස්ස පාසදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති - පෙ - අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො උත්තානො හොති ගම්භීරො භාසො. සෙය්‍යථාපි සො උදකරහදො උත්තානො ගම්භීරොභාසො තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ගම්භීරො හොති උත්තානොභාසො: ඉධෙකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති - පෙ - අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං පුග්ගලො ගම්භීරො හොති උත්තානො භාසො සෙය්‍යථාපි සො උදකරහදො ගම්භීරො උත්තානොභාසො තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො උත්තානො හොති උත්තානොභාසො: ඉධෙකච්චස්ස පුග්ගලස්ස න පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානාති --පෙ-- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං නප්පජානාති. එවං පුග්ගලො උත්තානො හොති උත්තානොභාසො. සෙය්‍යථාපි සො උදකරහදො උත්තානො උත්තානොභාසො තථූපමො අයං පුග්ගලො.

1. සම්මිඤ්ජිතං - මජ්සං.

කෙසේ නම් පුද්ගල පිරුණේ වසන ලද්දේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම, ඊම, ඉදිරි බැල්ම, අවට බැල්ම, අත්පා හැකිළීම, අත්පා දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැන ගනියි –පෙ– මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් දැනගනී. මෙසේ පුද්ගල තෙමේ පිරුණේ වසන ලද්දේ වේ. ඒ කුම්භය පිරුණේ වසන ලද්දේ යම්සේ ද මේ පුද්ගල එබඳු යි. මොහු සතර දෙන ලොකයෙහි කුම්භූපම පුද්ගලයෝ යි.

12. එහි ජලාශයට බඳු පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: ජලාශයයෝ සතර දෙනෙකි: ගැඹුරු ආකාර ඇති නො ගැඹුරු ජලාශය යැ, නො ගැඹුරු ආකාර ඇති ගැඹුරු ජලාශය යැ, නො ගැඹුරු ආකාර ඇති නො ගැඹුරු ජලාශය යැ, ගැඹුරු ආකාර ඇති ගැඹුරු ජලාශය යැ යි. මෙසේ මැ ලොකයෙහි ජලාශයට බඳු පුද්ගලයෝ සතර දෙනෙක් විද්‍යමානයහ. කවර සතර දෙනෙක් ද යත්: ගැඹුරු ආකාර ඇති නො ගැඹුරු වූයේ යැ, නො ගැඹුරු ආකාර ඇති ගැඹුරු වූයේ යැ, නො ගැඹුරු ආකාර ඇති නො ගැඹුරු වූයේ යැ, ගැඹුරු ආකාර ඇති ගැඹුරු වූයේ යි.

කෙසේ නම් පුද්ගල ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම, ඊම, ඉදිරි බැල්ම, අවට බැල්ම, අත්පා හැකිළීම, දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනී –පෙ– මේ දුක් නැති කිරීමේ පිළිවෙතැ යි ඇති සැටියෙන් නො දනී. මෙසේ පුද්ගල ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ වේ. ඒ ජලාශය ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ යම්සේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල නො ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම–ඊම, ඉදිරි බැල්ම අවට බැල්ම අත් පා හැකිළීම–දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනියි –පෙ– මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් දැනගනී. මෙසේ පුද්ගල නො ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ වේ. ඒ ජලාශය නො ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ යම්සේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල නො ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ වේ ද යත්: මෙලොව් එක් පුද්ගලයක්හු ගේ යෑම–ඊම, ඉදිරි බැල්ම අවට බැල්ම අත්පා හැකිළීම– දිගහැරීම සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ නො වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් නො දනියි –පෙ– මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් නො දනියි මෙසේ පුද්ගල නො ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ වේ. ඒ ජලාශය නො ගැඹුරු ආකාර ඇත්තේ නො ගැඹුරු වූයේ යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කථඤ්ච පුග්ගලො ගම්භීරො හොති ගම්භීරොභාසො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස පාසාදිකං හොති අභික්කන්තං පටික්කන්තං ආලොකිතං විලොකිතං සම්මිඤ්ජිතං පසාරිතං සඞ්ඝාටිපත්තචීවරධාරණං. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති. එවං පුග්ගලො ගම්භීරො හොති ගම්භීරොභාසො. සෙය්‍යථාපි සො උදකරහදො ගම්භීරො ගම්භීරොභාසො, තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො උදකරහදූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

13. තත්‍ථ කතමෙ චත්තාරො බලිවද්දූපමා පුග්ගලා: චත්තාරො බලිවද්දා - සගවචණ්ඩො[1] නො පරගවචණ්ඩො, පරගවචණ්ඩො නො සගවචණ්ඩො, සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච, නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො. එවමෙව චත්තාරො බලිවද්දූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ චත්තාරො: සගවචණ්ඩො නො පරගවචණ්ඩො, පරගවචණ්ඩො නො සගවචණ්ඩො, සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො.

කථඤ්ච පුග්ගලො සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො: ඉධෙ'කච්චො පුග්ගලො සකපරිසං උබ්බෙජිතා හොති නො පරපරිසං එවං පුග්ගලො සගවචණ්ඩො හොති, නො පරගවචණ්ඩො. සෙය්‍යථාපි සො බලිවද්දො සගවචණ්ඩො නො පරගවචණ්ඩො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො පරගවචණ්ඩො හොති නො සගවචණ්ඩො: ඉධෙ'කච්චො පුග්ගලො පරපරිසං උබ්බෙජිතා හොති නො සකපරිසං එවං පුග්ගලො පරගවචණ්ඩො හොති නො සගවචණ්ඩො. සෙය්‍යථාපි සො බලිවද්දො පරගවචණ්ඩො නො සගවචණ්ඩො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො සගවචණ්ඩො ච හොති පරගවචණ්ඩො ච: ඉධෙ'කච්චො පුග්ගලො සකපරිසඤ්ච උබ්බෙජිතා හොති පරපරිසඤ්ච, එවං පුග්ගලො සගවචණ්ඩො ච හොති පරගවචණ්ඩො ච. සෙය්‍යථාපි සො බලිවද්දො සගවචණ්ඩො ච පරගවචණ්ඩො ච, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො නෙව සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො: ඉධෙ'කච්චො පුග්ගලො නෙව සකපරිසං උබ්බෙජිතා හොති නො පරපරිසං, එවං පුග්ගලො නෙව සගවචණ්ඩො හොති නො පරගවචණ්ඩො, සෙය්‍යථාපි සො බලිවද්දො නෙව සගවචණ්ඩො නො පරගවචණ්ඩො. තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො බලිවද්දූපමා පුග්ගලා. සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

1. සකගවචණ්ඩො - මජ්සං

කෙසේ නම් පුද්ගල ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයක්හු ගේ යෑම-ඊම, ඉදිරි බැල්ම-අවට බැල්ම, අත් පා හැකිළීම-දිගහැරීම, සඟළ පා සිවුරු දැරීම ප්‍රසාද එළවන්නේ වෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනියි -පෙ- මේ දුක් නැති කිරීමට යන මඟැ යි ඇති සැටියෙන් දැනගනී. මෙසේ පුද්ගල ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ වේ. ඒ ජලාශය ගැඹුරු ආකාර ඇත්තේ ගැඹුරු වූයේ යම්සේ ද, මේ පුද්ගල එ බඳු යි.

13. එහි ගවයාට බඳු පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: ගවයෝ සතර දෙනෙකි: සිය ගවයනට සැඩ වූ පරගවයනට සැඩ නො වූයේ යැ, පරගවයනට සැඩ වූ සිය ගවයනට සැඩ නොවූයේ යැ, සිය ගවයනටත් පරගවයනටත් සැඩ වූයේ යැ, සිය ගවයනට සැඩ නො වූයේ ම පරගවයනටත් සැඩ නො වූයේ යැ යි. මෙසේ ම ලෝකයෙහි ගවයාට බඳු පුද්ගලයෝ සතර දෙනෙක් ඇත. කවරහු සතර දෙනෙක් ද යත්: ස්වගවයනට සැඩ වූ පරගවයනට සැඩ නො වූයේ යැ, පරගවයනට සැඩැ වූ ස්වගවයනට සැඩ නො වූයේ යැ ස්වගවයනටත් පරගවයනටත් සැඩ වූයේ යැ ස්වගවයනට සැඩ නො වූයේ මැ පරගවයනටත් සැඩ නො වූයේ යි.

කෙසේ නම් පුද්ගල ස්වගවයනට සැඩ වූයේ පරගවයනට සැඩ නො වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් සිය පිරිස් තැති ගන්වන්නේ වෙයි, පර පිරිස් තැති නො ගන්වයි. මෙසේ පුද්ගල සගවචණ්ඩ වූයේ පරගවචණ්ඩ නො වූයේ වේ. ඒ ගව තෙමේ ස්වගවයනට සැඩ වූයේ පරගවයනට සැඩ නො වූයේ යම්සේ ද මේ පුද්ගල එ බඳු යි.

කෙසේ නම් පුද්ගල පරගවචණ්ඩ වූයේ සගවචණ්ඩ නො වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් පරපිරිස් තැති ගනවන්නේ වෙයි, සිය පිරිස් තැති නො ගන්වයි, මෙසේ පුද්ගල පරගවචණ්ඩ වූයේ සගවචණ්ඩ නො වූයේ වේ. ඒ ගව තෙමේ පරගවයනට සැඩ වූයේ ස්වගවයනට සැඩ නො වූයේ යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල සගවචණ්ඩ වූයේත් පරගවචණ්ඩ වූයේත් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් සිය පිරිසත් පරපිරිසත් තැති ගන්වන්නේ වෙයි, මෙසේ පුද්ගල සගවචණ්ඩ වූයේත් පරගවචණ්ඩ වූයේත් වේ. ඒ ගවතෙමේ සවගවයනටත් පර ගවයනටත් සැඩවූයේ යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල සගවචණ්ඩ නො වූයේ ම පරගවචණ්ඩ නො වූයේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් සිය පිරිස තැති නො ගන්වන්නේ ම පරපිරිස ද නො තැති ගන්ව යි. මෙසේ පුද්ගල සගවචණ්ඩ නො වූයේ ම පරගවචණ්ඩ නො වූයේ වේ. ඒ ගවතෙමේ ස්වගවයනට සැඩ නො වූයේ ම පරගවයනට සැඩ නො වූයේ යම්සේ ද, මේ පුද්ගල එ බඳු යි. මොහු සතර දෙන ලෝකයෙහි විද්‍යමාන ගවයනට බඳු පුද්ගලයෝ යි.

14. තත්‍ථ කතමෙ චත්තාරො ආසිවිසූපමා පුග්ගලා. චත්තාරො ආසිවිසා ආගතවිසො නො ඝොරවිසො, ඝොරවිසො, නො ආගතවිසො, ආගතවිසො ච ඝොරවිසො ච, නෙව ආගතවිසො නො ඝොරවිසො. එවමෙව චත්තාරො ආසිවිසූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො; ආගතවිසො නො ඝොරවිසො, ඝොරවිසො නො ආගතවිසො, ආගතවිසො ච ඝොරවිසො ච, නෙව ආගතවිසො නො ඝොරවිසො.

කථඤ්ච පුග්ගලො ආගතවිසො හොති නො ඝොරවිසො: ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො න චිරං දීඝරත්තං අනුසෙති. එවං පුග්ගලො ආගතවිසො හොති නො ඝොරවිසො, සෙය්‍යථාපි සො ආසිවිසො ආගතවිසො නො ඝොරවිසො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ඝොරවිසො හොති නො ආගතවිසො: ඉධෙ කච්චො පුග්ගලො නෙව ඛො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො චිරං දීඝරත්තං අනුසෙති. එවං පුග්ගලො ඝොරවිසො හොති නො ආගතවිසො, සෙය්‍යථාපි සො ආසිවිසො[1] ඝොරවිසො නො ආගතවිසො. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ආගතවිසො ච හොති ඝොරවිසො ච: ඉධෙ'කච්චො පුග්ගලො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො චිරං දීඝරත්තං අනුසෙති. එව පුග්ගලො ආගතවිසො ච හොති ඝොරවිසො ච. සෙය්‍යථාපි සො ආසිවිසො ආගතවිසො ච ඝොරවිසො ච, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො නෙව ආගතවිසො හොති නො ඝොරවිසො: ඉධෙ කච්චො පුග්ගලො නහෙව ඛො අභිණ්හං කුජ්ඣති, සො ච ඛ්වස්ස කොධො න චිරං දීඝරත්තං අනුසෙති. එවං පුග්ගලො නෙව ආගතවිසො හොති නො ඝොරවිසො. සෙය්‍යථාපි සො ආසිවිසො නෙව ආගතවිසො නො ඝොරවිසො, තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො ආසිවිසූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

1. ආසිවිසො – මජසං

14. එහි සර්පයනට බඳු පුද්ගලයෝ සතර දෙන කවරහ යත්: සර්පයෝ සතර දෙනෙකි- ඝොරවිෂ නැති පැතිරෙන විෂ ඇත්තේ යැ, පැතිරෙන විෂ නැති ඝොරවිෂ ඇත්තේ යැ, ඝොරවිෂත් පැතිරෙන විෂත් ඇත්තේ ය, පැතිරෙන විෂ නැත්තේ ම ඝොරවිෂ නැත්තේ යැ යි. මෙසේ ම සර්පයනට බඳු පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි විද්‍යමානයහ. කවර සතර දෙනෙක් ද යත්: ඝොරවිෂ නැති පැතිරෙන විෂ ඇත්තේ යැ, පැතිරෙන විෂ නැති ඝොර විෂ ඇත්තේ යැ, ඝොර විෂත් පැතිරෙන විෂත් ඇත්තේ යැ, පැතිරෙන විෂ නැත්තේ ම ඝොර විෂ නැත්තේ යි.

කෙසේ නම් පුද්ගල ඝොරවිෂ නැති පැතිරෙන විෂ ඇත්තෙක් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිතොර කිපෙයි, ඔහුගේ ඒ ක්‍රොධය ද බොහෝ කලක් දිගු කලක් රැඳී නො පවතී. මෙසේ පුද්ගල තෙමේ ඝොරවිෂ නැති පැතිරෙන විෂ ඇත්තේ වේ. පැතිරෙන විෂ ඇති ඝොර විෂ නැති ඒ සර්ප යම්සේ ද, මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල පැතිරෙන විෂ නැත්තේ ඝොරවිෂ ඇත්තෙක් වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිතොර නො ම කිපෙයි, එතෙකුදු වත් ඔහුගේ ඒ ක්‍රොධය බොහෝ කලක් දිගු කලක් රැඳී පවතී. මෙසේ පුද්ගල පැතිරෙන විෂ නැත්තේ ඝොරවිෂ ඇත්තේ වේ. පැතිරෙන විෂ නැති ඝොරවිෂ ඇති ඒ සර්ප යම් සේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල පැතිරෙන විෂත් ඝොරවිෂත් ඇත්තේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිතොර කිපෙයි, ඔහු ගේ ඒ ක්‍රොධය ද බොහෝ කලක් දිගු කලක් රැඳී පවතී. මෙසේ පුද්ගල පැතිරෙන විෂත් ඝොරවිෂත් ඇත්තේ වේ. පැතිරෙන විෂත් ඝොරවිෂත් ඇති ඒ සර්ප තෙම යම් සේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල පැතිරෙන විෂ නැත්තේ ම ඝොරවිෂ නැත්තේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් නිතොර නො කිපේ මැ යි, ඔහුගේ ඒ ක්‍රොධය ද බොහෝ කලක් දිගු කලක් රැඳී නො පවතී. මෙසේ පුද්ගල පැතිරෙන විෂ නැත්තේ ම ඝොරවිෂ නැත්තේ වේ. පැති-රෙන විෂ නොමැති ඝොරවිෂ නැති ඒ සර්ප යම්සේ ද, මේ පුද්ගල එබඳු යි. මොහු සතර දෙන ලොකයෙහි විද්‍යමාන සර්පයනට බඳු පුද්ගලයෝ යි.

15. කථඤ්ච පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො දුප්පටිපන්නානං මිච්ඡාපටිපන්නානං තිත්ථියානං තිත්ථියසාවකානං වණ්ණං භාසති සුපටිපන්නා[1]. ඉතිපි, සම්මාපටිපන්නා ඉතිපී ති. එවං පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති.

කථඤ්ච පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො සුපටිපන්නානං සම්මාපටිපන්නානං බුද්ධානං බුද්ධසාවකානං අවණ්ණං භාසති, දුප්පටිපන්නා ඉතිපි, මිච්ඡාපටිපන්නා ඉතිපී ති. එවං පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා වණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති.

කථඤ්ච පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසිතා හොති: ඉධෙ කච්චො පුග්ගලො දුප්පටිපදය මිච්ඡාපටිපදය පසාදං ජනෙති සුපටිපද[2]. ඉතිපි, සම්මාපටිපද ඉතිපී ති එවං පුග්ගලො අනනුවිච්ච අපරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසිතා හොති.

කථඤ්ච පුග්ගලො අනනුවිච්ච අපරියොගා හෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො සුපටිපදය සම්මාපටිපදය අප්පසාදං ජනෙති දුප්පටිපද ඉතිපි, මිච්ඡාපටිපද ඉතිපී ති. එවං පුග්ගලො අනනුවිච්ච අපරියො ගාහෙත්වා පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති.

16. කථඤ්ච පුග්ගලො අනනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො දුප්පටිපන්නානං මිච්ඡාපටිපන්නානං තිත්ථියානං තිත්ථියසාවකානං අවණ්ණං භාසති දුප්පටිපන්නා ඉතිපි, මිච්ඡාපටිපන්නා ඉතිපී'ති. එවං පුග්ගලො අනනුවිච්ච පරියොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති.

කථඤ්ච පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො සුපටිපන්නානං සම්මාපටිපන්නානං බුද්ධානං බුද්ධසාවකානං වණ්ණං භාසති සුපටිපන්නා ඉතිපි, සම්මාපටිපන්නා ඉතිපී'ති, එවං පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති,

1. සුප්පටිපන්නා – සීමු.
   සුපටිපන්නා – මජසං.
2. සුප්පටිපද – සීමු, මජසං

15. කෙසේ නම් පුද්ගල තුලනය නො කොට (ගුණාගුණ මැන නො බලා යි සේ යි) (ගුණයෙහි) නො බැස ගෙන නුගුණ කියයුත්තහු ගේ ගුණ කියන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් 'සුපිළිපන්හ යි ද මොනවට පිළිපන්හ' යි ද යි දුපිළිපන් වැරැදි ලෙස පිළිපන් තීර්ත්ථකයන් ගේ තීර්ත්ථක ශ්‍රාවකයන් ගේ ගුණ කියයි. මෙසේ පුද්ගල තෙමේ තුලනය නො කොට ගුණයෙහි නො බැස ගෙන නුගුණ කිය යුත්තහුගේ ගුණ කියන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තෙම තුලනය නො කොට ගුණයෙහි නො බැස ගෙන ගුණ කියයුත්තහු ගේ නුගුණ කියන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් ''දුපිළිපන්හ' යි ද 'වැරැදි ලෙස පිළිපන්හ' යි ද'' සුපිළිපන් මනා කොට පිළිපන් බුදුන් වහන්සේ ගේ බුදු සව්වන් ගේ නුගුණ කියයි. මෙසේ පුද්ගල තුලනය නො කොට ගුණයෙහි නො බැසගෙන ගුණ කියයුත්තහු ගේ නුගුණ කියන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තුලනය නො කොට ගුණයෙහි නො බැසගෙන නො පැහැදිය යුතු තැන ප්‍රසාදය උපදවන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් දුෂ්ප්‍රතිපදයෙහි මිථ්‍යාප්‍රතිපදයෙහි සුප්‍රතිපද ය යි ද මිථ්‍යා ප්‍රතිපද ය යි ද යි ප්‍රසාදය උපදවයි. මෙසේ පුද්ගල තුලනය නො කොට ගුණයෙහි නො බැසගෙන නො පැහැදිය යුතු තැන ප්‍රසාදය දක්වන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තෙම තුලනය නො කොට ගුණයෙහි නො බැස ගෙන පැහැදිය යුතු තැන අප්‍රසාදය දක්වන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් සුප්‍රතිපදයෙහි සම්‍යක් ප්‍රතිපදයෙහි 'දුෂ්ප්‍රතිපද' ය යි ද 'මිථ්‍යා' 'ප්‍රතිපද' ය යි ද යි අප්‍රසාදය උපදවයි. මෙසේ පුද්ගල තෙමේ තුලනය නො කොට ගුණයෙහි නො බැසගෙන පැහැදිය යුතු තැන අප්‍රසාදය දක් වන්නේ වේ.

16. කෙසේ නම් පුද්ගල තුලනය කොට ගුණයෙහි බැසගෙන නුගුණ කිය යුත්තහු ගේ නුගුණ කියන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් 'දුෂ්ප්‍රතිපන්නයැ' යි ද 'මිථ්‍යාප්‍රතිපන්නයැ' යි ද යි දුෂ්ප්‍රතිපන්න මිථ්‍යාප්‍රතිපන්න තීර්ත්ථකයන් ගේ ද තීර්ත්ථක ශ්‍රාවකයන් ගේ ද නුගුණ කියයි. මෙසේ පුද්ගල තුලනය කොට ගුණයෙහි බැසගෙන නුගුණ කිය යුත්තහු ගේ නුගුණ කියන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තෙම තුලනය කොට ගුණයෙහි බැසගෙන ගුණ කිය යුත්තහු ගේ ගුණ කියන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් 'සුප්‍රතිපන්නයැ ' යි ද සම්‍යක් ප්‍රතිපන්නයැ' යි ද යි සුපිළිපන් මොනවට පිළිපන් බුදුන්වහන්සේ ගේ ද බුදුසව්වන් ගේ ද ගුණ කිය යි. මෙසේ පුද්ගල ගුණ කිය යුත්තහු ගේ ගුණ කියන්නේ වේ.

කථඤ්ච පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති: ඉධෙ'කච්චො පුග්ගලො දුප්පටිපදාය මිච්ඡාපටිපදාය අප්පසාදං ජනෙති, දුප්පටිපදා ඉතිපි මිච්ඡාපටිපදා ඉති-පී'ති' එවං පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසිතා හොති.

කථඤ්ච පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසිතා හොති: ඉධෙ කච්චො පුග්ගලො සුපටිපදාය සම්මා-පටිපදාය පසාදං ජනෙති, සුපටිපදා ඉතිපි, සම්මාපටිපදා ඉතිපී'ති එවං පුග්ගලො අනුවිච්ච පරියොගාහෙත්වා පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසිතා හොති.

17. කථඤ්ච පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, ඉධෙ'කච්ච පුග්ගලෙ වණ්ණො'පි සංවිජ්ජති. අවණ්ණො'පි සංවිජ්ජති, යො තත්‍ථ අවණ්ණො තං භණති භූතං තච්ඡං කාලෙන, යො තත්‍ථ වණ්ණො තං න භණති භූතං තච්ඡං කාලෙන. එවං පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

කථඤ්ච පුග්ගලො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන නො ච ඛො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන ඉධෙ'කච්ච පුග්ගලෙ වණ්ණො'පි සංවිජ්ජති, අවණ්ණො'පි සංවිජ්ජති, යො තත්‍ථ වණ්ණො තං භණති භූතං තච්ඡං කාලෙන, යො තත්‍ථ අවණ්ණො තං න භණති භූතං තච්ඡං කාලෙන එවං පුග්ගලො වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නො ච ඛො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

කථඤ්ච පුග්ගලො අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන වණ්ණාරහස්ස ච වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන: ඉධෙ'කච්ච පුග්ගලෙ අවණ්ණො'පි සංවිජ්ජති, වණ්ණොපි සංවිජ්ජති. යො තත්‍ථ අවණ්ණො තං භණති භූතං තච්ඡං කාලෙන යො පි තත්‍ථ වණ්ණො තම්පි භණති භූතං තච්ඡං කාලෙන. තත්‍ර කාලඤ්ඤූ හොති තස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. එවං පුග්ගලො අවණ්ණාරහස්ස ච අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන. වණ්ණාරහස්ස ච වණ්ණං භාසිත හොති භූතං තච්ඡං කාලෙන.

කෙසෙයින් පුද්ගල නුවණින් විමසා ගුණයෙහි බැසගෙන නො පැහැදිය යුතු තැන්හි අප්‍රසාදය දනවන්නේ වේ ද: මෙලොව පුද්ගලයෙක් 'නින්දිත ප්‍රතිපත්' ය යි ද 'වැරැදි පිළිවෙතැ' යි ද දැන නින්දිත ප්‍රතිපදයෙහි වැරැදි පිළිවෙතෙහි අප්‍රසාදය උපදවයි. මෙසේ පුද්ගල නුවණින් විමසා ගුණයෙහි බැසගෙන නො පැහැදිය යුතු තැන්හි අප්‍රසාදය දනවයි.

කෙසේ නම් පුද්ගල නුවණින් විමසා ගුණයෙහි බැසගෙන පැහැදිය යුතු තැන්හි ප්‍රසාදය දනවන්නේ වේ ද: මෙලොව කිසි පුද්ගලයෙක් 'මනා පිළිවෙතැ' යි ද 'නිවැරැදි පිළිවෙතැ' යි ද දැන මනා පිළිවෙතෙහි නිවැරදි පිළිවෙතෙහි ප්‍රසාදය උපදවයි. මෙසේ පුද්ගල නුවණින් විමසා ගුණයෙහි බැසගෙන පැහැදිය යුතු තැන්හි ප්‍රසාදය දනවයි.

17. කෙසේ නම් පුද්ගල නුගුණ කිය යුත්තහු ගේ ඇත්තා වූ තථ්‍ය වූ (එසේ ම වූ) නුගුණය සුදුසු කල්හි කියන්නේ වේ ද, එතෙකුදු වත් ගුණ කිය යුත්තාහු ගේ ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි නො කියන්නේ වේ ද: මෙලොව පුද්ගලයකු කෙරෙහි ගුණයෙක් ද පැනෙයි, නුගුණයෙක් ද පැනෙයි. එහි නුගුණය යමෙක් ද ඇත්තා වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි කියයි. එහි යම් ගුණයෙක් වේ නම් විද්‍යමාන වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි නො කියයි. මෙසේ පුද්ගල නුගුණ කියයුත්තහුගේ විද්‍යමාන වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි කියන්නේ වෙයි. එතෙකුදුවත් ගුණකියයුත්තහුගේ ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි නො කියන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තෙම ගුණ කිය යුත්තහුගේ ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියන්නේ වේ ද, එතෙකුදු වත් නුගුණ කිය යුත්තහුගේ ඇත්තා වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි නො කියන්නේ වේ ද: මෙලොව පුද්ගලයකු කෙරෙහි ගුණයෙක් ද පැනෙයි, නුගුණයෙක් ද පැනෙයි. එහි යම් ගුණයෙක් වේ නම් ඇත්තා වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි කියයි. එහි නුගුණය යමෙක් ද ඇත්තා වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි නො කියයි. මෙසේ පුද්ගල ගුණ කිය යුත්තහු ගේ ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියන්නේ වෙයි, එතෙකුදු වත් නුගුණ කිය යුත්තහුගේ ඇත්තා වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි නො කියන්නේ වේ.

කෙසේ නම් පුද්ගල නුගුණ කිය යුත්තහුගේ ද ඇත්තා වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි කියන්නේ වේ ද ගුණ කිය යුත්තහු ගේ ද ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියන්නේ වේ ද: මෙලොව පුද්ගලයෙකු කෙරෙහි නුගුණයෙක් ද පැනෙයි. ගුණයෙක් ද පැනෙයි. එහි යම් නුගුණයෙක් වේ නම් ඇත්තා වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි කියයි. තව ද එහි ගුණය යමෙක් ද ඇත්තා වූ තථ්‍ය වූ එය ද සුදුසු කල්හි කියයි. එහි ඒ ප්‍රශ්නය විසඳීමට සුදුසු කල් දන්නේ වෙයි. මෙසේ පුද්ගල නුගුණ කිය යුත්තාහු ගේ ද ඇත්තා වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි කියන්නේ වෙයි. ගුණ කිය යුත්තාහු ගේ ද ඇත්තා වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි කියන්නේ වේ.

කථඤ්ච පුග්ගලො නෙ'ව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නොපි වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන: ඉධෙ'කච්චෙ පුග්ගලෙ වණ්ණො'පි සංවිජ්ජති, අවණ්ණො'පි සංවිජ්ජති. යො තත්‍ථ අවණ්ණො තං න භණති භූතං තච්ඡං කාලෙන, යොපි තත්‍ථ වණ්ණො තම්පි න භණති භූතං තච්ඡං කාලෙන. උපෙක්ඛකො විහරති සතො සම්පජානො. එවං පුග්ගලො නෙව අවණ්ණාරහස්ස අවණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන, නොපි වණ්ණාරහස්ස වණ්ණං භාසිතා හොති භූතං තච්ඡං කාලෙන.

18. කතමො ච පුග්ගලො උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී: යස්ස පුග්ගලස්ස උට්ඨහතො ඝටතො වායමතො ආජීවො අභිනිබ්බත්තති නො පුඤ්ඤතො, අයං වුච්චති පුග්ගලො උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී.

කතමො ච පුග්ගලො පුඤ්ඤඵලූපජීවී නො උට්ඨානඵලූපජීවී: පරනිම්මිතවසවත්තිදෙවෙ උපාදය තතුපරි දෙවා පුඤ්ඤඵලූපජීවිනො නො උට්ඨානඵලූපජීවිනො.

කතමො ච පුග්ගලො උට්ඨානඵලූපජීවී ච පුඤ්ඤඵලූපජීවී ච: යස්ස පුග්ගලස්ස උට්ඨහතො ඝටතො වායමතො ආජීවො අභිනිබ්බත්තති පුඤ්ඤතො ච, අයං වුච්චති පුග්ගලො උට්ඨානඵලූපජීවී ච පුඤ්ඤඵලූපජීවී ච.

කතමො ච පුග්ගලො නෙව උට්ඨානඵලූපජීවී නො පුඤ්ඤඵලූපජීවී: නෙරයිකා නෙව උට්ඨානඵලූපජීවිනො නො පුඤ්ඤඵලූපජීවිනො.

19. කථඤ්ච පුග්ගලො තමො හොති තමපරායණො: ඉධෙ'කච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා නෙසාදකුලෙ වා වෙණකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දළිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ, යත්‍ථ කසිරෙන ඝාසච්ඡාදො ලබ්භති, සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්‍ථස්ස යානස්ස මාලාගන්‍ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්‍වා, වාචාය දුච්චරිතං චරිත්‍වා, මනසා දුච්චරිතං චරිත්‍වා, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති එවං පුග්ගලො තමො හොති තමපරායණො.

කෙසේ නම් පුද්ගල නුගුණ කිය යුත්තහුගේ භූත වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි නො කියන්නේ ම ගුණ කිය යුත්තහු ගේ භූත වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි නො කියන්නේත් වේ ද: මෙලොව කිසි පුද්ගලයකු කෙරෙහි ගුණයෙක් ද පැනෙයි, නුගුණයෙක් ද පැනේ. එහි යම් නුගුණයෙක් වේ නම් භූත වූ තථ්‍ය වූ එය සුදුසු කල්හි නො කියයි. තව ද එහි යම් ගුණයෙකුත් වේ නම් භූත වූ තථ්‍ය වූ එය ද සුදුසු කල්හි නො කියයි. සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ මැදහත් ව වෙසෙයි. මෙසේ පුද්ගල තෙමේ නුගුණ කියයුත්තහුගේ භූත වූ තථ්‍ය වූ නුගුණය සුදුසු කල්හි නො කියන්නේ ම ගුණ කියයුත්තහුගේ භූත වූ තථ්‍ය වූ ගුණය සුදුසු කල්හි නො ද කියන්නේ වේ.

18. කවර පුද්ගලයෙක් 'උත්ථානඵලොපජීවී' වූයේ පුණ්‍යඵලොපජීවී නො වේ ද යත්: නැඟී සිටුනා උත්සාහ කරන ව්‍යායාම කරන යම් පුද්ගලයක්හු ගේ දිවි පැවැත්ම සැපයේ ද පුණ්‍යයෙන් නො සැපයේ ද මේ පුද්ගල උත්ථානඵලොපජීවී වූයේ පුණ්‍යඵලොපජීවී නො වේ යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් පුණ්‍යඵලොපජීවී' වූයේ 'උත්ථානඵලොපජීවී' නො වේ ද යත්: පරනිර්මිතවශවර්ත්ති දෙවියන් පටන් ගෙන ඉන් මතුයෙහි දෙවියෝ පුණ්‍යඵලොපජීවී වූවාහු උත්ථානඵලොපජීවී නො වූවාහු ය.

කවර පුද්ගලයෙක් 'උත්ථානඵලොපජීවී'ත් 'පුණ්‍යඵලොපජීවී'ත් වේ ද යත්: නැඟී සිටුනා උත්සාහ කරන වෑයම් කරන යම් පුද්ගලයක්හු ගේ දිවි පැවැත්ම සැපයේ ද පිනිනුදු සැපයේ ද මේ පුද්ගල 'උත්ථානඵලොපජීවී'ත් 'පුණ්‍යඵලොපජීවී'ත් වේ ය යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'උත්ථානඵලොපජීවී' නො මැ වූයේ 'පුණ්‍යඵලොපජීවී' නො වේ ද යත්: නිරිසත්හු 'උත්ථානඵලොපජීවීහු' නො මැ වූවාහු 'පුණ්‍යඵලොපජීවී' නො වෙත්.

19. කෙසේ නම් පුද්ගල 'තමොතමපරායණ' (අඳුරු වූයේ අඳුරට යන්නේ) වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් යම් කුලයෙකැ දුකසේ ආහාර වස්ත්‍ර ලැබේ ද එබඳු දිළිඳු වූ මඳ වූ ආහාර පාන භොජන ඇති, දුකින් වැටෙන නීචකුල වූ සැඩොල්කුලයෙහි හෝ මුවවැදි කුලයෙහි හෝ කුලුපොතු කුලයෙහි හෝ රියවඩු කුලයෙහි හෝ පුප්සඩු කුලයෙහි හෝ උපන්නේ වෙයි. හෙ ද දුර්වර්ණයෙක් නපුරු දකුම් ඇත්තෙක්, ලකුණ්ටකයෙක් බොහෝ ආබාධ ඇත්තෙක් වෙයි. කණෙක් හෝ අත්පා කොරෙක් හෝ පිළෙක් හෝ වෙයි. ආහාර පාන, වස්ත්‍ර, යාන මල් ගඳ විලෙවුන්, ශයනාගාර ප්‍රදීපොපකරණ නොලබන්නෙක් වේ. හෙතෙම කයින් දුසිරිත් කරයි. වචනයෙන් දුසිරිත් කරයි. මනසින් දුසිරිත් කරයි. හෙතෙම කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට මනසින් දුසිරිත් කොට කා බුන් මරණින් මතු සැප නැති අපායෙහි දුගති වූ විනිපාත වූ නිරයට පැමිණේ: මෙසේ පුද්ගල 'තමොතමපරායණ' වේ.

කථඤ්ච පුග්ගලො තමො හොති ජොතිපරායණො: ඉධෙ'කච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති චණ්ඩාලකුලෙ වා නෙසාද කුලෙ වා වෙණකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ, යත්ථ කසිරෙන ඝාසච්ඡාදෙ ලබ්භති, සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො. කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදී-පෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති. සො කායෙන සුචරිතං චරිත්වා, වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං පුග්ගලො තමො හොති ජොතිපරායණො.

කථඤ්ච පුග්ගලො ජොති හොති තමපරායණො: ඉධෙ'කච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධන-ධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො. ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති මනසා දුච්චරිතං චරති සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. එවං පුග්ගලො ජොති හොති තමපරායණො.

කථඤ්ච පුග්ගලො ජොති හොති ජොතිපරායණො: ඉධෙ කච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති ඛත්තියමහාසාලකුලෙ වා බ්‍රාහ්මණමහාසාලකුලෙ වා ගහපතිමහාසාලකුලෙ වා අඩ්ඪෙ මහද්ධනෙ මහාභොගෙ පහූතජාතරූපරජතෙ පහූතවිත්තූපකරණෙ පහූතධන-ධඤ්ඤෙ. සො ච හොති අභිරූපො දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො, ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො කායෙන සුචරිතං චරති, වාචාය සුචරිතං චරති, මනසා සුචරිතං චරති සො කායෙන සුචරිතං චරිත්වා, වාචාය සුචරිතං චරිත්වා මනසා සුචරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. එවං පුග්ගලො ජොති හොති ජොතිපරායණො.

කෙසේ නම් පුද්ගල තමොජොතිපරායණ (අඳුරු වූයේ ආලොකයට යන්නේ) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් යම් කුලයෙකැ දුකසේ ආහාර හා වස්ත්‍ර ලැබේ ද එබඳු දිළිඳු වූ මඳ වූ ආහාර පාන භොජන ඇති දුකින් වැටෙන නීචකුල වූ සැඩොල්කුලයෙහි හෝ මුවවැදිකුලයෙහි හෝ කුලුපොතු කුලයෙහි හෝ රියවඩුකුලයෙහි හෝ පුප්සඩුකුලයෙහි හෝ උපන්නේ වෙයි. හෙ ද දුර්වර්ණයෙක් නපුරු දකුම් ඇත්තෙක් ලකුණ්ටකයෙක් රොගබහුලයෙක් වෙයි, කණෙක් හෝ අත් පා කොරෙක් හෝ පිළෙක් හෝ වෙයි, ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශයනාගාර ප්‍රදීපොපකරණ නො ලබන්නෙක් වේ. හෙතෙම කයින් සුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් සුසිරිතෙහි හැසිරෙයි, මනසින් සුසිරිතෙහි හැසිරේ. හෙතෙම කයින් සුසිරිතෙහි හැසිර වචනයෙන් සුසිරිතෙහි හැසිර, මනසින් සුසිරිතෙහි හැසිර කාබුන් මරණින් මතු ශොභනගති ඇති ස්වර්ගලොකයට පැමිණේ. මෙසේ පුද්ගල 'තමොජොතිපරායණ' වේ.

කෙසේ නම් පුද්ගල ජොයාතිමත් වූයේ අඳුර කරා යන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ඉසුරු ඇති මහදනැති මහාභොග ඇති බොහෝ රන්රිදී ඇති මනපිනවන බොහෝ උපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුල වූ කැත්මහසල් කුලයෙහි හෝ බමුණු මහසල් කුලයෙහි හෝ ගැහැවිමහසල්කුලයෙහි හෝ උපන්නේ වෙයි. හෙ ද මනාරූ ඇත්තේ දකුම්කලු වූයේ දුටුවන් පහදවන්නේ උතුම් සිරුරු පැහැයෙන් යුතු වූයේ ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ විලෙවුන් ශයනාගාර ප්‍රදීපොපකරණ ලබන්නේ වෙයි. හෙතෙම කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි, මනසින් දුසිරිතෙහි හැසිරේ. හෙතෙම කයින් දුසිරිතෙහි හැසිර වචනයෙන් දුසිරිතෙහි හැසිර මනසින් දුසිරිතෙහි හැසිර කාබුන් මරණින් මතුයෙහි සැපයෙන් පහ වූ දුකට ගති වූ විවස ව පතිත වන නිරයට පැමිණේ. මෙසේ පුද්ගල 'ජොතිතමපරායණ' වේ.

කෙසේ නම් පුද්ගල ආලෝකයෙන් යුක්ත වූයේ ආලෝකයට යන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ඉසුරු ඇති මහදනැති මහාභොග ඇති බොහෝ රන්රිදී ඇති මනපිනවන බොහෝ උපකරණ ඇති බොහෝ ධනධාන්‍ය ඇති උසස් කුලවූ කැත් මහසල් කුලයෙහි හෝ බමුණු-මහසල්කුලයෙහි හෝ ගැහැවිමහසල්කුලයෙහි හෝ උපන්නේ වෙයි. හෙ ද මනාරූ ඇත්තේ දකුම්කලු වූයේ දුටුවන් පහදවන්නේ උතුම් සිරුරු පැහැයෙන් සමන්වාගත වූයේ ආහාර පාන වස්ත්‍ර යාන මල් ගඳ-විලෙවුන් ශයනාගාර ප්‍රදීපොපකරණ ලබන්නේ වේ. හෙතෙම කයින් සුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් සුසිරිතෙහි හැසිරෙයි, මනසින් සුසිරිතෙහි හැසිරේ. හෙතෙම කයින් සුසිරිතෙහි හැසිර වචනයෙන් සුසිරිතෙහි හැසිර මනසින් සුසිරිතෙහි හැසිර කාබුන් මරණින් මතු ශොභනගති ඇති ස්වර්ගලොකයට පැමිණේ. මෙසේ පුද්ගල 'ජොතිජොතිපරායණ' වේ.

20. කථඤ්ච පුග්ගලො ඔනතොනතො හොති: ඉධෙකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො -පෙ- එවං පුග්ගලො ඔනතොනතො හොති. කථඤ්ච පුග්ගලො ඔනතුන්නතො හොති —පෙ— එවං පුග්ගලො ඔනතුන්නතො හොති. කථඤ්ච පුග්ගලො උන්නතොනතො හොති ඉධෙකච්චො පුග්ගලො උච්චෙ කුලෙ පච්චාජාතො හොති – පෙ – එවං පුග්ගලො උන්නතොනතො හොති. කථඤ්ච පුග්ගලො උන්නතුන්නතො හොති —පෙ— එවං පුග්ගලො උන්නතුන්නතො හොති.

21. තත්‍ථ කතමෙ චත්තාරො රුක්ඛූපමා පුග්ගලා: චත්තාරො රුක්ඛා, ඵෙග්ගුසාරපරිවාරො, සාරො ඵෙග්ගුපරිවාරො, ඵෙග්ගු ඵෙග්ගු පරිවාරො, සාරො සාරපරිවාරො. එවමෙවං චත්තාරො රුක්ඛූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො: ඵෙග්ගු සාරපරිවාරො, සාරො ඵෙග්ගුපරිවාරො, ඵෙග්ගු ඵෙග්ගුපරිවාරො, සාරො සාරපරිවාරො. කථඤ්ච පුග්ගලො ඵෙග්ගු හොති සාරපරිවාරො: ඉධෙකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො පරිසා ච ඛ්වස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං පුග්ගලො ඵෙග්ගු හොති සාරපරිවාරො. සෙය්‍යථාපි සො රුක්ඛො ඵෙග්ගු සාරපරිවාරො. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො සාරො හොති ඵෙග්ගුපරිවාරො: ඉධෙ'කච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො පරිසා ච ඛ්වස්ස හොති දුස්සීලා පාපධම්මා. එවං පුග්ගලො සාරො හොති ඵෙග්ගුපරිවාරො. සෙය්‍යථාපි සො රුක්ඛො සාරො ඵෙග්ගුපරිවාරො, තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො ඵෙග්ගු හොති ඵෙග්ගුපරිවාරො: ඉධෙ'කච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො. පරිසාපි'ස්ස හොති දුස්සීලා පාපධම්මා. එවං පුග්ගලො ඵෙග්ගු හොති ඵෙග්ගුපරිවාරො සෙය්‍යථාපි සො රුක්ඛො ඵෙග්ගු ඵෙග්ගුපරිවාරො. තථූපමො අයං පුග්ගලො.

කථඤ්ච පුග්ගලො සාරො හොති සාරපරිවාරො: ඉධෙ'කච්චො පුග්ගලො සීලවා හොති කල්‍යාණධම්මො, පරිසාපිස්ස හොති සීලවතී කල්‍යාණධම්මා. එවං පුග්ගලො සාරො හොති සාරපරිවාරො, සෙය්‍යථාපි සො රුක්ඛො සාරො සාරපරිවාරො, තථූපමො අයං පුග්ගලො. ඉමෙ චත්තාරො රුක්ඛූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

20. කෙසේ නම් පුද්ගල (දනුදු) නීච වූයේ (මතුදු) නීචයෙක් වේ ද: මෙලොව කිසි පුද්ගලයෙක් නීචකුලයෙහි උපන්නේ වෙයි.... මෙසේ පුද්ගල නීච වූයේ නීචයෙක් වේ. කෙසේ නම් පුද්ගල නීචවූයේ උච්චයෙක් වේ ද ... මෙසේ පුද්ගල අවනත–උන්නත වේ. කෙසේ නම් පුද්ගල උච්ච වූයේ නීචයෙක් වේ ද මෙලොව කිසි පුද්ගලයෙක් උච්චකුලයෙහි උපන්නේ වෙයි.... මෙසේ පුද්ගල 'උන්නත–අවනත' වේ, කෙසේ නම් පුද්ගල උච්ච වූයේ උච්චයෙක් වේ ද –පෙ– මෙසේ පුද්ගල 'උන්නත–උන්නත' වේ.

21. එහි වෘක්ෂයට බඳු පුද්ගලයෝ සතර දෙන කවරහු ද යත්: වෘක්ෂයෝ සතර දෙනෙකි. හරරුක් පිරිවැරූ එළරුක යැ, එළරුක් පිරිවැරූ හරරුක ය, එළරුක් පිරිවැරූ එළරුක යැ, හරරුක් පිරිවැරූ හරරුක යි. මෙසේ ම වෘක්ෂොපම පුද්ගලයෝ සතර දෙනෙක් ලෝකයෙහි ඇත්තාහු දක්නා ලැබෙත්. කවරහු සතර දෙනෙක යත්: ඵෙග්ගුසාරපරිවාර යැ, සාරඵෙග්ගුපරිවාර යැ, ඵෙග්ගුඵෙග්ගුපරිවාර යැ, සාරසාරපරිවාර යැ යි. කෙසේ නම් පුද්ගල ඵෙග්ගු වූයේ සාර- පරිවාර වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් දුශ්ශීල වූයේ පාපධර්ම ඇත්තේ වෙයි. එතෙකුදු වත් ඔහුගේ පිරිස සිල්වත් වූවා කලණදහම් ඇත්තී වෙයි. මෙසේ පුද්ගල ඵෙග්ගුසාරපරිවාර වේ. යම්සේ ඒ රුක ඵෙග්ගුසාරපරිවාර වේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල සාරවූයේ ඵෙගගුපරිවාර වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් සිල්වතෙක් කල්‍යාණධර්මයෙක් වෙයි. එතෙකුදු වත් ඔහුගේ පිරිස දුසිල් වූවා පාපධර්ම ඇත්තී වෙයි. මෙසේ පුද්ගල සාර වූයේ ඵෙග්ගුපරිවාර වේ. යම්සේ ඒ රුක සාර වූයේ ඵෙග්ගුපරිවාර වේ ද මේ පුද්ගල තෙමේ එබඳු යි.

කෙසේ නම් පුද්ගල ඵෙග්ගු වූයේ ඵෙග්ගුපරිවාර වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් දුශ්ශීලයෙක් පාපධර්මයෙක් වෙයි. ඔහුගේ පිරිස ද දුසිල් වූවා පාපධර්ම ඇත්තී වෙයි. මෙසේ පුද්ගල ඵෙග්ගු වූයේ ඵෙග්ගුපරිවාර වේ. යම්සේ ඒ රුක ඵෙග්ගු–ඵෙග්ගුපරිවාර වේ ද මේ පුද්ගල එබඳු යි.

කෙසේ නම් පුද්ගල සාර වූයේ සාරපරිවාර වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් සිල් ඇත්තේ කලණ දහම් ඇත්තේ වෙයි. ඔහුගේ පිරිස ද සිල්වත් වූවා කලණදහම් ඇත්තී වෙයි. මෙසේ පුද්ගල සාර වූයේ සාරපරිවාර වේ. යම්සේ ම ඒ රුක සාර වූයේ සාරපරිවාර වේ ද මේ පුද්ගල එබඳු යි. මොහු සතර දෙන ලෝකයෙහි ඇති විද්‍යමාන වූ වෘක්ෂොපම පුද්ගලයෝ යි.

22. කතමො ච පුග්ගලො රූපප්පමාණො රූපප්පසන්නො: ඉධෙ'කච්චො පුග්ගලො ආරොහං වා පස්සිත්වා පරිණාහං වා පස්සිත්වා සණ්ඨානං වා පස්සිත්වා පරිපූරං වා පස්සිත්වා තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති, අයං වුච්චති පුග්ගලො රූපප්පමාණො රූපප්පසන්නො.

කතමො ච පුග්ගලො ඝොසප්පමාණො ඝොසප්පසන්නො: ඉධෙ'කච්චො පුග්ගලො පරවණ්ණනාය පරථොමනාය පරපසංසනාය පරවණ්ණහාරිකාය[1] තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ඝොසප්පමාණො ඝොසප්පසන්නො.

කතමො ච පුග්ගලො ලූඛප්පමාණො ලූඛප්පසන්නො: ඉධෙ'කච්චො පුග්ගලො චීවරලූඛං වා පස්සිත්වා, සෙනාසනලූඛං වා පස්සිත්වා විවිධං වා දුක්කරකාරිකං පස්සිත්වා, තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ලූඛප්පමාණො ලූඛප්පසන්නො.

කතමො ච පුග්ගලො ධම්මප්පමාණො ධම්මප්පසන්නො: ඉධෙ'කච්චො පුග්ගලො සීලං වා පස්සිත්වා සමාධිං වා පස්සිත්වා පඤ්ඤං වා පස්සිත්වා තත්ථ පමාණං ගහෙත්වා පසාදං ජනෙති. අයං වුච්චති පුග්ගලො ධම්මප්පමාණො ධම්මප්පසන්නො.

23. කථඤ්ච පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා සීලසම්පන්නො හොති නො පරං සීලසම්පදාය සමාදපෙති, අත්තනා සමාධිසම්පන්නො හොති නො පරං සමාධිසම්පදාය සමාදපෙති, අත්තනා පඤ්ඤාසම්පන්නො හොති නො පරං පඤ්ඤාසම්පදාය සමාදපෙති. අත්තනා විමුත්තිසම්පන්නො හොති නො පරං විමුත්තිසම්පදාය සමාදපෙති, අත්තනා විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති නො පරං විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති. එවං පුග්ගලො අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

---

1. පරවණ්ණහාරියා – සිමු

22. කවර පුද්ගලයෙක් 'රූපප්‍රමාණ වූයේ රූපප්‍රසන්න' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ආරෝහය (උස්බව) හෝ බලා පරිණාහය හෝ බලා රූසටහන හෝ බලා ලකුණු පිරිපුන් බව හෝ බලා එහි පමණ ගෙන ප්‍රසාදය උපදවයි. මේ පුද්ගල 'රූපප්‍රමාණ වූයේ රූපප්‍රසන්න' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ඝොෂප්‍රමාණ වූයේ ඝොෂප්‍රසන්න' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් පරවර්ණනායෙහි පරස්තුතියෙහි පරප්‍රශංසා-යෙහි පරපුරින් ගෙන යන ගුණකථනයෙහි ප්‍රමාණය ගෙන එහි ප්‍රසාදය උපදවයි. මේ පුද්ගල 'ඝොෂප්‍රමාණ ඝොෂප්‍රසන්න' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ලූඛප්පමාණ වූයේ ලූඛප්පසන්න' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් සිවුරු රළු බව හෝ බලා සෙනසුන් රළු බව හෝ බලා නන් වැදෑරුම් වූ දුෂ්කරක්‍රියා හෝ බලා එහි පමණ ගෙන ප්‍රසාදය උපදවයි. මේ පුද්ගල 'ලූඛප්පමාණ– ලූඛප්පසන්න' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ධර්මප්‍රමාණ වූයේ ධර්මප්‍රසන්න' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ශීලය හෝ බලා සමාධිය හෝ බලා ප්‍රඥාව හෝ බලා එහි පමණ ගෙන ප්‍රසාදය උපදවයි. මේ පුද්ගල 'ධර්මප්‍රමාණ ධර්මප්‍රසන්න' යැ යි කියනු ලැබේ.

23. කෙසේ නම් පුද්ගල තමහට හිත පිණිස පිළිපන්නේ අනු-නට හිත පිණිස නො පිළිපන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ශීලසම්පන්න වෙයි. අනුන් ශීලසම්පත්තියෙහි සමාදන් නො කරවයි. තෙමේ සමාධිසම්පන්න වෙයි. අනුන් සමාධිසම්පත්තියෙහි සමාදන් නො කරවයි. තෙමේ ප්‍රඥාසම්පන්න වෙයි. අනුන් ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් නො කරවයි. තෙමේ විමුක්තිසම්පන්න වෙයි. අනුන් විමුක්ති සම්පත්තියෙහි සමාදන් නො කරවයි. තෙමේ විමුක්තිඥානදර්ශන සම්පන්න වෙයි. අනුන් විමුක්තිඥානදර්ශන සම්පත්තියෙහි සමාදන් නො කරවයි. මෙසේ පුද්ගල තමහට හිත පිණිස පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වේ.

කථඤ්ච පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා න සීලසම්පන්නො හොති පරං සීල සම්පදය සමාදපෙති, අත්තනා න සමාධිසම්පන්නො හොති පරං සමාධි-සම්පදය සමාදපෙති. අත්තනා න පඤ්ඤාසම්පන්නො හොති පරං පඤ්ඤා සම්පදය සමාදපෙති: අත්තනා න විමුත්තිසම්පන්නො හොති පරං විමුත්ති සම්පදය සමාදපෙති. අත්තනා න විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති පරං විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති, එවං පුග්ගලො පරහිතාය පටිපන්නො හොති නො අත්තහිතාය.

කථඤ්ච පුග්ගලො අත්තහිතාය චෙව පටිපන්නො හොති පරහිතාය ච: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා ච සීලසම්පන්නො හොති පරඤ්ච සීලසම්පදාය සමාදපෙති, අත්තනා ච සමාධිසම්පන්නො හොති පරඤ්ච සමාධිසම්පදය සමාදපෙති අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති පරඤ්ච පඤ්ඤාසම්පදය සමාදපෙති අත්තනා ච විමුත්තිසම්පන්නො හොති පරඤ්ච විමුත්තිසම්පදය සමාදපෙති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති පරඤ්ච විමුත්තිඤාණදස්සනසම්පදය සමාදපෙති. එවං පුග්ගලො අත්තහිතාය චෙව පටිපන්නො හොති පරහිතාය ච.

කථඤ්ච පුග්ගලො නෙව අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය: ඉධෙ'කච්චො පුග්ගලො අත්තනා න සීලසම්පන්නො හොති නො පරං සීලසම්පදය සමාදපෙති. අත්තනා න සමාධිසම්පන්නො හොති නො පරං සමාධිසම්පදය සමාදපෙති. අත්තනා න පඤ්ඤාසම්පන්නො හොති නො පරං පඤ්ඤාසම්පදය සමාදපෙති, අත්තනා න විමුත්ති-සම්පන්නො හොති නො පරං විමුත්තිසම්පදය සමාදපෙති, අත්තනා න විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති නො පරං විමුත්තිඤාණදස්සන සම්පදය සමාදපෙති. එවං පුග්ගලො නෙව අත්තහිතාය පටිපන්නො හොති නො පරහිතාය.

කෙසේ නම් පුද්ගල අනුනට හිත පිණිස පිළිපන්නේ තමහට හිත පිණිස නො පිළිපන්නේ වේ ද යත්: මෙලොව කිසිපුද්ගලයෙක් ශීල සම්පන්න නො වෙයි. අනුන් ශීලසම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේ සමාධිසම්පන්න නො වෙයි, අනුන් සමාධිසම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේ ප්‍රඥාසම්පන්න නො වෙයි, අනුන් ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේ විමුක්තිසම්පන්න නො වෙයි. අනුන් විමුක්තිසම්පත්ති-යෙහි සමාදන් කරවයි, තෙමේ විමුක්තිඥානදර්ශනසම්පන්න නො වෙයි, අනුන් විමුක්තිඥානදර්ශනසම්පත්තියෙහි සමාදන් කරවයි. මෙසේ පුද්ගල අනුනට හිත පිණිස පිළිපන්නේ තමහට හිත පිණිස නො පිළි පන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තමහට හිත පිණිසත් පිළිපන්නේ මැ අනුනට හිත පිණිසත් පිළිපන්නේ වේ ද යත්: මෙලොව එක් පුද්ගලයෙක් තෙමේත් ශීලසම්පන්න වෙයි. අනුනුදු ශීලසම්පත්තියෙහි සමාදන් කර-වයි. තෙමේත් සමාධිසම්පන්න වෙයි, අනුනුදු සමාධිසම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේත් ප්‍රඥාසම්පන්න වෙයි, අනුනුදු ප්‍රඥාසම්පත්ති-යෙහි සමාදන් කරවයි, තෙමේත් විමුක්තිසම්පන්න වෙයි. අනුනුදු විමුක්ති සම්පත්තියෙහි සමාදන් කරවයි. තෙමේත් විමුක්තිඥානදර්ශන-සම්පන්න වෙයි. අනුනුදු විමුක්තිඥානදර්ශනසම්පත්තියෙහි සමාදන් කරවයි. මෙසේ පුද්ගල තමහට හිත පිණිසත් පිළිපන්නේ ම අනුනට හිත පිණිසත් පිළිපන්නේ වේ.

කෙසේ නම් පුද්ගල තමහට හිත පිණිස නො මැ පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළිපන්නේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගල-යෙක් තෙමේ ශීලසම්පන්න නො වෙයි. අනුන් ශීලසම්පත්තියෙහි සමාදන් නො කරවයි. තෙමේ සමාධිසම්පන්න නො වෙයි. අනුන් සමාධිසම්පත්ති-යෙහි සමාදන් නො කරවයි. තෙමේ ප්‍රඥාසම්පන්න නො වෙයි. අනුනුදු ප්‍රඥාසම්පත්තියෙහි සමාදන් නො කරවයි, තෙමේ විමුක්ති සම්පන්න නො වෙයි. අනුන් විමුක්තිසම්පත්තියෙහි සමාදන් නො කරවයි, තෙමේ විමුක්තිඥානදර්ශනසම්පන්න නො වෙයි. අනුන් විමුක්තිඥාන දර්ශනසම්පත්තියෙහි සමාදන් නො කරවයි. මෙසේ පුද්ගල තමහට හිත පිණිස නො මැ පිළිපන්නේ අනුනට හිත පිණිස නො පිළි පන්නේ වේ.

24. කථඤ්ච පුග්ගලො අත්තන්තපො හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො, න එහිභදන්තිකො, න තිට්ඨභදන්තිකො, න අභිහටං, න උද්දිස්සකටං, න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පතිගණ්හාති, න ඛලොපිමුඛා[1] පතිගණ්හාති, න එළකමන්තරං, න දණ්ඩමන්තරං, න මුසලමන්තරං, න ද්වින්නං භුඤ්ජමානානං, න ගබ්භිනියා, න පායමානාය, න පුරිසන්තරගතාය, න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො වා, ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො වා, සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො වා, එකිස්සා'පි දත්තියා යාපෙති ද්වීහි'පි දත්තීහි යාපෙති -පෙ- සත්තහිපි දත්තීහි යාපෙති, එකාහිකම්පි ආහාරං ආහාරෙති, ද්වාහිකම්පි[2] ආහාරං ආහාරෙති, -පෙ- සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි[3] පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

සො සාකභක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති, නීවාරභක්ඛො වා හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති, කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාකභක්ඛො වා හොති, තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො වා හොති, වනමූල ඵලාහාරො යාපෙති, පවත්තඵලභොජී. සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, තිරීටානිපි ධාරෙති, අජිනානිපි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති, කෙසමස්සුලොචකොපි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො, උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො, කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති, සායතතියකම්පි[4] උදකොරොහනානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. එවං පුග්ගලො අත්තන්තපො හොති අත්ත පරිතාපනානුයොගමනුයුත්තො.

1. කළොපිමුඛා - සී මු.
2. ද්වාහිකම්පි - සී මු.
3. අඩ්ඪමාසිකම්පි - සී මු, මජසං, සයා
4. සායං තතියකම්පි - සයා.

24. කෙසේ නම් පුද්ගල ආත්මය තවනුයේ ආත්මය තවන යොග යෙහි යෙදුණේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් අචේලක (නිරුවත්) වෙයි. හළ ආචාර ඇත්තේ යැ, අත ලෙව්නේ යැ, (පිඩු ගන්නා පිණිස) එවහිමි' යි කිව නො එන්නේ යැ, 'සිට හිමි' යි කිව නො සිටුනේ යැ, පළමු කළ භික්ෂාව නො ගනියි, උදෙසා කළ භික්ෂාව නො ගනියි, පවරා දුන් භික්ෂාව නො ගනියි, සැළින් ගෙන දුන් භික්ෂාව නො ගනියි, පැසින් ගෙන දෙන භික්ෂාව නො ගනියි, එළිපත අතුරු කොට ලා දුන් භික්ෂාව නො ගනියි, දණ්ඩක් අතුරු කොට ලා දුන් භික්ෂාව නො ගනියි, මොහොලක් අතුරු කොට ලා දුන් භික්ෂාව නො ගනියි, වළඳන දෙදෙනකු අතුරින් එකකු දුන් භික්ෂාව නො ගනියි, ගැබිනිය ගේ භික්ෂාව නො පිළිගනියි, කිරිපොවන්නිය ගේ භික්ෂාව නො පිළිගනියි, පිරිමින් අතරට ගිය තැනැත්තිය ගේ භික්ෂාව නො පිළිගනියි, සමාදන් කොට කළ බතින් භික්ෂාව නො පිළිගනියි, සුනඛයන් එළඹ සිටි තැන්හි භික්ෂාව නො පිළිගනියි, මැස්සන් මුළු මුළු වැ හැසිරෙන තැන්හි භික්ෂාව නො පිළිගනියි, දියමස් නො පිළිගනියි, ගොඩ මස් නො පිළිගනියි, රහ නො බෙ යි, මෙරය නො බොයි, කාඩි දිය නො බොයි, හෙතෙම එක් ගෙයක සිඟන්නේ හෝ එක් පිඩෙකින් යැපෙන්නේ හෝ වෙයි, ගෙවල් දෙකක සිඟන්නේ හෝ දෙපිඩෙකින් යැපෙන්නේ හෝ වෙයි, ගෙවල් සතක සිඟන්නේ හෝ සත්පිඩෙකින් යැපෙන්නේ හෝ වෙයි, එක් දත්තියකිනුදු (කුඩා බඳුනකින්) යැපෙයි. දෙදත්තියකිනුදු යැපෙයි, –පෙ– සත් දත්තියකිනුදු යැපෙයි. දිනකට වරකුදු අහර ගනි, දෙදිනකට වරකුදු අහර ගනියි, –පෙ– සතියකට වරකුදු අහර ගනියි. මෙසේ මෙ අයුරින් අඩමසකට වරකුදු වරුබත් වැළඳු මෙහි යෙදී වෙසෙයි.

හෙතෙම අමු පළා කන්නේ හෝ වෙයි, බොඩහමු කන්නේ හෝ වෙයි, ඌරුහැල් කන්නේ හෝ වෙයි, සම්කසට කන්නේ හෝ වෙයි, සෙවෙල් කන්නේ හෝ වෙයි, කුඩු කන්නේ හෝ වෙයි, දමුකඩ කන්නේ හෝ වෙයි, මුරුවට කන්නේ හෝ වෙයි, තණ කන්නේ හෝ වෙයි, ගොම කන්නේ හෝ වේ. වනමුල්පල අහරින් යැපෙයි, වැටුණු පල වළඳනසුලු වෙයි. හෙතෙම සණවැහැරි ද දරයි, මිශ්‍රවස්ත්‍ර ද දරයි, මළ සිරුරු එතු වස්ත්‍ර ද දරයි, පංශුකූල ද දරයි. වැහැරි ද දරයි, අඳුන් දිවිසම් ද දරයි, මැදින් පළන ලද අඳුන් දිවිසම් ද දරයි, කුස වැහැරි ද දරයි, නියඳවැහැරි ද දරයි, පතුරුවැහැරි ද දරයි, කෙස්කම්බිලි ද දරයි, ලොම්කම්බිලි ද දරයි, මහමුහුණු පියාපතින් කළ වස්ත්‍ර ද දරයි. කෙස් මස් ඉදිරීමෙහි යෙදුණේ කෙස් මස් උදුරන්නේ ද වෙයි. හිඳීම ප්‍රතික්ෂෙප කෙළේ උඩුහුරු ව සිටුනේ ද වෙයි. උක්කුටික ව්‍රතයෙහි යෙදුණේ උක්කුටිකයෙක් ද වෙයි. කටු ඇතිරි ඇත්තේ ද වෙයි, කටු ඇතිරියෙහි හොත්නේ වෙයි. සවස තුන්වනු කොට දියෙහි ගැලෙන ව්‍රතයෙහි යෙදී වෙසෙයි. මෙසේ මෙබඳු නන් වැදෑරුම් වූ සිරුරු තවන වෙසෙසින් තවන ව්‍රතයන්හි යෙදී වෙසෙයි. මෙසේ පුද්ගල ආත්මය තවන්නේ ආත්මය තවන යොගයන්හි යෙදුණේ වේ.

කථඤ්ච පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඔරබ්භිකො හොති සූකරිකො සාකුණිකො මාගවිකො ලුද්දො මච්ඡඝාතකො චොරො චොරඝාතකො[*] බන්ධනාගාරිකො, යෙ වා පනඤ්ඤෙපි කෙචි කුරූරකම්මන්තා. එවං පුග්ගලො පරන්තපො හොති පරපරිතාපනානුයොගමනුයුත්තො.

කථඤ්ච පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො පරන්තපො ච හොති පරපරිතාපනානුයොගමනුයුත්තො: ඉධෙකච්චො පුග්ගලො රාජා වා හොති ඛත්තියො මුද්ධාභිසිත්තො[1] බ්‍රාහ්මණො වා මහාසාලො, සො පුරත්ථිමෙන නගරස්ස නවං යඤ්ඤාගාරං[2] කාරාපෙත්වා, කෙසමස්සුං ඔහාරෙත්වා ඛුරාජිනං[3] නිවාසෙත්වා සප්පිතෙලෙන කායං අබ්භඤ්ජිත්වා, මිගවිසාණෙන[4] පිට්ඨිං කණ්ඩූයමානො[5] යඤ්ඤාගාරං[2] පවිසති සද්ධිං මහෙසියා බ්‍රාහ්මණෙන ච පුරොහිතෙන. සො තත්ථ අනන්තරහිතාය භූමියා හරිතුපත්ථාය සෙය්‍යං කප්පෙති. එකිස්සා ගාවියා සරූපවච්ඡාය යං එකස්මිං ථනෙ ඛීරං හොති තෙන රාජා යාපෙති යං දුතියස්මිං ථනෙ ඛීරං හොති තෙන මහෙසී යාපෙති, යං තතියස්මිං ථනෙ ඛීරං හොති තෙන බ්‍රාහ්මණො පුරොහිතො යාපෙති, යං චතුත්ථස්මිං ථනෙ ඛීරං හොති තෙන අග්ගිං ජුහති. අවසෙසෙන වච්ඡකො යාපෙති.

සො එවමාහ: එත්තකා උසභා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා වච්ඡතරියො හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා අජා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය, එත්තකා උරබ්භා හඤ්ඤන්තු යඤ්ඤත්ථාය එත්තකා රුක්ඛා ඡිජ්ජන්තු යූපත්ථාය, එත්තකා දබ්භා ලූයන්තු බරිහිසත්ථායාති[6] යෙපිස්ස තෙ හොන්ති දසාති වා පෙස්සාති වා කම්මකරාති වා තෙපි දණ්ඩතජ්ජිතා භයතජ්ජිතා අස්සුමුඛා රුදමානා පරිකම්මානි කරොන්ති, එවං පුග්ගලො අත්තන්තපො ච හොති අත්තපරිතාපනානුයොගමනුයුත්තො, පරන්තපො ච හොති පරපරිතාපනානුයොගමනුයුත්තො.

කථඤ්ච පුග්ගලො නෙවත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො හොති න පරපරිතාපනානුයොගමනුයුත්තො: සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති: ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති, තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො.

---

1. මුද්ධාවසිත්තො – සීමු. මජ්ඣං
*. ගොඝාතකො – ස්‍යා, මජ්ඣං, අධිකං
2. සන්ධාගාරං – මජ්ඣ.
   සන්ථාගාරං – ස්‍යා, ප.
3. ඛරාජිනං – සීමු.
4. මගවිසාණෙන – සීමු.
5. කණ්ඩුවමානො – ස්‍යා, මජ්ඣං.
6. පරහිංසත්ථාය – සීමු.

කෙසේ නම් පුද්ගල මෙරමා තවන්නේ මෙරමා තවන යොගයෙහි යෙදුණේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් එළු වැදි හූරු වැදි ලිහිණි වැදි මුව වැදි රෞද්‍ර කෙවුළු සොර චොරවධක බන්ධනාගාරගොපක වෙයි. අන්‍ය වූ හෝ කිසි ක්‍රෑර ක්‍රියා කරන්නෙක් වේ. මෙසේ පුද්ගල මෙරමා තවන්නේ මෙරමා තවන යොගයෙහි යෙදුණේ වේ.

කෙසේ නම් පුද්ගල ආත්මය තවන්නේ ආත්මය තවන යොගයෙහි යෙදුණේත් පරා තවන්නේ පර තවන යොගයෙහි යෙදුණේත් වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් ක්ෂත්‍රිය වූ මුදුනෙහි අභිෂෙක ලද කැත්මහරජ හෝ වෙයි. බමුණු මහසල් හෝ වෙයි. හෙතෙම නුවරට පැදුම් දිග නව යාගශාලාවක් කරවා, කෙස්රැවුළු හරවා කුරසහිත අඳුන්-දිවිසමක් හැඳ, ගිතෙලින් හා තලතෙලින් සිරුර පිරිමැද, මුවහඟින් පිට කසමින් මෙහෙසිය හා පෙරෙවි බමුණා සමග යාගශාලාවට පිවිසෙයි. හෙතෙම එහි ඇතිරිලි රහිත ගොම පිරිමැදි බිම සයනය කරයි. සමාන වස්සකු ඇති එක් දෙනක ගේ එක් තනයක යම් කිරෙක් වේ ද එයින් රජ යැපෙයි දෙවැනි තනයෙහි යම් කිරෙක් වේ ද එයින් මෙහෙසිය යැපෙයි. තුන්වැනි තනයෙහි යම් කිරෙක් වේ ද එයින් පෙරෙවි බමුණා යැපෙයි. සිව් වැනි තනයෙහි යම් කිරක් වේ ද එයින් ගිනි පුදයි. සෙස්සෙන් වස්සා යැපෙයි.

හෙතෙම මෙසේ කියයි: 'මෙතෙක් ගොන්නු යාගයට මරනු ලැබෙත්වා, මෙතෙක් නාඹු ගොන්නු යාගයට මරනු ලැබෙත්වා මෙතෙක් නැඹි දෙන්නු යාගයට මරනු ලැබෙත්වා, මෙතෙක් එළුවෝ යාගයට මරනු ලැබෙත්වා මෙතෙක් බැටළුවෝ යාගයට මරනු ලැබෙත්වා, මෙතෙක් රුක් යාගස්තම්භය පිණිස කපනු ලැබෙත්වා, අවුරනු අතුරනු පිණිස මෙතෙක් ඉලුප් කපනු ලැබේවා' යි ඔහුගේ දස වූ හෝ සෙවක වූ හෝ කම්කරු වූ හෝ යම් කෙනෙකුන් වෙත් නම් ඔහු ද දඬුවමින් තැතිගත්තාහු බියෙන් තැති ගත්තාහු කඳුළු මුව ඇති ව හඬමින් අතවර කරත්. මෙසේ පුද්ගල තෙමේ ආත්මය තවන්නේ ආත්මය තවන යොගයෙහි යෙදුණේත් පරා තවන්නේ පරා තවන යොගයෙහි යෙදුණේත් වේ.

කෙසේ නම් පුද්ගල තමා නො කවන්නේ මැ තමා තවන යොග-යෙහි නො යෙදුණේත් පරා නො තවන්නේ පරා තවන යොගයෙහි නො යෙදුණේත් වේ ද යත්: හෙතෙම තමා නො තවන්නේ පරා නො තවන්නේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳුනේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයෙන් යුක්ත වැ වෙසෙයි. මේ ලොකයෙහි තථාගත වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ වූ විද්‍යාචරණ සම්පන්න වූ මනා ගමන් ඇති ලොව දන්නා වූ නිරුත්තර වූ පුරුෂදම්‍යසාරථී වූ දෙව්මිනිසුන්ට ශාස්තෘ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ උපදිති. උන්වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙලොව මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව තුමූ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරති. උන්-වහන්සේ මුල යහපත් වූ මැද යහපත් වූ කෙළවර යහපත් වූ අරුත් සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ සියල්ල සම්පූර්ණ වූ ධර්මය දෙසති. පිරිසුදු බ්‍රහ්ම-චර්‍ය්‍යාව ප්‍රකාශ කරති. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන්‍යතර වූ කුලයක උපන්නෙක් හෝ අසයි.

සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති, සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසඤ්චික්ඛති: සම්බාධො ඝරාවාසො රජාපථො, අබ්භොකාසො පබ්බජ්ජා, නයිදං සුකරං ආගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා ආගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති, සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය, මහන්තං වා භොගක්ඛන්ධං පහාය, අප්පං වා ඤාතිපරිවට්ටං පහාය, මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා, අගාරස්මා අනගාරියං පබ්බජති.

සො එවං පබ්බජිතො සමානො භික්ඛූනං සික්ඛාසාජීවසමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති, අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාමධම්මා, මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනාවාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං ආක්ඛාතා අමූසං භෙදාය, භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා, සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසාවාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනියා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං.

හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ලබයි. හෙතෙම ඒ ශ්‍රද්ධා ප්‍රතිලාභයෙන් යුක්ත වූයේ මෙසේ නුවණින් සලකයි. ‘ගෘහවාසය පරිරොධයෙකි, කෙලෙස් රජස් නැඟෙන තැනෙකි, පැවිද්ද අභ්‍යවකාශයෙකි, ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පරිපූර්ණ වූ එකාන්තයෙන් පරිශුද්ධ වූ සංඛලිඛිත (ලියැවූ සකක් බඳු) මේ බඹසරෙහි හැසිරෙන්නට සුකර නො වේ, මම කෙස් රැවුළු හරවා කහවත් හැඳගෙන ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැ’ යි හෙතෙම පසු කලෙක අල්ප හෝ භොගයන් හැර දමා මහත් වූ හෝ භොගයන් හැරදමා අල්ප වූ හෝ නෑදැයන් හැරදමා මහත් වූ හෝ නෑදැයන් හැරදමා කෙස් රැවුළු හරවා කහවත් හැඳපෙරෙව ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදි වෙයි.

හේ මෙසේ පැවිදි වූයේ භික්ෂූන් ගේ ශික්ෂා සංඛ්‍යාත සභජීවයට පැමිණියේ ප්‍රාණවධ හැර ප්‍රාණවධයෙන් වැළකුණේ වෙයි. බහා තබූ දඬු ඇත්තේ බහා තැබූ අවි ඇත්තේ ලජ්ජා ඇතියේ දයාවට පැමිණියේ සියලු ප්‍රාණභූතයනට හිත–අනුකම්පා ඇත්තේ වෙසෙයි. නුදුන්දැය ගැනුම හැර නුදුන්දැය ගැනීමෙන් වෙන් වූයේ වෙයි. දුන්දැය ගන්නා සුලු වූයේ දුන්දැය කැමැති වනසුලු වූයේ නො සොර වූ පිරිසුදු වූ ආත්ම-යෙන් යුතු ව වෙසෙයි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර බ්‍රහ්මචාරී වෙයි, අබ්‍රහ්ම-චර්‍ය්‍යායෙන් දුරු වූයේ ග්‍රාම්‍යධර්ම වූ මෛථුනයෙන් වෙන් වූයේ වෙයි. මුසවා හැර පියා මුසවායෙන් වෙන් වූයේ සත්‍යය වාදී වූයේ සත්‍යයෙන් සත්‍යය ගළපන්නේ ස්ථිර කථා ඇතියේ හැදහිය යුත්තේ ලොව නොරව-ටනුයේ වෙයි. පිසුනුබස් හැරපියා පිසුනුබසින් වෙන් වූයේ වෙයි. මෙතැනින් අසා මොවුන් ගේ බිඳීම පිණිස එතැන නො කියන්නේ යැ, එතැනින් හෝ අසා තුලුන්ගේ බිඳීම පිණිස මෙතැන නො කියන්නේ යැ, බිඳුණුවුන් සමගි කරනුයේ හෝ වෙයි. සමගිවූවන් දැඩි කරන්නේ හෝ වෙයි, සමගියෙහි කැමැති වූයේ සමගියෙහි ඇලුණේ සමගියෙහි සතුටු වූයේ සමගි කරුණු වූ වදන් කියන්නේ වේ. රළුවදන් හැරපියා රළුවදනින් වෙන් වූයේ වෙයි. යම් ඒ වචනයෙක් නිදෙස් ද කනට සුව ද ඇලුම් කටයුතු ද හෘදයංගම ද නාගරික ද බොහෝ දෙන අදනාසුලු ද, බොහෝ දෙනා ගේ මනවඩන්නෝ ද එබඳු වදන් කියන්නේ වේ. තුළුල් තෙපුල් (හිස් වදන) හැරදමා තුළුල් තෙපුලින් වෙන් වූයේ වෙයි, නිසි කල්හි කියන්නේ තථ්‍යය කියන්නේ වැඩ ඇති තෙපුල් කියන්නේ ධර්මවාදියෙක් විනයවාදි යෙක් මතක තබා ගත යුතු වදන් කියන්නෙක් අවස්ථානුකූල ව නිදසුන් සහිත ව පිරිසිඳීම් ඇති අරුතින් සැදුණු වදන් කියන්නෙක් වේ.

සො බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති, එකභත්තිකො හොති රත්තූපරතො විරතො විකාලභොජනා, නච්චගීතවාදිතවිසූකදස්සනා පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති, උච්චාසයනමහාසයනා පටිවිරතො හොති, ජාතරූපරජතපටිග්ගහණා පටිවිරතො හොති, ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති, ආමකමංසපටිග්ගහණා පටිවිරතො හොති, ඉත්ථිකුමාරිකපටිග්ගහණා පටිවිරතො හොති, දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා පටිවිරතො හොති, කුක්කුටසූකරපටිග්ගහණා පටිවිරතො හොති, හත්ථිගවාස්සවළවාපටිග්ගහණා පටිවිරතො හොති, ඛෙත්තවත්ථුපටිග්ගහණා පටිවිරතො හොති, දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති, කයවික්කයා පටිවිරතො හොති, තුලාකූටකංසකූටමානකූටා පටිවිරතො හොති, උක්කොටනවඤ්චනනිකතිසාචියොගා පටිවිරතො හොති, ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති.

සො සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති, සෙය්‍යථාපි පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති. එවමෙව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන පිණ්ඩපාතෙන, යෙන යෙනෙව පක්කමති, සමාදායෙව පක්කමති, සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති.

සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා, -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා-පෙ-කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා-පෙ-මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති.

හෙතෙම බීජගාම භූතගාම විකොපනයෙන් වැළැකියේ වෙයි, රාත්‍රි භොජනයෙන් වෙන් වූයේ විකල්හි වැළඳුමෙන් තොර වූයේ එක් වේලේ වළඳන්නේ වේ, නැටුම් ගැයුම්–වැයුම්–විසූළුදස්නෙන් වෙන් වූයේ වෙයි, මණ්ඩන විභූෂණයට කරුණු වූ මල්ගඳවිලෙවුන් දැරීමෙන් තොරවූයේ වෙයි. උසසුන් මහ අස්නෙන් වෙන් වූයේ වෙයි. රන්රිදී පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, අමු ධාන්‍ය පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, අමුමස් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. ස්ත්‍රීන් හා කුමාරිකාවන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, දැසිදසුන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, එළු බැටළුවන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, කුකුළන් හූරන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, ඇත් අස් ගව වෙළඹුන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. කෙත්වත් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි, දූත ගමන්හි හසුන් ගෙන යැමෙහි යෙදීමෙන් තොර වූයේ වෙයි, ගනු දෙනුයෙන් වෙන් වූයේ වෙයි. තුලාකූට මානකූට දෙකින් වෙන් වූයේ වෙයි. අල්ලස් ගැනීම රැවටීම මායාව ආදී කූට යොගයෙන් වෙන් වූයේ වෙයි, කැපීම් මැරීම් බන්ධන මංපැහැරීම් ගම්පැහැරීම් ආදී සාහසික ක්‍රියායෙන් වෙන් වූයේ වේ.

හෙතෙම සිරුරට පොහොනා පමණ සිවුරින් කුසට පොහොනා පමණ පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි, හෙතෙම යම් යම් තැනෙක්හි මැ යේ නම් ශ්‍රමණ පරිෂ්කාරයන් රැගෙන ම යෙයි. යම්සේ පියාපත් ඇති ළිහිණි යම් යම් තැනෙක්හි පියාඹා නම් තමපිය පත් බර ඇත්තේ මැ පියාඹා ද එපරිද්දෙන් මැ මහණ සිරුරට පොහොනා පමණ සිවුරින් කුසට පොහොනා පමණ පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි. යම් යම් තැනෙක්හි යේ නම් මහණ පිරිකර රැගෙන මැ යේ. හෙතෙම මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් යුක්ත වූයේ අධ්‍යාත්මයෙහි නිදෙස් සුව විඳියි.

හෙතෙම ඇසින් රුවක් දැක නිමිතිගන්නේ නො වෙයි. අනුව්‍යඤ්ජන ගන්නෙ නො වෙයි. යම් කරුණෙකින් චක්ෂුරින්ද්‍රියය සංවර නො කොට වාසය කරන්නා වූ මොහු අභිධ්‍යාදෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහු බඳනාහු නම් ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදියි. චක්ෂුරින්ද්‍රියය රකියි චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් හඬක් අසා... නැහැයෙන් ගඳක් අසා... දිවින් රසයක් විඳ... කයින් පහසක් පැහැස... මනසින් දහමක් දැන නිමිති ගන්නේ නො වෙයි. අනුව්‍යඤ්ජන ගන්නේ නො වෙයි, යම් කරුණෙකින් මනින්ද්‍රියය අසංවෘත ව වසන්නා වූ මොහු අභිධ්‍යා දෞර්මනස්‍ය සංඛ්‍යාත ලාමක අකුශල ධර්මයෝ ලුහුබඳනාහු නම් ඒ මනින්ද්‍රියයාගේ සංවරය කරනු පිණිස පිළිපදී. මනින්ද්‍රියය රකී, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ හෙතෙම මේ නිදෙස් වූ ඉන්ද්‍රිය සංවරයෙන් සමන්වාගත වූයේ ක්ලෙශාභිෂෙක රහිත සුවය විඳියි.

සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, අලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති.

සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං

සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති, අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති, සබ්බපාණභූතහිතානුකම්පී ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති, ථීනමිද්ධං පහාය විගතථීනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති- යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති- තතියං ඣානං උපසම්පජ්ජ විහරති සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති.

හෙතෙම යෑමෙහි ඊමෙහි සිහි එළවා කරන්නේ වෙයි, ඉදිරි බැල්මෙහි අවට බැල්මෙහි සිහි එළවා කරන්නේ වෙයි, අත්පා වක් කිරීමෙහි දික් කිරීමෙහි සිහි එළවා කරන්නේ වෙයි, සඟළ- පා- සිවුරු දැරීමෙහි සිහි එළවා කරන්නේ වෙයි, වැළඳුමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි සිහි එළවා කරන්නේ වෙයි, සුළුදියවටත් මහදියවටත් කිසෙහි සිහි එළවා කරන්නේ වෙයි. ගමනෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි බිණීමෙහි නිහඬ බැව්හි සිහි එළවා කරන්නේ වේ.

හෙතෙම මේ නිදෙස් වූ ශීලස්කන්ධයෙන් යුක්ත වූයේ මේ නිදෙස් වූ ඉන්ද්‍රියසංවරයෙන් ද යුක්ත වූයේ මේ නිදෙස් වූ ස්මෘතිසම්ප්‍රජන්‍යයෙන් ද යුක්ත වූයේ මේ නිදෙස් වූ සන්තෝෂයෙන් ද යුක්ත වූයේ අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කඳුරු යැ ගිරි ගුහා යැ සොහොන යැ වනසෙනසුන යැ අභ්‍යවකාශ යැ පිදුරුබිස්ස යැ යන විවෙක සෙනසුනක් භජනය කරයි.

හෙතෙම පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආයේ පළක් බැඳ කය සෘජු වැ පිහිටුවා කර්මස්ථානාභිමුඛ වැ සිහි එළවා හිඳියි. හෙතෙම ස්කන්ධ ලොකයෙහි අභිධ්‍යාව හැරපියා පහ වූ අභිධ්‍යා ඇති සිතින් යුතු ව වෙසෙයි. අභිධ්‍යාවෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාදද්වේෂය හැරපියා ව්‍යාපාදරහිත සිත් ඇති ව සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිත–අනුකම්පා ඇති වැ වෙසෙයි. ව්‍යාපාදද්වේෂයෙන් සිත පිරිසුදු කෙරෙයි. ථීනමිද්ධය හැරපියා පහ වූ ථීනමිද්ධ ඇති වැ ආලොකසංඥා ඇති වැ සිහි ඇති වැ සම්‍යක් ප්‍රඥා ඇති වැ වෙසෙයි, ථීනමිද්ධයෙන් සිත පිරිසුදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය හැරපියා නො විසුළ සිත් ඇත්තේ ඇතුළත සන්හුන් සිත් ඇති වැ වෙසෙයි, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරෙයි. විචිකිච්ඡාව හැරපියා තරණය කළ විචිකිච්ඡා ඇත්තේ කුශලධර්මයන්හි සැක රහිත වූයේ වෙසෙයි. විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරෙයි.

හෙතෙම මේ සිත කිලිටි කරන ප්‍රඥාව දුර්වල කරන පඤ්චනීවරණයන් දුරු කොට කාමයන්ගෙන් වෙන් වැ මැ අකුශල ධර්මයන් ගෙන් වෙන් වැ මැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීති සුඛ ඇති ප්‍රථමධ්‍යානය උපයා වාස කෙරෙයි. විතර්කවිචාරයන් ගේ ව්‍යපසමයෙන් අධ්‍යාත්මයෙහි ප්‍රසාදය ඇති කරන්නා වූ චිත්තයා ගේ එකඟ බව යැ යි කියන ලද විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ද්විතීයධ්‍යානයට එළඹ වාස කෙරෙයි. ප්‍රීතිය ගේ ද විරාගයෙන් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥා ඇත්තේ වෙසෙයි. කයින් සමාධි සුවය ද විඳියි. උපෙක්ෂක යැ ස්මෘතිමත් යැ සුඛවිහාරී යැ යි ආර්යයෝ ඒ යමකට කියත් නම් එකී තෘතීයධ්‍යානය උපයා වාස කෙරෙයි. සුඛයා ගේ ප්‍රහාණයෙන් දුඃඛයා ගේ ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස්දොම්නසුන් ගේ අස්තංගමයෙන් නිදුක් වූ නො සුව වූ උපෙක්ෂාස්මෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානය උපයා වාස කෙරෙයි.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනින්නාමෙති, සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො, චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවංනාමො -පෙ- එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති, ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කාය දුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

හෙතෙම මෙසේ සිත සමාධියට ගිය කල්හි පිරිසිදු වූ කල්හි හාත්පසින් නිර්මල වූ කල්හි කෙලෙස් රහිත වූ කල්හි පහ වූ උපක්ලෙශයන් ඇති කල්හි මෘදු වූ කල්හි කර්මක්‍ෂම වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි පූර්වනිවාසානුස්මෘති ඥානය පිණිස සිත නැඹුරු කෙරෙයි. හෙතෙම අනෙක ප්‍රකාර වූ පූර්වනිවාසය සිහි කෙරෙයි. කෙසේ යැ යත්: 'එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද, ජාති විස්සක් ද, ජාති තිසක් ද, ජාති සතලිසක් ද, ජාති පණසක් ද, ජාති සියයක් ද, ජාති දහසක් ද, ජාති සියදහසක් ද, නොයෙක් සංවර්ත කල්පයන් ද නොයෙක් විවර්ත කල්පයන් ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද, අසුවල් තැන මෙබඳු නම්, මෙබඳු ගොත් මෙ බඳු රූ මෙබඳු අහර ඇත්තෙම් වීමි. මෙබඳු සුවදුක් විඳියෙමි. මෙබඳු ආයු ඇත්තෙම් වීමි. ඒ මම එතැනින් ච්‍යුත වූයෙම් අසුවල් තැන උපන්මි. එහි දු මෙබඳු නම් ... මෙබඳු ආයු කෙළවර ඇත්තෙම් වීමි. ඒ මම එයින් සැව මෙහි උපන්මී' මෙසේ ආකාර සහිත වැ, උද්දෙශ සහිත වැ අනෙක ප්‍රකාර වූ පූර්වනිවාසය සිහි කෙරේ.

හෙතෙම මෙසේ සිත එකඟ වූ කල්හි පිරිසිදු වූ කල්හි හාත්පසින් නිර්මල වූ කල්හි කෙලෙස් රහිත වූ කල්හි පහ වූ උපක්ලෙශයන් ඇති කල්හි, මෘදු වූ කල්හි කර්මයොග්‍ය වැ සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි සත්වයන් ගේ චුතූපපාත ඥානය පිණිස සිත නැඹුරු කෙරෙයි. හෙතෙම මිනිස් බව ඉක්ම වූ පිරිසිදු වූ දිවැසින් සතුන් බලයි. මැරෙන උපදින හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගත වූ දුර්ගත වූ කම් වූ පරිදි ගිය සත්වයන් දැනගනී. එකාන්තයෙන් මේ භවත් සත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටික වූවාහු මිසදිටුකම් සමාදන් වූවාහු යැ. ඔහු කරජකායයාගේ භෙදයෙන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස වැ පතිත වන නිරයෙහි උපන්නාහු යැ, තවද මේ භවත් සත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට උපවාද නො කළාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහු යැ, ඔහු කාබුන් මරණින් මතු ශොභනගති ඇති ස්වර්ග ලොකයට පැමිණියාහු යැ යි මෙසේ මිනිස් බව ඉක්ම වූ පිරිසිදු වූ දිවැසින් සත්වයන් බලයි. මැරෙන උපදින හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගත වූ දුර්ගත වූ කම් වූ පරිදි ගිය සත්වයන් දැනගනී.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති, සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති, ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති, අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. එවං පුග්ගලො නෙව අත්තන්තපො හොති න අත්තපරිතාපනානුයොගමනුයුත්තො, න පරන්තපො හොති න පරපරිතාපනානුයොගමනුයුත්තො. සො අනත්තන්තපො අපරන්තපො දිට්ඨෙව ධම්මෙ නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

25. කතමො ච පුග්ගලො සරාගො: යස්ස පුග්ගලස්ස රාගො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො සරාගො. කතමො ච පුග්ගලො සදොසො, යස්ස පුග්ගලස්ස දොසො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො සදොසො. කතමො ච පුග්ගලො සමොහො: යස්ස පුග්ගලස්ස මොහො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො සමොහො. කතමො ච පුග්ගලො සමානො, යස්ස පුග්ගලස්ස මානො අප්පහීනො, අයං වුච්චති පුග්ගලො සමානො.

26. කථඤ්ච පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය, ඉධෙ'කච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං න ලාභී ලොකුත්තරමග්ගස්ස වා ඵලස්ස වා එවං පුග්ගලො ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤාධම්මවිපස්සනාය.

හෙතෙම මෙසේ සිත එකඟ වූ කල්හි පිරිසිදු වූ කල්හි භාත්පසින් නිර්මල වූ කල්හි කෙලෙස් රහිත වූ කල්හි උපක්ලේශයන් පහ වැ ගිය කල්හි මෘදුවූ කල්හි කර්මයොග්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි ආශ්‍රවක්ෂයඥානය පිණිස සිත නැමුරු කෙරෙයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දැන ගනී. මේ දුක් උපදනා හෙතු යැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැතිකිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. මොහු ආශ්‍රවයෝ යි ඇති සැටියෙන් දැනගනී. මේ ආශ්‍රව උපදනා හෙතු යැ යි ඇති සැටියෙන් දැන ගනී. මේ ආශ්‍රව නැති කිරීමැ යි ඇති සැටියෙන් දැනගනී. මේ ආශ්‍රව නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. ඔහු මෙසේ දන්නා කල්හි මෙසේ දක්නා කල්හි කාමාශ්‍රවයෙන් සිත මිදෙයි. භවාශ්‍රවයෙනුදු සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙනුදු සිත මිදෙයි. මිදුණු කල්හි මිදිණැ යි නුවණ ඇති වෙයි ''ජාතිය ක්ෂය වූවා ය බඹසර වැස නිමවන ලද, කළ යුත්ත කරන ලද, මේ අර්හත්වය පිණිස (කළ යුතු) අනෙකක් නැතැ යි දැනගනී. මෙසේ පුද්ගල ආත්මය (තමා) නො තවනනේ මැ ආත්මය තවන යොගයෙහි නො යෙදුණේ වෙයි. පරා නො තවන්නේ පරා තවන යොගයෙහි නො යෙදුණේ වේ. හෙතෙම තමා නො තවන්නේ පරා නො තවන්නේ මෙ අත්බැව්හි මැ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳුනේ ශ්‍රෙෂ්ඨ වූ ආත්මයකින් යුතු වැ වාස කෙරේ.

25. 'සරාග' පුද්ගල කවරේ ද යත්: යම් පුද්ගලයක්හු ගේ රාගය ප්‍රහීණ නො වූයේ ද, මේ පුද්ගල 'සරාග' යැ යි කියනු ලැබේ. 'සදෙස්' පුද්ගල කවරේ ද යත්: යම් පුද්ගලයක්හු ගේ ද්වේෂය ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'සදෙස' යැ යි කියනු ලැබේ. 'සමොහ' පුද්ගල කවරේ ද යත්: යම් පුද්ගලයක්හුගේ මොහය ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'සමොහ' යැ යි කියනු ලැබේ. 'සමාන' පුද්ගල කවරේ ද යත්: යම් පුද්ගලයක්හුගේ මානය ප්‍රහීණ නො වූයේ ද මේ පුද්ගල 'සමාන' යැ යි කියනු ලැබේ.

26. කෙසේ නම් පුද්ගල 'ආධ්‍යාත්මික චිත්තසමථය ලබන්නේ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාව (ස්කන්ධාදියෙහි අනිත්‍යාදිවශයෙන් පවත්නා විදර්ශනාව) නො ලබන්නේ' වෙ ද යත්: මෙ සස්නෙහි කිසි පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූපසහගත වූ හෝ සමාපත්තීන් ලබන සුලු යැ, ලොකොත්තර මාර්ගය හෝ ඵලය නො ලබනසුලු වෙයි. මෙසේ පුද්ගල ආධ්‍යාත්මික 'චිත්තසමථය ලබන්නේ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාව නො ලබන්නේ' වෙ.

කථඤ්ච පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤධම්මවිපස්සනාය න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස: ඉධෙ'කච්චො පුග්ගලො ලාභී හොති ලොකුත්තරමග්ගස්ස වා ඵලස්ස වා, න ලාභී රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං එවං පුග්ගලො ලාභී හොති අධිපඤ්ඤධම්මවිපස්සනාය න ලාභී අජ්ඣත්තං චෙතොසමථස්ස.

කථඤ්ච පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස ලාභී ච හොති අධිපඤ්ඤධම්මවිපස්සනාය: ඉධෙ'කච්චො පුග්ගලො ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, ලාභී ලොකුත්තරමග්ගස්ස වා ඵලස්ස වා එවං පුග්ගලො ලාභී චෙව හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, ලාභී අධිපඤ්ඤධම්මවිපස්සනාය.

කථඤ්ච පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතො සමථස්ස, න ලාභී අධිපඤ්ඤධම්මවිපස්සනාය: ඉධෙ'කච්චො පුග්ගලො නෙව ලාභී හොති රූපසහගතානං වා අරූපසහගතානං වා සමාපත්තීනං, ලාභී න ලොකුත්තරමග්ගස්ස වා ඵලස්ස වා එවං පුග්ගලො නෙව ලාභී හොති අජ්ඣත්තං චෙතොසමථස්ස, න ලාභී අධිපඤ්ඤධම්මවිපස්සනාය.

27. කතමො ච පුග්ගලො අනුසොතගාමී: ඉධෙකච්චො පුග්ගලො කාමෙ ච පටිසෙවති පාපඤ්ච කම්මං කරොති, අයං වුච්චති පුග්ගලො අනුසොතගාමී.

කතමො ච පුග්ගලො පටිසොතගාමී: ඉධෙ'කච්චො පුග්ගලො කාමෙ ච න සෙවති, පාපඤ්ච කම්මං න කරොති, සො සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛො රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, අයං වුච්චති පුග්ගලො පටිසොතගාමී.

කතමො ච පුග්ගලො ඨිතත්තො: ඉධෙ'කච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, අයං වුච්චති පුග්ගලො ඨිතත්තො.

කෙසේ නම් පුද්ගල 'අධිප්‍රඥධර්මවිදර්ශනාව ලබන්නේ ආධ්‍යාත්මික චිත්තශමථය ලබන්නේ' වේ ද යත්: මෙ සස්නෙහි කිසි පුද්ගලයෙක් ලොකොත්තරමාර්ගය හෝ ඵලය ලබනසුලු යැ රූපසහගත (රූපාවචර) වූ හෝ අරූපසහගත (අරූපාවචර) වූ හෝ සමාපත්තීන් නො ලබනසුලු වෙයි. මෙසේ පුද්ගල 'අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාව ලබන්නේ ආධ්‍යාත්මික චිත්තශමථය නො ලබන්නේ' වේ.

කෙසේ නම් පුද්ගල 'ආධ්‍යාත්මික චිත්තශමථය ලබන්නේ මැ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාවත් ලබන්නේ වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් රූපසහ ගත වූ හෝ අරූපසහගත වූ සමාපත්තීන් ලබන සුලු යැ, ලොකොත්තරමාර්ගය හෝ ඵලය ලබනසුලු වෙයි. මෙසේ පුද්ගල 'ආධ්‍යාත්මික චිත්තශමථය ලබන්නේ මැ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාවත් ලබන්නේ' වේ.

කෙසේ නම් පුද්ගල 'ආධ්‍යාත්මික චිත්තශමථය නො ලබන්නේ මැ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාවත් නො ලබන්නේ' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් රූපසහගත වූ හෝ අරූප සහගත වූ හෝ සමාපත්තීන් නො ලබන්නේ මැ වෙයි. ලොකොත්තරමාර්ගය හෝ ඵලයත් නො ලබනසුලු යැ, මෙසේ පුද්ගල ආධ්‍යාත්මික චිත්තශමථය නො ලබන්නේ මැ අධිප්‍රඥ සංඛ්‍යාත ධර්මවිදර්ශනාවත් නො ලබන්නේ වේ.

27. 'අනුසොතගාමී' පුද්ගල කවරේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් කාමයන් ද සෙවනය කෙරෙයි පව්කම් ද කෙරෙයි, මේ පුද්ගල 'අනුසොතගාමී' යැ යි කියනු ලැබේ.

'පටිසොතගාමී' පුද්ගල කවරේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් කාමයන් ද සෙවනය නො කෙරෙයි. පව් කම් ද නො කෙරෙයි හෙතෙම දුක් සහිත වැ මැ දෙමනස් සහිත වැ මැ කඳුළු මුව ඇත්තේ හඬමින් පිරිපුන් පිරිසුදු බඹසර රකී. මේ පුද්ගල 'පටිසොතගාමී' යැයි කියනු ලැබේ.

'ස්ථිතාත්ම' (නැවැතුණු ස්වභාව ඇති) පුද්ගල කවරේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ඔපපාතික වූයේ ඒ සුද්ධාවාස බඹලොව්හි පිරිනිවෙනුයේ එලොවින් පෙරළා නො එන ස්වභාව ඇත්තේ වෙයි. මේ පුද්ගල 'ස්ථිතාත්ම' යැ යි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො: ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති පුග්ගලො තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

28. කථඤ්ච පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන අනුප්පන්නො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස අප්පකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යා– කරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, සො තස්ස අප්පකස්ස සුතස්ස න අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානු ධම්මපටිපන්නො හොති. එවං පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන අනුප්පන්නො.

කථඤ්ච පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන උප්පන්නො: ඉධෙ කච්චස්ස පුග්ගලස්ස අප්පකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, සො තස්ස අප්පකස්ස සුතස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති. එවං පුග්ගලො අප්පස්සුතො හොති සුතෙන උප්පන්නො.

කථඤ්ච පුග්ගලො බහුස්සුතො හොති සුතෙන අනුප්පන්නො: ඉධෙ'කච්චස්ස පුග්ගලස්ස බහුකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යා– කරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, සො තස්ස බහුකස්ස සුතස්ස න අත්ථමඤ්ඤාය න ධම්මමඤ්ඤාය න ධම්මානු ධම්මපටිපන්නො හොති, එවං පුග්ගලො බහුස්සුතො හොති සුතෙන අනුප්පන්නො,

කථඤ්ච පුග්ගලො බහුස්සුතො හොති සුතෙන උප්පන්නො: ඉධෙ' කච්චස්ස පුග්ගලස්ස බහුකං සුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං සො තස්ස බහුකස්ස සුතස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මපටිපන්නො හොති, එවං පුග්ගලො බහුස්සුතො හොති සුතෙන උප්පන්නො,

කවර පුද්ගලයෙක් (තෘෂ්ණා ස්‍රොතස) තරණය කොළේ නිවන් නැමැති පරතෙරට ගියේ අර්හත්ඵලසමාපත්ති නැමැති ස්ථලයෙහි සිටුනා 'බ්‍රාහ්මණ' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව රහිත වූ චිත්තවිමුක්තියත් ප්‍රඥාවිමුක්තියත් මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙයි. මේ පුද්ගල තරණය කළ එතෙරට ගිය ස්ථලයෙහි සිටුනා 'බ්‍රාහ්මණ' වේ.

28. කෙසේ නම් පුද්ගල 'අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයක්හු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන මොහු මඳක් අසන ලද්දාහු වෙති. හෙතෙම ඒ අසන ලද මඳ දැයෙහි අර්ථය දැනගෙන ධර්මය දැන ගෙන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ නො වෙයි. මෙසේ පුද්ගල 'අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න' වේ.

කෙසේ නම් පුද්ගල 'අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයක්හු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන මොහු මඳ කොට අසන ලද්දාහු වෙති. හෙතෙම ඒ අසන ලද ම දැයෙහි අර්ථය දැනගෙන ධර්මය දැනගෙන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වෙයි. මෙසේ පුද්ගල 'අල්පශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න' වේ.

කෙසේ නම් පුද්ගල 'බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයක්හු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන මොහු බොහෝ කොට අසන ලද්දාහු වෙති. හෙතෙම ඒ බොහෝ කොට අසන ලද දැයෙහි අර්ථය දැන ගෙන ධර්මය දැනගෙන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ නො වෙයි. මෙසේ පුද්ගල 'බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් අනුත්පන්න' වේ.

කෙසේ නම් පුද්ගල 'බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයක්හු විසින් සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදාන ඉතිවුත්තක ජාතක අද්භූතධර්ම වෙදල්ල යන මොහු බොහෝ කොට අසන ලද්දාහු වෙති, හෙතෙම ඒ බොහෝ කොට අසන ලද දැයෙහි අර්ථය දැනගෙන ධර්මය දැනගෙන ධර්මානුධර්මයෙහි පිළිපන්නේ වෙයි. මෙසේ පුද්ගල බහුශ්‍රැත වූයේ ශ්‍රැතයෙන් උත්පන්න' වේ.

29. කතමො ච පුග්ගලො සමණමචලො: ඉධෙ'කච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො, අයං වුච්චති පුග්ගලො සමණමචලො.

කතමො ච පුග්ගලො සමණපදුමො: ඉධෙ'කච්චො පුග්ගලො තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති, අයං වුච්චති පුග්ගලො සමණපදුමො.

කතමො ච පුග්ගලො සමණපුණ්ඩරිකො: ඉධෙ'කච්චො පුග්ගලො පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඕපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා, අයං වුච්චති පුග්ගලො සමණපුණ්ඩරිකො.

කතමො ච පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො: ඉධෙ'කච්චො පුග්ගලො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයං වුච්චති පුග්ගලො සමණෙසු සමණසුඛුමාලො.

**චතුක්ක නිද්දෙසො නිට්ඨිතො.**

29. කවර නම් පුද්ගලයෙක් 'සමණමචල' (අචල ශ්‍රමණ) වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් සංයොජනත්‍රයක්හු ගේ ක්ෂයකිරීමෙන් සොතාපන්න වූයේ විනිපාත ස්වභාව නැත්තේ (මාර්ග) නියත වූයේ සම්බෝධිය පිහිට කොට ඇත්තේ වෙයි. මේ පුද්ගල 'ශ්‍රමණාචල' යැ යි කියනු ලැබේ.

කවර නම් පුද්ගලයෙක් 'ශ්‍රමණ පද්ම' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් සංයොජනත්‍රයක්හු ගේ ක්ෂය කිරීමෙන් රාග ද්වේෂ මොහයන් ගේ තුනී බැවින් සකෘදගාමී වෙයි. වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මේ පුද්ගල 'ශ්‍රමණපද්ම' යැ යි කියනු ලැබේ.

කවර නම් පුද්ගලයෙක් 'ශ්‍රමණපුණ්ඩරීක' වේ ද යත්: මෙ සසුන්හි කිසි පුද්ගලයෙක් පඤ්චවිධ ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ඖපපාතික වූයේ එහි පිරිනිවෙනසුලු වූයේ එලොවින් පෙරළා නො එන ස්වභාව ඇත්තේ වෙයි. මේ පුද්ගල 'ශ්‍රමණ පුණ්ඩරීක' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් ශ්‍රමණයන් අතුරෙහි 'ශ්‍රමණසුකුමාර' වේ ද යත්: මෙසසුන්හි කිසි පුද්ගලයෙක් ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව රහිත වූ චිත්ත විමුක්තියත් (ඵලසමාධිය) ප්‍රඥා විමුක්තිය (ඵල ප්‍රඥාව) ත් මෙ අත්බැව්හි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙයි. මේ පුද්ගල ශ්‍රමණයන් අතුරෙහි 'ශ්‍රමණසුකුමාර' යැ යි කියනු ලැබේ.

**චතුෂ්ක නිර්දේශය නිමියේ.**

## 5. පඤ්චක නිද්දෙසො

1. තත්‍ර යවායං පුග්ගලො ආරම්භති[1] ච විප්පටිසාරී ච හොති. තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවමස්ස වචනීයො: ආයස්මතො ඛො ආරම්භජා ආසවා සංවිජ්ජන්ති, විප්පටිසාරජා ච ආසවා පවඩ්ඪන්ති, සාධුවතායස්මා ආරම්භජෙ ආසවෙ පහාය විප්පටිසාරජෙ ආසවෙ පටිවිනොදෙත්වා චිත්තං පඤ්ඤඤ්ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතීති.

තත්‍ර යවායං පුග්ගලො ආරම්භති න විප්පටිසාරී හොති. තඤ්ච චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එව මස්ස වචනීයො-ආයස්මතො ඛො ආරම්භජා ආසවා සංවිජ්ජන්ති, විප්පටිසාරජා ආසවා නප්පවඩ්ඪන්ති, සාධුවතායස්මා ආරම්භජෙ ආසවෙ පහාය චිත්තං පඤ්ඤඤ්ච භාවෙතු එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතීති.

තත්‍ර යවයං පුග්ගලො න ආරම්භති, විප්පටිසාරී හොති, තඤ්ච චෙතො විමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති, යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවමස්ස වචනීයො-ආයස්මතො ඛො ආරම්භජා ආසවා න සංවිජ්ජන්ති, විප්පටිසාරජා ආසවා පවඩ්ඪන්ති, සාධු වතායස්මා විප්පටිසාරජෙ ආසවෙ පටිවිනොදෙත්වා චිත්තං පඤ්ඤඤ්ච භාවෙතු. එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතීති.

තත්‍ර යවායං පුග්ගලො නාරම්භති න විප්පටිසාරී හොති, තඤ්ච චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං යථාභූතං නප්පජානාති. යත්ථස්ස තෙ උප්පන්නා පාපකා අකුසලා ධම්මා අපරිසෙසා නිරුජ්ඣන්ති. සො එවමස්ස වචනීයො-ආයස්මතො ඛො ආරම්භජා ආසවා න සංවිජ්ජන්ති, විප්පටිසාරජා ආසවා නප්පවඩ්ඪන්ති. සාධු වතායස්මා චිත්තං පඤ්ඤඤ්ච භාවෙතු එවමායස්මා අමුනා පඤ්චමෙන පුග්ගලෙන සමසමො භවිස්සතීති. ඉති ඉමෙ චත්තාරො පුග්ගලා අමුනා පඤ්චමෙන පුග්ගලෙන එවං ඔවදියමානා, එවං අනුසාසියමානා අනුපුබ්බෙන ආසවානං ඛයං පාපුණන්ති.

1. ආරභති - මජ්සං

# 5. පඤ්චක නිර්දේශය

1. ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ඇවැතට පැමිණෙන්නේත් විපිළිසර වන්නේත් වේ ද, යම් තැනක ඔහුට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් ඇති සැටියෙන් නො දනී ද හෙතෙම මෙසේ කියයුතු වන්නේ යැ. (කෙසේ ද.) ''ආයුෂ්මතුන් ගේ ඇවැතට පැමිණීමෙන් හටගත් ආශ්‍රවයෝ දක්නා ලැබෙත්. විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ ද වෙසෙසින් වැඩෙත්. ආයුෂ්මත් තෙමේ ඇවැතට පැමිණීමෙන් හටගත් ආශ්‍රවයන් දුරු කොට විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයන් ද බැහැර කොට සමාධියත් විදර්ශනාවත් වඩනු මැනැවි. මෙසේ ආයුෂ්මත් තෙල පස් වැනි (ක්ෂීණාශ්‍රව) පුද්ගලයා හා සමසමයෙක් වන්නේ යැ'' යි.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ඇවැතට පැමිණේ ද විපිළිසර නො වනසුලු වේ ද යම් තැනක ඔහුට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් ඇති සැටියෙන් නො දනී ද, හෙතෙම මෙසේ කිය යුතු වන්නේ යැ, ආයුෂ්මතුන් ගේ ඇවැතට පැමිණීමෙන් හටගත් ආශ්‍රවයෝ දක්නා ලැබෙත්. විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ නො වැඩෙත්. ආයුෂ්මත් ඇවැතට පැමිණීමෙන් හටගත් ආශ්‍රවයන් දුරු කොට සමථයත් විදර්ශනාවත් වඩනු මැනවි. මෙසේ ආයුෂ්මත් තෙල පස් වැනි (ක්ෂීණාශ්‍රව) පුද්ගලයා හා සමසමයෙක් වන්නේ යැ'' යි.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ඇවැතට නො පැමිණේ ද, විපිළිසර වන්නේ ද, යම් තැනක ඔහුට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් ඇති සැටියෙන් නො දනී ද, හෙතෙම මෙසේ කිය යුතු වන්නේ යැ'' ආයුෂ්මතුන් ගේ ඇවැතට පත්වීමෙන් හටගත් ආශ්‍රවයෝ නො දක්නා ලැබෙත්. විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ වෙසෙසින් වැඩෙත්. ආයුෂ්මත් විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයන් බැහැර කොට සමථ විදර්ශනා වඩනු මැනැවි. මෙසේ ආයුෂ්මත් තෙල පස්වැනි (ක්ෂීණාශ්‍රව) පුද්ගලයා හා සමසමයෙක් වන්නේ යැ'' යි.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් ඇවැතට නො පැමිණේ ද, විපිළිසර නො වන්නේ ද යම් තැනක ඔහුට උපන් ඒ ලාමක අකුශලධර්මයෝ නිරවශෙෂයෙන් නිරුද්ධ වෙත් නම් ඒ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් ඇති සැටියෙන් නො දනී ද, හෙතෙම මෙසේ කිය යුතු වන්නේ යැ: ''ආයුෂ්මතුන් ගේ ඇවැතට පැමිණීමෙන් හටගත් ආශ්‍රවයෝ නොදක්නා ලැබෙත්. විපිළිසරයෙන් හටගත් ආශ්‍රවයෝ නො වැඩෙත්. ආයුෂ්මත් සමථවිදර්ශනා වඩනු මැනැවි. මෙසේ ආයුෂ්මත් තෙමේ තෙල පස්වැනි (ක්ෂීණාශ්‍රව) පුද්ගලයා හා සමසමයෙක් වන්නේ යැ යි මෙසේ මේ පුද්ගලයෝ සතරදෙන තෙල පස්වැනි (ක්ෂීණාශ්‍රව) පුද්ගලයා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු අනුක්‍රමයෙන් ආශ්‍රවයන් ගේ ක්ෂය වීමට පැමිණෙත්.

2. කථඤ්ච පුග්ගලො දත්වා අවජානාති: ඉධෙ'කච්චො පුග්ගලො පුග්ගලස්ස දෙති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං තස්ස එවං හොති අහං දම්මි, අයං[1] පතිගණ්හාතීති[2], තමෙනං දත්වා අවජානාති, එවං පුග්ගලො දත්වා අවජානාති.

කථඤ්ච පුග්ගලො සංවාසෙන අවජානාති: ඉධෙ'කච්චො පුග්ගලො පුග්ගලෙන සද්ධිං සංවසති ද්වෙ වා තීණි වා වස්සානි, තමෙනං සංවාසෙන අවජානාති, එවං පුග්ගලො සංවාසෙන අවජානාති.

කථඤ්ච පුග්ගලො ආධෙය්‍යමුඛො හොති: ඉධෙ'කච්චො පුග්ගලො පරස්ස වණ්ණෙ වා අවණ්ණෙ වා භාසියමානෙ ඛිප්පඤ්ඤෙව අධිමුච්චිතා හොති, එවං පුග්ගලො ආධෙය්‍යමුඛො හොති.

කථඤ්ච පුග්ගලො ලොලො හොති: ඉධෙ'කච්චො පුග්ගලො ඉත්තරසද්ධො හොති, ඉත්තරභත්ති, ඉත්තරපෙමො, ඉත්තරපසාදො, එවං පුග්ගලො ලොලො හොති.

කථඤ්ච පුග්ගලො මන්දො මොමූහො හොති: ඉධෙ'කච්චො පුග්ගලො කුසලාකුසලෙ ධම්මෙ න ජානාති. සාවජ්ජානවජ්ජෙ ධම්මෙ න ජානාති. හීනප්පණීතෙ ධම්මෙ න ජානාති: කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ න ජානාති. එවං පුග්ගලො මොමූහො හොති.

3. තත්‍ථ කතමෙ පඤ්ච යොධාජීවූපමා පුග්ගලා: පඤ්ච යොධාජීවා, ඉධෙ'කච්චො යෙ ධාජීවො රජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති[3] න සක්කොති සංගාමං ඔතරිතුං එවරූපොපි ඉධෙ'කච්චො යොධාජීවො හොති'අයං පඨමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනචපරං ඉධෙ'කච්චො යොධාජීවො සහති රජග්ගං. අපි ච ඛො ධජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං, එවරූපොපි ඉධෙ'කච්චො යොධාජීවො හොති. අයං දුතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

1. අයං, පන – සයා
2. පටිගණ්හාතී ති – සයා. මජ්ඣං.
3. සන්ථම්භති – සී මු.

2. කෙසේ පුද්ගල 'දී අවසනැ අවමන් කෙරේ' ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් පුද්ගලයක් හට සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර දෙයි. ඔහුට ''මම දෙමි, මේ තෙමේ පිළිගනී'' යන මෙ බඳු සිතෙක් වෙයි. ඒ මොහුට 'දී' අවමන් කෙරේ. මෙසේ පුද්ගල 'දී අවමන් කෙරේ.'

කෙසේ නම් පුද්ගල 'සංවාසයෙන් අවමන් කෙරේ' ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් පුද්ගලයකු සමග හවුරුදු දෙකක් හෝ තුනක් හෝ එක් වැ වෙසෙයි. ඒ මොහුට (ගරු සරු නො කිරීමෙන්) සහවාස-යෙන් අවමන් කෙරේ. මෙසේ පුද්ගල 'සහවාසයෙන් අවමන් කෙරේ.'

කෙසේ නම් පුද්ගල 'ආධෙය්‍යමුඛ' (පළමු වචනය තර වැ ගන්නේ) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් අනෙකකු ගේ ගුණයක් හෝ නුගුණයක් හෝ කියනු ලබා කල්හි වහා මැ හදහන්නේ වෙයි. මෙසේ පුද්ගල 'ආධෙය්‍යමුඛ' වේ.

කෙසේ නම් පුද්ගල 'ලොලයෙක්' (සැලෙන්නේ) වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් 'හීනශ්‍රද්ධා' ඇත්තේ, හීනභක්ති ඇත්තේ හීනප්‍රෙම ඇත්තේ හීනප්‍රසාද ඇත්තේ වෙයි. මෙසේ පුද්ගල 'ලොලයෙක්' වේ.

කෙසේ නම් පුද්ගල අඥනයෙක් මහාමුඪයෙක් වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලාකුශලධර්මයන් නො දනී. සාවද්‍ය නිරවද්‍ය ධර්මයන් නො දනි හීනප්‍රණීත ධර්මයන් නො දනී. සප්‍රතිභාග (අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ) වූ කෘෂ්ණශුක්ල ධර්මයන් නො දනී. මෙසේ පුද්ගල 'අඥනයෙක් මහාමුඪයෙක්' වේ.

3. එහි යුදසෙබළුන් බඳු පුද්ගලයෝ පස් දෙන කවරහ යත්: යුදසෙබළු පස් දෙනෙකි: මෙලොව යුදසෙබළෙක් ධූලිකඳ මතු දක නවතී, පසු බසී, දැඩි නො වෙයි, රණබිමට බස්නට නො හැකි වෙයි. මෙලොව මෙබඳු වූ ද යුද සෙබළෙක් වෙයි. මේ තෙමේ ලොවැ ඇති. විද්‍යාමාන වූ පළමුවැනි යුද සෙබළා යි.

තවද අනෙකෙකි: මෙලොව එක් යුදසෙබළෙක් ධූලිකඳ ඉවසයි. එතෙකුදු වත් දද කෙළවර මතු දක නවතී, පසුබසී, නො දැඩි වෙයි, රණබිමට බස්නට නො හැකි වෙයි. මෙහි මෙබඳු වූ ද කිසි යුද සෙබළෙක් වෙයි. මෙ තෙමේ ලොව ඇති දක්නා ලැබෙන දෙවැනි යුදසෙබළා යි.

පුනචපරං ඉධෙ'කච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, අපි ච ඛො උස්සාදනං යෙව සුත්වා සංසීදති, විසීදති න සන්ථම්භති[1] න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. එවරූපො'පි ඉධෙ'කච්චො යොධාජීවො හොති. අයං තතියො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනචපරං ඉධෙ'කච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං. අපි ච ඛො සම්පහාරෙ හඤ්ඤති ව්‍යාපජ්ජති, එවරූපො'පි ඉධෙ'කච්චො යොධාජීවො හොති, අයං චතුත්ථො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

පුනචපරං ඉධෙ'කච්චො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං, සහති සම්පහාරං, සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. එවරූපො'පි ඉධෙ'කච්චො යොධාජීවො හොති අයං පඤ්චමො යොධාජීවො සන්තො සංවිජ්ජමානො ලොකස්මිං.

ඉමෙ පඤ්ච යොධාජීවා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, එවමෙව පඤ්ච යොධාජීවූපමා පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛුසු, කතමෙ පඤ්ච: ඉධෙ'කච්චො භික්ඛු රජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං[2]. සික්ඛා දුබ්බල්‍යං ආවීකත්වා, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. කිමස්ස රජග්ගස්මිං: ඉධ භික්ඛු සුණාති, අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා කුමාරී වා අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතාති. සො තං සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං, සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා[3] සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස රජග්ගස්මිං. සෙය්‍යථාපි සො යොධාජීවො රජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. තථූපමො අයං පුග්ගලො. එවරූපො'පි ඉධෙ'කච්චො පුග්ගලො හොති අයං පඨමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛුසු.

පුනචපරං ඉධෙ'කච්චො භික්ඛු සහති රජග්ගං අපි ච ඛො ධජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං.[2] සික්ඛාදුබ්බල්‍යං ආවීකත්වා, සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති, කිමස්ස ධජග්ගස්මිං: ඉධ භික්ඛු න හෙව ඛො සුණාති, අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා ඉත්ථී වා කුමාරී වා අභිරූපා දස්සනීයා පාසාදිකා පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතාති,

---

1. සන්ථම්භති සීමු. 2. සන්ධාරෙතුං - මජසං,
3. ආවිකත්වා - මජසං

තවද අනෙකෙක්: මෙහි කිසි යුදසෙබළෙක් (රණබිම්හි) ධූලිකඳ ඉවසයි, දද කෙළවර ඉවසයි, එතෙකුදු වත් රණඝොස මතු අසා තවති පසුබසි නො දැඩි වෙයි. රණ බිමට බස්නට නො හැකි වෙයි. මෙහි මෙබඳු වූ ද කිසි යුදසෙබළෙක් වෙයි. මේ තෙමේ ලොවැ ඇති දක්නා ලැබෙන තුන්වැනි යුදසෙබළා යි.

තවද අනෙකෙක්: මෙලොව කිසි යුදසෙබළෙක් ධූලිකඳ ඉවසයි දද අග ඉවසයි. රණඝොස ඉවසයි. එතෙකුදු වත් පහර එක් මැ නැසෙයි, දුර්මුඛ වෙයි. මෙහි මෙ බඳු වූ ද කිසි යුදසෙබළෙක් වෙයි. මේ තෙමේ ලොවැ ඇති දක්නා ලැබෙන සතරවැනි යුදසෙබළා යි.

තවද අනෙකෙක්: මෙහි එක් යුදසෙබළෙක් ධූලි කඳ ඉවසයි. දද අග ඉවසයි රණඝොස ඉවසයි. අවිපහර ඉවසයි හෙතෙම ඒ යුදය ජය ගෙන දිනුයුද ඇත්තේ එ මැ ජය කඳවුරෙහි වාස කෙරෙයි, මෙහි මෙබඳු වූ ද කිසි යුදසෙබළෙක් වෙයි. මේ තෙමේ ලොවැ ඇති, දක්නා ලැබෙන පස්වැනි යුදසෙබළා යි.

මොහු පස්දෙන ලොවැ ඇති දක්නා ලැබෙන යුදසෙබළු යි. එපරිදි මැ භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන යුදසෙබළුනට බඳු පුද්ගලයෝ පස් දෙනෙකි. කවර පස් දෙනෙක් ද යත්: මෙ සසුන්හි එක් මහණෙක් රජග්ගය මැ දැක කිඳෙයි පසුබසී නො දැඩි වෙයි. බඹසර රක්නට නො හැකි වෙයි. ශික්ෂා දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂාප්‍රත්‍යා-ඛ්‍යානය කොට ගිහි වෙයි. ඔහු ගේ රජග්ගය කිමෙක් ද යත්: මෙ සසුනහි මහණ ''අසුවල් නම් ගම්හි හෝ නිගම්හි හෝ ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ මනා රූ ඇත්තී යැ දැකුම්කලු යැ ප්‍රසාද එළවනසුලු යැ උතුම් රූසපු-යෙන් යුක්ත යැ යි අසයි. හෙතෙම එය අසා කිඳෙයි, පසු බසි, නො දැඩි වෙයි. බඹසර රක්නට නො හැකි වෙයි. ශික්ෂා දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි වේ. මේ ඔහු ගේ රජග්ගය යි. යම්සේ මැ ඒ යුදසෙබළ තෙමේ රජග්ගය මැ දැක කිඳේ ද, පසු බසී ද, නො දැඩි වේ ද, රණ බිමට බස්නට නො හැකි වේද, මේ පුද්ගල එබඳු යි. මෙහි මෙබඳු වූ ද පුද්ගලයෙක් වෙයි. මේතෙමෙ භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන පළමු වැනි යුද සෙබළාට බඳු පුද්ගලයා යි.

තවද අනෙකෙක්: මෙ සසුන්හි කිසි මහණෙක් රජග්ගය ඉවසයි. එතෙකුදු වත් ධජග්ගය දැක කිඳෙයි, පසුබසී, නො දැඩි වෙයි, බඹසර පවත්වන්නට නො හැකි වෙයි. ශික්ෂා දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි වෙයි. ඔහුට ධජග්ගය කිමෙක් ද යත්: මෙ සසුන්හි මහණ ''අසුවල් නම් ගම්හි හෝ නිගම්හි හෝ ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ මනාරූ ඇත්තී යැ දැකුම්කලු යැ. ප්‍රසාදය එළවනසුලු යැ.

අපි ච ඛො සාමං යෙව පස්සති[1] ඉත්ථිං වා කුමාරිං වා අභිරූපං දස්සනීයං පාසාදිකං පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතං. සො තං දිස්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං, සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස ධජග්ගස්මිං. සෙය්‍යථාපි සො යොධාජීවො සහති රජග්ගං. අපි ච ඛො ධජග්ගඤ්ඤෙව දිස්වා සංසීදති විසීදති න සන්ථම්භති න සක්කොති සඞ්ගාමං ඔතරිතුං තථූපමො අයං පුග්ගලො. එවරූපොපි ඉධෙ'කච්චො පුග්ගලො හොති. අයං දුතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛුසු.

පුනචපරං ඉධෙ'කච්චො භික්ඛු සහති රජග්ගං සහති ධජග්ගං. අපි ච ඛො උස්සාදනංයෙව සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං[2] සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති, කිමස්ස උස්සාදනාය. ඉධ භික්ඛුං අරඤ්ඤගතං වා, රුක්ඛමූලගතං වා, සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසංකමිත්වා ඌහසති උල්ලපති උජ්ඣග්ඝති උප්පණ්ඩෙති. සො මාතුගාමෙන ඌහසියමානො උල්ලපියමානො උජ්ඣග්ඝියමානො උප්පණ්ඩියමානො සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති බ්‍රහ්මචරියං සන්තානෙතුං' සික්ඛාදුබ්බල්‍යං ආවිකත්වා සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. ඉදමස්ස උස්සාදනාය. සෙය්‍යථාපි සො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං. අපිච ඛො උස්සාදනංයෙව සුත්වා සංසීදති, විසීදති, න සන්ථම්භති, න සක්කොති සඞ්ගාමං ඔතරිතුං. තථූපමො අයං පුග්ගලො, එවරූපොපි ඉධෙ'කච්චො පුග්ගලො හොති. අයං තතියො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛුසු.

පුනචපරං ඉධෙ'කච්චො භික්ඛු සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං. අපි ච ඛො සම්පහාරෙ හඤ්ඤති ව්‍යාපජ්ජති. කිමස්ස සම්පහාරස්මිං. ඉධ භික්ඛුං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසංකමිත්වා අභිනිසීදති, අභිනිපජ්ජති, අජ්ඣොත්ථරති. සො මාතුගාමෙන අභිනිසීදියමානො අභිනිපජ්ජියමානො අජ්ඣොත්ථරියමානො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා මෙථුනං ධම්මං පටිසෙවති, ඉදමස්ස සම්පහාරස්මිං. සෙය්‍යථාපි සො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං. අපිච ඛො සම්පහාරෙ හඤ්ඤති ව්‍යාපජ්ජති තථූපමො අයං පුග්ගලො. එවරූපොපි ඉධෙ'කච්චො පුග්ගලො හොති, අයං චතුත්ථො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛුසු.

---

1. සාමං පස්සති – මජසං　　2. සංධාරෙතුං–මජසං

උතුම් රූසපුයෙන් යුක්ත යැ යි නො මැ අසයි. එතෙකුදු වත් ''මනාරූ ඇති දකුම්කලු වූ ප්‍රසාද එළවනසුලු වූ උතුම් රූසපුයෙන් යුත් ස්ත්‍රියක් හෝ කුමරියක් හෝ තෙමේ මැ දකී. හෙතෙම ඇය දැක කිඳෙයි, පසු බසී, නො දැඩි වෙයි, බඹසර රක්නට නො හැකි වෙයි. ශික්ෂා දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට පෙරළෙයි. මේ ඔහුට ධජග්ග යි. යම් සේ මැ ඒ යුදසෙබළ රජග්ගය ඉවසා ද එතෙකුදු වත් ධජග්ගය මැ දැක කිඳේ ද පසු බසී ද, නො දැඩි වේ ද, රණ බිමට බස්නට නො හැකි වේ ද, මේ පුද්ගල එබඳු යි. මෙහි මෙබඳු වූ ද පුද්ගලයෙක් වෙයි. මේ තෙමේ භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන දෙවැනි යුදසෙබළාට බඳු පුද්ගලයා යි.

තවද අනෙකෙකි: මෙ සසුන්හි කිසි මහණෙක් රජග්ගය ඉවසයි, ධජග්ගය ඉවසයි. එතෙකුදු වත් (රණහඬ) උස්සාදනය මැ අසා කිඳෙයි, පසු බසී, නො දැඩි වෙයි, බඹසර රක්නට නො හැකි වෙයි. ශික්ෂා දුර්වලභාවය ප්‍රකාශ කොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට පෙරළෙයි. ඔහුට (රණහඬ) උස්සාදනය කිමෙක් ද යත්: මෙ සසුන්හි අරණ්‍යගත වූ හෝ වෘක්ෂමූලගත වූ හෝ ශූන්‍යාගාරගත වූ හෝ මහණකු කරා මාගමක් එළඹ මුකුළු කොට සිනා සෙයි, කථා කරයි, හඬනගා සිනා සෙයි, කෙළි කවට බෙණෙයි. හෙතෙම මාගම විසින් මුකුළු කොට සිනාසෙනු ලබන්නේ මුකුළු කොට බණනු ලබන්නේ හඬනගා සිනාසෙනු ලබන්නේ කවටකම් කරනු ලබන්නේ කිඳෙයි, පසු බසී, නොදැඩි වෙයි. බඹසර රක්නට නො හැකි වෙයි, ශික්ෂා දුර්වල බව ප්‍රකාශ කොට ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කොට ගිහි බවට පෙරළෙයි. මේ ඔහුට රණහඬ වෙයි. යම්සේ මැ ඒ යුදසෙබළ රජග්ගය ඉවසා ද ධජග්ගය ඉවසා ද එතෙකුදු වත් උස්සාදනය (රණහඬ) මැ අසා කිඳේ ද පසු බසී ද නො දැඩි වේ ද රණබිමට බස්නට නො හැකි වේ ද, මේ පුද්ගල එබඳු යි. මෙහි මෙබඳු වූ ද පුද්ගලයෙක් වෙයි. මේ තෙමේ භික්ෂූන් අතුරෙහි ඇති දක්නා ලැබෙන තුන්වැනි වූ යුදසෙබළාට බඳු පුද්ගලයා යි.

තවද අනෙකෙකි: මෙ සසුන්හි කිසි මහණෙක් ධූලිකඳ ඉවසයි, දද අග ඉවසයි, රණහඬ ඉවසයි. එතෙකුදු වත් පහර හෙත් මැ නැසෙයි, පෙරළෙ යි. ඔහුට පහර දීම යනු කිමෙක් ද යත්: මෙ සසුන්හි අරණ්‍ය-ගත වූ හෝ වෘක්ෂමූල ගත වූ හෝ ශූන්‍යාගාරගත වූ හෝ මහණකු කරා මාගමක් එළඹ ළඟ හිඳියි, ළඟ හොවියි, මැඩගෙන හිඳියි. හෙතෙම මාගම විසින් ළඟ හිඳිනු ලබන්නේ ළඟ හොවිනු ලබන්නේ මැඩගනු ලබන්නේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නො කොට දුර්වල බව ප්‍රකාශ නො කොට මෛථුනධර්ම සෙවනය කරයි. මේ ඔහුට පහර දීම යි යම්සේ මැ ඒ යුදබළ ධූලිකඳ ඉවසා ද දදඅග ඉවසා ද රණහඬ ඉවසා ද එතෙකුදු වත් පහර හෙත් මැ නැසේ ද වැනැසේ ද මේ පුද්ගල එබඳු යි. මෙහි මෙබඳු වූ ද පුද්ගලයෙක් වේ. මේ තෙමේ භික්ෂූන් අතුරෙහි ඇති, දක්නා ලැබෙන සතර වැනි වූ යුදසෙබළාට බඳු පුද්ගලයා යි.

පුනචපරං ඉධෙ'කච්චො භික්ඛු සහති රජග්ගං, සහති ධජග්ගං සහති උස්සාදනං සහති සම්පහාරං සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිත සඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. කිමස්ස සඞ්ගාමවිජයස්මිං ඉධ භික්ඛුං අරඤ්ඤගතං වා රුක්ඛමූලගතං වා සුඤ්ඤාගාරගතං වා මාතුගාමො උපසංකමිත්වා අභිනිසීදති, අභිනිපජ්ජති අජ්ඣොත්ථරති. සො මාතුගාමෙන අභිනිසීදියමානො අභිනිපජ්ජියමානො අජ්ඣොත්ථරියමානො විනිවෙඨෙත්වා විනිමොචෙත්වා යෙන කාමං පක්කමති. සො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං.

සො අරඤ්ඤගතො වා රුක්ඛමූලගතො වා සුඤ්ඤාගාරගතො වා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සො අභිජ්ඣං ලොකො පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. ව්‍යාපාදපදොසං පහාය අව්‍යාපන්නචිත්තො විහරති. සබ්බපාණභූතහිතානුකම්පී. ව්‍යාපාදපදොසා චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං පහාය විගතථිනමිද්ධො විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථිනමිද්ධා චිත්තං පරිසොධෙති උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති. අජ්ඣත්තං වූපසන්තචිත්තො. උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සො ඉමෙ පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා දුතියං ඣානං —පෙ— තතියං ඣානං —පෙ— චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආසවානං ඛයඤාණාය චිත්තං අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදති යථාභූතං පජානාති.

තවද අනෙකෙක්: මෙ සසුන්හි කිසි මහණෙක් ධූලිකඳ ඉවසයි, දද'ග ඉවසයි, රණහඬ ඉවසයි, පහරහෙනු ඉවසයි. හෙතෙම සංග්‍රාමය ජයගෙන දිනූ සංග්‍රාම ඇත්තේ එමැ යුදකඳවුරෙහි වාස කෙරෙයි. ඔහුට සංග්‍රාමවිජය කිමෙක යත්: මෙ සසුන්හි අරණ්‍යගත වූ හෝ වෘක්ෂමූල ගත වූ හෝ ශූන්‍යාගාර ගත වූ හෝ මහණකු කරා මාගමක් එළඹ ළඟ-හිදියි. ළඟ හොවියි. මැඩගනියි. හෙතෙම මාගම විසින් ළඟ හිඳිනු ලබන්නේ ළඟ හොවිනු ලබන්නේ මැඩගනු ලබන්නේ වෙළුම් හැර ග්‍රහණයෙන් මිදී කැමැති පරිදි යම් තැනෙක යෙයි. හෙතෙම අරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කඳුරැලි යැ ගිරිගුහා යැ ශ්මසාන යැ වනසෙනසුන යැ අභ්‍යාවකාශ යැ පිදුරුබිස්ස යැ යන විවේක සෙනාසනයක් භජනය කෙරේ.

හෙතෙම අරණ්‍යයට ගියේ හෝ වෘක්ෂමූලයට ගියේ හෝ ශූන්‍යාගාර-යට ගියේ හෝ පලක් බැඳ කය සෘජු කොට තබා කර්මස්ථානාභිමුඛ කොට සිහි එළවා කායලෝකයෙහි අභිධ්‍යාව දුරු කොට පහ වූ අභිධ්‍යාව ඇති සිතින් යුතු වැ වාස කෙරෙයි. අභිධ්‍යාවෙන් සිත පිරිසිදු කරයි. ව්‍යාපාද දෙෂය හැර දමා ව්‍යාපාද රහිත සිත් ඇත්තේ සියලු ප්‍රාණභූතයන්ට හිතානුකම්පීව වාස කෙරෙයි. හිත-අනුකම්පා ඇත්තේ ව්‍යාපාද දෙෂයෙන් සිත සොධා හරියි. ථීනමිද්ධය දුරු කොට පහ වූ ථීනමිද්ධ ඇත්තේ ආලොකසංඥා ඇති වැ සිහි ඇති වැ සම්‍යක් ප්‍රඥා ඇති වැ වාස කෙරෙ යි. ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්චකුක්කුච්චය දුරු කොට උඩහු නො වූයේ අධ්‍යාත්මයෙහි සන්හුන් සිත් ඇති වැ වාස කෙරෙයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරෙයි. විචිකිච්ඡාව දුරු කොට විචිකිච්ඡායෙන් එතෙර වූයේ කුශලධර්මයන්හි සැක රහිත වූයේ වෙසෙයි. විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරේ.

හෙතෙම චිත්තයා ගේ උපක්ලෙශයන් වූ ප්‍රඥාව දුර්වල කරන්නා වූ මේ පඤ්චනීවරණයන් දුරු කොට කාමයන් ගෙන් වෙන් වැ මැ අකුශල ධර්මයන් ගෙන් වෙන් වැ විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිසුඛය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන් සන්හිඳීමෙන් ද්විතීයධ්‍යානයට ... තෘතීය ධ්‍යානයට ... චතුර්ථ-ධ්‍යානයට පැමිණ වෙසෙයි. හෙතෙම මෙසේ සිත සමාධිගත වූ කල්හි පිරිසුදු වූ කල්හි නිර්මල වූ කල්හි කෙලෙස් රහිත වූ කල්හි පහ වූ උපක් ලෙශයන් ඇති කල්හි මොළොක් වූ කල්හි කර්මණ්‍ය වැ සිටි කල්හි නො සැලෙන බවට පැමිණි කල්හි ආස්‍රවක්ෂයඥානය පිණිස සිත නමයි. හෙතෙම මේ දුකැ යි ඇති සැටියෙන් දනගනි. මේ දුක් ඇති වීමේ හෙතු යැ යි ඇති සැටියෙන් දනගනි. මේ දුක් නැති කිරීමැ යි ඇති සැටියෙන් දනගනි. මෙ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දනගනි.

ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසව නිරොධගාමිනීපටිපදති යථාභූතං පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදමස්ස සඞ්ගාමවිජයස්මිං. සෙය්‍යථාපි සො යොධාජීවො සහති රජග්ගං, සහති ධජග්ගං, සහති උස්සාදනං, සහතිසම්පහාරං. සො තං සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති. තථූපමො අයං පුග්ගලො. එවරූපොපි ඉධෙ'කච්චො පුග්ගලො හොති. අයං පඤ්චමො යොධාජීවූපමො පුග්ගලො සන්තො සංවිජ්ජමානො භික්ඛුසු. ඉමෙ පඤ්ච යොධාජීවූපමා පුග්ගලා සන්තා සංවිජ්ජමානා භික්ඛුසු.

4. තත්ථ කතමෙ පඤ්ච පිණ්ඩපාතිකා: මන්දත්තා මොමූහත්තා පිණ්ඩපාතිකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො පිණ්ඩපාතිකො හොති, උම්මාද චිත්තක්ඛෙපා පිණ්ඩපාතිකො හොති. වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති පිණ්ඩපාතිකො හොති. අපි ච අප්පිච්ඡතංයෙව නිස්සාය, සන්තුට්ඨිංයෙව නිස්සාය, සල්ලෙඛංයෙව නිස්සාය, ඉදමට්ඨිතංයෙව නිස්සාය පිණ්ඩපාතිකො හොති.

තත්‍ර ය්වායං පිණ්ඩපාතිකො අප්පිච්ඡතංයෙව[1] නිස්සාය, සන්තුට්ඨිංයෙව නිස්සාය, සල්ලෙඛංයෙව නිස්සාය, ඉදමට්ඨිතංයෙව[2] නිස්සාය, පිණ්ඩපාතිකො හොති. අයං ඉමෙසං පඤ්චන්නං පිණ්ඩපාතිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි නාම ගවා ඛීරං, ඛීරම්හා දධි, දධිම්හා නොනීතං, නොනීතම්හා සප්පි සප්පිම්හා සප්පිමණ්ඩො. සප්පිමණ්ඩං තත්ථ අග්ගමක්ඛායති. එවමෙව ය්වායං පිණ්ඩපාතිකො අප්පිච්ඡතංයෙව නිස්සාය සන්තුට්ඨිංයෙව නිස්සාය සල්ලෙඛංයෙව නිස්සාය ඉදමට්ඨිතංයෙව නිස්සාය පිණ්ඩපාතිකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං පිණ්ඩපාතිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච, ඉමෙ පඤ්ච පිණ්ඩපාතිකා.

1. අප්පිච්ඡං, යෙව – ස්‍යා  2. ඉදමත්ථිකංයෙව – මජසං

මොහු ආශ්‍රවහ යි ඇති සැටියෙන් දනගනී. මේ ආශ්‍රවයන් ඇති වීමේ හේතු යැ යි ඇති සැටියෙන් දනගනී. මේ ආශ්‍රවයන් ගේ නිරොධ යැ යි ඇති සැටියෙන් දනගනී. මේ ආශ්‍රවයන් නිරුද්ධ කරන පිළිවෙතැයි ඇති සැටියෙන් දනගනී. මෙසේ දන්නා වූ මෙසේ දක්නා වූ ඔහු ගේ සිත කාමාශ්‍රවයෙනුදු භවාශ්‍රවයෙනුදු අවිද්‍යාශ්‍රවයෙනුදු මිදෙයි. මිදුණු කල්හි මිදිණැ යි නුවණ පහළ වෙයි. ජාතිය ක්ෂය වූවා යැ බඹසර වැස නිමවන ලද. කළ යුතු කිස කරන ලදී. මෙ අර්හත්වය සඳහා අන් කළ යුතු දයෙක් නැතැ යි දනගනී. මේ ඔහු ගේ සංග්‍රාමවිජය යි. යම්සේ මැ ඒ යුදබළ ධූලිකඳ ඉවසා ද දද'ග ඉවසා ද රණහඬ ඉවසා ද ප්‍රහාරය ඉවසා ද හෙතෙම ඒ සංග්‍රාමය ජය ගෙන දිනූසංග්‍රාම ඇත්තේ එ මැ රණබිම්හි වෙසේ ද, මේ පුද්ගල එබඳු යි. මෙහි මෙබඳු වූ ද කිසි පුද්ගලයෙක් වෙයි. මේ තෙමේ භික්ෂූන් අතුරෙහි ඇති, දක්නා ලැබෙන පස් වැනි යුද සෙබළාට බඳු පුද්ගලයා යි.

4. එහි පිණ්ඩපාතිකයෝ පස්දෙන කවරහ යත්: අඥාන බැවින් අතිශයින් මුළා බැවින් පිණ්ඩපාතික වෙයි. පාපෙච්ඡා ඇත්තේ පාපෙච්ඡායෙන් මැඩුණේ පිණ්ඩපාතික වෙයි. උමතුවෙන් චිත්ත වික්ෂෙපයෙන් පිණ්ඩපාතික වෙයි. බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් පසස්නා ලදැ යි පිණ්ඩපාතික වෙයි. තව ද අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂය මැ නිසා කෙලෙසුන් ගේ තුනු බව මැ නිසා 'මේ ඇත' යන බව මැ නිසා පිණ්ඩපාතික වේ.

ඔවුනතුරෙහි යම් පිණ්ඩපාතිකයෙක් අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂ මැ නිසා, කෙලෙසුන් ගේ තුනු බව මැ නිසා 'මේ ඇත' යන බව මැ නිසා පිණ්ඩපාතික වේ ද, මේ තෙමේ මේ පිණ්ඩපාතිකයන් පස් දෙනා අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද උත්තම ද ප්‍රවර ද වෙයි. යම්සේ දෙනගෙන් කිරි කිරෙන් දී දීයෙන් වෙඬරු වෙඬරුයෙන් ගී ගීයෙන් ගීමඬ ලැබෙ ද, ඔවුනතුරෙහි සපපිමණ්ඩය මැ අග්‍ර යැ යි කියනු ලැබෙ එපරිදි මැ යම් පිණ්ඩපාතිකයෙක් අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂ මැ නිසා කෙලෙසුන් ගේ තුනු බව මැ නිසා, 'මේ ඇත' යන බව මැ නිසා පිණ්ඩපාතික වේ ද, මෙ තෙමේ මේ පිණ්ඩපාතිකයන් පස් දෙනා අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද, ප්‍රධාන ද උත්තම ද ප්‍රවර ද වේ. මොහු පස් වැදෑරුම් පිණ්ඩපාතිකයෝ යි.

5–14. තත්‍ථ කතමෙ පඤ්ච ඛලුපච්ඡාභත්තිකා –පෙ– පඤ්ච එකාසනිකා –පෙ– පඤ්චපංසුකූලිකා -පෙ– පඤ්ච තෙචීවරිකා –පෙ– පඤ්ච ආරඤ්ඤිකා –පෙ– පඤ්ච රුක්ඛමූලිකා–පෙ– පඤ්ච අබ්භොකාසිකා –පෙ– පඤ්ච නෙසජ්ජිකා –පෙ- පඤ්ච යථාසන්ථතිකා –පෙ– පඤ්ච සොසානිකා.

තත්‍ථ කතමෙ පඤ්ච සොසානිකා: මන්දත්තා මොමූහත්තා සොසා–නිකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො සොසානිකො හොති, උම්මාද චිත්තවික්ඛෙපා සොසානිකො හොති. වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති සොසානිකො හොති, අපිච අප්පිච්ඡතංයෙව නිස්සාය සන්තුට්ඨිංයෙව නිස්සාය සල්ලෙඛංයෙව නිස්සාය ඉදමට්ඨිතංයෙව නිස්සාය සොසානිකො හොති.

තත්‍ර ය්වායං සොසානිකො අප්පිච්ඡතංයෙව නිස්සාය සන්තුට්ඨිං–යෙව නිස්සාය සල්ලෙඛංයෙව නිස්සාය ඉදමට්ඨිතංයෙව නිස්සාය සොසානිකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං සොසානිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. සෙය්‍යථාපි නාම ගාවා ඛීරං ඛීරම්හා දධි දධිම්හා නොනීතං නොනීතම්හා සප්පි, සප්පිම්හා සප්පි–මණ්ඩො, සප්පිමණ්ඩං තත්‍ථ අග්ගමක්ඛායති, එවමෙව ය්වායං සොසා–නිකො අප්පිච්ඡතංයෙව නිස්සාය සන්තුට්ඨිංයෙව නිස්සාය සල්ලෙඛංයෙව නිස්සාය ඉදමට්ඨිතංයෙව නිස්සාය සොසානිකො හොති, අයං ඉමෙසං පඤ්චන්නං සොසානිකානං අග්ගො ච සෙට්ඨො ච මොක්ඛො ච උත්තමො ච පවරො ච. ඉමෙ පඤ්ච සොසානිකා.

පඤ්චක නිද්දෙසො නිට්ඨිතො.

5-14. එහි පස්වැදෑරුම් ඛලුපච්ඡාභත්තිකයෝ ... පස් වැදෑරුම් ඒකාසනිකයෝ ... පස් වැදෑරුම් පංශුකූලිකයෝ ... පස් වැදෑරුම් තෙචීවරිකයෝ ... පස් වැදෑරුම් ආරණ්‍යකයෝ ... පස් වැදෑරුම් වෘක්ෂමූලිකයෝ ... පස් වැදෑරුම් අභ්‍යවකාශිකයෝ ... පස් වැදෑරුම් නෛසජ්ජිකයෝ ... පස් වැදෑරුම් යථාසන්ථතිකයෝ ... පස් වැදෑරුම් සොසානිකයෝ කවරහ යත්:

එහි පස් වැදෑරුම් සොසානිකයෝ කවරහ යත්: අඥාන බැවින් අතිශයින් මූඪ බැවින් සොසානික වෙයි. ලාමක පැතුම් ඇත්තේ පාපෙච්ඡායෙන් මැඩුණේ සොසානික වෙයි. උමතුවෙන් චිත්ත-වික්ෂෙපයෙන් සොසානික වෙයි. බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් පසසන ලද යි සොසානික වෙයි. තවද අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂභාවය මැ නිසා කෙලසුන් ගේ තුනු බව මැ නිසා මේ ඇත' යන බව මැ නිසා සොසානිකයෙක් වේ.

ඔවුනතුරෙහි යම් සොසානිකයෙක් අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂභාවය මැ නිසා කෙලෙසුන්ගේ තුනු බව මැ නිසා, 'මේ ඇත' යන බව මැ නිසා සොසානික වේ ද මේ තෙමේ මේ පස්වැදෑරුම් සොසා-නිකයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද උත්තම ද ප්‍රවර ද වෙයි, යම්සේ දෙනගෙන් කිරි, කිරෙන් දී, දීයෙන් වෙඬරු, වෙඬරුයෙන් ගී, ගීයෙන් ගීමඬ ලබා ද ගීමඬ – සෘතමණ්ඩය ඔවුනතුරෙන් අග්‍ර යැ යි කියනු ලැබේ ද, එපරිදි මැ යම් සොසානිකයෙක් අල්පෙච්ඡභාවය මැ නිසා සන්තොෂභාවය මැ නිසා කෙලෙසුන් ගේ තුනු බව මැ නිසා 'මේ ඇත' යන බව මැ නිසා සොසානික වේ ද මේ තෙමේ මේ පස්වැදෑරුම් සොසානිකයන් අතුරෙන් අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රධාන ද උත්තම ද ප්‍රවර ද වේ මොහු පස් වැදෑරුම් සොසානිකයෝ යි.

**පඤ්චක නිර්දේශ නිමියේ යි.**

# 6. ඡක්ක නිද්දෙසො

1. තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති. තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණාති බලෙසු ච වසීභාවං. සම්මාසම්බුද්ධො තෙන දට්ඨබ්බො.

තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, න ච තත්ථ සබ්බඤ්ඤුතං පාපුණාති න ච බලෙසු වසීභාවං. පච්චෙකසම්බුද්ධො තෙන දට්ඨබ්බො.

තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තං කරොති[1] සාවකපාරමිඤ්ච පාපුණාති, සාරිපුත්තමොග්ගල්ලානා තෙන දට්ඨබ්බා.

තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති, දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තං කරොති න ච සාවකපාරමිං පාපුණාති, අවසෙසා අරහන්තා තෙන දට්ඨබ්බා.

තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති, න ච දිට්ඨෙවධම්මෙ දුක්ඛස්සන්තං කරොති අනාගාමී හොති අනාගන්තා ඉත්ථත්තං, අනාගාමී තෙන දට්ඨබ්බො.

තත්ථ ය්වායං පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අනභිසම්බුජ්ඣති, න ච දිට්ඨෙව ධම්මෙ දුක්ඛස්සන්තකරො හොති, ආගාමී හොති ආගන්තා ඉත්ථත්තං, සොතාපන්නසකදාගාමිනො තෙන දට්ඨබ්බා.

**ඡක්ක නිද්දෙසො නිට්ඨිතො.**

---

1. දුක්ඛස්සන්තකරො හොති - මජසං

# 6. ෂට්ක නිර්දේශය

ඔවුනතුරෙහි (ෂඩ්විධ පුද්ගලයන් අතුරෙහි) යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ ද, එහි දු සර්වඥභාවයට පැමිණේ ද, බලධර්මයන්හි දු වශීභාවයට පැමිණේ ද එකරුණින් (**ඒ සබ්බඤ්ඤුත ඤාණයෙන්**) සම්මා සම්බුදුන් වහන්සේ දත යුත්තාහ.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ ද, එතෙකුදු වත් එහි සර්වඥභාවයට නො පැමිණේ ද බලධර්මයන්හි වශීභාවයට නො ද පැමිණේ ද එකරුණින් (**ඒ පච්චෙක බොධිඤාණයෙන්**) පසේ බුදුන් වහන්සේ දතයුත්තාහ.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ ද, මෙ අත් බැව්හි මැ දුක් කෙළවර කෙරේ ද, ශ්‍රාවකපාරමීතාවටත් පැමිණේ ද, එකරුණින් (**ඒ සාවක පාරමී ඤාණයෙන්**) ශාරීපුත්‍ර-මෞද්ගල්‍යානයෝ දතයුත්තාහ.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ නො කෙරේ ද, මෙ අත් බැව්හි මැ දුක් කෙළවර කෙරේ ද, එතෙකුදු වත් ශ්‍රාවකපාරමීතාවට නො පැමිණේ ද එකරුණින් (**දුක්ඛන්තකර ඤාණයෙන්**) සෙසු රහත්හු දතයුත්තාහ.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ ද, එතෙකුදු වත් මෙ අත් බැව්හි මැ දුක් කෙළවර නො කෙරේ ද, එකරුණින් (**අනාගාමී ඤාණයෙන්**) මෙලොවට නොඑන අනාගාමී දතයුත්තේ යි.

ඔවුනතුරෙහි යම් පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ නො කෙරේ ද, මෙ අත්බැව්හි මැ දුක් කෙළවර කරන්නේත් නො වේ ද, මේ අත් බවට එන්නේ ආගාමී වේ ද, එකරුණින් (**ආගාමී හෙයින්**) සොතාපන්න සකදගාමීහු දතයුත්තාහ.

**ෂට්ක නිර්දේශ නිමියේ යි.**

# 7. සත්තක නිද්දෙසො

1. කථඤ්ච පුග්ගලො සකිං නිමුග්ගො නිමුග්ගොව හොති: ඉධෙ'කච්චො පුග්ගලො සමන්නාගතො හොති එකන්තකාළකෙහි අකුසලෙහි ධම්මෙහි එවං පුග්ගලො සකිං නිමුග්ගො නිමුග්ගොව හොති.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා නිමුජ්ජති: ඉධෙ'කච්චො පුග්ගලො උම්මුජ්ජති සාහු[1] සද්ධා කුසලෙසු ධම්මෙසු සාහු හිරි කුසලෙසු ධම්මෙසු සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු සාහු විරියං කුසලෙසු ධම්මෙසු සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති, තස්ස සා සද්ධා නෙව තිට්ඨති නො වඩ්ඪති, හායතිමෙව, තස්ස සා හිරි නෙව තිට්ඨති නො වඩ්ඪති හායතිමෙව, තස්ස තං ඔත්තප්පං නෙව තිට්ඨති නො වඩ්ඪති හායතිමෙව, තස්ස තං විරියං[2] නෙව තිට්ඨති නො වඩ්ඪති හායතිමෙව, තස්ස සා පඤ්ඤා නෙව තිට්ඨති නො වඩ්ඪති හායතිමෙව, එවං පුග්ගලො උම්මුජ්ජිත්වා නිජ්ජති.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති: ඉධෙ'කච්චො පුග්ගලො උම්මුජ්ජති, සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු සාහු හිරි කුසලෙසු ධම්මෙසු සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු සාහු විරියං කුසලෙසු ධම්මෙසු සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති. තස්ස සා සද්ධා නෙව හායති නො වඩ්ඪති ඨිතා හොති, තස්ස සා හිරි නෙව හායති නො වඩ්ඪති ඨිතා හොති, තස්ස තං ඔත්තප්පං නෙව හායති නො වඩ්ඪති ඨිතං හොති, තස්ස තං විරියං නෙව හායති නො වඩ්ඪති ඨිතං හොති, තස්ස සා පඤ්ඤා නෙව හායති, නො වඩ්ඪති ඨිතා හොති එවං පුග්ගලො උම්මුජ්ජිත්වා ඨිතො හොති.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා විපස්සති විලොකෙති: ඉධෙ'කච්චො පුග්ගලො උම්මුජ්ජති, සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාහු හිරි කුසලෙසු ධම්මෙසු, සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු, සාහු විරියං කුසලෙසු ධම්මෙසු, සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති. සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණො. එවං පුග්ගලො උම්මුජ්ජිත්වා විපස්සති විලොකෙති.

---

1. සාධු - මජසං
2. විරියං - මජසං

# 7. සප්තක නිර්දේශය

1. කෙසේ නම් පුද්ගල වරක් ගිලුණේ ගිලුණේ මැ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් එකාන්තයෙන් කෘෂ්ණ වූ අකුශල ධර්මයන් ගෙන් යුක්ත වූයේ වෙයි. මෙසේ පුද්ගල වරක් ගිලුණේ ගිලුණේ මැ වේ.

කෙසේ නම් පුද්ගල ඉල්ප ගිලේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාව මැනැවැ කුශලධර්මයන්හි හිරිය (ලජ්ජාව) මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය (බිය) මැනැවැ කුශල ධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. ඔහු ගේ ඒ ශ්‍රද්ධාව නො මැ සිටියි, නො වැඩෙයි, පිරිහේ මැ යි. ඔහු ගේ ඒ හිරිය නො මැ සිටියි, නො වැඩෙයි, පිරිහේ මැ යි. ඔහුගේ ඒ ඔත්තප්පය නො මැ සිටියි, නො වැඩෙයි, පිරිහේ මැ යි. ඔහු ගේ ඒ වීය්‍ර්‍යය නො මැ සිටියි, නො වැඩෙයි, පිරිහේ මැ යි. ඔහු ගේ ඒ ප්‍රඥාව නො මැ සිටියි, නො වැඩෙයි, පිරිහේ මැ යි මෙසේ පුද්ගල ඉල්පී ගිලේ.

කෙසේ නම් පුද්ගල ඉල්ප සිටියේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාව මැනැවැ කුශලධර්මයන්හි හිරිය මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය මැනැවැ කුශලධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. ඔහු ගේ ඒ ශ්‍රද්ධාව නො මැ පිරිහෙයි, නො වැඩෙයි, සිටියා වෙයි. ඔහු ගේ ඒ හිරිය නො මැ පිරිහෙයි, නො වැඩෙයි, සිටියා වෙයි. ඔහු ගේ ඒ ඔත්තප්පය නො මැ පිරිහෙයි, නො වැඩෙයි, සිටියේ වෙයි. ඔහු ගේ ඒ වීය්‍ර්‍යය නො මැ පිරිහෙයි, නො වැඩෙයි. සිටියේ වෙයි. ඔහුගේ ඒ ප්‍රඥාව නො මැ පිරි-හෙයි, නො වැඩෙයි, සිටියා වෙයි. මෙසේ පුද්ගල ඉල්ප සිටියේ වේ.

කෙසේ නම් පුද්ගල ඉල්ප අවට දකී ද බලා ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාවැ මැනැවැ කුශලධර්මයන්හි හිරිය මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය මැනැවැ කුශලධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. හෙතෙම තුන් සංයොජනයන් ගේ ක්ෂය වීමෙන් විනිපාතධර්ම (නිරයධර්ම) රහිත වූ නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සොතාපන්නයෙක් වෙයි. මෙසේ පුද්ගල ඉල්ප අවට දකියි අවට බලයි.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා පතරති: ඉධෙ'කච්චො පුග්ගලො උම්මුජ්ජති, සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාහු හිරි කුසලෙසු ධම්මෙසු සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු, සාහු විරියං කුසලෙසු ධම්මෙසු, සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති, සො තිණ්ණං සඤ්ඤොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදගාමී හොති සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. එවං පුග්ගලො උම්මුජ්ජිත්වා පතරති.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොති: ඉධෙකච්චො පුග්ගලො උම්මුජ්ජති, සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු ස හු හිරි කුසලෙසු ධම්මෙසු, සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු, සාහු විරියං කුසලෙසු ධම්මෙසු සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති, සො පඤ්චන්නං ඔරම්භාගියානං සඤ්ඤොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. එවං පුග්ගලො උම්මුජ්ජිත්වා පතිගාධප්පත්තො හොති.

කථඤ්ච පුග්ගලො උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො: ඉධෙකච්චො පුග්ගලො උම්මුජ්ජති, සාහු සද්ධා කුසලෙසු ධම්මෙසු, සාහු හිරි කුසලෙසු, ධම්මෙසු, සාහු ඔත්තප්පං කුසලෙසු ධම්මෙසු, සාහු විරියං කුසලෙසු ධම්මෙසු, සාහු පඤ්ඤා කුසලෙසු ධම්මෙසූති, සො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං පුග්ගලො උම්මුජ්ජිත්වා තිණ්ණො හොති පාරංගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

2. කතමො ච පුග්ගලො උභතොභාගවිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති, අයං වුච්චති පුග්ගලො උභතොභාග විමුත්තො.

කතමො ච පුග්ගලො පඤ්ඤාවිමුත්තො -පෙ- කායසක්ඛී -පෙ- දිට්ඨිප්පත්තො -පෙ- සද්ධාවිමුත්තො -පෙ- ධම්මානුසාරී -පෙ- කතමො ච පුග්ගලො සද්ධානුසාරී. යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධාවාහී සද්ධාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති. අයං වුච්චති පුග්ගලො සද්ධානුසාරී. සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො පුග්ගලො සද්ධානුසාරී. ඵලෙ ඨිතො සද්ධාවිමුත්තො.

**සත්තක නිද්දෙසො නිට්ඨිතො.**

කෙසේ නම් පුද්ගල ඉල්ප තරණය කෙරේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාව මැනැවැ කුශලධර්මයන්හි හිරිය මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය මැනැවැ කුශලධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. හෙතෙම තුන් සංයොජනයන් ගේ ක්ෂය වීමෙන් රාග ද්වේෂ මොහයන් තුනි කිරීමෙන් සකෘදගාමී වෙයි. වරක් මැ මෙලොවට අවුත් දුක් කෙළවර කෙරෙයි. මෙසේ පුද්ගල ඉල්ප තරණය කෙරේ.

කෙසේ නම් පුද්ගල ඉල්ප නො ගැඹුරට (ප්‍රතිෂ්ඨාස්ථානයට) පැමිණියේ වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාව මැනැවැ කුශල ධර්මයන්හි හිරිය මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය මැනැවැ කුශලධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. හෙතෙම පස්වැදෑරුම් ඔරම්භාගිය සංයොජනයන් ක්ෂය කිරීමෙන් ශුද්ධාවාසයෙහි උපදනේ එහි පිරිනිවෙන්නේ, එලොවින් පෙරළා නොඑන සුලු වූයේ වෙයි. මෙසේ පුද්ගල ඉල්ප නො ගැඹුරට පැමිණියේ වේ.

කෙසේ නම් පුද්ගල ඉල්ප තරණය කෙළේ, පරතෙරට ගියේ 'ගොඩබිම සිටුනා බ්‍රාහ්මණ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් කුශලධර්මයන්හි ශ්‍රද්ධාව මැනැවැ කුශලධර්මයන්හි හිරිය මැනැවැ කුශලධර්මයන්හි ඔත්තප්පය මැනැවැ කුශලධර්මයන්හි වීය්‍ර්‍යය මැනැවැ කුශලධර්මයන්හි ප්‍රඥාව මැනැවැ යි ඉල්පෙයි. හෙතෙම ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව රහිත වූ ඵලසමාධිය, ඵලප්‍රඥාව මෙ අත් බැවහි මැ තෙමේ වෙසෙසින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වෙසෙයි. මෙසේ පුද්ගල ඉල්ප තරණය කෙළේ පරතෙරට ගියේ 'ගොඩබිම සිටුනා බ්‍රාහ්මණ' වේ.

2. කවර පුද්ගලයෙක් 'උභතොභාගවිමුක්ත' වේ ද යත්: මෙ සස්නෙහි කිසි පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් (නාම) කයින් ස්පර්ශ කොට වෙසෙයි. (විදර්ශනා) ප්‍රඥායෙනුදු දැක ඔහුගේ ආස්‍රවයෝ ක්ෂය වූවාහු වෙති, මේ පුද්ගල 'උභතොභාග විමුක්ත' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ප්‍රඥා විමුක්ත'... 'කායසාක්ෂි' ...'දෘෂ්ටිප්‍රාප්ත' ... 'ශ්‍රද්ධාවිමුක්ත' ... 'ධර්මානුසාරී' වේ ද යත්: ... කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධානුසාරී' වේ ද යත්: සොතාපත්තිඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් යම් පුද්ගලයක්හු ගේ ශ්‍රද්ධෙන්ද්‍රියය අධික වේ ද ශ්‍රද්ධාව විසින් ඔසවනසුලු වූයේ ශ්‍රද්ධාපූර්වංගම වූ ආය්‍ර්‍යමාර්ගය වඩා ද, මේ තෙමේ 'ශ්‍රද්ධානුසාරී' පුද්ගලයා යි. කියනු ලැබේ. සොතාපත්තිඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් පුද්ගල 'ශ්‍රද්ධානුසාරී' යැ ඵලයෙහි සිටියේ 'ශ්‍රද්ධාවිමුක්ත' යි.

**සප්තක නිර්දේශ නිමියේ යි.**

## 8. අට්ඨක නිද්දෙසො

1. තත්‍ථ කතමෙ චත්තාරො මග්ගසමඞ්ගිනො, චත්තාරො ඵලසමඞ්ගිනො පුග්ගලා:

සොතාපන්නො, සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො සකදගාමී, සකදගාමීඵලසච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමී, අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො. අරහා, අරහත්තඵලසච්ඡිකිරියාය[1] පටිපන්නො. ඉමෙ චත්තාරො මග්ගසමඞ්ගිනො, චත්තාරො ඵලසමඞ්ගිනො පුග්ගලා.

**අට්ඨක නිද්දෙසො නිට්ඨිතො.**

1. අරහත්තාය - ස්‍යා

# 8. අෂ්ටක නිර්දේශය

1. ඔවුනතුරෙහි චතුර්විධ මාර්ගයෙන් යුක්ත වූ, චතුර්විධ ඵලයෙන් යුක්ත වූ පුද්ගලයෝ කවරහ යත්:

සොතාපන්න යැ සොතාපත්තිඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ යැ සකදාගාමී යැ සකදාගාමීඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ යැ අනාගාමී යැ අනාගාමීඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ යැ අර්හත් යැ අර්හත්ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන්නෝ යැ (යන) මොහු චතුර්විධ මාර්ගයෙන් යුක්ත වූ චතුර්විධ ඵලයෙන් යුක්ත වූ පුද්ගලයෝ යි.

**අෂ්ටක නිර්දේශ නිමියේ යි.**

# 9. නවක නිද්දෙසො

1. කතමො ච පුග්ගලො සම්මාසම්බුද්ධො: ඉධෙ'කච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණාති, බලෙසු ච වසීභාවං. අයං වුච්චති පුග්ගලො සම්මාසම්බුද්ධො.

කතමො ච පුග්ගලො පච්චෙකබුද්ධො: ඉධෙකච්චො පුග්ගලො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣති, න ච තත්ථ සබ්බඤ්ඤුතං පාපුණාති, න ච බලෙසු වසීභාවං. අයං වුච්චති පුග්ගලො පච්චෙකබුද්ධො.

කතමො ච පුග්ගලො උභතොභාගවිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො අට්ඨවිමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයං වුච්චති පුග්ගලො උභතොභාගවිමුත්තො.

කතමො ච පුග්ගලො පඤ්ඤාවිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො නහෙව අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති, අයං වුච්චති පුග්ගලො පඤ්ඤා විමුත්තො.

කතමො ච පුග්ගලො කායසක්ඛී: ඉධෙ'කච්චො පුග්ගලො අට්ඨ විමොක්ඛෙ කායෙන ඵුසිත්වා විහරති, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති, අයං වුච්චති පුග්ගලො කායසක්ඛී.

කතමො ච පුග්ගලො දිට්ඨිප්පත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධ ගාමිනී පටිපදාති යථාභූතං පජානාති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති, අයං වුච්චති පුග්ගලො දිට්ඨිප්පත්තො.

# 9. නවක නිර්දේශය

1. කවර පුද්ගලයෙක් 'සම්‍යක් සම්බුද්ධ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ. එහිදු සර්වඥත්වයට පැමිණේ, බලධර්මයන්හි ද වශීභාවයට පැමිණේ. මේ පුද්ගල 'සම්‍යක්සම්බුද්ධ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ප්‍රත්‍යෙකබුද්ධ' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් පෙර නො ඇසූ විරූ ධර්මයන්හි තෙමේ සත්‍යයන් අවබොධ කෙරේ. එතෙකුදු වත් එහි සර්වඥභාවයට නො පැමිණෙයි, බලධර්මයන්හි වශීභාවයට ද නො පැමිණේ. මේ පුද්ගල 'ප්‍රත්‍යෙකබුද්ධ' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'උභතොභාගවිමුක්ත' වේ ද යත්: මෙලොව පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් (නාම) කායයෙන් ස්පර්ශ කොට වෙසෙයි. (විදර්ශනා) ප්‍රඥායෙනුදු දැක ඔහු විසින් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. මේ පුද්ගල 'උභතොභාගවිමුක්ත' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ප්‍රඥාවිමුක්ත' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් (නාම) කයින් ස්පර්ශ කොට නො මැ වෙසෙයි. එතෙකුදු වත්, ප්‍රඥායෙන් දැක ඔහු විසින් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. මේ පුද්ගල 'ප්‍රඥාවිමුක්ත' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'කායසාක්ෂී' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් අෂ්ටවිමොක්ෂයන් කයින් ස්පර්ශ කොට වෙසෙයි. ප්‍රඥායෙනුදු දැක ඔහු විසින් ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. මේ පුද්ගල 'කායසාක්ෂී' යැ යි කියනු ලැබේ.

කවර නම් පුද්ගලයෙක් 'දෘෂ්ටිප්‍රාප්ත' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් මේ දුකැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් උපදනා හෙතු යැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති වීමැ යි ඇති සැටියෙන් දැනගනී. මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දැනගනී. තථාගතයන් වහන්සේ විසින් දන්නා ලද ධර්මයෝ ද මොහු විසින් ප්‍රඥාවෙන් මොනවට දක්නා ලදහ. මොනවට පිළිපදනා ලදහ. ප්‍රඥායෙනුදු දැක ඔහු විසින් ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. මේ පුද්ගල තෙමේ 'දෘෂ්ටිප්‍රාප්ත' යැ යි කියනු ලැබේ.

කතමො ච පුග්ගලො සද්ධාවිමුත්තො: ඉධෙ'කච්චො පුග්ගලො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනීපටිපදති යථාභූතං පජානාති, තථාගතප්පවෙදිතා චස්ස ධම්මා පඤ්ඤාය වොදිට්ඨා හොන්ති වොචරිතා, පඤ්ඤාය චස්ස දිස්වා එකච්චෙ ආසවා පරික්ඛීණා හොන්ති නො ච ඛො යථාදිට්ඨිප්පත්තස්ස, අයං වුච්චති පුග්ගලො සද්ධාවිමුත්තො.

කතමො ච පුග්ගලො ධම්මානුසාරි: යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස පඤ්ඤින්ද්‍රියං අධිමත්තං හොති, පඤ්ඤාවාහී පඤ්ඤාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති, අයං වුච්චති පුග්ගලො ධම්මානුසාරි සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො පුග්ගලො ධම්මානුසාරි ඵලෙ ඨිතො දිට්ඨිප්පත්තො.

කතමො ච පුග්ගලො සද්ධානුසාරී: යස්ස පුග්ගලස්ස සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නස්ස සද්ධින්ද්‍රියං අධිමත්තං හොති, සද්ධාවාහී සද්ධාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති, අයං වුච්චති පුග්ගලො සද්ධානුසාරි සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො පුග්ගලො සද්ධානුසාරී ඵලෙ ඨිතො සද්ධාවිමුත්තො.

**නවක නිද්දෙසො නිට්ඨිතො.**

කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධාවිමුක්ත' වේ ද යත්: මෙලොව කිසි පුද්ගලයෙක් මේ දුකැ යි ඇති සැටියෙන් දනගනී. ... මේ දුක් නැති කිරීමට යන පිළිවෙතැ යි ඇති සැටියෙන් දනගනී. තථාගතයන් වහන්සේ විසින් ප්‍රවිදිත වූ ධර්මයෝ ද මොහු විසින් ප්‍රඥායෙන් මොනොවට දක්නා ලදහ. මොනොවට පිළිපදනා ලදහ. ප්‍රඥායෙනු දු දක මොහු විසින් ඇතැම් ආස්‍රවයෝ ක්ෂය කරන ලද්දහු වෙති. එතෙකුදු වත් දෘෂ්ටිප්‍රාප්තයා බඳු නො වේ, මේ පුද්ගල 'ශ්‍රද්ධාවිමුක්ත' යැ යි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් 'ධර්මානුසාරී' වේ ද යත්: සෝවාන් ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් යම් පුද්ගලයක්හු ගේ ප්‍රඥේන්ද්‍රිය අධික වේ ද, ප්‍රඥාව විසින් ඔසවනසුලු වූයේ ප්‍රඥාපූර්වාංගම කොට ආර්‍ය්‍ය මාර්ගය වඩා ද මේ පුද්ගල 'ධර්මානුසාරී' යැ යි කියනු ලැබේ. සෝවාන් ඵලය සාක්ෂාත් කරනු පිණිස පිළිපන් පුද්ගල 'ධර්මානුසාරී' යි. ඵලයෙහි සිටියේ 'දෘෂ්ටිප්‍රාප්ත' යි.

කවර පුද්ගලයෙක් 'ශ්‍රද්ධානුසාරී' වේ ද යත්: සොතාපත්තිඵලය පසක් කරනුවට පිළිපන් යම් පුද්ගලයක්හු ගේ ශ්‍රද්ධේන්ද්‍රිය අධික වේ ද ශ්‍රද්ධාව විසින් ඔසවනසුලු වූයේ ශ්‍රද්ධාපූර්වංගම කොට ආර්‍ය්‍යමාර්ගය වඩා ද මේ පුද්ගල 'ශ්‍රද්ධානුසාරී' යැ යි කියනු ලැබේ. සොතාපත්තිඵලය සාක්ෂාත් කරනුවට පිළිපන් පුද්ගල 'ශ්‍රද්ධානුසාරී' යි. ඵලයෙහි සිටියේ 'ශ්‍රද්ධාවිමුක්ත' යි.

**නවක නිර්දේශ නිමියේ යි.**

## 10. දසක නිද්දෙසො

කතමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා: සත්තක්ඛත්තුපරමස්ස කොලංකොලස්ස එකබීජිස්ස සකදාගාමිස්ස, යො ච දිට්ඨෙව ධම්මෙ අරහා ඉමෙසං පඤ්චන්නං ඉධ නිට්ඨා.

කතමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨා: අන්තරාපරිනිබ්බායිස්ස උපහච්චපරිනිබ්බායිස්ස අසඞ්ඛාරපරිනිබ්බායිස්ස සසඞ්ඛාරපරිනිබ්බායිස්ස උද්ධංසොතස්ස අකනිට්ඨගාමිනො. ඉමෙසං පඤ්චන්නං ඉධ විහාය නිට්ඨාති.

එත්තාවතා පුග්ගලානං පුග්ගලපඤ්ඤත්ති.

දසක නිද්දෙසො නිට්ඨිතො.

පුග්ගලපඤ්ඤත්තිප්පකරණං සමත්තං.

## 10. දශක නිර්දේශය

කවර පස් දෙනකුන් ගේ 'ඉහනිෂ්ඨා' (කාමාවචර භූමියෙහි නිෂ්ඨාව) වන්නී ද යත්: සත්තක්ඛත්තුපරමයා ගේ යැ කොලංකොලයා-ගේ යැ එකබීජිහු ගේ යැ සකදගාමීහු ගේ යැ යමෙකුත් මෙ අත් බැව්හි ම අර්හත් වේ ද ඔහු ගේ දැයි මොවුන් පස් දෙනා ගේ 'ඉහනිෂ්ඨා' යි.

කවර පස් දෙනකුන් ගේ 'ඉහවිහායනිෂ්ඨා' (කාමාවචරය හැර අන්තරා පරිනිබ්බායීහුගේ යැ උපහච්චපරිනිබ්බායීහුගේ යැ අසංඛාර පරිනිබ්බායීහුගේ යැ සසංඛාරපරිනිබ්බායීහුගේ යැ උද්ධංසොත අකනිට්ඨගාමීහුගේ යැ යි මොවුන් පස් දෙනාගේ 'ඉහවිහායනිෂ්ඨා' යි.

මෙතෙකින් පුද්ගලයනට පුද්ගලප්‍රඥප්ති වෙයි.

**දසක නිර්දේශ නිමියේ යි.**

**පුද්ගල ප්‍රඥප්තිප්‍රකරණ සමාප්ත යි.**

# ධාතුකථාප්පකරණ

## පදානුක්කමණිකා

### අ


පිට්ඨඞ්කා

අකුසලා ධම්මා 32
අගන්ථනියෙහි ධම්මෙහි 198
අචෙතසිකා ධම්මා 54
අජ්ඣත්තබහිද්ධා ධම්මා 42
අජ්ඣත්තබහිද්ධාරම්මණා ධම්මා 42
අජ්ඣත්තා ධම්මා 42
අජ්ඣත්තිකා ධම්මා 56
අජ්ඣත්තිකෙහි ධම්මෙහි 94
අඤ්ඤාතාවින්ද්‍රිය 24, 140
අඤ්ඤින්ද්‍රිය 24, 140
අට්ඨාරසධාතුයො 2, 18
අතීතා ධම්මා 42
අතීතාරම්මණා ධම්මා 42, 118
අතීතාරම්මණෙහි ධම්මෙහි 162,222
අධිමොක්ඛ 2, 32, 110, 134, 156, 186
අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය 24,140
අනාගතා ධම්මා 42
අනාගතාරම්මණා ධම්මා 42
අනාරම්මණා ධම්මා 52, 124
අනාරම්මණෙහි ධම්මෙහි 92, 200
අනාසවා ධම්මා 50, 120
අනාසවෙහි ධම්මෙහි 92, 166
අනිදස්සන අප්පටිඝා ධම්මා 44
අනිදස්සන සප්පටිඝා ධම්මා 42
අනිදස්සන සප්පටිඝෙහි 68
අනිදස්සනා ධම්මා 46
අනිය්‍යානිකා ධම්මා 64
අනුත්තරා ධම්මා 64


### අ


පිට්ඨඞ්කා

අනුපාදානියෙහි ධම්මෙහි 200
අනුපාදින්න අනුපාදානියා ධම්මා 36, 112
අනුපාදින්නා ධම්මා 58, 124
අනුපාදින්නානුපාදානියා ධම්මා 34
අනුපාදින්නෙහි ධම්මෙහි 168
අනුප්පන්නා ධම්මා 40, 116, 162
අපචයගාමිනො ධම්මා 38
අපරාමට්ඨා ධම්මා 50
අපරාමට්ඨෙහි ධම්මෙහි 92, 116, 168
අපරියාපන්නා ධම්මා 64
අපරියාපන්නෙහි ධම්මෙහි 200
අප්පච්චයා ධම්මා 44, 120
අප්පච්චයෙහි ධම්මෙහි 72, 90, 164, 224
අප්පටිඝා ධම්මා 46
අප්පමඤ්ඤා 2, 32, 108
අප්පමඤ්ඤාය 142, 184
අප්පමාණා ධම්මා 38, 116
අප්පමාණාරම්මණා ධම්මා 40, 116
අප්පමාණෙහි ධම්මෙහි 162, 218
අප්පීතිකා ධම්මා 62
අබ්‍යාකතා ධම්මා 32
අබ්‍යාකතෙහි ධම්මෙහි 212
අරණා ධම්මා 64
අරියො අට්ඨඞ්ගිකො මග්ගො 2, 32

අ

පිට්ඨඞ්කා

අරූපභව 30, 84, 106, 194
අරූපාවචරා ධම්මා 64
අරූපිනො ධම්මා 46
අරූපීහි ධම්මෙහි 90, 198
අවිචාරා ධම්මා 60
අවිජ්ජා 26, 76
අවිජ්ජාපච්චයා සඞ්ඛාරා 28
අවිතක්කඅවිචාරා ධම්මා 36, 114
අවිතක්කවිචාරමත්තා ධම්මා 36, 114
අවිතක්කා ධම්මා 60, 128
අවිතක්කෙහි ධම්මෙහි 168
අසඞ්කිලිට්ඨා ධම්මා 58
අසඞ්කිලෙසිකා ධම්මා 58, 126
අසඞ්කිලෙසිකෙහි ධම්මෙහි 90, 168, 230
අසඞ්ඛතා ධම්මා 44
අසඤ්ඤභව 30, 66, 84, 106, 156
අසෙක්ඛා ධම්මා 38
අසෙක්ඛෙහි ධම්මෙහි 160
අහෙතුකා ධම්මා 44

ආ

ආචයගාමිනො ධම්මා 38
ආචයගාමීහි ධම්මෙහි 196
ආසවවිප්පයුත්තා අනාසවා ධම්මා- 50
ආසවවිප්පයුත්තා ධම්මා 48, 120
ආසවවිප්පයුත්තා සාසවා ධම්මා 48
ආසවසම්පයුත්තා ධම්මා 50, 122
ආසවා චෙව සාසවා ච ධම්මා 48
ආසවා ධම්මා 48, 120
ආසවෙහි ධම්මෙහි 72, 90, 146, 164, 186, 224

ඉ

පිට්ඨඞ්කා

ඉත්ථින්ද්‍රිය 2, 24, 70, 76, 172
ඉද්ධිපාද 2, 30, 108, 142, 182

උ

උපපත්ති භවො 28, 210
උපාදා ධම්මා 56
උපාදානපච්චයා කම්ම භවො 28
උපාදානා ධම්මා 58, 126
උපාදානෙහි ධම්මෙහි 74, 94, 148, 168, 230
උපාදින්නා ධම්මා 56
උපාදින්නුපාදානියා ධම්මා 34
උපාදින්නුපාදානියෙහි ධම්මෙහි 214
උපාදින්නෙහි ධම්මෙහි 228
උපායාස 30, 142, 176
උපෙක්ඛාසහගතා ධම්මා 36, 62, 114
උපෙක්ඛාසහගතෙහි- ධම්මෙහි 160, 170, 216, 234
උපෙක්ඛින්ද්‍රිය 24, 102, 132, 154
උප්පන්නා ධම්මා 40
උප්පන්නෙහි ධම්මෙහි 220
උප්පාදිනො ධම්මා 40

ඒ

ඒකවොකාර භවො 30

ඔ

ඔඝා ධම්මා 50
ඔඝෙහි ධම්මෙහි 226

ක

කාම භවො 28, 210
කාමාවචරා ධම්මා 62
කාමාවචරෙහි ධම්මෙහි 234
කාය ධාතු 16
කායායතන 12

කි

පිට්ඨඞ්කා

කිලෙසවිප්පයුත්තා ධම්මා 58
කිලෙසවිප්පයුත්තා-
සංකිලෙසිකා ධම්මා 58
කිලෙසසම්පයුත්තා ධම්මා 60
කිලෙසාචෙව කිලෙස-
සම්පයුත්තා ධම්මා 58
කිලෙසා චෙව සංකිලිට්ඨාච-
ධම්මා 58
කිලෙසා ධම්මා 58

කු

කුසලා ධම්මා 32
කුසලෙහි ධම්මෙහි 86 196, 212

කෙ

කෙනචි න විඤ්ඤෙය්‍යා ධම්මා 48
කෙනචි විඤ්ඤෙය්‍යා ධම්මා 48

ග

ගන්ධායතන 12

ඝ

ඝානායතන 12
ඝානින්ද්‍රියං 24

ච

චක්ඛායතන 12, 14, 66, 80, 98, 152, 204
චක්ඛු ධාතු 16, 18, 100
චක්ඛුන්ද්‍රිය 22, 24, 66, 82
චක්ඛුවිඤ්ඤාණ ධාතුයා 66, 132, 152, 204
චතුවොකාරභව 30
චත්තාරි සච්චානි 2, 22

චි

පිට්ඨඞ්කා

චිත්ත 2, 32, 86, 184
චිත්තවිප්පයුත්තා ධම්මා 50, 54
චිත්තසමුට්ඨානා ධම්මා 54
චිත්තසම්පයුත්තා ධම්මා 52
චිත්තසහභුනො ධම්මා 54
චිත්තසහභූහි ධම්මෙහි 74
චිත්තසංසට්ඨා ධම්මා 52
චිත්තා ධම්මා 52, 124
චිත්තෙහි ධම්මෙහි 94, 148

චෙ

චෙතනා 2, 32
චෙතසිකා ධම්මා 52
චෙතසිකෙහි ධම්මෙහි 74, 94, 148

ජ

ජරා 30

ජා

ජාති 30
ජාතියා 72

ජී

ජීවිතින්ද්‍රිය 24, 76

ඣා

ඣානං 2, 32, 142, 184

ත

තණ්හාපච්චයා උපාදානං 28
දස්සනෙන පහාතබ්බා ධම්මා 38, 60, 116, 126
දස්සනෙන පහාතබ්බෙහි ධම්මෙහි 220, 232

# පදානුක්කමණිකා


දු

පිට්ඨඞ්කා

දුක්ඛං 30
දුක්ඛසච්චං 20,22
දුක්ඛසච්චෙන 206

දෙ

දෙමනස්සං 30

ද්වා

ද්වාදසායතනානි 2,16

ධ

ධම්මායතන 14,82,194

නා

නාමරූපපච්චයා සළායතනං 28,84

නි

නිරොධසච්ච 20,70,100,152

නෙ

නෙවසඤ්ඤානාසඤ්ඤාභවො 30

නො

නො උපාද ධම්මා 56
නො විත්තා ධම්මා 52

ප

පච්චුප්පන්නාරම්මණා ධම්මා 42,118,222
පඤ්චක්ඛන්ධා 2,12
පඤ්ච බලානි 2,32
පඤ්ච වොකාරභවො 28
පඤ්චින්ද්‍රියානි 32
පටිච්චසමුප්පාදෙ 2
පරාමට්ඨා ධම්මා 50
පරාමට්ඨෙහි ධම්මෙහි 226
පරාමාසවිප්පයුත්තා ධම්මා 50

ප

පිට්ඨඞ්කා

පරාමාසසම්පයුත්තෙහි ධම්මෙහි 188
පරිත්තා ධම්මා 38
පරිත්තාරම්මණා ධම්මා 38,116
පරිදෙවො 30
පරිදෙවෙන 66,86,174

පු

පුරිසින්ද්‍රිය 24

බ

බහිද්ධා ධම්මා 42

බා

බාහිරා ධම්මා 56

බො

බොජ්ඣඞ්ගා 2

භ

භාවනාය පහාතබ්බා ධම්මා 38,60

ම

මජ්ඣිමා ධම්මා 40
මජ්ඣිමෙහි ධම්මෙහි 220
මනසිකාර 2,32
මනායතන 14
මනින්ද්‍රිය 24,102,178
මරණං 30
මහග්ගතා ධම්මා 38
මහග්ගතාරම්මණෙහි ධම්මෙහි 220

යො

යොගා ධම්මා 50
යොගෙහි ධම්මෙහි 226

රූ

පිට්ඨඞ්කා

රූපක්ඛන්ධො 6,8,10,80,98,136,152
194,204
රූපභවො 30,210
රූපායතනං 12
රූපාවචරා ධම්මා 64
රූපාවචරෙහි ධම්මෙහි 170
රූපිනො ධම්මා 46
රූපීහි 90

ලො

ලොකියා ධම්මා 48
ලොකියෙහි ධම්මෙහි 224
ලොකුත්තරා ධම්මා 48
ලොකුත්තරෙහි ධම්මෙහි 164

වි

විඤ්ඤාණක්ඛන්ධො 8,80,98,178
විඤ්ඤාණපච්චයා නාමරූපං 28,84
විපාකධම්මධම්මා 34,214
විපාකා ධම්මා 34
විසභාගො 4

වෙ

වෙදනා 2,32,98
වෙදනාක්ඛන්ධො
6,70,82,132,138,174
වෙදනාපච්චයා තණ්හා 28

ස

සඋත්තරා ධම්මා 62
සඞ්ඛාරක්ඛන්ධො 6
සඤ්ඤා 2,32
සඤ්ඤාක්ඛන්ධො 6
සඤ්ඤාභවො 28
සඤ්ඤොජනා ධම්මා 50,122

ස

පිට්ඨඞ්කා

සඤ්ඤොජනෙහි
74,92,146,166,226
සතින්ද්‍රියං 24
සතිපට්ඨාන 2,30,76,210
සද්දායතනං 12
සද්ධින්ද්‍රියං
24,102,140,174,206
සනිදස්සනා ධම්මා 46,68,90
සනිදස්සන සප්පටිඝෙහි 88,164
සප්පච්චයා ධම්මා 44
සප්පටිඝෙහි ධම්මෙහි 68
සප්පීතිකා ධම්මා 62
සප්පීතිකෙහි ධම්මෙහි 170,232
සභාගො 4
සමාධින්ද්‍රියං 24
සමුදයසච්ච 20,76,82,
100,138,172,178
සම්මත්තනියතා ධම්මා 40
සම්මත්තනියතෙහි ධම්මෙහි 196
සම්මප්පධානං 2,30
සරණා ධම්මා 64,130
සහෙතුකා ධම්මා 44
සවිචාරා ධම්මා 60
සවිතක්කා ධම්මා 60
සවිතක්කසවිචාරෙහි
ධම්මෙහි 216
සහෙතුකෙහි ධම්මෙහි 90,146
සළායතනපච්චයා ඵස්සො 28,84,182
සංකිලිට්ඨා ධම්මා 60
සංකිලෙසා ධම්මා 50
සංඛතා ධම්මා 44
සංඛාරක්ඛන්ධො 6
සංඛාරපච්චයා 84,104,140,180

# පදානුක්කමණිකා


## සා

| | පිටඞ්කා |
|---|---|
| සාරම්මණා ධම්මා | 52 |
| සාරම්මණෙහි ධම්මෙහි | 166 |
| සාසවා ධම්මා | 48 |
| සාසවෙහි ධම්මෙහි | 226 |

## සු

| | |
|---|---|
| සුඛසහගතා ධම්මා | 36,62 |
| සුඛසහගතෙහි ධම්මෙහි | 170 |
| සුඛාය වෙදනාය සම්පයුත්තා | 32 |
| සුඛින්ද්‍රිය | 24,102,138,172,206 |

## සෙ

| | පිටඞ්කා |
|---|---|
| සෙක්ඛා ධම්මා | 38 |

## සො

| | |
|---|---|
| සොකො | 30 |
| සොකෙන | 176 |
| සොතායතන | 12 |
| සොතින්ද්‍රියං | 24 |
| සොතෙන | 72,86,142 |

## හෙ

| | |
|---|---|
| හෙතුධම්මා | 44 |
| හෙතූහි ධම්මෙහි | 78,88,164,222 |

# පුග්ගලපඤ්ඤත්ති

## පදානුක්කමණිකා


අ — පිට්ඨඞ්කා

අකුප්පධම්මො 242, 262
අක්කොධනො 244, 286
අචෙළකො 364
අජ්ඣත්තං චෙතො-
සමථස්ස 254, 376, 378
අජ්ඣත්ත සඤ්ඤොජනො 244,286
අජ්ඣුපෙක්ඛිතබ්බො 246, 320
අත්තන්තපො 252, 364
අත්තහිතාය පටිපන්නො 252, 360
අධිපඤ්ඤාධම්ම-
විපස්සනා 254, 376, 378
අනත්තන්තපො 254, 376
අනරියො 268
අනවජ්ජො 248, 332
අනාගාමී 242, 244, 272, 276,
310, 398, 404
අනියතො 242, 266
අනිස්සුකී 244, 288
අනුපනාහී 244, 286
අනුරක්ඛනාභබ්බො 242, 264
අනුසොතගාමී 254, 378
අනොත්තප්පී 280
අන්තරාපරිනිබ්බායී 274
අන්ධො 246, 306
අපරන්තපො 254, 376
අපරිහාන ධම්මො 242, 264
අපලාසී 244, 286
අප්පමෙය්‍යො 246, 316
අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං-
උපදංසිතා 250, 352

අ — පිට්ඨඞ්කා

අප්පවජ්ජො 248, 332
අප්පසාදනීයෙ ඨානෙ පසාදං-
උපදංසිතා 250, 350
අප්පස්සුතො 254, 380
අභබ්බාගමනො 242, 266
අභයූපරතො 242, 66
අබ්භොකාසිකො 256, 396
අමක්ඛී 244
අමච්ඡරී 244, 288
අමායාවී 244, 288
අම්බූපමා පුග්ගලා 248, 340
අරහන්තා 398
අරහා 244, 266, 276, 310, 404
අරියො 242, 258
අරුකූපමචිත්තො 246, 304
අවකුජ්ජපඤ්ඤො 246, 308
අවණ්ණාරහස්ස අවණ්ණං-
භාසිතා 250
අවණ්ණාරහස්ස වණ්ණං-
භාසිතා 250
අවීතරාගො 246, 310
අසඞ්ඛාරපරිනිබ්බායී 242, 274
අසඨො 244, 288
අසප්පුරිසෙන-
අසප්පුරිසතරො 248, 326
අසප්පුරිසො 248, 326
අසමය විමුත්තො 242, 262
අසම්පජානො 244, 284
අසෙඛො 242, 268
අහිරිකො 244, 280

## පදානුක්කමණිකා


### ආ

පිට්ඨඞ්කා

ආගතවිසො 348
ආධෙය්‍යමුඛො 256, 386
ආයතනපඤ්ඤත්ති 240
ආරඤ්ඤිකා 256, 396
ආසංසො 246, 298
ආසිවිසූපමො 248, 348

### ඉ

ඉධ නිට්ඨා 260, 410
ඉධ විහාය නිට්ඨා 410
ඉන්ද්‍රියපඤ්ඤත්ති 240
ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරො 244, 282
ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො 244, 290
ඉස්සා 278, 288
ඉස්සුකී 244, 278

### උ

උග්ඝටිතඤ්ඤූ 248, 332
උච්ඡඞ්ගපඤ්ඤො 246, 308
උච්ඡෙදවාදෙ සත්ථා 324
උට්ඨාන ඵලූපජීවී 252, 354
උදකරහදූපමා පුග්ගලා 248, 344
උදකලෙඛූපමො 246, 312
උදකූපමා පුග්ගලා 258
උද්ධංසොතො-
අකනිට්ඨගාමී 242, 274
උන්නතුන්නතො 252, 358
උන්නතොනතො 252, 358
උපට්ඨිතසති 244, 292
උපනාහී 244, 278
උපනාහො 278
උපහච්චපරිනිබ්බායී 242, 274
උභතොභාගවිමුත්තො 242, 258, 260
268,, 402, 406
උස්සාදනා 388

### එ

පිට්ඨඞ්කා

එකචක්ඛු 246, 306
එකබීජී 242, 272
එකාසනිකා 256, 396

### ඔ

ඔත්තප්පී 244, 290
ඔනතුන්නතො 252, 358
ඔනතොනතො 252, 358
ඔපපාතිකො 402

### ක

කතඤ්ඤූ කතවෙදී 294
කල්‍යාණධම්මතරො 248, 330
කල්‍යාණධම්මො 244, 248, 330
කල්‍යාණමිත්තො 244, 290
කල්‍යාණො 248, 328

### කා

කායසක්ඛී 242, 246, 258, 260,
270, 302, 402, 406
කාසිකවත්ථූපමො
පුග්ගලො 246, 314
කාසිකං වත්ථං 314

### කු

කුප්පධම්මො 242, 262
කුම්භූපමා පුග්ගලා 248, 342

### කො

කොධනො 244. 278
කොධො 278
කොලංකොලො 242, 272

### ඛ

ඛන්ධපඤ්ඤත්ති 240
ඛලුපච්ඡාභත්තිකො 256, 396
ඛුරාජිනං 366

ගි

පිට්ඨඞ්කා

ගිලානා 300
ගිලානූපමා පුග්ගලා 246, 300

ගු

ගූථභාණී 246, 302

ගො

ගොත්‍රභූ 242, 266

ඝො

ඝොරවිසො 348
ඝොසප්පමාණො 252, 360

චෙ

චෙතනා භබ්බො 242, 264
චෙතොවිමුත්තිං 256

ඡ

ඡළභිඤ්ඤො 242, 268

ජි

ජිගුච්ඡිතබ්බො 246, 320

ජො

ජොති ජොතිපරායනො 252, 356
ජොතිතමපරායනො 252, 356

ඨි

ඨිතකප්පී 242, 268
ඨිතත්තො 254, 378
ඨිතධම්මො 242

ත

තථාගතො 366
තප්පෙතා 244, 296
තමොජොතිපරායණො 252, 356
තමොතමපරායණො 252, 354

ති

පිට්ඨඞ්කා

තිණ්ණො 254, 380, 402
තිත්තො 244, 296

තෙ

තෙචීවරිකො 256, 396
තෙවිජ්ජො 242, 268

ද

දත්වා අවජානාති 256, 386

දි

දිට්ඨිප්පත්තො 242, 246, 258, 270, 302, 402, 406
දිට්ඨිවිපන්නො 244, 284
දිට්ඨිසම්පද 294
දිට්ඨිසම්පන්නො 244, 294

දු

දුප්පමෙය්‍යො 246, 316
දුබ්බචො 244, 280

ද්වි

ද්විචක්ඛු 246, 306

ධ

ධජග්ගං 386, 388
ධම්මකථිකා පුග්ගලා 248, 334
ධම්මප්පමාණො 252, 360
ධම්මානුසාරී 242, 258, 260, 270, 402, 408

ධා

ධාතුපඤ්ඤත්ති 240

න

න සෙවිතබ්බො 246

### නි

පිට්ඨඞ්කා

නිමුග්ගො 400
නියතො 242, 266
නිරාසො 246, 298

### නෙ

නෙය්‍යො 248, 332
නෙවසෙක්ඛා නාසෙක්ඛා 242
නෙසජ්ජිකා 256, 396

### ප

පච්චෙකබුද්ධො 242, 260, 268, 398, 406
පඤ්ඤාය පරිපූරකාරී 248, 322
පඤ්ඤාවිමුත්තිං 256
පඤ්ඤාවිමුත්තො 242, 258, 260, 270, 406
පටිපන්නකො 242, 266
පටිසොතගාමී 254, 378
පඨවිලෙඛූපමො 246, 312
පණීතාධිමුත්තො 244, 296
පතිගාධප්පත්තො 402
පදපරමො 248, 332
පරගවචණ්ඩො 346
පරන්තපො 252, 366
පරහිතාය පටිපන්නො 252, 362
පරිහානධම්මො 242, 264
පලාසී 244, 278
පසාදනීයෙ ඨානෙ අප්පසාදං
උපදංසිතා 250, 350
පසාදනීයෙ ඨානෙ පසාදං
උපදංසිතා 250, 352
පංසුකූලිකො 256, 396

### පා

පිට්ඨඞ්කා

පාපතරො 248, 328
පාපධම්මතරො 248, 330
පාපධම්මො 248, 330
පාපමිත්තො 244, 282
පාපො 248, 328
පාරගතො 254, 380, 402
පාසාණලෙඛූපමො 246, 310

### පි

පිණ්ඩපාතිකා 256, 394

### පු

පුග්ගලපඤ්ඤත්ති 240
පුඤ්ඤඵලූපජීවී 252, 354
පුථුජ්ජනො 242, 266
පුථුපඤ්ඤො 246, 310
පුප්ඵභාණී 246, 304
පුබ්බකාරී 294

### පො

පොත්ථකූපමො පුග්ගලො 246, 312
පොත්ථකො 312

### ඵ

ඵලසමඞ්ගිනො 260, 404
ඵලෙඨිතො 242, 266

### බ

බලිවද්දූපමා පුග්ගලා 248, 346
බහිද්ධා සඤ්ඤොජනො 244, 286
බහුස්සුතො 254, 380

### බ්‍රා

බ්‍රාහ්මණො 254, 380, 402

# පදානුක්කමණිකා


## භ

| | පිට්ඨඞ්කා |
|---|---|
| භබ්බාගමනො | 242, 266 |
| භයූපරතො | 242, 266 |

## භො

| | |
|---|---|
| භොජනෙ අමත්තඤ්ඤූ | 244, 282 |
| භොජනෙ මත්තඤ්ඤූ | 244; 292 |

## ම

| | |
|---|---|
| මක්ඛී | 244, 278 |
| මක්ඛො | 278 |
| මග්ගසමඞ්ගිනො | 260, 404 |
| මච්ඡරියං | 378 |
| මච්ඡරී | 244,278 |
| මධුභාණී | 246,304 |
| මඤ්ඤෙ මොමූහො | 256,386 |

## මා

| | |
|---|---|
| මායා | 280 |
| මායාවී | 234,280 |

## මු

| | |
|---|---|
| මුට්ඨස්සති | 244,282 |
| මුත්තපටිභානො | 248,334 |

## මූ

| | |
|---|---|
| මූසිකූපමා පුග්ගලා | 248,336 |

## ය

| | |
|---|---|
| යථාසන්ථතිකො | 256,396 |

## යු

| | |
|---|---|
| යුත්තපටිභානො | 248,334 |

## යො

| | |
|---|---|
| යොධාජීවූපමා පුග්ගලා | 256,386 |
| යොධාජීවො | 386,388 |

## ර

| | පිට්ඨඞ්කා |
|---|---|
| රජග්ගං | 386,388 |
| රුක්ඛූපමා පුග්ගලා | 252,358 |
| රූපප්පමාණො | 252,360 |

## ලූ

| | |
|---|---|
| ලූඛප්පමාණො | 252,360 |

## ලො

| | |
|---|---|
| ලොලො | 256,386 |

## ව

| | |
|---|---|
| වජිරූපමචිත්තො | 246,306 |
| වජ්ජබහුලො | 248,332 |
| වණ්ණාරහස්ස අවණ්ණං භාසිතා | 250,350 |
| වණ්ණාරහස්ස වණ්ණං භාසිතා | 250,350 |
| වලාහකූපමා පුග්ගලා | 248,336 |

## වි

| | |
|---|---|
| විගතාසො | 246,298 |
| විජිතසඞ්ගාමො | 388,394 |
| විජ්ජූපමචිත්තො | 246,304 |
| විපඤ්චිතඤ්ඤූ | 248,332 |

## වී

| | |
|---|---|
| වීතරාගො | 246,310 |

## ස

| | |
|---|---|
| සකදාගාමී | 242,244,272,276,404 |
| සගවචණ්ඩො | 346 |
| සච්චපඤ්ඤත්ති | 246 |
| සඨො | 244,280 |
| සත්තක්ඛත්තුපරමො | 242,272 |
| සත්ථාරො තයො | 248,322,324 |
| සදෙසො | 254,376 |

ස

පිට්ඨඞ්කා

සද්ධානුභාරී 242,258,260,272, 402,468

සද්ධාවිමුත්තො 242,246,258,260, 270,302,402

සප්පුරිසෙන සප්පුරිසතරො 248,326

සප්පුරිසො 248,326

සමණපදුමො 254,382

සමණපුණ්ඩරීකො 254,382

සමණමචලො 254,382

සමණසුඛුමාලො 254,382

සමයවිමුත්තො 242,262

සමසීසී 232,266

සමාධිස්මිං පරිපූරකාරී 246,322

සමානො 254,376

සමොහො 254,376

සම්පජානො 244,292

සම්පහාරං 388,390

සම්මාසම්බුද්ධො 242,260,268,322 324,398,406

සරාගො 254,376

සසඞ්ඛාරපරිනිබ්බායී 242,274

සස්සතවාදෙ සත්ථා 324

සංවාසෙන අවජානාති 256,386

සා

පිට්ඨඞ්කා

සාවජ්ජො 248,330

සාධෙය්‍යං 280

සාරිපුත්තමොග්ගල්ලානා 398

සී

සීලවිපන්නො 244,284

සීලසම්පද 292

සීලසම්පන්නො 244,292

සීලෙසු පරිපූරකාරී 248,322

සු

සුප්පමෙය්‍යො 246,316

සුවචො 244,290

සෙ

සෙඛො 242,268

සෙවිතබ්බො පුග්ගලො 246, 318,322

සො

සොතාපන්නස්සකදාගාමිනො 398

සොතාපන්නො 244,276,404

සොසානිකො 256,396

හි

හිරිමා 244,290

හී

හීනාධිමුත්තො 244,296

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤ්ඤත්තිප්පකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR
## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume 45～Volume 57;**
**TRIPITAKA DICTIONARY one volume.**

**書名：斯里蘭卡巴利文大藏經，第四十五冊～第五十七冊；**
**斯里蘭卡巴利文大藏經索引 一冊**
**Book Serial No., 書號：SR245～SR257；SR258**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,136,532：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,457,632；Print 1,000 sets**
**以上合計，新台幣 1,457,632 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，
崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡巴利文大藏經 第五十一冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; December 2013

SR251 - 11808